2026 ඔක්තෝම්බර් මස 06 වන දින පෙරවරු 9.30 ට
මොරටුව මහා නගර සභා රැස්වීම් ශාලාවේදි පවත්වන ලද
මොරටුව මහා නගර සභාවේ මාසික සභා රැස්වීමේ වාර්තාව

සහභාගීත්වය:-

1.	නගරාධිපති	-	කේ.ඩී. නිශාන්ත ප්‍රදීනාන්දු මහතා
2.	නියෝජ්‍ය නගරාධිපති	-	ඩබ්.පී. ප්‍රභාෂණී වික්‍රමසිංහ මහත්මිය
3.	මහා නගර සභා මන්ත්‍රී	-	ඒ.එච්. සුදේශ් ඉන්ද්‍රජිත් කුමාර මහතා
4.	මහා නගර සභා මන්ත්‍රී	-	ඩබ්. රවින්ද්‍ර රංගන ප්‍රනාන්දු මහතා
5.	මහා නගර සභා මන්ත්‍රී	-	ඩබ්. ඉෂාන් දුමින්ද ප්‍රනාන්දු මහතා
6.	මහා නගර සභා මන්ත්‍රී	-	ඩී. සමන් සුජීව මහතා
7.	මහා නගර සභා මන්ත්‍රී	-	එම්.බී. සෙව්වන්දි නිලංගිකා ප්‍රනාන්දු මහත්මිය
8.	මහා නගර සභා මන්ත්‍රී	-	බී. යෝගේෂ ප්‍රියදර්ශණ මෙන්ඩිස් මහතා
9.	මහා නගර සභා මන්ත්‍රී	-	ඩබ්. සුජිත් ඩිල්රෝයි ප්‍රනාන්දු මහතා
10.	මහා නගර සභා මන්ත්‍රී	-	ඩී. ශාන්තිනී වල්ගම ද සිල්වා මහත්මිය
11.	මහා නගර සභා මන්ත්‍රී	-	එල්.ඩී. තිලක් විජේතුංග මහතා
12.	මහා නගර සභා මන්ත්‍රී	-	ඩබ්. ස්වර්ණා විජේරත්න මහත්මිය
13.	මහා නගර සභා මන්ත්‍රී	-	ටී. සංජීව ප්‍රියශාන්ත ප්‍රනාන්දු මහතා
14.	මහා නගර සභා මන්ත්‍රී	-	ඩී. ලීලාරත්න හේවාවිතාරණ මහතා
15.	මහා නගර සභා මන්ත්‍රී	-	අයි.ඩී. මහින්ද පල්ලිආරච්චි මහතා
16.	මහා නගර සභා මන්ත්‍රී	-	එච්.කේ. ෂර්මන් පිලිසියන් ප්‍රනාන්දු මහතා
17.	මහා නගර සභා මන්ත්‍රී	-	ඩබ්. ජීවන්ත සුදර්ශන කුමාර ප්‍රනාන්දු මහතා
18.	මහා නගර සභා මන්ත්‍රී	-	එච්.කේ. ශ්‍රියංග මනෝජ් ප්‍රනාන්දු මහතා
19.	මහා නගර සභා මන්ත්‍රී	-	ජීවන්ත සෙනෙවිරත්න මහතා
20.	මහා නගර සභා මන්ත්‍රී	-	කේ.ඩබ්. සඳුන් චාමර ප්‍රනාන්දු මහතා
21.	මහා නගර සභා මන්ත්‍රී	-	ඩී.එස්. සුසන්ත ඉරෝෂන් ප්‍රනාන්දු මහතා
22.	මහා නගර සභා මන්ත්‍රී	-	ඩබ්. දිලිජ් මනෝජ් ප්‍රනාන්දු මහතා
23.	මහා නගර සභා මන්ත්‍රී	-	බී. සරෝජනී මැන්දිස් මහත්මිය
24.	මහා නගර සභා මන්ත්‍රී	-	එම්. චන්ද්‍රසිරි ප්‍රනාන්දු මහතා
25.	මහා නගර සභා මන්ත්‍රී	-	එම්. ඉන්ද්‍රජිත් ප්‍රනාන්දු මහතා
26.	මහා නගර සභා මන්ත්‍රී	-	ඩබ්. මැක්සි ජේ. ප්‍රනාන්දු මහතා
27.	මහා නගර සභා මන්ත්‍රී	-	ඩී.එම්.සුජිත් පුෂ්පකුමාර මහතා
28.	මහා නගර සභා මන්ත්‍රී	-	ඩී. සමන්ත සිල්වා මහතා
29.	මහා නගර සභා මන්ත්‍රී	-	එම්. තිලකසිරි ප්‍රනාන්දු මහතා
30.	මහා නගර සභා මන්ත්‍රී	-	එල්. ඔසඳ හර්ෂණ අබේකෝන් මහතා
31.	මහා නගර සභා මන්ත්‍රී	-	බී.සජිත් දුමින්ද පීරිස් මහතා
32.	මහා නගර සභා මන්ත්‍රී	-	ඒ.එච්. සුරේෂ් ඉන්දික මහතා
33.	මහා නගර සභා මන්ත්‍රී	-	යූ. සුදත් ක්‍රිශාන්ත පෙරේරා මහතා
34.	මහා නගර සභා මන්ත්‍රී	-	යූ.අනුරසිරි ජයලාල් ද සිල්වා මහතා
35.	මහා නගර සභා මන්ත්‍රී	-	යූ.එල්. සේනක දමයන්ත ද සිල්වාමහතා

36.	මහා නගර සභා මන්ත්‍රී	-	එම්.ලිහිණි ප්‍රනාන්දු මහත්මිය
37.	මහා නගර සභා මන්ත්‍රී	-	සිත්ති මසීනා බක්කර් මහත්මිය
38.	මහා නගර සභා මන්ත්‍රී	-	එම්.ශිරෝමි ඉන්දිකා කුරේ මහත්මිය
39.	මහා නගර සභා මන්ත්‍රී	-	එස්. චදුන් රොමේෂ් ප්‍රනාන්දු මහතා
40.	මහා නගර සභා මන්ත්‍රී	-	එල්. දිලිජ් රොෂාන් කුමාර පෙරේරා මහතා
41.	මහා නගර සභා මන්ත්‍රී	-	ඩබ්. සුරේෂ් ප්‍රේමකුමාර ප්‍රනාන්දු මහතා
42.	මහා නගර සභා මන්ත්‍රී	-	පී.එම්. ෂෙයාන් දුලිජ් තිසේරා මහතා
43.	මහා නගර සභා මන්ත්‍රී	-	ඩබ්. සමීර ප්‍රභාත් ප්‍රනාන්දු මහතා
44.	මහා නගර සභා මන්ත්‍රී	-	ඩබ්.ඩී. බ්‍රෙන්ඩන් හිමාෂා ක්‍රිස්ටිල්කාන්ත මහතා
45.	මහා නගර සභා මන්ත්‍රී	-	පී. සුලක්ෂිකා තිලක්ෂනී ප්‍රනාන්දු මෙනවිය
46.	මහා නගර සභා මන්ත්‍රී	-	හරිෂ් චන්දන පිලානවිතානගේ මහතා
47.	මහා නගර සභා මන්ත්‍රී	-	ඩබ්.ඩී.රංජලා එස්.ජයතුංග මහත්මිය
48.	මහා නගර සභා මන්ත්‍රී	-	ඩී.එම්. මනෝජ් මධුරංග විජයරත්න මහතා
49.	මහා නගර සභා මන්ත්‍රී	-	ඕ. දිනූෂි කෞෂල්‍යා පෙරේරා මහත්මිය
50.	මහා නගර සභා මන්ත්‍රී	-	එච්.එල්.තිලිනි නෙත්සරණි මෙනවිය
51.	මහා නගර සභා මන්ත්‍රී	-	එම්.ප්‍රියනාත් මැකන්සි මැන්දිස් මහතා

ගරු නගරාධිපතිතුමාගේ ආරාධනය මත නාගරික ලේකම් එම්.කේ.ඩී. තාරක මුණසිංහ මහතා විසින් 2026.10.06 වන දින මාසික සභා රැස්වීමේ නිවේදනය සභාවට ඉදිරිපත් කරන ලදි.

01. <u>වාර්තාව පිළිගැනීම හා සළකා බැලීම.</u>

2026.09.01 වන දින පැවති මාසික මහා සභා රැස්වීමේ වාර්තාව.

<u>මහා නගර සභා මන්ත්‍රී - ඒ. එච්. සුදේශ් ඉන්ද්‍රජීත් කුමාර මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, 2026.09.01 දිනැති මාසික සභා රැස්වීමේ වාර්තාව පිලිගත යුතුයැයි යෝජනා කර සිටිමි.

මහා නගර සභා මන්ත්‍රී,ඩබ්. රවින්ද්‍ර රංගන ප්‍රනාන්දු මහතා විසින් යෝජනා ස්ථිර කරන ලදී.

2026.09.01 දිනැති මහා සභා රැස්වීම් වාර්තාව සභා සම්මත විය.

02. <u>ගරු නගරාධිපතිතුමාගේ නිවේදන:-</u>

02(1) <u>ගරු නගරාධිපති - කේ.ඩී.නිශාන්ත ප්‍රදීනාන්දු මහතා</u>

ගරු මන්ත්‍රීවරුනි, අසනීප තත්වයක් හේතුවෙන් 2026/09/04 දින පැවති ඉඩම් හා නගර සංවර්ධනය පිළිබඳ ස්ථාවර කමිටුවට සහභාගි විය නොහැකිබැවින් නිවාඩු ලබා දෙන ලෙස මහා නගර සභා මන්ත්‍රී එච්.කේ.ෂර්මන් පිලීසියන් ප්‍රනාන්දු මහතා 2026/09/03 දිනැති ලිපිය මගින් දැනුම් දී ඇති බැවින් 2014/11/20 දිනැති අංක 1889/32 දරණ ගැසට් පත්‍රයේ මහා නගර සභාවල සභිකයින් සඳහා දීමනා ගෙවීමට අදාල නියෝග මාලාවේ අංක 03 යටතේ එදින කමිටු රැස්වීමට සහභාගි නොවීම සම්බන්ධව සභාවේ අවසරය ලබා ගැනීමට ඉදිරිපත් කරනවා.

02(2) **<u>ගරු නගරාධිපති - කේ.ඩී.නිශාන්ත ප්‍රදීනාන්දු මහතා</u>**

ගරු මන්ත්‍රීවරුනි, නොවැලැක්විය හැකි හේතුවක් මත 2026/09/04 දින පැවති ඉඩම් හා නගර සංවර්ධනය පිළිබඳ ස්ථාවර කමිටුවට සහභාගි විය නොහැකි බැවින් නිවාඩු ලබා දෙන ලෙස මහා නගර සභා මන්ත්‍රී එම්.ශිරෝමි ඉන්දිකා කුරේ මහත්මිය 2026/09/01 දිනැති ලිපිය මගින් දැනුම් දී ඇති බැවින් 2014/11/20 දිනැති අංක 1889/32 දරණ ගැසට් පත්‍රයේ මහා නගර සභාවල සභිකයින් සඳහා දීමනා ගෙවීමට අදාල නියෝග මාලාවේ අංක 03 යටතේ එදින කමිටු රැස්වීමට සහභාගි නොවීම සම්බන්ධව සභාවේ අවසරය ලබා ගැනීමට ඉදිරිපත් කරනවා.

02(3) **<u>ගරු නගරාධිපති - කේ.ඩී.නිශාන්ත ප්‍රදීනාන්දු මහතා</u>**

ගරු මන්ත්‍රීවරුනි, අසනීප තත්වයක් හේතුවෙන් 2026/09/08 දින පැවති ක්‍රීඩා කටයුතු හා පොදු විනෝද කටයුතු පිළිබඳ ස්ථාවර කමිටුවට සහභාගි විය නොහැකි බැවින් නිවාඩු ලබා දෙන ලෙස මහා නගර සභා මන්ත්‍රී එස්.චදුන් රොමේෂ් ප්‍රනාන්දු මහතා 2026/09/08 දිනැති ලිපිය මගින් දැනුම් දී ඇති බැවින් 2014/11/20 දිනැති අංක 1889/32 දරණ ගැසට් පත්‍රයේ මහා නගර සභාවල සභිකයින් සඳහා දීමනා ගෙවීමට අදාල නියෝග මාලාවේ අංක 03 යටතේ එදින කමිටු රැස්වීමට සහභාගි නොවීම සම්බන්ධව සභාවේ අවසරය ලබා ගැනීමට ඉදිරිපත් කරනවා.

02(4) **<u>ගරු නගරාධිපති - කේ.ඩී.නිශාන්ත ප්‍රදීනාන්දු මහතා</u>**

ගරු මන්ත්‍රීවරුනි, අත්‍යවශ්‍ය කටයුත්තක් හේතුවෙන් 2026/09/08 දින පැවති ව්‍යාපෘති හා භෞතික සම්පත් කළමනාකරණය පිළිබඳ ස්ථාවර කමිටුවට සහභාගි විය නොහැකි බැවින් නිවාඩු ලබා දෙන ලෙස මහා නගර සභා ඒ.එච්.සුදේශ් ඉන්ද්‍රජීත් කුමාර මහතා 2026/09/08 දිනැති ලිපිය මගින් දැනුම් දී ඇති බැවින් 2014/11/20 දිනැති අංක 1889/32 දරණ ගැසට් පත්‍රයේ මහා නගර සභාවල සභිකයින් සඳහා දීමනා ගෙවීමට අදාල නියෝග මාලාවේ අංක 03 යටතේ එදින කමිටු රැස්වීමට සහභාගි නොවීම සම්බන්ධව සභාවේ අවසරය ලබා ගැනීමට ඉදිරිපත් කරනවා.

02(5) **<u>ගරු නගරාධිපති - කේ.ඩී.නිශාන්ත ප්‍රදීනාන්දු මහතා</u>**

ගරු මන්ත්‍රීවරුනි, අසනීප තත්වයක් හේතුවෙන් 2026/09/09 දින පැවති ඵලදායිතා හා මුදල් උත්පාදනය පිළිබඳ ස්ථාවර කමිටුවට සහභාගි වීමට නොහැකි වූ බැවින් නිවාඩු ලබා දෙන ලෙස මහා නගර සභා මන්ත්‍රී ඩබ්.ජීවන්ත සුදර්ශන කුමාර ප්‍රනාන්දු මහතා 2026/09/21 දිනැති ලිපිය මගින් දැනුම් දී ඇති බැවින් 2014/11/20 දිනැති අංක 1889/32 දරණ ගැසට් පත්‍රයේ මහා නගර සභාවල සභිකයින් සඳහා දීමනා ගෙවීමට අදාල නියෝග මාලාවේ අංක 03 යටතේ එදින කමිටු රැස්වීමට සහභාගි නොවීම සම්බන්ධව සභාවේ අවසරය ලබා ගැනීමට ඉදිරිපත් කරනවා.

02(6) **<u>ගරු නගරාධිපති - කේ.ඩී.නිශාන්ත ප්‍රදීනාන්දු මහතා</u>**

ගරු මන්ත්‍රීවරුනි, පෞද්ගලික කරුණක් හේතුවෙන් 2026/09/10 දින පැවති මුදල් පිළිබඳ ස්ථාවර කමිටුවට සහභාගි වීමට නොහැකි වූ බැවින් නිවාඩු ලබා දෙන ලෙස මහා නගර සභා මන්ත්‍රී තුසිත් ද සිල්වා මහතා 2026/09/10 දිනැති ලිපිය මගින් දැනුම් දී ඇති බැවින් 2014/11/20 දිනැති අංක 1889/32 දරණ ගැසට් පත්‍රයේ මහා නගර සභාවල සභිකයින් සඳහා දීමනා ගෙවීමට අදාල නියෝග මාලාවේ අංක 03 යටතේ එදින කමිටු රැස්වීමට සහභාගි නොවීම සම්බන්ධව සභාවේ අවසරය ලබා ගැනීමට ඉදිරිපත් කරනවා.

02(7) **<u>ගරු නගරාධිපති - කේ.ඩී.නිශාන්ත ප්‍රදීනාන්දු මහතා</u>**

ගරු මන්ත්‍රීවරුනි, පෞද්ගලික විදේශ සංචාරයක් සඳහා විදෙස්ගත වීම හේතුවෙන් 2026/10/06 දිනැති මාසික මහා සභා රැස්වීම සඳහා සහභාගි වීමට නොහැකි බැවින් නිවාඩු ලබා දෙන ලෙස මහා නගර සභා මන්ත්‍රී තුසිත් ද සිල්වා මහතා විසින් 2026.09.22 දිනැති ලිපිය මගින් දැනුම් දී ඇති බැවින් 2014/11/20 දිනැති අංක 1889/32 දරණ ගැසට් පත්‍රයේ මහා නගර සභාවල සභිකයින් සඳහා දීමනා ගෙවීමට අදාල නියෝග මාලාවේ අංක 03 යටතේ අද දිනමාසික මහා සභා රැස්වීමට සහභාගි නොවීම සම්බන්ධව සභාවේ අවසරය ලබා ගැනීමට ඉදිරිපත් කරනවා.

02(8) **<u>ගරු නගරාධිපති - කේ.ඩී.නිශාන්ත ප්‍රදීනාන්දු මහතා</u>**

ගරු මන්ත්‍රීවරුනි, ඔක්තෝම්බර් මස 15, 16 හා 17 යන දින තුන සාහිත්‍ය මහෝත්සවය පැවැත්වීමට අවශ්‍ය කරන කටයුතු සුදානම් කරමින් තිබෙනවා. ඒ සම්බන්ධව ඔබ සියලු දෙනා දැනුවත් කරනවා. ඒ සඳහා ඔබ සියලු දෙනාගේ උදව්ව, සහයෝගය හා සහභාගීත්වය ලබාදෙන්න කියන ඉල්ලීම කරනවා.

03. <u>සභාව අමතා එවන ලද ආයාචනා හා පෙත්සම් පැමිණිලි හා සන්දේශ සභාව හමුවේ තැබීම.</u>

03(1) **<u>මහා නගර සභා මන්ත්‍රී - එම්.තිලකසිරි ප්‍රනාන්දු මහතා</u>**

ගරු නගරාධිපතිතුමනී, ආයාචනා හා පෙත්සම් යටතේ ඉල්ලීම් කිහිපයක් තියෙනවා ඔබතුමාගෙන් කරන්න. රාවතාවත්ත පොදු සුසාන භූමියේ තිබෙන සෞඛ්‍ය තත්ත්වය සම්බන්ධයෙන් මෑත දිනකදිත් අපි ඔබතුමත් සමඟ සාකච්ඡා කළා. මම එම ස්ථානයෙන් උදේ හවස දරුවන් රැගෙන යන පුද්ගලයෙකු වශයෙන් එහි ගමන් කරන විට එයින් ලොකු දුර්ගන්ධයක් හමනවා. අපි ඔබතුමාව මේ සම්බන්ධයෙන් දැනුවත් කළාම ඔබතුමා ඒ මොහොතේම ක්‍රියාත්මක වෙලා එම තත්ත්වය සමථයකට පත්කළා. ඒ පිළිබඳව ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා. ඒවගේම තමයි ගරු නගරාධිපතිතුමනි, අපි රාවතාවත්ත පොදු සුසාන භූමියේ භූමිදාන කටයුතු කිරීමේදි ලොකු ඒරියා එකකින් දෛනිකව දේහයන් රැගෙන එනවා. මොරටුවෙන් වැඩි ප්‍රමාණයක් රැගෙන එන්නේ රාවතාවත්ත පොදු සුසාන භූමියට. දෛනිකව භූමිදාන කටයුතු තුන හතරක් එහි සිදුවෙනවා. මෙහිදි සුසාන භූමියේ වලවල් කපා ගැනීමේදි ස්ථීර සේවකයන්ගේ අඩුපාඩුවක් තිබෙනවා.මේ නිසා ජනතාව දැඩි අපහසුතාවයකට පත්වෙනවා. එමනිසා ගරු නගරාධිපතිතුමනි, මේ සම්බන්ධව ඔබතුමාගේ අවධානය යොමු කරන්න. මේ සභාවේ අවධානය යොමු කරන්න. මෙය ජනතාවට දැනෙන ප්‍රශ්ණයක්. මක්නිසාද මරණයක් සිදුවුණාම මිනිසුන් සංවේදිව සිටින අවස්ථාවක්. එමනිසා ගරු නගරාධිපතිතුමනි, මේ සම්බන්ධව ඔබතුමාගේ අවධානය යොමු කරලා ස්ථීර සේවකයන් කිහිපදෙනෙකු අනිවාර්යයෙන්ම ඒ සඳහා සම්බන්ධන කරන්න කියන ඉල්ලීම කරනවා.

03(2) **<u>මහා නගර සභා මන්ත්‍රී - එම්.තිලකසිරි ප්‍රනාන්දු මහතා</u>**

ගරු නගරාධිපතිතුමනී, ඉදිබැද්ද ඩග්ලස් ප්‍රනාන්දු ක්‍රීඩාංගණයේ අත්පන්දු ක්‍රීඩාවට යම්කිසි කැමැත්තක් දක්වන අයවලුන්ට අත්පන්දු ක්‍රීඩාව කරන්න ඔවුන් වෙනුවෙන් මාගේ මැදිහත්වීම මත එවකට හිටපු බස්නාහිර පළාත් සභා මන්ත්‍රී අමල් සිල්වා මැතිතුමාගේ පෞද්ගලික මුදලින් ලක්ෂ 05ක පමණ මුදලක් වෙන්කරලා ස්ථානයක් වෙන්කරලා තිබුණා. නමුත් මෙය කවුරුන්

හෝ පුද්ගලයකු හෝ කණ්ඩායමක් විසින් එම ස්ථානයෙන් මෙය ඉවත් කරලා තිබෙනවා. එය ඉවත් කරන දවසෙම මම ඔබතුමාට දුරකතනයෙන් ඇමතුමක් ගත්තා, නමුත් ඔබතුමාව සම්බන්ධ කරගැනීමට නොහැකි වුණා. සමහරවිට ඔබතුමා කිසියම් රාජකාරියක සිටින්නට ඇති. නැතිනම් ඔබතුමා නැවත පෙරලා අපට ඇමතුමක් ගන්නවා. ඒ පිළිබඳව නෙමෙයි ප්‍රශ්ණය තිබෙන්නේ. මම ඉන්පසුව ඊළඟ ප්‍රධානියා හැටියට නාගරික කොමසාරිස්තුමියට ඇමතුමක් ගත්තා. එවිට එහි සේවිකාවක් දුරකතනයට සම්බන්ධවෙලා සඳහන් කළා කොමසාරිස්තුමියත් රැස්වීමකට සහභාගිවෙලා කියලා. මම ඉන්පසුව අපේ ඉංජිනේරුතුමාට ඇමතුමක් දුන්නා. එහිදි ඉංජිනේරුතුමා ඇමතුමට සම්බන්ධ වුණා. මම එහිදි එතුමාට සඳහන් කළා මෙය මේවිදිහට ඉවත් කරනවා කියලා. එම අවස්ථාවේ මේ සම්බන්ධව එතුමා දන්නෙත් නෑ, කර්මාන්ත අංශයෙන් දන්නෙත් නෑ. කිසිම කෙනෙකුගේ දැනුවත්භාවයකින් තොරව තමයි මෙය හිතුමනාපෙට මෙම කණු දෙක ඉවත් කරලා අද ක්‍රීඩා කරන්න බැරි තත්ත්වයකට පත් කරලා තිබෙන්නේ. මම කියන්නේ මේ නිසා ක්‍රිකට් ක්‍රීඩාව කරන්න අවහිරයක් තිබෙනවා නම්, මේ නිසා ක්‍රිකට් ක්‍රීඩාවට අසාධාරණයක් සිදුවෙනවා නම් මෙය ඉවත් කරන්න කිසියම් ක්‍රමවේදයක් තිබෙනවා. සභාව සමඟ සාකච්ඡා කරලා හරි, කර්මාන්ත අංශය සමඟ සාකච්ඡා කරලා හරි, කමිටුවක් පත්කරලා හරි කරන්න පුළුවන්. මෙය මෙම ස්ථානයේ අවුරුදු 10ක් තිස්සේ මෙහෙම තිබුණා. දැන් තමයි කියන්නේ මේ නිසා ක්‍රිකට් ක්‍රීඩාවට අවහිරයක් සිදුවෙනවා කියලා. කමක් නෑ එහෙම වෙන්නත් පුළුවන්. එහෙම මෙය වෙනත් ස්ථානයක ස්ථාපිත කරනවා නම් ක්‍රීඩා කරන්න පුළුවන් තැනක ස්ථාපිත කරන්න ඕනේ. නමුත් මෙය ස්ථාපිත කරලා තියෙන්නේ ගහ අයිනේ. එතන කිසිම කෙනෙකුට ක්‍රීඩා කරන්න බෑ. මම කියන්නේ මෙය තිබුණ තැන තියලා ක්‍රීඩා කරන්නේ නැති වෙලාවට, ක්‍රිකට් තරගයක් තිබෙන අවස්ථාවේ ඇත්තටම අවහිරතාවයක් තිබෙනවා එම කණු දෙක ඉවත් කරලා හරි නැවත සවිකරන්න පුළුවන් ක්‍රමයක් තිබෙනවා නම් ඔබතුමා හොයලා බලන්න. මම මේ සම්බන්ධයෙන් නාගරික ඉංජිනේරුතුමාව දැනුවත් කළා, කර්මාන්ත අංශය දැනුවත් කළා. අද වෙනතුරු එයට කිසිදු පිලිතුරක් නෑ. එමනිසා මේ සම්බන්ධව ඔබතුමාගේ කාරුණිකව අවධානය යොමුකරලා මේ සම්බන්ධව සොයලා බලන්න. ඔබතුමා දන්නවා ඇති ලොකු අවහිරයක් වන ජීවිතවලට පවා හානි සිදුවිය හැකි දිරපු අඩි 100ක් විතර උස ගසක් මාස 09ක්, අවුරුද්දක් තිස්සේ මෙම ක්‍රීඩාංගණයේ තිබුණා. නමුත් මෙය ඉවත් කරන්න කිසිවෙක් කටයුතු කළේ නෑ. අන්තිම මොහොතේ සංගීත ප්‍රසංගයක් පවත්වන අවස්ථාවක මම ඔබතුමාට කතා කරලා ඔබතුමා ඉක්මනටම ක්‍රියාත්මක වෙලා පහුවෙනිදම එය ඉවත් කරලා දුන්නා. නමුත් මෙම කණ්ඩායම මෙම අනතුරුදායක ගස ඉවත් කරන්න මේ විදිහට කිසිම සම්බන්ධයක් වුණේ නෑ. අද ඉදිබැද්ද ඩග්ලස් ප්‍රනාන්දු ක්‍රීඩාංගණයේ ක්‍රිකට් ක්‍රීඩාව ව්‍යාපාරයක් බවට පත්වෙලා. කිහිප දෙනෙක් එකතු වෙලා බිස්නස් එකක් බවට පත්කරගෙන මුදල් හම්බකරන්න කරන වැඩක්. එමනිසා මේ සම්බන්ධව ඔබතුමාගේ අවධානය යොමු කරන්න කියලා ඉල්ලා සිටිනවා.

03(3) **<u>මහා නගර සභා මන්ත්‍රී - එම්.තිලකසිරි ප්‍රනාන්දු මහතා</u>**

ගරු නගරාධිපතිතුමනී, වරිපනම් අංක 105/11, බෝධිරාජ මාවත, විල්ලෝරාවත්ත, මොරටුව ලිපිනයේ පදිංචි මොරටුව මහා නගර සභාවේ හිටපු නගරාධිපති ඩබ්.ඩබ්.සමන්ලාල් ප්‍රනාන්දු මැතිතුමා විසින් පැමිණිල්ලක් ඉදිරිපත් කරලා තිබෙනවා. මම එය සභාවට ඉදිරිපත් කරනවා. එමඟින් මොරටුව මහා නගර සභාවට අයත් කටුබැද්ද සුපර් සිටි වෙළඳ සංකීර්ණයේ ප්‍රවේශ මුදල් මිලියන 30කට වඩා වැඩි ප්‍රමාණයක් කපා හැරීමට කටයුතු සිදුකිරීම සම්බන්ධව ගරු නගරාධිපතිතුමා ඇතුළු පාලක පක්ෂයට චෝදනාවක් එල්ල කරනවා. එම මුදල් කපා හැරීම සඳහා මහා නගර සභා ආඥා පනතේ විධිවිධාන නොමැති බවත්, සුපර් සිටි වෙළඳ සංකීර්ණය ක්‍රියාත්මක

කිරීම සඳහා නිර්දේශය මුදල් කමිටුව මගින් සභාවට යොමු කර ඇති අතර, ඒ අනුව සභාවේ වැඩි මන්ත්‍රිවරුන්ගේ කැමැත්ත මත මහා නගර සභා ආඥා පනතේ පැහැදිලි ලෙස සඳහන් කර ඇති 185 (2) (ඊ) යටතේ සභාවේ ආදායම් ප්‍රභවයට ගැනීමට කටයුතු කර ඇත. ගරු නගරාධිපතිතුමා මේ සම්බන්ධව ලොකු විස්තරයක් සඳහන් වෙනවා. මම ඒ සියල්ලම සඳහන් කරන්නට යනෙන් නෑ. මෙතනදි එතුමා වැදගත් දෙයක් මතුකරනවා. එනම්, මහා නගර සභාවේ නගරාධිපතිවරයා ප්‍රධාන විධායක නිලධාරියා වන බවත් සභාවට අයවිය යුතු මුදල් අය කර ගැනීමේදි 254 (අ) 1,2 යන කරුණුවලදි නගරාධිපතිවරයා අභිබවා කොමසාරිස් ක්‍රියා කළයුතු වන බවත් මහා නගර සභා ආඥා පනතේ 14(3) කරුණෙන් පැහැදිලි වන බවත් තවද 254(අ) 1,2 කරුණු ක්‍රියාත්මක් කිරීමට කොමසාරිස් බැඳී සිටින බවත් එතුමා සඳහන් කරනවා. ඔබතුමා ඇතුළු පාලක කණ්ඩායම මෙම මුදල කපා හරිනවා නම්, කොමසාරිස්තුමියගේ වගකීම වෙනවා මෙම සභාවට ලැබීමට තිබෙන මුදල් ලබාගැනීම කියලා. එමනිසා මම එම ලිපිය සභාගත කරනවා.

03(4) **<u>මහා නගර සභා මන්ත්‍රී - එම්.තිලකසිරි ප්‍රනාන්දු මහතා</u>**

ගරු නගරාධිපතිතුමනී, හිටපු නගරාධිපති ඩබ්.ඩබ්.සමන්ලාල් ප්‍රනාන්දු මැතිතුමා විසින් තිලකසිරි ප්‍රනාන්දු මන්ත්‍රිතුමා මගින් නගරාධිපතිතුමා යනුවෙන් තවත් ලිපියක් ඉදිරිපත් කරලා තිබෙනවා. එහි සඳහන් වෙන්නේ කැඩැස්තර සිතියම් සම්බන්ධව. මෙම සභාව මගින් කැඩැස්තර සිතියම් සම්බන්ධව එතුමාගේ පාලනය කාලේ මෙම සම්බන්ධව මමත් මෙම සභාවේ කතා කළා. අපි කතා කරලා කිව්වා ආණ්ඩුව වශයෙන් මොරටුවට ලොකු මුදලක් වෙන්කරලා තමයි මෙම කැඩැස්තර සිතියම ලබාදීලා තිබෙන්නේ කියලා. අපේ කාලෙත් එය නොවෙන කොට මම සභාවේ කතා කරලා කිව්වා මේවා අනුමත නොකිරීම තුලින් අනවසර ඉදිකිරීම් ඇතිවෙන්න පුළුවන් කියලා. එමනිසා මෙමගින් ජනතාවගේ අයිතිවාසිකම් උල්ලංඝනය වීමක් සිදුවෙන්නේ. මෙම ලිපිය මගින් කියනවා එතුමාගේ කැඩැස්තර සිතියමත් මෙම සභාව මගින් අනුමත කරන්න නොහැකි බව සඳහන් කළාම මෙය අනුමක කිරීමට නොහැකි හේතුව සඳහන් කරන්න කියලා නාගරික ඉංජිනේරුවරයාගෙන් ලිඛිතව ඉල්ලා සිදුකලා යනුවෙන්. එම ලිපියේද පිටපතක් මා වෙත එවලා තිබෙනවා මම එම ලිපි දෙකත් සභාගත කරනවා.

03(5) **<u>මහා නගර සභා මන්ත්‍රී - යූ.අනුරසිරි ජයලාල් ද සිල්වා මහතා</u>**

ගරු නගරාධිපතිතුමනී, ආයාචනා හා පෙත්සම් අයිතමය යටතේ වාචික කරුණු කිහිපයක් ඉදිරිපත් කරන්න තිබෙනවා. මාගේ පළමු වාචික කරුණ වන්නේ මෙම කාලසීමාව වැසි සහිත කාලසීමාවක්. මෙම වැස්ස නිසා රටේ නොයෙකුත් පළාත්වලට ගංවතුර තත්ත්වයකුත් ඇතිවෙලා තිබෙනවා. ඒවගේම ඩෙංගු උවදුරත් වැඩිවීමකට ලක්වෙනවා. එමනිසා ඩෙංගු උවදුර මොරටුව මහා නගර සභා සීමාව තුළ ගිය කාලසීමාව තුළ වගේම මේ කාලසීමාවෙත් වැඩිවෙන්න පුළුවන්. අපට සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි කාර්යාල දෙකක් තිබෙනවා මොරටුව හා එගොඩඋයන. එමනිසා එම වෛද්‍යවරුන් හා කණ්ඩායම් එකතු කරලා, අපේ සියලුම සෞඛ්‍ය අංශ එකතු කරලා වැඩපිලිවෙලක් හදන්න කියන එක තමයි ඔබතුමාගේ අවධානයට යොමු කරන්නේ.

03(6) **<u>මහා නගර සභා මන්ත්‍රී - යූ.අනුරසිරි ජයලාල් ද සිල්වා මහතා</u>**

ගරු නගරාධිපතිතුමනී, මාගේ දෙවැනි වාචික කරුණ වන්නේ කල්දමුල්ල ප්‍රදේශයේ ක්‍රියාත්මක වන මලඅපද්‍රව්‍ය ව්‍යාපෘතිය සම්බන්ධව.මෙය මම සභාවේ නිතර සඳහන් කරන කතාවක්. මෙම ව්‍යාපෘතියට දැන් වසර තුනකට වැඩි. කල්දමුල්ල ප්‍රදේශයේ එම ව්‍යාපෘතිය ක්‍රියාත්මක වන පාරවල් සම්බන්ධව මහා නගර සභාවේ ඉංජිනේරුතුමා සහ ඔබතුමාගේ ප්‍රධානත්වයෙන් අපි

දෙවතාවක්ම එම ව්‍යාපෘතියේ අධ්‍යක්ෂකතුමා, කළමණාකාරතුමා ඇතුළු නිලධාරි කිහිප දෙනෙකු සමඟ සාකච්ඡා පැවැත්වුවා. කල්දමුල්ල ප්‍රදේශයේ ජනතාව වසර තුනක් තිස්සේ අපහසුතාවයට පත්වෙලා තිබෙනවා එම ව්‍යාපෘතිය හේතුවෙන් ගොඩදමන පස් නිසා කාණු සියල්ලම පිරී තිබීම හේතුවෙන් වැසි කලා සීමාව නිසා කිසි දිනක වතුර නොදාපු නිවාසවලට මේ හේතුවෙන් වතුර දාලා තියෙනවා. මදුරුවන් විශාල වශයෙන් වැඩිවෙලා තිබෙනවා. අපි මේ සම්බන්ධව දෙවතාවක්ම අදාළ ව්‍යාපෘතියේ නිලධාරීන් සමඟ සාකච්ඡා පැවැත්වුවත් ඔවුන්ගේ අවධානය යොමු වී නොමැති බව මම සඳහන් කරන්න කැමතියි. මෙම පාරවල් මහා නගර සභාව සතු පාරවල්. අපි සහ එම ව්‍යාපෘතිය අතර ගිවිසුමක් තිබෙනවා. ගිවිසුම අනුව පාරවල් තිබුණු ආකාරයට හදලා දෙන්න ඕනේ, කාණු ටික තිබුණු ආකාරයට පිරිසිදු කරලා දෙන්න ඕනේ. එමනිසා ජනතාවට සිදුවන අපහසුතාවය වලක්වා ගැනීමට කඩිනමින් එම පාරවල් හා කාණු තිබුණු ආකාරයට සාකසා ගැනීමට ඔබතුමාගේ අවධානය යොමු කරන්න කියලා ඉල්ලා සිටිනවා.

03(7) **<u>මහා නගර සභා මන්ත්‍රී - යූ.අනුරසිරි ජයලාල් ද සිල්වා මහතා</u>**

ගරු නගරාධිපතිතුමනී, කැළි කසළ ඉවත් කිරීමට සෞඛ්‍ය දෙපාර්තමේන්තුවට අයත් ට්‍රැක්ටර් රථ තිබෙනවා. මෙම රථ කළාප 05කට වෙන්කරලා තිබෙනවා. මේවා ගමින් ගමට යනවා. මේ කාල සීමාවේ වර්ෂාව තිබුණත් තද උෂ්ණත්වයකුත් පවතිනවා. එමනිසා එම ට්‍රැක්ටර් රථ පදවන රියදුරු මහතුන්ගේ ආසනය වටේට ආවරණයක් ලබාදුන්නොත් ඉතා සහනයක් කියලා මම හිතනවා. බොරුපන ප්‍රදේශයේ ට්‍රැක්ටර් රථයට පත්තර කඩෙන් බට වගයකුත් දීලා තිබෙනවා.නමුත් තවමත් එම ට්‍රැක්ටර් රථය ආවරණය කරගෙන නෑ කියලා මට දැනගන්නට ලැබුණා. එමනිසා ඒ සම්බන්ධවත් අවධානය යොමු කරන්න කියලා ඉල්ලා සිටිනවා.

03(8) **<u>මහා නගර සභා මන්ත්‍රී - යූ.අනුරසිරි ජයලාල් ද සිල්වා මහතා</u>**

ගරු නගරාධිපතිතුමනී, කර්මාන්ත කමිටුවේ සාමාජිකයෙකු විදිහට මම සතුටට පත්වෙනවා කෝටියකට අධික මුදලක් වැයකරලා ගල් රෝලක් මිලදි ගැනීම සම්බන්ධව.අපිට දැන් ඕනේ එයින් වැඩ කරන්න. මම දන්නා විදිහට මුළු මොරටුවේම සෑම කොට්ඨාශයකම වගේ පාරවල් කැඩිලා තියෙනවා. අපි දැන් එය භාවිතා කරලා පාරවල් සංවර්ධනය කරන්න අවශ්‍යයි. ගරු නගරාධිපතිතුමනි, කොලාස්වල ප්‍රශ්නයක් තිබෙනවා. එම ගැටලුව කඩිනමින් නිරාකරණය කරගෙන කොලාස් ටික ප්‍රිමික්ස් ටික දාලා එම පාරවල් සංවර්ධනය කරලා දෙන්න කියන එක ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා.

03(9) **<u>මහා නගර සභා මන්ත්‍රී - යූ.අනුරසිරි ජයලාල් ද සිල්වා මහතා</u>**

ගරු නගරාධිපතිතුමනී, විදුලි අංශය මගින් මොරටුවට ප්‍රදේශයට විදුලි බල්බයක් පිච්චුණාම සවිකිරීම, ඒවගේම ලාම්පු සවි කිරීම ආදි විදුලිය සම්බන්ධ විශාල සේවයක් කරනවා. ත්‍රීරෝද රථ දෙකක් තිබෙනවා. එම ත්‍රීරෝද දෙකෙන් තමයි මේ සේවකයන් හා බාසුන්නෑහෙලා යන්නේ. මම හිතන්නේ මෙම ත්‍රීරෝද රථ නිකන්වත් යන්න බැරි තත්ත්වයක තිබෙන්නේ. ඔවුන් අව්වේ යනවා, වැස්සේ තෙමෙනවා. මෙම අංශයේ සේවකයන් ඉතා උනන්දුවෙන් වැඩ කරන පිරිසක්. එමනිසා මොවුන්ට අවශ්‍ය කරන පහසුකම්, රථවාහන ටික ලබාදෙන්න කියලා ඔබතුමාගේ අවධානයට යොමු කරනවා.

03(10) <u>මහා නගර සභා මන්ත්‍රී - යූ.අනුරසිරි ජයලාල් ද සිල්වා මහතා</u>

ගරු නගරාධිපතිතුමනී, පසුගිය දෙවැනිදා වැස්සත් සමඟ විදුලි සැර වැදිලා කල්දෙමුල්ල, දහම්පුර ප්‍රදේශයේ නිවාස බොහොමයක විදුලි බල්බ පිච්චිලා, විදුලි උපකරණ බොහොමයක් අක්‍රිය වෙලා තිබුණා. මම එම ප්‍රදේශයේ මන්ත්‍රීවරයා ලෙස සොයා බැලුවම මත්ද්‍රව්‍ය භාවිතා කරනා පුද්ගලයන් විසින් සමහර ලයිට් කණුවල අර්ත් වයර් ගලවාගෙන ගොස් තිබෙනවා. එමනිසා ඒ සම්බන්ධවත් අවධානය යොමු කරන්න කියලා ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා.

03(11) <u>මහා නගර සභා මන්ත්‍රී - එම්.ප්‍රියනාත් මැකන්සි මැන්දිස් මහතා</u>

ගරු නගරාධිපතිතුමනී, මොරටුව, කඩලාන නගර සභා ක්‍රීඩාංගණය, පසුගිය කාල සීමාවේදි මෙම සභාවට යම් ආදායමක් ලබාදුන් ක්‍රීඩාංගණයක්. දිවිවා ව්‍යාවසනය පැමිණි අවස්ථාවේදි එහිදි ඉවත් කරනු ලැබූ සියලුම අපද්‍රව්‍ය බැහැර කරනු ලැබුවේ එම ක්‍රීඩාංගණයට. එදා සිට අද වෙනතුරු දරුවෙකුට එම ක්‍රීඩා පිටියේ ක්‍රිඩා කිරීම තියා ඇතුල්වීමට නොහැකි තත්ත්වයකට පත්වෙලා තිබෙනවා. කඩලාන ප්‍රදේශයේ පෙර වගේ ක්‍රීඩා කිරීමට මෙම ක්‍රීඩාංගණය හැර වෙනත් ක්‍රීඩාංගණයක් නෑ. මෙය විශාල වශයෙන් නගර සභාවෙන් මුදල් වියදම් කරලා ගොඩනගපු ක්‍රීඩා පිටියක් නෙමෙයි. අපි බොහොම ආඩම්බරයෙන් කියන්න ඕනේ, පස් නොමිලේ හොයාගෙන මම මන්ත්‍රීවරයකු කටයුතු කරපු කාලසීමාවේ මෙම ක්‍රීඩාංගණය මම හැදුවේ. නමුත් අද ගිහිල්ලා බැලුවතින් ළමයෙකුට ක්‍රීඩා කරන්න විදිහක් නෑ ක්‍රීඩා පිටිය වල් වැදිලා නිසා. එම ක්‍රීඩාංගණයේ වෙනම කොටසක් හදලා තියෙනවා ළමා ක්‍රීඩාංගණයක් ලෙස. පොඩ්ඩක් ගිහින් බලන්න. බස් යන මාර්ගයේ මෙය තිබෙන්නේ. විල්ලෝරාවත්ත, ඉඳිබැද්ද, කඩලාන හා පුවක්අරඹ කියන ප්‍රදේශවල ජනතාව එතනින් එහෙට මෙහෙට යනවා. ඇත්තටම නගර සභාවේ විපක්ෂ මන්ත්‍රීවරයෙක් විදිහට මටත් ලැජ්ජයි. එමනිසා මම බොහොමත්ම උවමනාවෙන් ඉල්ලා සිටිනවා මේ පිළිබඳව ඔබතුමාගේ අවධානය යොමු කරන්න කියලා.

03(12) <u>මහා නගර සභා මන්ත්‍රී - එම්.ප්‍රියනාත් මැකන්සි මැන්දිස් මහතා</u>

ගරු නගරාධිපතිතුමනී, කඩලාන ප්‍රදේශයේ පාරවල් ගැන කතාකරන කොට දැන් හරිම කණගාටුයි. මම මේ මහා නගර සභාවට මන්ත්‍රීවරයෙක් විදිහට පත්වෙලා තුන්වන මාසය. නමුත් පසුගිය කාල වකවානුව දිහා බැලුවම අද පාරවල් ඉතාමත්ම අබලන් වෙලා තිබෙන්නේ. අඩුම ගානේ ප්‍රිමික්ස් ටිකක් දාලා හරි හැටි නොහැදුවොත් වෙන්නේ මෙම පාරවල් අලුතින් හදන්න වෙනවා. මට මතකයි මම මෙම සභාවට මන්ත්‍රීවරයකු වශයෙන් ආණ්ඩු බලය රැගෙන ආපු පළමු පළමු වසරේ අපට තිබුනේ ප්‍රිමික්ස් බැරිල් 15 හෝ 16ක්. මම ඒ 16 ම අරගෙන හැදුවා කඩලාන පාර. අපේ මන්ත්‍රීවරු මාත් එක්ක අමනාපත් වුණා ඒ දවස්වල. මක්නිසාද මන්ත්‍රීවරයකුට ප්‍රිමික්ස් ලෝඩ් එකක් ගන්න විදහක් නැති නිසා. එහෙම හදලා තමයි මම කඩලාන පාරවල් ඔය තත්ත්වයට තියාගත්තේ. නමුත් අද බලනවිට කියන්න කණගාටුයි. මොරටු ගම් 18 කියලා තරුණ තරුණියෝ ෆේස් බුක් අකවුන්ට් එක්ක හදාගෙන ඔබතුමාලව බලයට ගෙනාවේ ලොකු බලාපොරොත්තුවක් තියාගෙන. මම ඒ අයට ඇත්තටම ගරු කරනවා. මක්නිසාද අපිට වඩා හොදින් වැඩ කරයි කියලා හිතාගෙනනේ ඔබතුමාලව බලයට ගෙනාවේ. නමුත් අද ගිහිල්ලා බලන්න තත්ත්වය මොකක්ද කියලා. අපේ ගෙවල් පාරේ පොඩි පල්ලියක් තියෙනවා සුවකිරීමේ ක්‍රිස්තු රාජයාණන්ගේ දේවස්ථානය කියලා. එහි මේ 25 වෙනිදා මංගල්‍යය. මුළු පාරම කැඩිලා. මම කවදාවත් පාරවල් ඔහොම තියලා නැහැ. මේ පරණ නිලධාරින් දන්නවා මම කොහොමද කඩලානේ වැඩ කෙරුවේ කියලා. 25 වෙනිදා මංගල්‍ය නිසා මම ඉතාමක් ඕනෑකමින් ඉල්ලා සිටිනවා එම පාරවල් ටික හදලා අඩුම තරමේ වීථි සංචාරයේ යන්න වරිපනම් බදු ගෙවන

ජනතාවට අවස්ථාව ලබාදෙන්න කියලා. ඒවගේම එම පල්ලියේම 02 වෙනිදා තියෙනවා අවුරුදු 50ක් තිස්සේ ඉදලා කරගෙන යන දානමය පිංකමක්. එයට ෆ්ලෑෂ් ලයිට් දෙක තුනක් දාලා එම මංගල්‍යයට අවශ්‍ය කරන කටයුතු ඉටුකරලා දෙන්න. එම ප්‍රදේශයට ඔබතුමාලගේ මන්ත්‍රීවරයෙකු ඉන්නවා. අපි එතුමට සහයෝගය දෙනවා. මම ස්වාමී ඉදිරිපිටදීම කිව්වා ඉදිරියේදි එම මන්ත්‍රීවරයත් සමඟ කටයුතු කරගෙන යන්න කියලා. නගර සභාව පෙරළුනා කියලා නගර සභාව පාච්චල් කරලා මිනිස්සු ඉස්සරහ සවුත්තු කරන ගතියක් අපේ නැහැ. මක්නිසාද අපි බොහොම ශීලාචාර දේශපාලනයක් කරලා මෙතනට ආවේ. කියන්න කණගාටුයි ඔබතුමාලගේ මේ කටයුතු ගැන බලනකොට. මම ඉතාමත් ඕනෑකමින් ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා එම ජනතාවට එම කටයුතු සාර්ථක කර ගැනීමට අවශ්‍ය සහයෝගය ලබාදෙන්න කියලා.

03(13) **<u>මහා නගර සභා මන්ත්‍රී - එම්.ප්‍රියනාත් මැකන්සි මැන්දිස් මහතා</u>**

ගරු නගරාධිපතිතුමනී, මම ඔබතුමාගේ අවධානය යොමු කරන්න කැමතියි මමත් ඉතා හොඳින් දන්නා, මීට අවුරුදු 10කට 12කට ප්‍රථම මගෙනුත් ඉල්ලීමක් කරපු කාණුවක් සම්බන්ධව. ලක්ෂපතිය, අර්නස්ට් පෙදෙසේ මෙම මාර්ගය පටුයි. මම මේ ප්‍රදේශවල වැඩ කරලා තියෙනවා. ඒ ප්‍රදේශය භාර ගරු මන්ත්‍රීවරයාගෙන් අවසර අරගෙන ඒ ප්‍රදේශයේ කාණු බෝක්කු සම්බන්ධව මමත් වැඩ කරලා තියෙනවා. නමුත් අද වන විට කාණුවේ කොටසක් කරලා තියෙනවා. ඒ පවුලේ පිරිස මේ සභාවට ඇවිල්ලා කර්මාන්ත කමිටුවට ගිහිල්ලා විමසුවම මුදල් නෑ පසුව කරනවා කියලා රස්තියාදු කරලා යවලා තියෙනවා. මම කණගාටුව වෙනවා එක්තරා සීමාවක් දක්වා කාණුව සකස් කරලා ඉතිරි කොටස නොකිරීම සම්බන්ධයෙන්. නමුත් මට දැනගැනීමට ලැබුණේ අනෙකුක් පවුල් සමඟ අමනාපකම් තිබෙන නිසා නොකරන බවයි. මම රංග මන්ත්‍රීතුමාට පැවසුවා වැඩේ පොඩ්ඩක් බලන්න කියලා. නමුත් ඒ අය මට ලියුමක් දීලා තියෙනවා තවම මේ සම්බන්ධව අවධානය යොමු කරලා නෑ එමනිසා මේ සම්බන්ධව පොඩ්ඩක් කතා කරන්න කියලා. ගරු නගරාධිපතිතුමනි, මම ඔබතුමාගෙන් ඉතාමත් ඕනෑකමින් ඉල්ලා සිටිනවා පෞද්ගලික අමනාපකම් නිසා මෙවැනි කටයුතු කරන්න එපා කියලා. මම දන්නේ නෑ මගේ දේශපාලන ජීවිතයේ මට තාම එවැනි කම්ප්ලේන් නෑ. එමනිසා අප කරන වැඩ කටයුතු විනිවිදභාවයකින් යුතුව නිවැරදිව කරමු කියලා යෝජනා කරනවා.

03(14) **<u>මහා නගර සභා මන්ත්‍රී - ඒ.එච්.සුරේෂ් ඉන්දික මහතා</u>**

ගරු නගරාධිපතිතුමනී, මම විශේෂ ප්‍රණාමයක් මේ අවස්ථාවේදි පුදකිරීමට සූදානම්. එනම් අපි කවුරුත් දන්නා, මුළු රටක් ලෝකයක් දන්නා පසුගිය දිනක මොරටුව මහල් නිවාස සංකීර්ණයේ C4 නිවාස ඒකකයේ විශාල ගින්නක් හටගත්තා.ඒ සම්බන්ධව මම කතා කිරීමට යන්නේ නෑ ඌ වගන්තිය යටතේ ඉදිරිපත් කරලා තිබෙන නිසා. ගරු නගරාධිපතිතුමනි, එම ගින්න හටගන්නා අවස්ථාවේදි මමත් සොයිසාපුර තිබෙන මගේ ව්‍යාපාරික ස්ථානයේ හිටියේ. මම එහිදි දුටුවා ක්ෂණිකව අපේ ගිනි නිවීම් සේවා රථ කිහිපයක් ඒ දෙසට ඇදී යනවා. ගරු නගරාධිපතිතුමනි, එම අවස්ථාවේ ගිනිහට නිලධාරින් නොපැමිණියේ නම් විශාල හානියක් සොයිසාපුර එම සී නිවාස ඒකකයේ නිවාසවාසීන්ට සිදුවීමට තිබුණා. එම ගින්න හට ගත්තේ බිම් මහලේ නිවසකින්. නමුත් එම බිම් මහලින් හටගත් ගින්න පැතිරමින් තිබුණා ඉහළ මහළයේ තිබුණු නිවසක් තුනක් හා විරුද්ධ දිශාවෙන් පිහිටි නිවාස හතරක් ඇතුළු නිවාස හතක් පුරා. අපේ ගිනි නිවීම් සේවා ඒකකයේ දරුවන් ටික පැමිණ ක්ෂණිකව ක්‍රියාත්මක නොවුනානම් එම නිවාස සංකීර්ණයේ පැත්තක් සම්පූර්ණයෙන් විනාශ වීමට ඉඩතිබුණා. විවිධ අඩුපාඩුකම් මැද තමන්ට සිදුවන අලාභහානියන් ගැන පවා නොසලකා හරිමින් එම අවස්ථාවේ අපේ ගිනි නිවීම් සේවා ඒකකයේ නිල දරුවන්

ක්‍රියාකල ආකාරය, හැසිරුණු විදිහ, මැදිහත් වුණ ආකාරය මම ඇස් දෙකෙන් දුටුවා. අත් දෙකට ග්ලවුස් හා මුහුණු ආවරණ පවා නොමැතිවයි ඔවුන් කටයුතු කළේ. එම දරුවන් මැදිහත් වෙලා ගින්න පාලනය කලා කෙටි කාලයක් ඇතුළත. එමනිසා ගරු නගරාධිපතිතුමනි, මම විතරක් නෙමෙයි මෙම මුළු සභාවම එම ගිනිහට කණ්ඩායමට ගෞරවය, ප්‍රණාමය පුද කරන්න ඕනේ. ඒ විතරක් නෙමෙයි ඔවුන්ගේ සේවා ලිපිගොනුවට ඇගයීමක් ලිපියක් ඇතුළත් කරන්න ඕනේ. මම ඒ සිද්ධිය ඇස් දෙකෙන් දුටුවා. එම අවස්ථාවේ පිලිස්සුණ වයසක අයවලුන්ව ගන්න කොට මස් කැලි හැලුනා. නමුත් අපේ දරුවන් අත් ග්ලවුස් කිසිවක් නොමැතිව සිය අත් දෙකෙන් එම අයව ආරෝග්‍ය ශාලාවලට යොමු කිරීමට කටයුතු කළා. මම හිතන්නේ මේ සම්බන්ධව ආයාචනා හා පෙත්සම් යටතේ මම කතා කළ නිසා වෙනත් කිසිවෙකුට මේ සම්බන්ධව කතා කිරීමට නොහැකි වෙයි. නමුත් යෝජනාවක් ඉදිරිපත් කරලා තිබෙනවා. මම හිතනවා එම අවස්ථාවේදි මේ සම්බන්ධව ප්‍රණාමය පළ කරයි කියලා. අපේ මහා නගර සභාවට සැබෑ ලෙසම ආඩම්බරයක් වෙන්න පුළුවන් ගිනි ආරක්ෂක කණ්ඩායමක් අපට ඉන්නවා. ඒ අනුව ගරු නගරාධිපතිතුමනි, ඔවුන්ට අත් ආවරණ නොමැතිව, මුහුනු ආවරණ නොමැතිව එම දුම අග්‍රාහණය වෙත්දිත් ඒවා නොසලකා හරිමින් එම දරුවන් කළ එම කටයුත්තට අඩුම තරමේ ගුණයක් හෝ දක්වලා ඔවුන්ට අවශ්‍ය පහසුකම් ටික ලබා දෙන්න කියලා මම මේ අවස්ථාවේදි ඉතාමක් ඕනෑකමින් ඉල්ලා සිටිනවා.

03(15) **<u>මහා නගර සභා මන්ත්‍රී - ඒ.එච්.සුරේෂ් ඉන්දික මහතා</u>**

ගරු නගරාධිපතිතුමනි, උයන ප්‍රදේශයේ චාල්ස් පටුමග මම හිතන්නේ සි වීව් රෙසිඩන්ස් නිවාස සංකීර්ණය, ඒවගේම රෝහල හා ශාන්ත සෙබස්තියන් විද්‍යාලය පිහිටා තිබෙන ප්‍රධාන පාර සම්බන්ධව මම කලිනුත් මතු කළා. එහි කාණු පද්ධතියක් තිබෙනවා. එම කාණු පද්ධතිය දැන් සැලකිය යුතු කාලයකට කලින් සුද්ධ පවිත්‍ර කිරීමක් සිදුකරලා තිබුණා. නමුත් එම සුද්ධ පවිත්‍ර කිරීමේදි එහි තිබෙන කොන්ක්‍රීට් ස්ලැබ් ඉවත් කරලා සම්පූර්ණ සුද්ධ පවිත්‍ර කිරීමක් සිදුවුණේ නෑ. එම හේතුව නිසා අද වනවිට ලුනාව චාල්ස් පාරේ කාණු තුළ සිටින මදුරු දාහනය තවදුරටත් වැඩිවෙලා එසේම පවතිනවා. එම කාණුව ගත්තම, එම කාණුවේ මොන මදුරු වර්ගය ඉන්නවද කියලා හිතාගන්න බෑ. ඩෙංගු මදුරුවා ඉන්නවා, මැලේරියා මදුරුවා ඉන්නවා, බරවා මදුරුවා ඉන්නවා. දැන් මේ මදුරුවෝ සියල්ලම රීමික්ස් වෙලා තිබෙන්නේ. එමනිසා මම ඉතාමත් ඕනෑකමින් ඉල්ලා සිටිනවා එම කාණු පද්ධතියේ කොන්ක්‍රීට් ආරවණ ඉවත් කරලා පරිපූර්ණ ලෙස සුද්ධ පවිත්‍ර කරලා දෙන්න කියලා.

.

03(16) **<u>මහා නගර සභා මන්ත්‍රී - ඒ.එච්.සුරේෂ් ඉන්දික මහතා</u>**

ගරු නගරාධිපතිතුමනී, මොරටුව මහා නගර සභාවත්, ප්‍රාදේශීය ලේකම් කාර්යාලයත් , ශ්‍රී ලංකා පොලිසියත්, ආර්.ඩී ඒ.එකයි එකතු වෙලා පසුගිය දවස්වල කිසියම් ව්‍යාපෘතියක් යටතේ මා හට එම ව්‍යාපෘතියේ නම මතක නෑ ඩෙංගු මර්දන මෙහෙයමුක් දියත් කළා. එම වැඩසටහන ලුනාව ප්‍රදේශයේ වීරපුන්අප්පු විරුවාගේ සමරුව සිදුකල දිනයේදී සිදුකළා. ලුනාව දුම්රිය ස්ථානය යාබඳව තිබෙන තාප්පයත් සමඟ විශාල අනවසර ඉදිකිරීම් වගේම පදුරු ග්‍රහණයක් තිබුණා. ඒ තුළ විශාල අපචාර පවා සිදුවුණා. අප මහල් නිවාසයේ උඩ සිටින නිසා රාත්‍රියේදී සිදුවන සමහර දේවල් අපට පේනවා. හොඳ තීරණයක් අරගෙන ඉහත ව්‍යාපෘතිය මගින් එම සියල්ල සුද්ධ පවිත්‍ර කරලා අද වන විට බොහොම එළිමහන් ප්‍රදේශයක් බවට පත්වෙලා තිබෙනවා. මම ඉතාමත් ඕනෑකමින් ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා නැවත එම ස්ථානය විනාශ වීමට ඉඩ නොදී එනම් අනවසර ඉදිකිරීමක් හෝ මොනයම් හෝ දෙයක් ඉදිකිරීමට පෙර එම ප්‍රදේශයට අපි කියනවා

ලැන්ඩ්ස්කෙපින් කියලා. ඒ විදිහට බිම සකස් කරලා මල් හෝ යමක් සිටුවා අලංකාර කිරීමට අවශ්‍ය කරන මැදිහත්වීම සිදුකරන්න කියලා. සි.වී.වී.රෙසිඩන්ස් හි අපි සූදානම් එය නඩත්තු කරන්න. ඔබතුමා ඒ සඳහා අවශ්‍ය මුල පිරීම කරන්න. පැළ සිටුවා එය දිනපතා නඩත්තු කිරීමේ වගකීම අපි භාරගන්නවා. එමනිසා එම කටයුත්තත් ඉෂ්ට කරලා දෙන්න කියලා ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා.

03(17) <u>මහා නගර සභා මන්ත්‍රී - ඒ.එච්.සුරේෂ් ඉන්දික මහතා</u>

ගරු නගරාධිපතිතුමනී, මෙම කරුණ සම්බන්ධයෙන් මීට පෙර මම පමණක් නොව අපේ මන්ත්‍රීවරුන් දෙතුන් දෙනෙක්ම කතා කළා. අපි කවුරුත් දන්න, ඔබතුමත් දන්න බොහොම හිතවතෙක් අපේ ජගත් පනාගොඩ මහත්මයා. එතුමාගේ පුරෝගාමියා කියලා වෙබ් අඩවියක් ආරම්භ කරලා තිබෙනවා. එතුමා නිතරම ඉල්ලීමක් කළා සභාවේ වාර්තා කිරීම සඳහා නිල වශයෙන් එතුමව පිලිගන්න කියලා. නමුත් සෑහෙන්න කාලයක් තිස්සේ එය සිදුවෙනවා. මම හිතනවා බාධා ඇති කියලා. තර්කයක් තියෙන්න පුළුවන් එයාට විතරක් දුන්නම මොරටුවේ ඉන්න වෙබ් අඩවි සියල්ලම මෙතන්ට ඇවිල්ලා වාර්තා කරන්න ඉල්ලයිද කියලා. මම ඒක පිලිගන්නවා. ගරු නගරාධිපතිතුමනි, සාමාන්‍යයෙන් ලෝකයේ තියෙනවා පුරවැසි මාධ්‍යය කියලා එකක්. දැන් මේ ලෝකේ තිබෙන අලුත් ට්‍රෙන්ඩ් එකක්. ඒ අනුව මම විශ්වාස කරනවා දැන් මෙම සභාවේ අපි ඕනෑතරම් කතා කරනවා. පැය ගණන් කතා කරනවා. මේ හිස්තලයේ ඇති අපි කතා කරපු සියල්ලම. නමුත් මොරටුවේ ජනතාව දන්නේ නෑ. ආණ්ඩු පක්ෂය, විපක්ෂය මේ සභාව ඇතුළේ කුමක් සිදුකරනවද කියලා මොරටුවේ ජනතාව දන්නේ නෑ. නමුත් මෙම වෙබ් අඩවියට පින් සිදුවෙන්න යම් අංශු මාත්‍රයක් හරි මේ සභාව තුළ සිදුවන දේවල් මොරටුව ජනතාවට සන්නිවේදනය වන ක්‍රමවේදයක් තිබෙනවා. මම නිතරම අපේ විපක්ෂ නායකතුමාට, පක්ෂ කණ්ඩායම් නායකයන්ට කියන්නේ අපි මේකේ ඇතුලේ විතරක් කතා කරලා කෑගහලා අපේ මතය, අපේ දේ ඉදිරිපත් කළාට වැඩක් නෑ. අපි මොරටුවේ මිනිසුන් ලඟටත් යන්න ඕනේ. ජනතාවත් සමඟත් සන්නිවේදනයේ යෙදෙන්න ඕනේ කියන මතය මම නිතරම ඉදිරිපත් කළා. මෙම කටයුත්තෙන් මොරටුවේ ජනතාවට මොරටුව මහා නගර සභාවේ ඇතුලේ සිදුවන දේවල් යම් ප්‍රමාණයක් හෝ සාධනීය හෝ නිෂේධනීය වෙන්න පුළුවන්. නමුත් යම් ප්‍රමාණයක් සිදුවෙනවා. එමනිසා ගරු නගරාධිපතිතුමනි, මම නැවත වතාවක් ඔබතුමාගෙන් ඉල්ලා කාරුණිකව සිටිනවා ජගත් පනාගොඩ මහතාගේ මෙම පුරෝගාමියා වෙබ් අඩවියටත් ඉඩක් මොරටුව මහා නගර සභාව තුළ වාර්තාකරණයේදී ලබාදෙන්න කියලා.

03(18) <u>මහා නගර සභා මන්ත්‍රී - ඩබ්.මැක්සි ජේ.ප්‍රනාන්දු මහතා</u>

ගරු නගරාධිපතිතුමනී, මොරටුව මහා නගර සභාවට අනුබද්ධිත ජනසෙත පුස්තකාලයේ පවත්වාගෙන යනු ලබන පරිගණක පාඨමාලාව සඳහා මාගේ දියණිය ඇතුළු එම පාසලේ දරුවන් කිහිපදෙනෙකු සහභාගි වුණා. ඉතාමත් සාර්ථක පරිගණක පුහුණුවක් එම ස්ථානයේදී එම දරුවන් වෙනුවෙන් ලබාදී තිබෙනවා. එම දරුවන් නිවසට පැමිණි ප්‍රකාශ කළේ ලක්මාල් මහතා විසින් ලබාදී තිබෙන අත්පොත ඉදිරි අනාගතයට බෙහෙවින් වැදගත් වෙනවා කියලා. එමනිසා විශේෂ ස්තුතියක් මෙම අවස්ථාවේදි මම පෞද්ගලිකවම පුදකරනවා. මෙම ස්ථානයේ දරුවන් තව වැඩිකර ගැනීමේ අවශ්‍යතාවයක් පැන නගිනවා. මම මේ අවස්ථාවේදි සහෝදර මහා නගර සභා මන්ත්‍රීවරුන්ගෙන් මේ සම්බන්ධව පාසල් වන දරුවන්ට වැඩිහිටියන්ට එම ස්ථානය ගොස් පරිගණක අධ්‍යාපනය ලබාගැනීමට දැනුවත් කරන්න කියලා ඉල්ලා සිටිනවා. එසේම ගරු

නගරාධිපතිතුමනි, එම පරිගණක පාඨමාලාව ව්‍යාප්ත කිරීම සඳහා කළ හැකි දේ නගර සභාවෙන් කරන්නට කියලා විශේෂ ඉල්ලීමක් කරනවා.

03(19) **<u>මහා නගර සභා මන්ත්‍රී - ඩබ්.මැක්සි ජේ.ප්‍රනාන්දු මහතා</u>**

ගරු නගරාධිපතිතුමනී, මම මීට මාස හතරකට පෙරදි කතා කළා ඉඳිබැද්ද එඩ්වඩ් පටුමඟ, බණ්ඩාරනායක මාවත, ජනජය නිවාස සංකීර්ණයට යන පාරවල්වල ස්ථාන කඩතුලු වීම සම්බන්ධව. එම ස්ථානවලට ප්‍රිමික්ස් ටිකක් දාලා දෙන්න කියලා ඉල්ලීමක් කරනවා.

03(20) **<u>මහා නගර සභා මන්ත්‍රී - ඩබ්.මැක්සි ජේ.ප්‍රනාන්දු මහතා</u>**

ගරු නගරාධිපතිතුමනී, ඔබතුමාගෙන් විශේෂ ඉල්ලීමක් කළා බිල්මෝරියා පාර ප්‍රතිසංස්කරණය කරලා දෙන්නට කියලා එහි සිටින විශේෂ පුද්ගලයෙක් නිසා.එම කටයුතු නිමකරලා තිබුණා.ඒ සම්බන්ධවත් ස්තුතිය පුද කරනවා.

<u>ගරු නගරාධිපති - කේ.ඩී.නිශාන්ත ප්‍රදීනාන්දු මහතා</u>

ගරු මහා නගර සභා මන්ත්‍රීවරුනි, අපගේ ජනසෙත පරිගණක මධ්‍යස්ථානයේ නව පාඨමාලාවක් ආරම්භ කරලා තිබෙනවා. දරුවන් විසිපස්දෙනෙකුට වගේ තවම අවස්ථාව තිබෙනවා. ඒ සම්බන්ධව සභාවේ මන්ත්‍රීවරුන් දැනුවත් කිරීමක් කරනවා.

03(21) **<u>මහා නගර සභා මන්ත්‍රී - සිත්ති මසීනා බක්කර් මහත්මිය</u>**

ගරු නගරාධිපතිතුමනී, ආයාචනා හා පෙත්සම් යටතේ වාචිකව කරුණු දෙකක් ඉදිරිපත් කරනවා. ප්‍රථමයෙන් සොයිසාපුර නිවාස සංකීර්ණයේ අවුරුදු 49ක් පදිංචි පුද්ගලයෙකු වශයෙන් මට මෙය නොහැකියාම බෑ. මම දන්නවා 2025 දී ඔක්තෝම්බර් මාසයේදී හරි අගෝස්තු මාසයේදී හරි මම මේ සභාවට ඉදිරිපත් කළා සොයිසාපුර නිවාස සංකීර්ණයේ ඇතිවනි ප්‍රශ්ණ, ගැටලු රාශියක් සම්බන්ධව අපිට සභාධිපත්‍ය කළමනාකරණ අධිකාරිත් සමඟ සාකච්ඡාවක් ලබාදෙන්න කියලා. අපිට තවමත් එම සාකච්ඡාව ලැබුණේ නෑ. නමුත් මට කියන්න කණගාටුයි මෙම සැප්තැම්බර් මස 23 වෙනිදා සවස 6.30ට විතර හදිසි ගින්නක් ගන්නවා C4 කියන නිවාස ඒකකයේ. එම නිවාස ඒකකයේ නිවාස දාසයක් තියෙනවා. එම නිවාස දාසයෙන් එක් නිවසක තමයි ගෑස් කාන්දුවක් නිසා මෙම විශාල ගින්න ඇතිවෙන්නේ. එයින් අපට ජීවිතයක් පවා අහිමි වුණා. සොයිසාපුර ඉතිහාසයේ ගිනි ගැනීම් ඇතිවෙලා තිබෙනවා ස්ථාන හතරක විතර. මේ හතරවැනි ගින්න.

<u>ගරු නගරාධිපති - කේ.ඩී.නිශාන්ත ප්‍රදීනාන්දු මහතා</u>

ගරු මන්ත්‍රීතුමිය, ගැටලුවක් තිබෙනවා. මේ සම්බන්ධව ඌ වගන්තිය යටතේ යෝජනාවකුත් තිබෙනවා. එම යෝජනාව ඉදිරිපත් කළ මන්ත්‍රීතුමත් ඒ සම්බන්ධව කතා කළා. නැවත ඔබතුමියත් මේ පිළිබඳව කතා කරනවා. එමනිසා කාලය කලමනාකරණය කිරීමේදි ගැටලුවක් ඇතිවෙන වෙනවා. එමෙන්ම යෝජනාව අවස්ථාවේදි ඔබතුමියට මේ සම්බන්ධව කතා කිරීමට අවස්ථාව ලැබෙනවා.

03(22) **<u>මහා නගර සභා මන්ත්‍රී - සිත්ති මසීනා බක්කර් මහත්මිය</u>**

ගරු නගරාධිපතිතුමනී, දෙවැනි කරුණ නම් මම කියන්න කැමතියි B7 සහ B15 අතර කාණු පද්ධතියක් හදලා තියෙනවා. මම මෙය කම්ප්ලේන් එකක් හැටියට නෙමෙයි නමුත් යෝජනාවක්

ලෙස ඉදිරිපත් කරනවා ඔබතුමාගේ සහ මන්ත්‍රීතුමාගේ අවධානය පිණිස. එම කාණුව හැදුවේ යහපත් චේතනාවෙන් වෙන්න පුළුවන්. මමත් ඉන්නේ කාණුවෙන් වතුර බැසයන පැත්තේ. නමුත් දැන් එම කාණුව දැන් ගැටලුවක් වෙලා තිබෙනවා. එම පැත්ත භාරව ඉන්නේ කෝකිලා මිස්. එතුමියත් දක්ෂ නිලධාරිතුමියක්. වැස්සොත් එම පාරේ දිගටම වතුර රැඳිලා තිබෙනවා. ඒ නිසා එම කොටස් දෙකේ පදිංචිකරුවන්ට මාර්ගයේ ගමන් කිරීමට අපහසුයි. මෙම කාණු පද්ධතිය හදලා තිබෙන්නේ දකුණු පැත්තේ වතුර ටික උතුරට බහින්න. නමුත් කාණුව උසයි. එමනිසා එතන තාක්ෂණික ගැටලුවක් තිබෙනවා. එමනිසා මේ සම්බන්ධව ඔබතුමාගේ අවධානය යොමු කරලා නැවත එම කාණුව පද්ධතිය සකස් කරලා දෙන්න කියලා ඉල්ලා සිටිනවා.

03(23) **<u>මහා නගර සභා මන්ත්‍රී - යූ.එල්.සේනක දමයන්ත ද සිල්වා මහතා</u>**

ගරු නගරාධිපතිතුමනී, ආයාචනා හා පෙත්සම් යටතේ කරුණු තුනක් ඉදිරිපත් කිරීමට බලාපොරොත්තු වෙනවා. එක් කරුණක් නම් කටුබැද්ද ඇවිදින මංතීරුව සම්බන්ධවයි. මම අවස්ථා ගණනාවකදීම මෙම සභාව දැනුවත් කළා එහි තිබෙන අඩුපාඩුකම් සම්බන්ධව හා ඇවිදින මංතීරුව භාවිතා කරන අයට ඇතිවන දුෂ්කරතා පිළිබඳව. දීර්ඝ කාලයක් තිස්සේ මම ඉල්ලීමක් කළා එහි තැන කිහිපයක් පොඩි වර්ෂාවකදී පවා මඩවෙන නිසා මේ පිළිබඳව විධිමත් ක්‍රියාමාර්ගයක් ගන්න කියලා. මට එහි ඇවිදින අයගෙන් දැනගැනීමට ලැබුණේ මේ සඳහා මුදලක් වෙන්කරලා තිබෙනවා කියලා. මම මේ සම්බන්ධව සභාවේ කොච්චර කතා කළත් මා හට දැනගැනීමට ලැබුණේ නෑ. එම නිසා මට දැනගැනීමට පුළුවන්ද මේ සඳහා මුදලක් වෙන්කරලා තිබෙනවද, සාමාන්‍යයෙන් එම මුදල් කොපමණ ප්‍රමාදයක්ද කියන එක. මතකයක් තිබෙනවා නම් පමණක් කියන්න.

<u>ගරු නගරාධිපති - කේ.ඩී.නිශාන්ත ප්‍රදීනාන්දු මහතා</u>

ගරු මන්ත්‍රීතුමා, එම ස්ථානයේ ක්‍රීඩා උපකරණ සවිකිරීම සම්බන්ධ යෝජනාවට මුදල් වෙන්කරලා තිබෙනවා.

<u>මහා නගර සභා මන්ත්‍රී - යූ.එල්.සේනක දමයන්ත ද සිල්වා මහතා</u>

ගරු නගරාධිපතිතුමනී, පාරට වැලි දැමීම සම්බන්ධව වෙන්කරලා නැද්ද ?

<u>ගරු නගරාධිපති - කේ.ඩී.නිශාන්ත ප්‍රදීනාන්දු මහතා</u>

ගරු මන්ත්‍රීතුමා, නැහැ.

<u>මහා නගර සභා මන්ත්‍රී - යූ.එල්.සේනක දමයන්ත ද සිල්වා මහතා</u>

ගරු නගරාධිපතිතුමනී, විශේෂයෙන්ම මම දැක්කා ඔබතුමන්ලගේ සංවර්ධන ක්‍රියාදාමය තුළ විශාල මුදලක් වෙන්කරලා පාරවල් ගණනාවක් සංවර්ධනය කරගෙන යනවා. සමහර විට මෙම මාර්ගවල එක දවසට ගමන් කරන පිරිස තුන් හාරසීයක් වෙන්න පුළුවන්. නමුත් මෙම ඇවිදින මන්තීරුවේ දවසට දහස් ගාණක් ඇවිදිනවා. මම හොඳට බලලා තියෙනවා වර්ෂාව තිබුණත් පායලා විනාඩි 10ක් 15ක් අතර මිනිසුන් එහි ඇවිදීමට පැමිණෙනවා. නමුත් ඇවිදින්නේ මෙම මඩ ගොඩේ. සමහර අයවලුන් මඩ ගොඩ මග හැරලා ප්‍රධාන පාරෙන් ගිහිල්ලා තමයි ඒ ටික කවර් කර ගන්නේ.

ගරු නගරාධිපති - කේ.ඩී.නිශාන්ත ප්‍රදීනාන්දු මහතා

ගරු මන්ත්‍රීතුමා, අපට පුළුවන් නේද ඒක ටිකක ලෙවල් කරලා වගේ දෙයක් කරන්න.

මහා නගර සභා මන්ත්‍රී - යූ.එල්.සේනක දමයන්ත ද සිල්වා මහතා

ගරු නගරාධිපතිතුමනී, ලෙවල් කරන්න දැන් බැහැ. මක්නිසාද සාමාන්‍යයෙන් ඒ සඳහාම භාවිතා කරනු ලබන වැලි වර්ගයක් තිබෙනවා. එම වැලි දාලා දෙපස වතුර රැඳෙන්නේ නැතුව තිබුනා නම් හරි. හැම තැනට අවශ්‍ය වන්නෙත් නෑ එහෙම කරන්න ගියොත් ලොකු වියදමක් යනවා. හදුනාගත් වතුර රැඳෙන තැන් හතරක් පහක් වගේ තමයි තිබෙන්නේ. ඒ තැන් ටික ආවරණය කරන්න පුළුවන් නම් දැනට ලොකු ප්‍රයෝජනයක් වෙනවා. මම හිතන්නේ රුපියල් මිලියන එකකින් දෙකකින් වගේ වෙන් කරලා ඒ තැන් ආවරණය කරන්න පුළුවන් ඒක ප්‍රයෝජනයක් වෙනවා. ඒ සම්බන්ධව ඔබතුමාගේ අවධානය යොමු කරන්න කියලා ඉල්ලා සිටිනවා. ඒවගේම ගරු නගරාධිපතිතුමනි, මෙම ඇවිදින මංතීරුවේ මම දවස ගානේ වගේ බොහෝ දුරට ඇවිදිනවා. මෙම මංතීරුවේ ගස් ටික කැපිලා නෑ. ඇවිදින අය යන්නේ ඔලුව පහත් කරගෙන. එම ගස්ටික කප්පාදු කළා නම් හරි. මංතීරුව භාරව සිටින අයගෙන් විමසූ විට පැවසුවේ ඒ සඳහා උපකරණ නොමැති බවයි. දවසක් මම ගෙදර තිබුණු පොඩි කියතක් දුන්නා කපලා ගෙනත් දෙන්න කියලා. එමනිසා මෙම අඩුපාඩුකම් සපුරන්න ඕනේ. සති දෙක තුනක් තිස්සේ මෙම ගැටලුව තිබෙනවා. මිනිසුන් මටත් කියනවා. මට දැන් මිනිස්සුන්ට මුහුණ දෙන්න බැරි තත්ත්වයක් උදාවෙලා තිබෙනවා. ඒවගේම එහි යොදවා ඇති සේවයකයන් පිළිබඳව අවධානයෙන් සිටින්න, කීදෙනෙක් එහි රාජකාරි කරනවද කියලා. මම දකින්නේ එක්කෙනයි දෙන්නයි එතන වැඩ කරන්නේ. ඉන්න දෙතුන්දෙනා බොහොම අවංකව වැඩ කරනවා. නමුත් කාර්යක්ෂමවතාවය ඔවුනට තිබුණට වැඩක් භූමි ප්‍රමාණය වැඩි නිසා නිසියාකාරව මෙහි නඩත්තු කටයුතු කරගෙන යන්න බැරි තත්ත්වයක් උදාවෙලා තිබෙනවා. මේ පිළිබඳවත් විශේෂ අවධානය යොමු කරන්න කියලා ඉල්ලා සිටිනවා.

03(24) මහා නගර සභා මන්ත්‍රී - යූ.එල්.සේනක දමයන්ත ද සිල්වා මහතා

ගරු නගරාධිපතිතුමනී, දෙවැනි කාරණය පිළිබඳව ඔබතුමා දන්නවා. අපි දීර්ඝ කාලයක් තිස්සේ මේ සම්බන්ධව මෙම සභාවේ කතා කළා. මෙම සභාවේ රාජකාරි කළ චමින්ද මහතා සම්බන්ධව. චමින්ද ප්‍රියන්ත පීරිස් මහතාගේ සේවය නැවතිලා, පරීක්ෂණයක් පවත්වලා එතුමට හිඟ වැටුප් ගෙවන්න නියම වෙලා තිබුණා. මේ සම්බන්ධව මාස ගාණවක් කතා කළා. ඒ අවස්ථාවේදි ඊළඟ දවසේ දෙන විදිහටයි කතා කළේ. වැටුප් භාගයක් ගෙවන්නම් ඉතිරිය පසුව දෙන්නම් කියලා. කෙනෙකුට හිතේ යම් විශ්වාසයක් රැඳිලා විශ්වාසය කඩවන දවසකුත් එනවා. ඒ නිසාවෙන් තමයි මෙතුමා බලන් ඉදලා සියදිවි නසාගන්න තත්වයට පත්වෙලා තිබුණා. පුද්ගලිකව මා සමඟත් කතා කළා ඉඩමක් උකස් තියලා තියෙනවා කියලා. මෙම මුදලින් එම ඉඩම බේරගන්න තමයි බලාපොරොත්තු වෙලා තිබෙන්නේ. නමුත් මෙය දවසින් දවස කල් යන නිසා එහි පොළිය වැඩිවෙලා. මෙම මුදල දැන් ලැබුනොත් එය මහත් ප්‍රයෝජනයක් වන තත්ත්වයක තිබුණේ. ඒ නිසාම වෙන්න ඕනේ මෙතුමා ගිහිල්ලා නීතිඥ මහත්මයෙකු මුණගැහිලා නඩුවක් දාන්න එන්තරවාසියක් එවනවා. එන්තරවාසියක් එවලා මෙතුමා දැන් ඉල්ලීමක් කරනවා, අපිත් මෙතුමට කතා කළා. මෙය සාකච්ඡා මගින් විසඳාගැනීමක් කරමුයි කියලා. එතුමා දැන් ලිපියක් එවලා තියෙනවා, මම එය ඉදිරිපත් කරනවා. එතුමා කැමැත්ත ප්‍රකාශ කරලා තිබෙනවා එය ඉල්ලා අස්කරගන්න නමුත් අපේ පැත්තෙනුත් ඉටුවිය යුතු යුතුකම ඉෂ්ට කරන්න කියලා. යම්කිසි දවසක මෙතුමා නඩු මගට බැස්සොත් අපිට ඔලිවර් මහත්මයාගේ සිද්ධිය වගේ අනවශ්‍ය නඩුවකට

පැටලෙන්න වෙන්නේ. එමනිසා ගරු නගරාධිපතිතුමනි, මේ පිළිබඳව කල්මැරීමක් සිදුකිරීමට යන්න එපා. මේ සම්බන්ධව ඔබතුමාගේ අවධානය යොමු කර මෙය ලබාදීමට කටයුතු කරන්න කියලා ඉල්ලා සිටිනවා. විපක්ෂය ලෙස අපි එකහෙලාම අත් උස්සනවා මෙය ලබාදෙන්න කියලා.

ගරු නගරාධිපති - කේ.ඩී.නිශාන්ත ප්‍රදීනාන්දු මහතා

ගරු මන්ත්‍රීතුමා, අපි සභාවක් විදිහට යම් එකඟතාවයකට ආවා මේක ගෙවන්න. අපි එහෙම ගෙවන්න එකඟතාවයකට ඇවිල්ලා තිබෙන වෙලාවේ තමයි නීතිඥයකු ලවා අපට අර ලියවිල්ල එවන්නේ. අපි කල්පනා කරන්නේ අපි මේ ගෙවන්න ඉන්න මොහොතේ නීතිඥයකු පැත්තෙන් අර විදිහේ ලියවිල්ලක් එව්වම එතන පොඩි ගැටලුවක් තිබෙනවා. එහෙනම් ඒක බේරගෙන ඉන්න ඕනේ. මේ සම්බන්ධව කොමසාරිස්තුමියත් මා සමඟ සාකච්ඡා කළා. එහෙම යනවා ඒ මාර්ගයෙන් යමු, එහෙම නැත්නම් එය ඉවත් කරලා අභ්‍යන්තර පරීක්ෂණයකින් එය අවසන් කරමු කියලා.

මහා නගර සභා මන්ත්‍රී - යූ.එල්.සේනක දමයන්ත ද සිල්වා මහතා

ගරු නගරාධිපතිතුමනී, පරීක්ෂණය තියලා එවරයි නේද?

ගරු නගරාධිපති - කේ.ඩී.නිශාන්ත ප්‍රදීනාන්දු මහතා

ගරු මන්ත්‍රීතුමා, එම පරීක්ෂණය සම්පූර්ණ කළේ නෑ. මට අද උදේ එතුමා මුණගැහුණා. කතා කළා. ආයතනය මට්ටමින් පවත්වන පරීක්ෂණයට සහභාගී වෙලා පිලිතුරු දුන්නා නම් දවස් කිහිපයකින් එය ඉවර කරලා එම ගෙවීම කරනවා.

මහා නගර සභා මන්ත්‍රී - යූ.එල්.සේනක දමයන්ත ද සිල්වා මහතා

ගරු නගරාධිපතිතුමනී, මෙම ලිපිය එවන්න සාධාරණ හේතුවක් තිබුණා. මා විසින්ම මෙම සභාවේ මීට මාස පහකට හයකට ඉහතදී කතා කරලා තිබෙනවා. මාස පහක් හයක් කියන්නේ දීර්ඝ කාලයක්නේ. බැරිම තැන වෙන්න පුළුවන් මෙතුමා එතනට යන්න ඇත්තේ. නමුත් එකඟතාවයකින් කටයුතු කරන්න කියන ඉල්ලීම කරනවා.

03(25) මහා නගර සභා මන්ත්‍රී - යූ.එල්.සේනක දමයන්ත ද සිල්වා මහතා

ගරු නගරාධිපතිතුමනී, අවසාන වශයෙන් කියනවා ඔබතුමා පොත් කට්ටල ලබාදීමට කටයුතු කළා. අවසන් දිනය ගිය මාසේ 30 වෙනිදා දක්වා තිබුණා. 30 වෙනිදා බොහෝ දෙනෙක් භාරදෙන්න ඇති. තව කිහිප දෙනෙක් භාරදීමට තිබෙනවා. අවසාන වශයෙන් තව සති දෙකක් දෙන්න කියලා ඉල්ලීමක් කරනවා. මක්නිසාද මෙහි අවසානයේ ග්‍රාම සේවක මහතාගේ අත්සන ලබාගැනීමට තිබෙනවා. එහිදි බොහෝ අපහසුතාවලට මුහුණ දීමට සිදුවුණා. ග්‍රාම සේවක මහතුන් ඔවුන්ගේ සේවය ලබාදෙන්නේ දින දෙකක් පමණයි. නමුත් අළුතින් පැමිණ සිටින නිලධාරි නීත්‍යානුකූල ලෙසම කටයුතු කිරීම නිසා අත්සන් ලබාගැනීමට නොහැකි වූ අවස්ථා තිබුණා. 30 වෙනිදා වෙනකම් විතරයි නගර සභාවේ කල් දිලා තියෙන්නේ කියලා සඳහන් කළත් සමහර ග්‍රාම සේවක මහතුන් 01 වෙනිදා පැමිණෙන්න කියලා සඳහන් කරපු අවස්ථා තිබුණා. එමනිසා මේ පිළිබඳව මානුෂීය සලකා බලලා අවසාන වශයෙන් සති දෙකක කාලයක් ලබාදෙන්න කියලා ඉල්ලා සිටිනවා.

ගරු නගරාධිපති - කේ.ඩී.නිශාන්ත ප්‍රදීනාන්දු මහතා

ගරු මහා නගර සභා මන්ත්‍රීවරුනි, අපි මේ තීන්දු ගන්නේ සියලු දෙනා කතා කරලා. නමුත් එම තීන්දු හැල්ලුවට ලක්වෙනවා නැවත කල් දැමීම ඇතුළේ. මේවා මහා ගැටලු නෙමෙයි. බේරගන්න පුළුවන්. නමුත් අපි ගන්න තීන්දු නැවත නැවත හැරවීමක් කලොත් බලපෑමක් තිබෙනවා. ඔබ උනන්දු වෙන්නේ නෑ. ඔබ හිතන්නේ මේ සති දෙක ගියාම නැවත ගන්න පුළුවන් කියලා. අපිට මේක ලේසියි. නමුත් මේ පිළිබඳව වගකීම තියන අයට අමාරුයි. මේක අවසන් කරගන්න විදිහක් නැනේ.

03(26) මහා නගර සභා මන්ත්‍රී - එල්.ඔසඳ හර්ෂන අබේකෝන් මහතා

ගරු නගරාධිපතිතුමනී, මම ඊයේ පෙරේදා ගියා දිගරොල්ල පොළ භූමියට. එහිදි වෙළඳුන් කතා කරලා කිව්වා ඔයාලා අපෙන් පෙරසැරි ගාස්තු ගත්තා. නමුත් අපිත් එක්ක හිටපු අපේ නගරාධිපතිතුමා, නිශාන්ත ප්‍රදීනාන්දු මහත්මයා සුපර් සිටි එකේ පෙරසැරි ගාස්තු කැපුවා. අපිටත් ඒක ආයේ ගන්න පුළුවන්ද කියලා ඇහුවා. ඒ මිනිස්සු හදිස්සියෙවත් ඉල්ලුවොත් අපි මොකක්ද කරන්නේ ගරු නගරාධිපතිතුමා.

ගරු නගරාධිපති - කේ.ඩී.නිශාන්ත ප්‍රදීනාන්දු මහතා

ගරු මන්ත්‍රීතුමා, එයාලට දුන්නා. වහලා තිබුණු කඩ ටික අපේ හිටපු නගරාධිපතිතුමත් සමඟ සාකච්ඡා කරලා තමයි මූලික මුදල ඉවත් කරලා ලංසු මුදල අඩු කරලා මාසෙකට ගෙවා ගෙන යන්න, මාස කුලිය පොඩි මුදලකින් වැඩි කරලා හිටපු අයට දුන්නේ.

03(27) මහා නගර සභා මන්ත්‍රී - එල්.ඔසඳ හර්ෂන අබේකෝන් මහතා

ගරු නගරාධිපතිතුමනී, ලුනාව කළපුවේ ලයිට් සම්බන්ධව මම පසුගිය සභාවෙත් කතා කළා, ඔබතුමා කිව්වා ලයිට් දැම්මා කියලා. නමුත් ලයිට් දොළහක් පත්තු වෙන්නේ නෑ.කළපුව ග්‍රවුන්ඩ් එකේ හවසට තරුණයෝ ඇවිල්ලා ක්‍රිකට් ක්‍රීඩා කරනවා. නමුත් දැන් ටික කාලෙක ඉදලා ග්‍රවුන්ඩ් එකේ කුණු දාලා තියෙනවා. සුදේශ් මන්ත්‍රතුමා ඒ සම්බන්ධව පොඩ්ඩක් බලන්න. ඒවගේම අපේ රංගන මන්ත්‍රීතුමා කොටන් වගයකුත් දාලා තියෙනවා.එමනිසා ඒ ටික ඉවත් කරලා දෙන්න ඕනේ. තව කාරණයක් ගරු නගරාධිපතිතුමා, මේ දවස් ටිකේ වහිනවනේ. අපිට බැරිද පොඩි අට්ටාලයක් වගේ , ටෙන්ට් එකක් වගේ ගහලා වැස්ස වෙලාවට මිනිස්සුන්ට ඉන්න හදලා දෙන්න.

ගරු නගරාධිපති - කේ.ඩී.නිශාන්ත ප්‍රදීනාන්දු මහතා

ගරු මන්ත්‍රීතුමා, මුදල් අනුමත වෙලා ටෙන්ඩර් දාලා තියෙන්නේ. හට් එකක් හදනවා එතන. ලුනාව පෙරහැර අවස්ථාවේදි අස්කරපු කුණු ටික තමයි එතන තියෙන්නේ. ඒ ටික අද ඉවත් කරලා දානවා.

මහා නගර සභා මන්ත්‍රී - එල්.ඔසඳ හර්ෂන අබේකෝන් මහතා

ගරු නගරාධිපතිතුමනී, ඒවගේම කළපුවෙන් ගොඩදාපු කුණු ටිකකුත් තියෙනවා. ඒ කුණු ටිකත් බොහෝ දවසකින් ඉවත් කරලා නෑ. ඒකත් පොඩ්ඩක් බලන්න ඕනේ.

03(28) මහා නගර සභා මන්ත්‍රී - එල්.ඔසඳ හර්ෂන අබේකෝන් මහතා

ගරු නගරාධිපතිතුමනී, අපි හැමදාම කතා කරනවා වගේ කර්මාන්ත අංශය, ප්ලැනින් අංශය ගැන කතා කරන්න ඕනේ. අපිට දැන් නගර සභාවට වැඩිය එවෙන්නෙත් නෑ. ඇවිල්ලා වැඩකුත් නෑ.

කොච්චර ප්ලෑන් භාරදුන්නත් සීයට අසුවක්ම රිජෙක්ට් වෙන නිසා. දිනක් දුවකුයි තාත්තා කෙනෙකුයි ඇවිල්ලා ප්ලෑන් එක භාරදුන්නට පස්සේ මොකක් හරි අඩුපාඩුක් කියනවා. ආයේ යනවා සර්වියර් ළඟට. ආයේ හදාගෙන එනවා. මම ඇහුවා අංකල් කීපාරක් ගියාද කියලා. දැනට 16 පාරක් දෙහිවල සර්වියර් ලගට ගියා කියලා කිව්වා.පොඩ්ඩක් විපරම් කරලා බලන්න ගරු නගරාධිපතිතුමා. එක පාර අඩුපාඩු සියල්ලම කිව්වා නම් හරි. ඔබතුමා එතුමාව දන්නවා. කිල්ස් එක ඉස්සරහ වත්ත. ඔබතුමාවත් දෙතුන් පාරක් මුණ ගැහුණා කිව්වා.

<u>ගරු නගරාධිපති - කේ.ඩී.නිශාන්ත ප්‍රදීනාන්දු මහතා</u>
ගරු මන්ත්‍රීතුමා, ඒක හරි.

<u>මහා නගර සභා මන්ත්‍රී - එල්.ඔසඳ හර්ෂන අබේකෝන් මහතා</u>
ගරු නගරාධිපතිතුමනී, තාම නැහැ.

<u>මහා නගර සභා මන්ත්‍රී - එල්.ඔසඳ හර්ෂන අබේකෝන් මහතා</u>
ගරු නගරාධිපතිතුමනී, අපි පොඩි කාලයේ සිට දන්නා හදුනන ජගත් පනාගොඩගේ මැතිතුමාගේ වෙබ් අඩවිය සම්බන්ධව. මම හිතුවේ එතුමාව මේ සභාවට ගෙන්නයි කියලා. එමනිසා එතුමව ලබන සභාවට හෝ ගෙන්වීමට අවශ්‍ය කටයුතු කරන්න කියලා ඉල්ලා සිටිනවා.

03(29) **<u>මහා නගර සභා මන්ත්‍රී - බී.සජීත් දුමින්ද පීරිස් මහතා</u>**
ගරු නගරාධිපතිතුමනී, ආයාචනා හා පෙත්සම් යටතේ විශේෂයෙන් මොරටුවට බලපාන සහ අවධානය යොමු කළ යුතු කාරණ කිහිපයක් පිලිබඳව අවධානය යොමු කරන්න කැමතියි. එනම් මේ වන විට එච්.අයි.වී.ඒඩ්ස් කියන රෝග තත්ත්වය දැවැන්ත ලෙස ව්‍යාප්ත වෙලා තිබෙනවා. මොරටුවේ තිබෙන ප්‍රතිශතයත් එන්න එන්නම වැඩිවෙලා තිබෙනවා කියලා අපට කළුබෝවිල ලිංගාශ්‍රිත රෝග මර්දන ඒකකයේ සටහන් නිරීක්ෂණය කළොත් දැනගැනීමට පුළුවන්. එමනිසා ගරු නගරාධිපතිතුමනි, අද වන විට ලෝක සෞඛ්‍ය සංවිධානය රටවල් 21ක් නම් කළා එච්.අයි.වී.ආසාධන වැඩිම රටවල් ලෙස. දැන් ශ්‍රී ලංකාවත් 17වෙනි තැනට පත්වෙලා තිබෙනවා. එයට සාපේක්ෂව මොරටුවේ තත්ත්වයත් භයානක තැනක තිබෙනවා කියන එකයි අපට නිරීක්ෂණ වලින් පෙනෙන්නේ.එමනිසා මෙය හවස් වරුවේ නියාමන කිරීම සහ පාසල් මට්ටමින් දැනුවත් කිරීම වැදගත්. අපි අනුමත නොකලත් තරුණ තරුණියෝ එල්.ජී.බී.ටී.කියන කන්සෙප්ට් එකටත් යොමු වෙලා තිබෙන එකත් එක හේතුවක්. ඒවගේම මොරටුවේ ගත්තම වීථි ගණිකාවෝ ⁄ සිටින ප්‍රමණයත් වැඩිවෙලා තිබෙනවා. එමනිසා ගරු නගරාධිපතිතුමනි, මෙම තත්ත්වය පාලනය කිරීම පිළිබඳව අවධානය යොමු කරලා තරුණ තරුණියෝ සහ අනෙකුත් පිරිස දැනුවත් කිරීමේ වැඩසටහනක් සෞඛ්‍ය අංශයත් සමඟ එකතු වෙලා ක්‍රියාත්මක කරන්න කියලා මම ප්‍රථමයෙන් ඉල්ලා සිටිනවා.

03(30) **<u>මහා නගර සභා මන්ත්‍රී - බී.සජීත් දුමින්ද පීරිස් මහතා</u>**
ගරු නගරාධිපතිතුමනී, මේ වන විට අපේක්ෂා රෝහලේ පිලිකා රෝගය සඳහා ලියාපදිංචි වුණ මොරටුවේ විශේෂයෙන් එගොඩඋයන, කොරළවැල්ල, කටුකුරුන්ද, මොරටුමුල්ල, ඉඳිබැද්ද යන ප්‍රදේශවල ඉන්න සායනවලට යන ප්‍රමාණය ඉතාමත් වැඩිවෙලා තිබෙනවා. අපේ මේ ඉන්ෝෂා මහත්මියත් එහි වැඩ කරන නිසා මට නිරන්තයෙන් ඒ සම්බන්ධව දැගැනීමට ලැබෙනවා.

ඒවගේම අප වසරකට වතාවක් එක් එක් ද්‍රව්‍ය ආරෝග්‍යා රෝහලට පරිත්‍යාග කිරීමට රැගෙන යනවා. ඒත් එක්කම ඖෂධවල යම් අඩුපාඩුවකුත් පවතිනවා. අපේක්ෂා රෝහලෙනුත් එම ඖෂධ ඉල්ලා තිබෙනවා. එමනිසා මොරටුවේ එම දුප්පත් පවුල්වල සිටින ඉතා අමාරුවෙන් බස් එකට අවශ්‍ය මුදල පමණක් හොයාගෙන යන අපේ අසරණ ජනතාවට මෙම බෙහෙත් ටික ගන්න විදිහක් නෑ. එම බෙහෙත් මිලෙන් වැඩියි. එමනිසා මේ පිළිබඳව සෞඛ්‍ය ඇමතිතුමාවත් දැනුවත් කරලා එය විධිමත් කරන්න කියන අතරේ, නගර සභාව පැත්තෙන් අපට කරන්න පුළුවන් දෙයක් තිබෙනවා නම් ඒ පිළිබඳවත් නිරීක්ෂණය කිරීමට අවශ්‍යයි. ඊයේ දිනයේ කණිෂ්ක සේනානායක මහතාගේ අවමංගල්‍ය අවස්ථාවේදි හිටපු සෞඛ්‍ය ඇමතිතුමත් හමුවුණා. ඒ පිළිබඳව ඔහු සමඟ සාකච්ඡා කරද්දිත් කිව්වේ ඇත්තටම මෙය කළ යුතු කාරණාවක් කියලා. ඔහුගේ පැත්තෙනුත් රජය දැනුවත් කිරීමක් කරන්නම් කියලා කිව්වා. එමනිසා මේ සම්බන්ධව කඩිනමින් ක්‍රියාත්මක වෙන්න කියලා ඉල්ලා සිටිනවා. ඒවගේම ගරු නගරාධිපතිතුමනි, කොළඹ මහ රෝහලේ එක්සිඩන්ට් වෝඩ් එකේ ඉස්සරහ ඉන්න අයට බැන්ඩේජ් නෑ. ඩොක්ටර්ස්ලා මේක පිටින් ගන්න ලියලා දෙන්න කැමති නෑ දූෂණ විරෝධී පනතට අසුවෙයි කියලා. එක් වෛද්‍යවරයෙන් මගේ ඉස්සරහම කිව්වා අල්ලස් එකට ගියත් කමක් නෑ මම ලියලා දෙනවා දෙන්නම් කියලා. ඒවගේ තත්ත්වයකුත් තියෙනවා. මේ රෝහල්වලට යන මොරටුව ප්‍රදේශයේ ජනතාව, රටේ ජනතාව මෙම තත්ත්වයට මුහුණ දෙනවා. එමනිසා මෙම තත්ත්වය නියාමනය කරන්න. ඔවුන්ට සහනය ලබාදීමට අවශ්‍ය මැදිහත්වීම කරන්න කියලා ඉල්ලා සිටිනවා. ඒක සෞඛ්‍ය ඇමතිතුමා ඇතුළු රජයේ පාර්ශවයෙනුත්, අනෙකුත් සංවිධානය වලිනුත් ඉල්ලීමක් කරන්න කියලා මම ඉල්ලා සිටිනවා.

03(31) <u>මහා නගර සභා මන්ත්‍රී - බී.සජිත් දුමින්ද පීරිස් මහතා</u>

ගරු නගරාධිපතිතුමනී, මොරටුව කියන්නේ සංගීතයට ලැදි, සංගීතයෙන් ආදරණීයන් බිහිකරපු, ගායක ගායිකාවන් බිහිකරපු, සංගීත කණ්ඩායම් බිහිකරපු, එවගේම ක්ලැරන්ස් විජේවර්ධන, මිල්ටන් මල්ලවාරච්චි, නිහාල් නෙල්සන් හා ධනපාල උඩවත්ත වැනි ප්‍රවීණ ගායකයන්ට තෝතැන්නක් වුණ තැනක්. දැන් මේ වන විට සමහර ආයතන කර්තෘ භාග ගෙවන්න ගත්ත නිසා පුංචි පුංචි සංගීත කණ්ඩායම් වලට වගේ සිංදුවක් කියාගන්න ලැබෙන්නේ නෑ. එමනිසා මේ සම්බන්ධව යම් ක්‍රියාදාමයක් තිබෙනම් මැදිහත්වීමක් කරන්න කියලා ඉල්ලා සිටිනවා.

03(32) <u>මහා නගර සභා මන්ත්‍රී - එම්.ලිහිණි ප්‍රනාන්දු මහත්මිය</u>

ගරු නගරාධිපතිතුමනී, ඔබතුමාට පැමිණිල්ලක් ඉදිරිපත් කිරීමට තිබෙනවා මොරටුව, ඇලන්මාවත, උස්වත්ත පළමුවන පටුමඟ, අංක 6/9 දරණ ස්ථානයේ පදිංචි එම්.ඊ.එල්.කුරේ යන අය විසින් ලබාදි ඇති ලිපියක් සම්බන්ධව. එම නිවස හා එම නිවසට යාබඳ 12/14, 12/14/1A යන නිවෙස්වල සිටින පුද්ගලයන් වෙනුවෙන් තමයි මෙම ලිපිය ඉදිරිපත් කරලා තිබෙන්නේ. එම මාර්ගය අවසානයේ නගර සභාවට අයත් පාරක් වහලා අනවසර ඉදිකිරීමක් පවතිනවා. ඔබතුමාට මේ සම්බන්ධයෙන් 2026.08.14 වන දින ලිපියක් ලබාදුන්නා ඉන් අනතුරුව 2026.09.08 වන දිනත් ලිපියක් ලබාදුන්නා. මා මේ සම්බන්ධව තුසිත් මන්ත්‍රීතුමාවත් දැනුවත් කළා. තුසිත් මන්ත්‍රීතුමා හරහා ඉංජිනේරු දෙපාර්තමේන්තුවත් දැනුවත් කළා. එම අනවසර ඉදිකිරීම සම්බන්ධව 2010 ඉදලා පැමිණිලි කරලා තිබෙනවා. එවකට පැවති දේශපාලන අධිකාරියේ මැදිහත්වීම මත මෙය එලෙස පැවතීමට අවසර ලබාදීලා තිබෙනවා. නමුත් මෙය නීති විරෝධියි. නීතිය නම් සැමටම එක නීතියක්. දේශපාලනය මත නගර සභාවට අයත් පාරවල් වහලා ඒවා හරහා ගොඩනැගිලි ඉදිකිරීමට අවසරයක් නෑ. මේ සම්බන්ධව ඔබතුමාගේ සෘජු මැදිහත්වීම

බලාපොරොත්තු වෙනවා. මේ සම්බන්ධව අපක්ෂපාති පරීක්ෂණයක් කරලා ඉංජිනේරු දෙපාර්තමේන්තුවත් සම්බන්ධ කරගෙන, ඊට අදාළ ප්ලෑන් සියල්ල මට දීලා තිබෙනවා, ඒ සියල්ල ඔබතුමා අධීක්ෂණය කරන්න. මේ සම්බන්ධයෙන් ඒ අයව නඩු මාර්ගයට ගන්න පුළුවන්. නමුත් නඩු මාර්ගයට යාමට ප්‍රථමයෙන් මේ සම්බන්ධයෙන් මැදිහත්වීම නගර සභාවේ වගකීමක්. එමනිසා මේ සම්බන්ධව ඔබතුමාගේ වපසරිය තුළ අපක්ෂපාතිව නීතිය ක්‍රියාත්මක කිරීමට කටයුතු කරන්න කියලා ඉල්ලා සිටිනවා.

03(33) <u>මහා නගර සභා මන්ත්‍රී - ඩී.එම්.සුජිත් පුෂ්පකුමාර මහතා</u>

ගරු නගරාධිපතිතුමනී, නගර සභාවේ නිල වෙබ් අඩවිය විවෘත කරන දවසේ මම දැක්කා දාලා තියෙනවා "මහ නගර සභාව සමඟ තම සම්බන්ධතා පවත්වාගෙන යාමට අපගේ මෙම වෙබ් අඩවිය මහඟු අත්වැලක් සලසන බව මා තරයේ විශ්වාස කරමි. මෙම වෙබ් අඩවිය මගින් දැනට පුරවැසියන් වෙත ලබාදෙන වරිපනම් බදු ගෙවීමේ පහසුකම, අත්‍යාවශ්‍ය අයදුම්පත් භාගත කරගැනීමේ පහසුකම් ලබා දෙන අතර, අනාගතයේදී පුරවැසියන්ට අන්තර්ජාලය ඔස්සේ මහා නගර සභාවෙන් ලබාගත හැකි සේවාවන් වඩාත් පහසු, සුරක්ෂිත, විශ්වාසදායි ලෙස පවත්වාගැනීම අපගේ අපේක්ෂාව වේ. අපගේ සේවා වඩාත් ඵලදායි කිරීම සඳහා ඔබගේ ඉල්ලීම් සහ පැමිණිලි ලබා ගැනීමේ පහසුකම ද මෙම වෙඩ් අඩවිය සතුවේ. මොරටුව මහා නගර සභාව නවීන තාක්ෂණයෙන් සපිරි පුරවැසියන්ට ඵලදායි සේවාවක් සපයන ආයතනයක් බවට නව පාලනය යටතේ ස්ථාපිත කරන බව මොරටුව පුරවැසියන් වෙත ප්‍රතිඥා දෙමි. කේ.ඩී.නිශාන්ත ප්‍රදීනාන්දු, නගරාධිපති, මොරටුව මහා නගර සභාව." ගරු නගරාධිපතිතුමනි, දැන් මෙම වෙබ් අඩවිය මොරටුව මහා නගර සභාව භාවිතා කරන්නේ නැද්ද? රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 27/2023 අනුව ඊමේල් ආදිය එව්වම දිනපතා පරීක්ෂා කරන්න ඕනේ. ඒක නීතියක්. නමුත් මොරටුව මහා නගර සභාවේ නිල වෙබ් අඩවියට ඊමේල් පණිවුඩයක් දැම්මම ඒක බලන්නේ නෑ. ඒක වැඩ කරන්නේ නැලු. ඊමේල් ලිපින දෙකක් සඳහන් කරලා තිබුණත් ඒ දෙකම වැඩ කරන්නේ නෑ කියලා තමයි ප්‍රදේශවාසීන් පැමිණිලි කරන්නේ. එමනිසා කරුණා කරලා ඒ සම්බන්ධයෙන් සොයා බලන්න. මක්නිසාද, ආයතන කමිටුවට වාඩි වුණාට පස්සේ ගෙවීම් එහෙම ක්‍රමවත් කරන්න, ඵලදායි කරන්න ලොකු කාර්යභාරයක් අපි කතා කරනවා. නමුත් නගර සභාවේ වෙබ් අඩවිය අප්ඩේට් වෙන්නේ නෑ.ඊමේල් වැඩ කරන්නේ නෑ. එමනිසා ගරු නගරාධිපතිතුමා මේ සම්බන්ධයෙන් සොයා බලන්න. සාමාන්‍යයෙන් රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 27/2023 තියෙනවා ඊමේල් පණිවුඩයක් එවලා ප්‍රශ්නයක් යොමු කළායින් පසුව එයට දින 28ක් ඇතුළත පිලිතුරු ලබාදෙන්න ඕනේ. එසේ පිලිතුරු දුන්නේ නැත්නම් දෙන දවසක් හරි අදාළ දිනයට පෙර කියන්න ඕනේ කියලා. එමනිසා ඒ සඳහා ඔබතුමාගේ අවධානය යොමු කරන්න.

03(34) <u>මහා නගර සභා මන්ත්‍රී - ඩී.එම්.සුජිත් පුෂ්පකුමාර මහතා</u>

ගරු නගරාධිපතිතුමනී, මම ඔබතුමාගේ අවධානය යොමු කරන්න කැමතියි වාහන සංචිතය සම්බන්ධයෙන්. මේ අවස්ථාවේ අපේ ලේකම්තුමාට ස්තුතිය පුදකරනවා, එතුමා වාහන සංචිතය භාර හිටපු කාලයේ එතුමා හා එතුමාගේ ගෝලයා වාහන සංචිතය හොඳටම කළා. ඒකට තර්කයක් නෑ අපේ. ඒ කියෙන්නේ තාරක මුණසිංහ මහතාගේ අධීක්ෂණය යටතේ රමේෂ් අපෝන්සු විසින් හොදින් කරගෙන ගියා. ඒ අවශ්‍ය කාරණා ඒ විදිහටම වුණා. අපි දකිනවා සමහර වෙලාවට එම කටයුතු නීත්‍යානුකූලවම වෙන විදිහක් අපි දැක්කා. කවුරු ඉල්ලුවත් සමහර අවස්ථාවල නීතයානුකූල නැත්නම් වාහනයක් දෙන්නේ නෑ. අපි නොදැනුවත්ව අනීතිකව වුණාද කියලා අපි දන්නේ නෑ. නමුත් මොනම හේතුවක් නිසා හරි එතුමලා ඉල්ලලා හරි කොහොම හරි

වාහන සංචිතය මාරු වෙලා තිබෙනවා. වාහන සංචිතය මාරු වෙන්නේ දිවා භෝජන සංග්‍රහයක් දීලා ඩී.ජේ.ගහලා සාදයක් දාලා. ඒකේ තෑග්ග හැටියට වාහන සංචිතය දුන්නද කියන සැකයත් අපට තියෙනවා. සාමාන්‍යයෙන් ඒ.ඕ.කෙනෙක් වුණාම ගෲප් ට්‍රාන්ස්පෝට් තමයි තිබෙන්නේ. නමුත් අපට පැමිණිලි ලැබිලා තිබෙනවා වාහන සංචිතය ලැබුණට පස්සේ වාහන සංචිතය භාරකෙනා තමන්ට යන්න වාහනයක් තමන්ම දාගන්න තත්ත්වයකට පත්වෙලා තිබෙනවා. ලේකම්තුමා ඉන්න කොට එහෙම දෙයක් වෙනවා අපි දැක්කේ නෑ. ඔබතුමාලගේ පාලනය යටතේ තිබෙන නිසා වාහන සංචිතය කාටද දෙන්නේ කියන එක පිළිබඳ අපට ගැටලුවක් නෑ ඒක ඔබතුමාලගේ තීන්දුවක්. නමුත් ඔබතුමාලගේ තීන්දුවෙන් සභාවට අවාසියක් වෙන්න බෑ. සභාවට අවාසියක් වෙනවා කියන්නේ මහජනතාවටයි අවාසියක් වෙන්නේ. එමනිසා මහජනතාවට අවාසියක් වෙන්න බෑ. එමනිසා මෙය අනීතිකව වෙනවා නම් ඒ සම්බන්ධයෙන් ඔබතුමා මැදිහත් වෙලා කරුණාකරලා එය නිවැරදි කරන්න කියලා ඔබතුමාගෙන් ගෞරවයෙන් ඉල්ලා සිටිනවා.

03(35) **<u>මහා නගර සභා මන්ත්‍රී - ඩබ්.සුරේෂ් ප්‍රේමකුමාර ප්‍රනාන්දු මහතා</u>**

ගරු නගරාධිපතිතුමනී, ආයාචනා හා පෙත්සම් යටතේ කරුණු දෙකක් තිබෙනවා මා හට ඉදිරිපත් කරන්න. රාවතාවත්ත රෝමානු කතෝලික විද්‍යාලයේ විදුහල්පතිතුමිය නගර සභාවට ලිපියක් ඉදිරිපත් කරලා තිබෙනවා, එම පාසලේ ගේට්ටුව ඉදිරිපිට පාරෙන් එහා පැත්තේ අලුතින් ඉදිවන ගේට්ටුවෙන් පාසලේ දරුවන්ගේ ආරක්ෂාව සම්බන්ධයෙන් යම් ගැටලුවක් තිබෙනවා කියලා. එම ලිපියට නගර සභාවේ තාක්ෂණ නිලධාරිතුමිය ගිහිල්ලා එතන පරීක්ෂා කරලා ඉංජිනේරුතුමා විසින් ලිපියක් ඉදිරිපත් කරලා එම ඉදිකිරීම වහාම නවත්වනවා. අදාළ අයගේ නිවසට ඇතුළුවීමට ගේට්ටු හතරක් තිබෙනවා. වාහන ඇතුළු කිරීම සඳහා ගේට්ටු දෙකක් තිබෙනවා. දැනටත් පුරවැසියන්ට ඇතුළුවීම සඳහා ගේට්ටු දෙකක් තිබෙනවා. එම ගේට්ටු හතරම තිබෙන්නේ උතුරු පැත්තේ. මේ අය උතුරු පැත්තෙන් පිවිසුම් මාර්ග පෙන්නලා මේ ගොඩනැගිල්ලේ ඉදිකිරීම් සිදුකරලා අවසන් වුණායින් පස්සේ පසුකාලීනව කුමක් හේතුවක් නිසා එතනින් පිවිසුම් මාර්ග නොදෙන නිසා එම පිවිසුම් මාර්ගය ඔවුන් ඉල්ලන්නේ නැතුව ඇති. දැන් ඉදිකිරීම කරලා පදිංචි වුණාට පස්සේ සද්ද නැතුව මෙතනින් පිවිසුම් මාර්ගයක් තියාගන්නවා.එම අවස්ථාවේ තමයි විදුහල්පතිතුමිය ඒ සම්බන්ධයෙන් විරුද්ධත්වය ප්‍රකාශ කරලා ඔබතුමාට ලිපියක් ඉදිරිපත් කරන්නේ. මෙම ලිපිය ඉදිරිපත් කරලා මෙම ඉදිකිරීම් නතර කළායින් පසුව පාසලේ නිවාඩු කාලය තුළ, ඒ අවස්ථාවේ විදුහලිපතිතුමිය විභාගයට සහභාගි වෙලා ඉදලා තිබෙන්නේ. ඒ අවස්ථාවේ කිසිවෙක් ඉදලා නෑ. එම කාලය තුළ එම ගේට්ටුව සම්බන්ධ ප්ලෑන් එක නගර සභාවට දාලා අනුමත කිරීමක් කරගන්නවා. මෙය අනුමත කරගන්නේ විරෝධතාවයෙන් පසුව.මේක පාසලක්. පෞද්ගලික ඉඩමක් නෙමෙයි. විදුහල්පතිතුමිය කිසියම් ගැටලුවක් තිබෙන නිසා තමයි විරෝධතාවය පළ කරලා ඔබතුමාට ලිපියක් යොමු කරලා තිබෙන්නේ. එසේ තිබියදීත් ඔබතුමා එම විරෝධතාවය කැඳවන්නේ නැතුව ප්‍රශ්නය කුමක්ද කියලා විමසන්නේ නැතුව ඔබතුමා මේ සඳහා අනුමැතිය ලබාදීලා තිබෙනවා එම ගේට්ටුවට. නගර සභාවෙන් එම ගේට්ටුව නවත්වන්න ලිපියක් යවලා තියෙනවා.එම ලිපියේ හෙඩින් එක දාලා තියෙන්නේ අනවසරෙන් ඉඩමක් ගොඩකිරීම සම්බන්ධවයි කියලා. මේ හරියට යන්නේ කොහොද මල්ලේ පොල් වගේ සිද්ධියක්. හෙඩින් එකේ එකක් දානවා. ඡේදයේ වෙන එකක් දානවා. මෙම ලිපිය යවලා තිබෙන්නේ ඉංජිනේරු අංශයෙන්. දරුවන්ගේ ආරක්ෂාව පිළිබඳ ගැටලුවක් ඔබතුමාට දැනුම් දුන්නට පස්සේ ඔබතුමාට යුතුකමක් වගකීමක් තියෙනවා විදුහල්පතිතුමියව කැඳවලා මෙය විභාග කරලා ගැටලුව කුමක්ද කියලා අහන්න.මට දැනගැනීමට ලැබුණු විදිහට විදුහල්පතිතුමිය විසින් ඔබතුමාට නැවතත් ලිපියක් එවලා ඇති. මෙය ඔබතුමාට ඉදිරිපත් කරනවා. ඔබතුමා මේ පිළිබඳව නැවත

සොයා බලන්න. මෙය දරුවන්ගේ ප්‍රශ්ණයක්. පෞද්ගලික දෙන්නෙක්ගේ ආරවුලක් නෙමෙයි. ගේට්ටුව ඉදිරිපිටම සුදු ඉරක් තිබෙනවා. එතනින් තමයි පාර මාරුවෙන්නේ.එතනට තව ගේට්ටුවක්. පිවිසුම් මාර්ග පහක් එම නිවසට තියෙනවා. පිවිසුමක් මාර්ග දහයක් තිබුණත් අපට ගැටලුවක් නෑ. නමුත් දරුවන්ට තිබෙන ප්‍රශ්ණය සම්බන්ධයෙන් අපි කතා කරන්නේ. එය පළමු කාරණාව ලෙස ඔබතුමාට ඉදිරිපත් කරනවා. මේ සම්බන්ධයෙන් මම ඔබතුමාටත් චෝදනාවක් එල්ල කරනවා. විදුහල්පතිතුමියගේ විරෝධතාවය නොසලකා හැරලා මෙතරම් ඉක්මණින් මෙය අනුමත කරන්නේ කුමන පදනමින්ද කියන කාරණය මම ඔබතුමාගෙන් අහනවා.

03(36) **<u>මහා නගර සභා මන්ත්‍රී - ඩබ්.සුරේෂ් ප්‍රේමකුමාර ප්‍රනාන්දු මහතා</u>**

ගරු නගරාධිපතිතුමනී, මා විසින් මේ මස සභාවට යෝජනාවන් තුනක් ඉදිරිපත් කළා. ඉන් එක් යෝජනාවක් සම්බන්ධයෙන් ඔබතුමා විසින් මා වෙත ලිපියක් එවා තිබෙනවා. එය අධිභාරය සම්බන්ධ යෝජනාවක්. මේ අධිභාරය සම්බන්ධව මම දෙයක් ඔබතුමාට කියන්න තියෙනවා. ඇත්තටම ඔබතුමාලා පසුගිය කාල වකවානුවේ ඔබතුමාලට බලය දුන්නේ හොරකම, වංචාව හා දූෂණය කියන දේවල නැති කරලා ඔබතුමාලට මෙම කටයුතු මොරටුව තුළ කරගෙන යන්න. ඔබතුමා ඒ සම්බන්ධයෙන් කිසිදු තැකීමක් කරන්නේ නෑ කියන එකයි මගේ විශ්වාසය. ඔබතුමා පෞද්ගලිකව මේ සඳහා පිලියමක් යොදනවද කියන එක මම දන්නේ නෑ. නමුත් එය සභාව දැනගතයුතුයි. මෙය එක්කෝටි දහඅට ලක්ෂයක මුදලක් සම්බන්ධ ප්‍රශ්ණයක්. එමනිසා මෙය රජයේ නිලධාරින් අතින් හෝ බාහිර පාර්ශවයක් අතින් යම් කිසි මුදලක් මුද්දර ගාස්තුවක්, ටෙන්ඩර් පටිපාටියක් සිදුවුණහොත් වහාම එකවර ලබාගත යුතු මුදලක් මේ අධිභාරය යටතේ තියෙන්නේ. වැටුපක් වැරදීමකින් ගියපු එකක්, වාහනයක් හැප්පිච්ච එකක් වැරදීමකින් ගිය එකක් වගේ දෙයක් මාස්පතා ගෙවීමේ ක්‍රමයට මාස දොළහක් දක්වා දෙන්න පුළුවන්. මෙම මුදල් මොරටුව ජනතාවගේ මුදල්. එමනිසා මෙම මුදල් ඔබතුමා ඉක්මණින් ලබාගන්න ඕනේ. මට හැගෙන පරිදි නම් ඔබතුමාත් මෙහි ඉන්නවා. ඔබතුමාලගේ පක්ෂයට උදව් කරපු පිරිසකුත් මෙතන ඉන්න නිසා ඔබතුමා මේ අවුරුදු හතර පහත් මේක කල් අදිනවද කියන ප්‍රශ්ණය තියෙනවා. අධිභාරයක් උනාම ගරු නගරාධිපතිතුමා, මෙය විගණනය වෙලා මුදල් වංචාවක් හැටියට තමයි අධිභාරය එන්නේ. මෙයට දසක දෙකක කාලයකට ආසන්නයි. මේ ජනවාරි 27ට අවුරුදු විස්සයි. ඔබතුමත් මෙය කාලයක් අදිනවා නම් මේක කොහෙටද යන්නේ. මොරටුවේ ජනතාව ඔබතුමාව විශ්වාස කරලා ඉහල පුටුවේ තියලා පළමු පුරවැසියා කළා. අද ඔබතුමාට යුතුකමක් තියෙනවා අධිභාරය ගෙවපු අපගේ මන්ත්‍රීවරුන්වත් නිදහස් කරලා, ගෙවන්න තියන අයගෙන් එම මුදල් ඉතා ඉක්මණින් සභාවට අයකර ගැනීම. ඔබතුමා මට එවපු ලිපියේ සඳහන් කරලා තියෙනවා මෙම කටයුත්ත කරගෙන යනවා කියලා. නමුත් මෙය තවදුරටත් කරගෙන යාමට කොපමණ කාලයක් අවශ්‍යද?

<u>ගරු නගරාධිපති - කේ.ඩී.නිශාන්ත ප්‍රදීනාන්දු මහතා</u>

ගරු මන්ත්‍රීතුමා, පෙත්සම් හා පැමිණිලි අයිතමය යටතේ අපි කරුණු කාරණා ඉදිරිපත් කරද්දි, අපිටත් විනයක් තිබෙන්නට ඕනේ. අපි ඒ සම්බන්ධව ඔබ හට එවලා තිබෙන ලිපියේ තියෙනවා ඊට අදාළව ක්‍රියාමාර්ග ගන්නා බව. මක්නිසාද, එයින් අපට ගැලවෙන්නටත් බෑ. එම අධිභාරය සම්බන්ධයෙන් ක්‍රියාමාර්ග ගණනාවක් ගනිමින් තිබෙනවා. මීට අදාළව අප විසින් ඔබ හට පිලිතුරු ලබාදුන් පසුව ඔබට කිසිදු සාධාරාත්මක අයිතියක් නෑ නැවත ඒ පිළිබඳව දීර්ඝව කතා කරන්න. මම යෝජනාව භාරගත්තනම් ඉවරයි. ඔබ දැන් ඒ පිළිබඳවනේ කතා කරන්නේ. ඒ සම්බන්ධව මෙම සභාවේ හුගක් මන්ත්‍රීවරු දන්නවා. ඒ සම්බන්ධව කටයුතු කරනවා. විශාල

ගෙවීම් කරපු මන්ත්‍රීවරු ඉන්නවා. හරි සංකීර්ණ ගැටලුවක්. නමුත් එය විසඳිය යුතු ගැටලුවක්. මම ඔබගේ යෝජනාව ප්‍රතික්ෂේප කළේ මේ සම්බන්ධව කටයුතු කරමින් තිබෙන නිසා. නමුත් ඔබ නැවත අවස්ථාව අරගෙන පෙත්සම් හා පැමිණිලි අයිතිමය යටතේ ඒ සම්බන්ධව දිගටම කතා කරනවා. මම හිතන්නේ ඒක සාධාරණ නෑ.

<u>මහා නගර සභා මන්ත්‍රී - ඩබ්.සුරේෂ් ප්‍රේමකුමාර ප්‍රනාන්දු මහතා</u>

ගරු නගරාධිපතිතුමනී, මම සතුටුයි ඔබතුමා මෙය බොහොම ඉක්මණින් විසඳලා දෙනවා නම්. සභාවට අයිති මුදලක් අයකරගන්නා නම්. අපි මේ සභාවට ඇවිල්ලා තිබෙන්නේ ඒවගේ දේවල් නවත්වලා කරපු දේවල් වලට උත්තර ලබාදෙන්න. මෙය ලබන අවුරුද්ද අවසන් වෙන්න ඉස්සෙල්ලා ඉවර කරලා දෙන්න කියලා ඔබතුමාගෙන් ඉල්ලනවා.

<u>මහා නගර සභා මන්ත්‍රී - ඩබ්.මැක්සි ජේ.ප්‍රනාන්දු මහතා</u>

ගරු නගරාධිපතිතුමනී, අපි මේ අධිභාරය සම්බන්ධයෙන් පත්කරලා තිබෙන කමිටුවත් සමඟ විශේෂ සාකච්ඡාවක් ඔබතුමාගෙන් ඉල්ලුවා. එම කමිටුවත් සමඟ අපි සාකච්ඡා කළා. අපි දැන් සල්ලි ගෙවලා තියෙන්නේ. ඒ සම්බන්ධව ස්තුති කරලා නාගරික කොමසාරිස් විසින් අපි වෙත ලිපි එවලා තිබෙනවා. එහෙම ගෙවපු මන්ත්‍රීවරු මෙතන ඕනෑතරම් ඉන්නවා.

<u>ගරු නගරාධිපති - කේ.ඩී.නිශාන්ත ප්‍රදීනාන්දු මහතා</u>

ගරු මන්ත්‍රීතුමා, අපි චෝදනාවන්ට ලක්වෙනවා නෙමෙයි. අපි අර සාකච්ඡාවට ඉක්මණටම ගමු. සමාවෙන්න ඒ සාකච්ඡාව ගන්න බැරවීම සම්බන්ධයෙන්.

03(37) **<u>මහා නගර සභා මන්ත්‍රී - පී.එම්.ෂෙයාන් දූලිප් තිසේරා මහතා</u>**

ගරු නගරාධිපතිතුමනී, ධර්මබන්දු මාවතේ ගලිවලවල් දෙක සම්බන්ධයෙන් ගිය සභාවෙත් ඔබතුමාට සඳහන් කළා. වාහනයක් ගිහිල්ලා අනතුරක් වුනොත් ජීවිතයක් වුවත් නැතිවීමට ඉඩ තිබෙනවා.එමනිසා ඒ සම්බන්ධව ඔබතුමාගේ අවධානය යොමු කරන්න කියලා ඉල්ලා සිටිනවා.

03(38) **<u>මහා නගර සභා මන්ත්‍රී - පී.එම්.ෂෙයාන් දූලිප් තිසේරා මහතා</u>**

ගරු නගරාධිපතිතුමනී, දකුණු කළාපයේ, එගොඩඋයන, මෝදර, කටුකුරුන්ද ප්‍රදේශවල හැමතැනම කුණු. පසුගිය දවසක මහා පාරට කුණු දමලා පොලීසිය මැදිහත්වෙලා තමයි කුණු අයිනකට දාලා තියෙන්නේ. එමනිසා මේ සම්බන්ධව සොයා බලන්න කියලා ඉල්ලා සිටිනවා.

<u>මහා නගර සභා මන්ත්‍රී - ඩබ්.ඩී.රංජලා එස්.ජයතුංග මහත්මිය</u>

ගරු නගරාධිපතිතුමනී, කුණ සම්බන්ධ ප්‍රශ්නය මතුවුණ නිසා ඔබතුමාට පැමිණිල්ලක් කරනවා. මම හිතන්නේ මීට වසරකට පමණ පෙර සෞඛ්‍ය කමිටුවේදි මම යෝජනාවක් කළා ජාතික නිවාසයේ කුණු තිබෙනවාඒ ටික අස් කරලා දෙන්න කියලා. නමුත් දැන් වසරකුත් පසුවෙලා තවම ඒක සුද්ද කරන්න ඇවිල්ලා නෑ. දැන් ඒ කුණු ප්‍රශ්නයට කුඩු ප්‍රශ්නය වෙලා. දැන් මේ කුණු ගොඩේ තමයි කුඩු තියෙන්නේ. එමනිසා හැමෝම ගෙදරට ඇවිත් මට කියනවා කුණු ගොඩ අස්කරලා දෙන්න කියලා. මම පෞද්ගලිකවත් ඇවිල්ලා කිව්වා. පොලිසියටත් කිව්වා. නමුත් මේ කුණු ටික ඉවත් කරලා නෑ. මම ඔබතුමාගෙන් කාරුණිකව ඉල්ලා සිටිනවා පුළුවන් නම් ඒ කුණු

ටික ඉවත් කරලා ජාතික නිවාස සුද්ද පවිත්‍ර කරලා දෙන්න කියලා. මක්නිසාද, චුයින්ගම් එකේ පවා කුඩු අරන් යනවා. දිනයක් යොදා ගන්න මමත් ඒ සඳහා සහභාගි වෙන්නම්.

03(39) <u>මහා නගර සභා මන්ත්‍රී - ඩී.සමන්ත සිල්වා මහතා</u>

ගරු නගරාධිපතිතුමනී, දෙරණ රූපවාහිනී නාලිකාවේ දර්ශන මහත්මා ඉල්ලීමක් කළා එතුමාටත් සභාව වාර්තා කිරීමට අවස්ථාව ලබාදෙන්න කියලා. පසුගිය සභාවෙත් ඉල්ලීමක් කළා. ඔබතුමාට ලිඛිතවත් ඉල්ලීමක් කරලා තිබෙනවා. ඒ සම්බන්ධවත් ඔබතුමාගේ අවධානය යොමු කරන්න කියලා ඉල්ලීමක් කරනවා.

03(40) <u>මහා නගර සභා මන්ත්‍රී - ඩී.සමන්ත සිල්වා මහතා</u>

ගරු නගරාධිපතිතුමනී, මොරටුවේ ආහාර සම්බන්ධව ගත්තොත්, පිසූ ආහාර අලෙවි කිරීම සම්බන්ධව සී.පී.එච්.අයි.මහත්මයා සමඟ සාකච්ඡා කරද්දි ඒ සම්බන්ධයෙන් තහනමක් පනවන්න බෑ කියලා දැන ගැනීමට ලැබුණා. නමුත් සමහර තැන්වල රු.500/-ට කෑම පැකට් එක තියෙනවා, සමහර තැන්වල රු.400/-ට කෑම පැකට් තියෙනවා. සමහර තැන්වල රු.700/-ටත් තියෙනවා. මොරටුවේ බැලුවම මේ එකම ආහාර වේල. මේ මොහොතේ මිනිසුන් බොහොම ආර්ථික අපහසුතාවයට මුහුණදීලා තිබෙන අවස්ථාවක්. අපි මොරටුවේ පුරවැසියන් වශයෙන් හැටියට මොරටුවේ කඩ මේ සම්බන්ධයෙන් දැනුවත් කරන්න පුළුවන්නම්, එකම ආහාර වේලක් කට්ටියක් රු.500/-ට දෙන්නත්, තව කට්ටියක් රු.400/-ටත්, රු.700/-ටත් දීම වගේ ගැටලු කිහිපයක් මෙතන තියෙනවා. ආඥා පනතේ විධිවිධානයක් පදනම් කරගෙන හෝ මේ සම්බන්ධයෙන් අපට කුමක් හෝ පියවරක් ගන්න හැකියාවක් තිබෙනවා නම් ලේකම්තුමා ඒ සම්බන්ධයෙන් පොඩ්ඩක් සොයා බලන්න. අපි ඒ සම්බන්ධයෙන් ප්‍රධාන මහජන සෞඛ්‍ය පරීක්ෂතුමා ඇතුළු මහජන සෞඛ්‍ය පරීක්ෂක මහතුන් සම්බන්ධ කරගෙන ක්‍රමවේදයක් හදන්න උත්සහ කරමු.

03(40) <u>මහා නගර සභා මන්ත්‍රී - එස්.ඩබ්.චදුන් රොමේෂ් ප්‍රනාන්දු මහතා</u>

ගරු නගරාධිපතිතුමනී, ආයාචනා හා පෙත්සම් යටතේ ඉදිබැද්ද බැක්වත්ත ප්‍රදේශයේ කාණුව පිළිසකර කර ගැනීම සම්බන්ධයෙන් පෙත්සමක් තිබෙනවා ඉදිරිපත් කරන්න. පසුගිය පාලනය කාලේ නම් දැනුම් දුන් සැනින් ඇවිත් පිළිසකර කරලා දෙනවා. නමුත් අවුරුද්ද කාලයක සිට මෙම කාණුව පිළිසකර කරලා නෑ. මේ දවස්වල පවතින කුඩා වැස්සට පවා එම ප්‍රදේශය යටවෙනවා. මේ පිළිබඳව පරිපාලක අජිත් මහත්මාට වීඩියෝවකුත් කරලා දැම්මා බලන්න කියලා. එතුමා කිව්වේ එතුමාට මේ පිළිබඳව දැන් බලයක් නෑ එමනිසා සභාව දැනුවත් කරන්න කියලා. මම එය සභාගත කරනවා.

03(41) <u>මහා නගර සභා මන්ත්‍රී - එස්.ඩබ්.චදුන් රොමේෂ් ප්‍රනාන්දු මහතා</u>

ගරු නගරාධිපතිතුමනී, ඉදිබැද්ද ඩග්ලස් ප්‍රනාන්දු ක්‍රීඩාංගණයේ ප්‍රේක්ෂකාගාරයේ ගාමන්ට් එකක් දාන්න යනවා කියලා මම ගිය සභාවෙදිත් දැනුම් දුන්නා. මම දන්නේ නෑ ඔබතුමා හා ක්‍රීඩා කමිටු සභාපතිතුමා ඒ සම්බන්ධව දැනුවත්ද කියලා.ඊයේ පෙරේදත් ඇවිල්ලා එහි මැනීම් කටයුතු කරගෙන ගිහිල්ලා තිබෙනවා. ගරු නගරාධිපතිතුමනි, මේ දේ කරන්න දෙන්න එපා මේ සම්බන්ධව දැඩි විරෝධයක් තිබෙනවා. සෙල්ලම් කරන තරුණයෝ මෙතන තමයි ඇවිල්ලා ඉන්නේ. අපේ ජීවන්ත මන්ත්‍රීතුමත් මේ සම්බන්ධව දන්නවා. මෙතන ගාමන්ට් එකක් දැම්මම සෙල්ලම් කරන තරුණයන්ට ඉන්න තැනක් නෑ. ඒ තරුණයෝ ඉන්නේ කොහේද?

ගරු නගරාධිපති - කේ.ඩී.නිශාන්ත ප්‍රදීනාන්දු මහතා
ගරු මන්ත්‍රීතුමා, එය සම්පූර්ණ අසත්‍යයක්.

මහා නගර සභා මන්ත්‍රී - එස්.ඩබ්.චදුන් රොමේෂ් ප්‍රනාන්දු මහතා
ගරු නගරාධිපතිතුමනී, මම ඔබතුමාට සාක්ෂි සහිතව පෙන්නන්නම්. දැනටත් මා ලඟ සාක්ෂි තිබෙනවා. එමනිසා මේ සම්බන්ධව ඔබතුමාගේ අවධානය යොමු කරලා ඒ දේ කරන්න දෙන්න එපා.

03(42) මහා නගර සභා මන්ත්‍රී - එස්.ඩබ්.චදුන් රොමේෂ් ප්‍රනාන්දු මහතා
ගරු නගරාධිපතිතුමනී, මම ගියා සභාවෙදිත් මතක් කළා පහළ ඉදිබැද්ද පාරේ වෙල ලඟ පාර කැඩිච්ච එක සම්බන්ධයෙන්.ඔබතුමා කිව්වා පී.ආර්.ඩී.එකට ගිහිල්ලා තියෙන්නේ සතියක් ඇතුළත හදනවා කියලා. තවම එතන හැදිලා නම් නෑ. එමනිසා නැවත වරක් මතක් කරනවා ඒ පිළිබඳව සලකා බලලා එය පිළිසකර කර දෙන්න කියලා.

03(43) මහා නගර සභා මන්ත්‍රී - එල්.දිලිප් රොෂාන් කුමාර පෙරේරා මහතා
ගරු නගරාධිපතිතුමනී, අද උදේ ෆොටෝස් වගයක් ගහගෙන ඇවිල්ලා තියෙනවා. මෙන්න මේ ටික කරලා දෙන්න කියලා මම ඔබතුමාගෙන් ඉල්ලීමක් කරනවා. කොක්කෙන් හරි කෙක්කෙන් හරි මගේ ගමේ වැඩ ටික විතරයි මට වෙන්න ඕනේ.

03(44) මහා නගර සභා මන්ත්‍රී - එල්.දිලිප් රොෂාන් කුමාර පෙරේරා මහතා
ගරු නගරාධිපතිතුමනී, ඔබතුමා දන්නවා, මම සී.පී.එච්.මහත්මයා එක්කත් කතා කළා අපි දැන් ටෙන් මිනිට් චැලේජ් යටතේ ගෙවල් ගානේ යනකොට දකිනවා මිනිසුන්ගේ නොදිරන ද්‍රව්‍ය නගර සභාවෙන් ගන්නේ නෑ. උදාහරණයක් විදිහට රබර් කැලි වැනි බෝතල් කඩවලින් ගන්නේ නැති දේවල් ගන්නේ නෑ. එමනිසා ඒ දේවල් ගොඩක් එකතු වෙලා තියෙනවා. ඒ සම්බන්ධයෙන් කුමක් හෝ කර දෙන්න කියලා ඉල්ලා සිටිනවා.

03(45) මහා නගර සභා මන්ත්‍රී - එල්.දිලිප් රොෂාන් කුමාර පෙරේරා මහතා
ගරු නගරාධිපතිතුමනී, අගුලාන රම්‍ය නදී මාවත ඔබතුමාලා හරි ලස්සනට හදලා දුන්නා. කාරණය කියන්නේ දැන් වාහන ටිකක් වේගයෙන් ගමන් කරනවා. අපේ දරුවන්ට සෙල්ලම් කරන්න තැනක් නැති නිසා ඔවුන් සෙල්ලම් කරන්නේ පාරේ. පොදුජය විදුහල් භූමිය ගේට්ටු දාලා ලොක් කරගෙන තියෙන්නේ. මගේ ගමේ දරුවන්ට සෙල්ලම් කරන්න විදිහක් නෑ. ඒ නිසාම සෙල්ලම් කරනවා වෙනුවට අවුරුදු 14, 15, 16 වගේ පුංචි දරුවෝ යම් යම් මත්ද්‍රව්‍ය වලට ඇබ්බැහි වීමේ ප්‍රවණතාවය වැඩි. ඒ නිසා මම ඔබතුමාගෙන් කරුණාවෙන් ඉල්ලා සිටිනවා මේ එක ස්ථානයක මෙම දරුවන් සෙල්ලම් කරන නිසා මාර්ගයක් බාධකයක් දාලා දෙන්න කියලා මම ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා.

03(46) මහා නගර සභා මන්ත්‍රී - එල්.දිලිප් රොෂාන් කුමාර පෙරේරා මහතා
ගරු නගරාධිපතිතුමනී, මොරටුවැල්ල කඩ කාමර 03 සම්බන්ධයෙන් මම මාස කිහිපයක්ම මෙම සභාවේ කතා කළා. දැන් මාස 06ක් වෙනවා තමවත් එම වැඩේ වෙලා නෑ. මම හිතන්නේ,

කණගාටුවෙන් වුවත් කියන්නට ඕනා ඔබතුමාගේ මීනිට් එකවත් සලකන්නේ නැති තත්ත්වයක් තියෙන්නේ. ඔබතුමා මීනිට් එක ගහලා දැන් මාස දෙකක් විතර වෙනවා. තවමත් ඒ වැඩේ වෙලා නෑ. ඔබතුමාගෙන් කාරුණාවෙන් ඉල්ලා සිටිනවා නැවත වතාවක් මේ පිළිබඳව අවධානය යොමු කරන්න කියලා.

03(47) **<u>මහා නගර සභා මන්ත්‍රී - එල්.දිලිප් රොෂාන් කුමාර පෙරේරා මහතා</u>**

ගරු නගරාධිපතිතුමනී, මොරටුවට ආභරණයක්, වත්කමක් වුණ නගර සභාවේ පශු වෛද්‍ය කාර්යාලයෙන් එන්නත් කිරීම පමණයි සිදුකරන්නේ. නමුත් පළාත් සභාවෙන් පාලනය වන පශු වෛද්‍ය කාර්යාලයෙන් සතුන්ට බෙහෙත් හේත් කරනවා. සුරතල් සතුන් ඇති කරන්නේ සල්ලිභාගය තියෙන අය විතරක් නෙමෙයි නැති බැරි අසරණ අයත් සතුන් ඇතිකරනවා. පෞද්ගලික ආයතනවලින් මේ සඳහා විශාල මුදලක් අයකරනවා. අපට තිබෙන එකම සම්පත. කණගාටුවට කාරණය තමයි පශු වෛද්‍ය කාර්යාලයේ වෛද්‍ය තුමිය කාර්යබහුල ඇති. සමහර විට වෙනත් ප්‍රදේශවලට යනවා ඇති. නමුත් මොරටුවට එක දවසක් හරි දෙකක් හරි අනිවාර්යයෙන්ම එන්න කියලා අපට පළාත් සභාවට ඉල්ලීමක් කරන්න පුළුවන් නම් ඔබතුමා හරහා ඒක මේ අවස්ථාවේදි ගොඩක් වටිනවා කියලා මතක් කරනවා.

03(48) **<u>මහා නගර සභා මන්ත්‍රී - එල්.දිලිප් රොෂාන් කුමාර පෙරේරා මහතා</u>**

ගරු නගරාධිපතිතුමනී, සමන් සුජීව මහත්මාට පොඩි කාරණයක් මතක් කිරීමට තිබෙනවා. සමන් සුජීව මන්ත්‍රීතුමනි, ඔබතුමාට අයත් ක්ලිනික් එකක එක කාමරයක බඩු මූට්ටු වගයක් ගොඩ ගහලා තියෙනවා.මම ඇහුවා ඇයි මේ බඩු ගොඩගහලා තියෙන්නේ අපරාධයක්නේ කියලා. ඊට පස්සේ කිව්වා නගර සභාවෙන් ගෙනිච්චේ නෑනේ කියලා. සමන් සුජීව මහත්මා ගැන එතුමිය හොඳ කිව්වා. කියන වැඩේ කරලා දෙනවා කිව්වා. මේ වැඩෙත් කරලා දෙන්න කියලා ඉල්ලා සිටිනවා.

<u>ගරු නගරාධිපති - කේ.ඩී.නිශාන්ත ප්‍රදීනාන්දු මහතා</u>

ගරු මහා නගර සභා මන්ත්‍රීවරුනි, බොහොම ස්තුතියි. පෙත්සම් හා පැමිණිලි අයිතමය අවසාන කරනවා. පිලිතුරු දිය යුතු ගැටලු ගණනාවක් මතුවුණත් මම මේ වේලාවේ කාලය පිළිබඳව සලකලා පිලිතුරු දෙන්නේ නෑ. නමුත් අපේ සුජීත් මන්ත්‍රීතුමා මතුකරපු කාරණයක් තිබුණා. එම කාරණාවෙන් මතුකරපු වාහන සංචිතය සම්බන්ධව හා එය හේතු කොටගෙන නාගරික ගරාජයේ ඩී.ජේ.දාලා පාටියක් දැමීම සම්බන්ධව. එය සම්පූර්ණයෙන්ම ප්‍රතික්ෂේප කරනවා. ඒ දෙක අතර කිසිදු සම්බන්ධතාවයක් නෑ. අපේ නාගරික ගරාජයේ සේවය කරන පරිපාලන නිලධාරි සහ තවත් දෙදෙනෙකුගේ උපන් දින තිබුණා. ඒ උපන් දින වෙනුවෙන් බෙහොම වේලපහා අපට දැනුම්දීමක් කරලා තිබුණා දවල් කෑම දීමට සූදානම් කරලා තිබෙනවා කියලා. හරියට කෑම පැය ඇතුළත තමයි එම කටයුත්ත සිදුවුණේ. ඒ තුළ යම් යම් අඩුපාඩු තිබුණා නම් එය පිලිගන්නම්. අපි යමක් කිව්වම අකුරට කරන කෙනෙක් තමයි රමේෂ්. රමේෂ් පිළිබඳ කිසිම ගැටලුවකුත් නෑ. අපේ ලේකම්තුමා සම්බන්ධයෙන් ගැටලුවකුත් නෑ. අපි යම් යම් වෙනස්කම් කරමින් උත්සහ කරලා බලනවා සමහර සමහර වගකීම් වෙනස් කරලා යම් යම් පාලනයන් ඇතුළේ මීට වඩා හොඳින්, කාර්යක්ෂමව කරගන්න පුළුවන්කමක් තියෙනවද කියලා.පාලනය ඉදිරියට පත්වාගෙන යාමට එහෙම කරනවා විනා කිසිම කෙනෙක් එක්ක මොනයම් අමනාපකමක් තරහක් ඇතුළේ නෙමෙයි මේවා කළමනාකරණය කිරීමට දරණ උත්සහයක් පමණයි. සමහරු මතු කරපු සමහර කාරණා ඇත්ත. යම් මිනිට් එකක් දැම්මම, ඒ මිනිට් එකට අදාළව ඒ කටයුත්ත ඒ ආකාරයට නොකෙරෙන

පමාවක් තිබෙනවා. ඒක ඉදිරියේදි වෙනස් කරගැනීමට මැදිහත් වෙන්න ඕනේ. ඒවගේම පාසලේ ගේට්ටුව සම්බන්ධයෙන් ඔබතුමා කිව්වා වගේ ප්‍රශ්නයක් තිබෙනවා. නීත්‍යානුකූල විදිහට ප්ලෑන් එකක් දාලා ඒ ප්ලෑන් එක අදාළ නීතිමය තත්ත්වය ඇතුළේ නිර්දේශ කරපුවම අනුමත කරන්න වෙනවා. ඒ අනුමත කිරීමෙන් පසුව වුනත් මම දිගටම ප්‍රශ්න කළා, නතර කරලා තිබුණා. නමුත් ඔබ දන්නවා යූ.ඩි.එක සතු බලයක් මේ තියෙන්නේ. මම එතනදි අවසාන වශයෙන් ප්‍රශ්න කෙරුවේ දරුවන්ගේ අනතුරදායක තත්ත්වය පිළිබඳව. මෙය වෙනස් කරනවා නම් වෙනස් කළ හැක්කේ දරුවන්ගේ ප්‍රශ්නය තුළ. ඒ කටයුත්ත නැවත හිතමින්, කල්පනා කරමින් ඉන්නවා. සාකච්ඡා කරමින් ඉන්නවා. එතන පෞද්ගලික ප්‍රශ්න ගණනාවක් තිබෙනවා. ඒ පෞද්ගලික ප්‍රශ්න ටිකත් මේකට ඇදිලා තිබෙන්නේ. ඒ සියල්ල බේරලා දැම්මට පස්සේ දරුවන්ට තිබෙන අනතුර වලක්වා ගැනීම වෙනුවෙන් ඉදිරියේදී ක්‍රියාමාර්ගයක් ගත යුතුව තිබෙනවා කියන හැඟීමක් මා හට තිබෙනවා.

04. **ප්‍රශ්න** - නැත

05. **යෝජනා** -

05(01) මහා නගර සභා මන්ත්‍රී ඩී.සමන්ත සිල්වා මහතා විසින් කල් දී ඇති යෝජනාව සභාවට ඉදිරිපත් කරන ලදී.

මොරටුව මහා නගර සභා සීමාව තුළ ජීවත්වන ජනතාවට මරණ කටයුතු සිදු කරගත යුතු අවස්ථාවන්වල තමන්ගේ නිවෙස්වල එම කටයුතු කර ගැනීමට නොහැකි අවස්ථාවන් තුළදි ඔවුන්ට පෞද්ගලික මල්ශාලාවලට යාමට සිදුවනු ඇත. මෙහිදි එම ජනතාව මූල්‍යමය වශයෙන් දැඩි ලෙස අපහසු අවස්ථාවන්ට මුහුණදීමට සිදුවනු ඇත. මෙම තත්ත්වයන්ගෙන් ජනතාව මුදවා ගැනීම සඳහා අප සභාව මගින් පාලනය වන රාවතාවත්ත පොදු සුසාන භූමියේ ඉදිරිපස ඇති හිස් ඉඩම් කොටසේ දේහයන් තැන්පත් කිරීම සඳහා වර්ථමානයට ගැලපෙන පරිදි මල්ශාලාවක් ඉදිකර යම් සහනදායි මිලකට අප මොරටුව ජනතාවට මරණ කටයුතු කරගැනීමට ලබාදිය යුතුයැයි මෙම ගරු සභාවට යෝජනා කර සිටින්නීය.

මහා නගර සභා මන්ත්‍රී ඩබ්.සුරේෂ් ප්‍රේමකුමාර මහතා විසින් යෝජනාව ස්ථිර කරන ලදි.

අංක 05(01) යෝජනාව ඒකමතිව සභා සම්මත විය.

<u>**ගරු නගරාධිපති - කේ.ඩී.නිශාන්ත ප්‍රදීනාන්දු මහතා**</u>

ගරු මහා නගර සභා මන්ත්‍රීතිවරුනි, 05(01) යෝජනාව ඉදිරි කටයුතු සඳහා කර්මාන්ත හා ඉදිකිරීම් පිළිබඳ ස්ථාවර කමිටුවට යොමු කරනවා.

05(02) මහා නගර සභා මන්ත්‍රී පී.එම්.ෂෙයාන් දුලිප් තිසේරා මහතා විසින් කල් දී ඇති යෝජනාව සභාවට ඉදිරිපත් කරන ලදී

මළල ක්‍රීඩාව තුළින් ජාත්‍යන්තර, ජාතික හා පළාත් ජයග්‍රහණ ලබාගත් මොරටුවේ ක්‍රීඩකයන් සහ ඔවුන්ගේ පුහුණුකරුවන් හට ද සොයිසා ක්‍රීඩාංගණයේ නොමිලයේ පුහුණුවීම් කටයුතු කිරීමට ඉඩ

අවකාශය ලබා දෙන ලෙසත්, දැනටමත් ජාත්‍යන්තර සහ ජාතික මට්ටමේ සහ පළාත් මට්ටමේ නියෝජනය කරන ක්‍රීඩකයන් මොරටුවේ සිටින බව සතුටට කරුණක්. අප මොරටුව මහ නගර සභාව මගින් එම ක්‍රීඩකයන්ට නොමිලයේ පුහුණුවීම් කටයුතු කර ගැනීමට ඉඩ සලස්වා දුනහොත් ඉදිරියේදී පැවැත්වෙන තරග තුලින් ජයග්‍රහණ ලබා මොරටුවේ නාමය බැබලවීමට මෙම ක්‍රීඩකයන් හට හැකි බව මම තරයේ විශ්වාස කරමි. මෙයට අවශ්‍ය කරන කටයුතු සලසා දෙන මෙන් මෙම ගරු සභාවට යෝජනා කර සිටින්නීය.

මහා නගර සභා මන්ත්‍රී බී.සජිත් දුමින්ද පීරිස් මහතා විසින් යෝජනාව ස්ථීර කරන ලදි.

<u>මහා නගර සභා මන්ත්‍රී - පී.එම්.ෂෙයාන් දුලිප් තිසේරා මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, මලල ක්‍රීඩාව තුළින් මොරටුවේ ක්‍රීඩකයන් බොහොමයක් බිහිවෙලා තිබෙනවා. ඒ බොහොමයක් ක්‍රීඩකයෝ ද සොයිසා ක්‍රීඩාංගණයේ පුහුණුවීම් කටයුතු කරලා තිබෙන අය. බස්නාහිර පළාත නියෝජනය කරන ක්‍රීඩකයන්ට හරි මෙම ක්‍රීඩාංගණය නොමිලේ පුහුණුවීම් සඳහා ලබාදීමට කටයුතු කරන්න කියලා ඉල්ලා සිටිනවා.

<u>මහා නගර සභා මන්ත්‍රී - එම්.ප්‍රියනාත් මැකන්සි මැන්දිස් මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, මීට වසර ගණනාවකට පෙර මම මෙම සභාවට යෝජනා කරලා, එවැනි ක්‍රීඩකයෙක් විදෙස්ගත වන්නේ නම් මොරටුවේ වරිපනම් බදු ගෙවන පවුලක නම් රු.5000/-ක මුදලක් ගෙවන්න සභාවෙන් තීරණය කරලා තිබ්බා. මම හිතන්නේ අපි එවකට ක්‍රියාත්මක කරපු යෝජනාවත් මේකටම සම්බන්ධ කරලා එවැනි සහභාගිත්වයක් නියෝජනය කරන්නේ නම් එය කටයුත්තත් කරන්න කියන කියලා මම මෙම සභාවෙන් ඉල්ලා සිටිනවා.

<u>මහා නගර සභා මන්ත්‍රී - බී.සජිත් දුමින්ද පීරිස් මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, ෂෙයාන් මන්ත්‍රීතුමා ඉදිරිපත් කරපු යෝජනාවත් සමඟ අපේ මොරටුව මහා නගර සභාව පැත්තෙනුත් ගත්තම දක්ෂ ක්‍රීඩකයන් බිහිවන තැනක්. අපි මීට පෙරත් කතා කළා බයිසිකල් ධාවන තරගය සඳහා සුවිශේෂ ක්‍රීඩකයන් මේ මොරටුව මහා නගර සභාව සතුව ඉන්නවා. අපේ ක්‍රිකට් කණ්ඩායමත් මේ වන විට වෙළඳ සේවා අවසන් මහා තරගය සඳහා තේරී පත්ව තිබෙනවා. මොරටුව කියන්නේ දක්ෂ ක්‍රීඩකයන් බිහිවුණ තැනක්. මීට පෙර පැවතුණු පාලනය වගේම ඔබතුමත් සභාව පැවැත්වුණු මුල්ම දවසේ මලල ක්‍රීඩකයන් කිහිප දෙනෙකු කැඳවලා සම්මානයෙන් පිදුම් ලැබුවා. අපි ඔවුන්ව අගේ කළා. ගරු නගරාධිපතිතුමනි, අද වන විටත් මේ සභා සීමාව තුළ ජාතික මට්ටමට, ජාත්‍යන්තර මට්ටමට යන්න පුළුවන් ක්‍රිකඩයින් අපට පෙනෙන මානයේ එම නිසැක හැකියාවන් පෙන්නලා තිබෙනවා. අපට හෙල්ල විසි කිරීමට රොමේෂ් තරංග වගේම, යක්ගුලිය විසික් කිරීමේ දක්ෂයෙක් ඉන්නවා එගොඩඋයන ධර්ම බන්දු මාවතේ. නලින්ද සිල්වා ඔහුගේ පියා. ඔහු ඉතාම දක්ෂයෙක්. අවුරුදු 16, 17 වෙන කොට ඔහු එම රෙකෝඩ් එක කඩලා තියෙනවා. අපට මෙය නියාමනය කරලා යමක් කරන්නට පුළුවන්කමක් ලැබුනොත් ඉතාම වැදගත්. විශේෂයෙන් මම මතක් කරනවා අපේ ෂෙයාන් මන්ත්‍රතුමත් යෝජනා කරපු, මීට පෙර ක්‍රීඩකයෙක් සිටියා ඔහු අවස්ථා ගණනාවකදි ශ්‍රී ලංකා යුධ හමුදාව නියෝජනය කරලා 21න් පහළ, 17න් පහළ තරඟ වලදි ලංකා පළවෙනියා වුණ එක පිට අට වතාවක්. ඔහුත් සමඟ තරඟ කළ සුජානි ක්‍රීඩිකාව ඔලිම්පික් මට්ටමට වඩා විනාඩි අටකින් ඇය තරගය නිම කළා. ගරු නගරාධිපතිතුමනි, මේ වන විට මොරටුවේ සිටින ක්‍රීඩක ක්‍රීඩිකාවන්ගේ පෝෂණ මට්ටම් ඉතා අඩු මට්ටමක තිබෙන්නේ. උපකරණ මට්ටමින් ගත්තම ඉතා අඩුම මට්ටමක තිබෙන්නේ.

විශේෂයෙන් මට මේ වෙලාවේ සතුටුයි ෂෙයාන් දක්ෂයෙක් වෙලා ඉන්නකොට මම මන්ත්‍රිවරයෙක්. ඔහු කිව්වා, අයියේ මට ඊළඟ තරගයට යන්න තියෙනවා මට බුට්ස් දෙකක් ඕනේ කියලා. මම කිව්වා මල්ලි මම මේක කොහොම හරි අරන්දෙනවා කියලා. ඒ කාලේ වෙනකොට රු.57000/-ක් පමණ වටින කට්ටලයක්. ඔහු බොහොම කෘතවේදී තරුණයෙක්. ඔහු එම තරගය ජයග්‍රහණය කරලා ආවට පස්සේ ඔහු, ඔහුට පුළුවන් විදිහට අනිත් ක්‍රීඩකයන්ටත් උදව්පදව් කළා. ඒ නිසා මම හිතන්නේ මේක අපේ වගකීමක්. එය ඉටුකල යුතුයි. ඒවගේම මේ යෝජනාව යටතේම අපට උදව් කරන මිනිසුන්ට අපි කෘතවේදී වෙන්න ඕනේ. ඔබතුමා දන්නවා අපේ අජිත් කුරේ මහතා. පසුගිය කාලේ අපේ ක්‍රිකට් කණ්ඩායමට උපකරණවල අඩුවක් තිබුණා. එතුමා අපව මුණගැහෙන්න පැමිණි අවස්ථාවක මා විසින් මෙහෙම අඩුපාඩු වගයක් තියෙනවා කියලා කිව්වම, මල්ලි ටීම් එකට එන්න කියන්න කිව්වා. එතුමා විසින් ලක්ෂ දෙකහමාරක පමණ උපකරණ අපේ මොරටුව නගර සභා කණ්ඩායමට ලබාදීලා තිබුණා. එමනිසා එවැනි උදව් උපකාර කරන මිනිසුන් සම්බන්ධ කරගෙන අපි මෙය ප්‍රවර්ධනය කළ යුතුයි. එහෙම වුනොත් ජාතික මට්ටමේ, ආසියානු මට්ටමේ, ඔලිම්පික් මට්ටමේ සිහින අපට යථාර්ථයක් කරගන්න පුළුවන්.

අංක 05(02) යෝජනාව ඒකමතිව සභා සම්මත විය.

<u>ගරු නගරාධිපති - කේ.ඩී.නිශාන්ත ප්‍රදීනාන්දු මහතා</u>

ගරු මහා නගර සභා මන්ත්‍රීතිවරුනි, 05(02) යෝජනාව ඉදිරි කටයුතු සඳහා ක්‍රීඩා කටයුතු හා පොදු විනෝද කටයුතු පිළිබඳ ස්ථාවර කමිටුවට යොමු කරනවා.

05(03) මහා නගර සභා මන්ත්‍රී ඩබ්.සුරේෂ් ප්‍රේමකුමාර ප්‍රනාන්දු මහතා විසින් කල් දී ඇති යෝජනාව සභාවට ඉදිරිපත් කරන ලදී.

පී.එස්.ඩග්ලස් ප්‍රනාන්දු මහතා මොරටුව මහා නගර සභාවේ නගරාධිපති හා උප නගරාධිපති ලෙසින් මොරටුව ප්‍රදේශයේ නාගරික සංවර්ධනය, යටිතල පහසුකම් නැංවීම සහ ප්‍රදේශවාසීන්ගේ පොදු සුභසාධන කටයුතු වෙනුවෙන් පුරෝගාමීව වැඩකටයුතු කළ නායකයෙකි. නමුදු මේ වන විට ඔහුගේ නාමය පවා මොරටුවෙන් වියැකී යන තත්වයක් පෙනෙන්නට තිබෙයි.

අතීතයේ මොරටුව නගර සභාවේද ඔහුට ගරු කිරීමක් ලෙස ඔහු විසූ ඉදිබැද්ද ප්‍රදේශයේ පාරක් ඔහු නමින් නම් කිරීම පිළිබඳව සාකච්ඡා කල බවට ආරංචි ඇතත් එය ක්‍රියාත්මක වී නොතිබිණි.

ඔහු නමින් ඉදිබැද්ද ක්‍රීඩාංගණය ඩග්ලස් ප්‍රනාන්දු ක්‍රීඩාංගණය නමින් නම් කරනු ලැබූ නමුත් මේ වන විට අඩුම තරමේ ඒ බව සඳහන් නාම පුවරුවක් පවා ඇත්තේ නැත.

මේ නිසාම මෙදා දේශපාලනයේ සිටින්නෝ බොහෝ දෙනෙක් එයට අත් පොත් තැබූ ඉතිහාසයේ අමරණීය චරිතයක් වූ ඩග්ලස් ප්‍රනාන්දු මහතා නමින් ඉදිබැද්ද ප්‍රදේශයේ පාරක් හෝ මාවතක් නම් කරනා ලෙසත්,

බොහෝ කලක් නොමැතිව තිබෙනා ඩග්ලස් ප්‍රනාන්දු ක්‍රීඩාංගණයේ ඔහුගේ නමින් වන නාම පුවරුවක් ඔහුගේ අභිමානය රැකෙනා පරිදි සවි කරමින් කෘතගුණ දක්වනා ලෙසත් මෙම ගරු සභාවට යෝජනා කර සිටින්නීය.

මහා නගර සභා මන්ත්‍රී එම්.ප්‍රියනාත් මැකන්සි මැන්දිස් මහතා විසින් යෝජනාව ස්ථීර කරන ලදි.

<u>මහා නගර සභා මන්ත්‍රී - ඩබ්.සුරේෂ් ප්‍රේමකුමාර ප්‍රනාන්දු මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, ඩග්ලස් ප්‍රනාන්දු මහත්මයා කියන්නේ මොරටුව මහා නගර සභාවේ හිටපු නගරාධිපතිවරයෙක්, උප නගරාධිපතිවරයෙක්. මොරටුව ප්‍රදේශයේ නාගරික සංවර්ධන කටයුතු, යටිතල පහසුකම් හා සුභසාධන කටයුතු බොහොමයකට අතහිත දීලා වැඩ කරපු නායකයෙක්. ඔහු මිය ගිහිල්ලා මෙම වසර වෙනකොට අවුරුදු 40ක් වෙනවා. ඔහු මිය යන අවස්ථාවේදි ඔහුට අඩුම තරමේ බැංකු පොතක්වත් තිබුණේ නෑ. ඔහු රටට ගමට සේවයේ කළේ ඔහුගේ හෘද සාක්ෂියට අනුව හදවතින්ම. ඔහුගේ නාමය රැකෙන විදිහට ඔහු වෙනුවෙන් ඔහුගේ ගමේ අපි යම්කිසි දෙයක් කළ යුතුයි. ඔහු වෙනුවෙන් ඔහුගේ ගමේ ඔබතුමා සුදුසු පාරක් හොයලා ඔහුගේ නමින් නම් කරන්න පුළුවන්නම්, ඩග්ලස් ප්‍රනාන්දු ක්‍රීඩාංගණයේ නාම පුවරුවත් නෑ. මම අවුරුදු තුන හතරකට කලින් ග්‍රවුන්ඩ් එකට ගිය අවස්ථාවේ පිරිසක් ග්‍රවුන්ඩ් එක කෙළවරේ මදින මැෂින් තියාගෙන මදිනවා. එහා පැත්තේ ත්‍රිවිල්, වාහන ගරාජ් එකක් දාලා මදිනවා. මමත් වාහනයේ ගිහිල්ලා ලොකු අමාරුවක වැටුනා. ගේට්ටුව වහලා. මට එය උස්සගන්නත් බෑ, වාහනය රිවස් කරන්නත් බෑ, මම පොඩ්ඩක් ගිහිල්ලා බලලා මේ ගේට්ටුව නම් වහන්න ඕනා යැයි කියනකොටම ගරාජ් එකේ පුද්ගලයා මට ඇවිල්ලා කියනවා එහෙම කාටවත් ඕන විදිහට මෙතන වැඩ කරන්න දෙන්නේ නෑ මේවා අපේ දේවල් කියලා හයියන්කාරකමක් දැම්මා. ඉන්පසුව එම පුද්ගලයාම මට උදව් කළා මට වාහනය හරවගන්න. එයා ළඟ සිස්ටම් එකක් තියෙනවා ඒක අරින්න. ගරු නගරාධිපතිතුමා එතන අප සභාව සතු දේපළක් අවභාවිතා වෙන්නේ. දොරවල් ඇරලා. මම පල්ලේහාට ගියා, තිලකසිරි මන්ත්‍රීතුමා කිව්වා වගේ වොලිබෝල් කෝඩ් ගලවලා කෙළවරක සවිකරලත් තියෙනවා. නමුත් මම හිතන්නේ එය එච්චර සාර්ථක නෑ කියලා. එතන පස් ටිකක් බුරුල්. මම ඔබතුමාට යෝජනා කරන්නේ පුළුන්නම් ඩගලස් ප්‍රනාන්දු ක්‍රීඩාංගණයේ පුවරුවවත් සවිකරලා දෙන්න කියලා. ඒවගේම පුවක්අරඹේ ඉදලා පහළ ඉදිබැද්ද පාර ඩග්ලස් ප්‍රනාන්දු මාවත නමින් නම් කරන්න කියලා මම ඔබතුමාගෙන් ඉල්ලීමක් කරනවා.

අංක 05(03) යෝජනාව ඒකමතිව සභා සම්මත විය.

<u>ගරු නගරාධිපති - කේ.ඩී.නිශාන්ත ප්‍රදීනාන්දු මහතා</u>

ගරු මහා නගර සභා මන්ත්‍රීතිවරුනි, 05(03) යෝජනාව ඉදිරි කටයුතු සඳහා කර්මාන්ත හා ඉදිකිරීම් පිළිබඳ ස්ථාවර කමිටුවට යොමු කරනවා.

05(04) මහා නගර සභා මන්ත්‍රී ඩබ්.සුරේෂ් ප්‍රේමකුමාර ප්‍රනාන්දු මහතා විසින් කල් දී ඇති යෝජනාව සභාවට ඉදිරිපත් කරන ලදී.

මොරටුව ප්‍රදේශයේ මේ වන විට සියලු මාර්ග හා මාවත් හි රැයෙහි පමණක් නොව දහවලෙහිද යාමට නොහැකි තරමටම සුනඛ ගහනය දැඩිවී ඇති අතර මෙම වීදි සුනඛයින් සපා කෑම නිසා අනතුරට පත්වූ පිරිසද බොහෝය. මේ නිසාම වාහන අනතුරු සිදුවීමද විශේෂයෙන් මෝටර් සයිකල් හා ත්‍රීරෝද රථ පසුපස මෙම සුනඛයින් හඹා ඒම නිසා ඉන් ජනතාව ලබනා පීඩාව සුලු පටු නොවේ.

මෙම ජන පීඩාවන්ට සෘජුවම මොරටුව මහා නගර සභාව වගකිව යුතු බවට ජනතාව අතර ඇති මතයද බැහැර කල නොහැක්කේය. එසේම මාරාන්තික රෝගී තත්වයක් වූ සුනඛයින් සපා කෑම නිසා ඇතිවිය හැකි ජල භීතිකා රෝගී තත්වයටද මෙම සුනඛ ගහණය හේතුවී තිබෙයි.

මොරටුව මහා නගර සභාවෙන් මේ වෙනුවෙන් මුදල් වෙන්කොට සුනඛයින් වන්ධ්‍යාකරණයට ලක්කිරීම හා එන්නත් කිරීම සිදුකරනා නමුත් ලක්ෂ ගණනින් එසේ මුදල් වෙන් කලද එයින් නිසි පල ලැබී නැති බව මෙදා සුනඛ ගහණය වැඩි වීම දෙස බලද්දි පෙනී යයි.

මේ නිසාම වීදි සුනඛයින් නිසා වන මෙම ජන පීඩනය දුරුකර දැමීමට මෙම සුනඛ ගහණය පාලනයට නව ක්‍රමවේදයක් ඇති කරමින් ප්‍රදේශයේ සත්ව ආරක්ෂණ සංවිධාන හා මේ පිළිබඳව උනන්දුවක් දක්වන සමිති සමාගම් එක්රැස් කරවමින් මොරටුව මහා නගර සභාවෙන් ක්‍රියාත්මක වන එම වඩසටහන් නිසියාකාරව අධීක්ෂණයකින් ක්‍රියාත්මක කරනා ලෙසත් සුනඛ ගහණය අවම කිරීමට නව ක්‍රමවේදයක් අනුගමනය කිරීමට ඒ වෙනුවෙන් නගරාධිපතිවරයා ප්‍රමුඛ කමිටුවක් පත් කරනා ලෙසත් මෙම ගරු සභාවට යෝජනා කර සිටින්නීය.

මහා නගර සභා මන්ත්‍රී එම්.තිලකසිරි ප්‍රනාන්දු මහතා විසින් යෝජනාව ස්ථිර කරන ලදි.

<u>මහා නගර සභා මන්ත්‍රී - ඩබ්.සුරේෂ් ප්‍රේමකුමාර ප්‍රනාන්දු මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, අපි ගිය වසරෙත් විශාල මුදලක් සභාවෙන් වෙන්කළා සුනඛ ගහණය අඩුකිරීම සම්බන්ධව. අපිට එසේ විශාල මුදලක් ලැබුණත්, අපි වෙනත් ආයතනත් එකතු කරගෙන මෙම කාර්යය කළ යුතුයි. මේ වන විට සුනඛ ගහණය ඉතා විශාලයි. බයිසිකල් එකක යන්න බෑ. ත්‍රිවිල් එකක යන්න බෑ පස්සෙන් එලවගෙන එනවා. ගරු නගරාධිපතිතුමා, සුනඛයෙක් සපා කෑම නිසා තමයි මගේ පියා මියයන්නේ. ඇත්ත කතාව නම් මම පොඩි කාලේ ඉඳන්ම බල්ලන්ට බයයි. මගේ ගෙදර මම බල්ලෙක්වත් හදන්නේ නෑ. එන්න දෙන්නෙත් නෑ. තාත්තා විදපු දුක මම දැක්කා. මේ දවස්වල පායනවා. රස්නේ වැඩී. මේ කාලෙදි තමයි බල්ලන්ට ජලභීතිකා රෝගය හැදෙන්නේ. අපි සභාව වශයෙන් එකතු වෙලා, තවත් ආයතන කිහිපයක් සහභාගී කරගෙන සුනඛ ගහනය අඩු කිරීමට උනන්දුවෙන් කටයුතු කළ යුතුයි.

<u>මහා නගර සභා මන්ත්‍රී - ඒ.එච්.සුරේෂ් ඉන්දික මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, අපේ සුරේෂ් ප්‍රේමකුමාර ගරු මන්ත්‍රීතුමා ඉතාමත් කාලෝචිත යෝජනාවක් ඉදිරිපත් කළේ. මොරටුව පුරා සුනඛ ගහණය අධික වීමෙන් ජනතාව බරපතල පීඩාවකට පත්වෙන වෙලාවක්. ඉතාමත් ප්‍රමුඛතාවයක් ලෙස සලකලා මෙම ගැටලුවට මැදිහත් වෙන්න ඕනේ. මක්නිසාද, ගරු මන්ත්‍රීතුමා ඉතාමත් හැගුම්බරව ප්‍රකාශ කළා එතුමාගේ පියාගේ අභාවය සිදුවුනෙත් සුනඛයකු නිසා කියලා. මම හිතනවා මෙම සුනඛ ගහණය අධික තැන් තියෙනවා. උදාහරණයක් ලෙස මම දන්නා තැන් ගත්තොත් අගුලාන හංදිය, සොයිසාපුර. ඊට අමතරව තවත් තැන් කිහිපයක මම යන එන අතරේ දකිනවා. මේ කියන කාරණා සත්‍යයි. රාත්‍රී කාලයේ බයිසිකලයකට යන්න බෑ. ත්‍රිවිල් එකකට යන්න බෑ. බල්ලෝ පනිනවා සපා කන්න. එමනිසා මෙම යෝජනාව සරල කාරණාවක් නොවන නිසා හැකි ඉක්මණින් ක්‍රියාවට නංවන්න අවශ්‍ය කරන මැදිහත්වීම කරන්න.

<u>මහා නගර සභා මන්ත්‍රී - එච්.වන්දන පී.චිතානගේ මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, සුරේෂ් ප්‍රේමකුමාර මන්ත්‍රීතුමා ඉදිරිපත් කරපු යෝජනාව ඉතාමත් කාලෝචිත යෝජනාවක් ලෙස මම දකිනවා. මහා නගර සභා ආඥා පනතේ 96 වන වගන්තිය ප්‍රකාරවත් මහා නගර සභාවක් පොදු මහජන සෞඛ්‍ය සම්බන්ධ අධිකරිය විය යුත්තේය යනුවෙන් තමයි සඳහන් වෙන්නේ. මොරටුව පුරවැසියාගේ මහජන සෞඛ්‍ය ආරක්ෂා කිරීමේ ප්‍රමුඛ වගකීම

මොරටුව මහා නගර සභාව සතු වෙනවා. ජලභීතිකා රෝගය ශ්‍රී ලංකාව පුරා ව්‍යාප්තවීමේ අවධානම සම්බන්ධයෙන් අපට මාධ්‍යය වලින් පවා දැකගැනීමට ලැබෙනවා. විශේෂයෙන් බල්ලා හා පූසා ප්‍රමුඛ ක්ෂීරපායි සතුන්ගෙන් තමයි මෙම ජලභීතිකා රෝගය ව්‍යාප්ත වෙන්නේ. මෙම රෝගයෙන් අපේ පුරවැසියන් ආරක්ෂා කරගැනීමේ වගකීමට අපි බැඳී සිටිනවා. මෙම එන්නත් කිරීමේ සහ වන්ධ්‍යාකරණය කිරීමේ වැඩපිළිවෙල විද්‍යාත්මක ක්‍රමවේදයක් තුළින් ක්‍රියාත්මක නොකළ හොත් අපේක්ෂිත ප්‍රතිඵල ලබාගැනීමට කිසිසේත්ම හැකියාවක් ලැබෙන්නේ නෑ. එමනිසා අපි ක්‍රියාත්මක කරන වැඩපිළිවෙල විද්‍යාත්මක විය යුතුයි. විශේෂයෙන් ගෘහස්ථ හා වීථි ලෙස බල්ලන් හා පූසන් හඳුනාගත යුතුයි. විශේෂයෙන් වීථි සුනඛයින් එන්නත්කරණයේදි බහුතරයකට එන්නත්කරණය සිදුවුණේ නැතිනම් අපේක්ෂිත ප්‍රතිඵලය ලැබෙන්නේ නෑ. ගරු නගරාධිපතුමනි, මෙය මාරාන්තික රෝගයක්. මෙම රෝගය වැළඳුනහොත් මරණයෙන් කෙළවර වෙන්නේ. එමනිසා මෙම තත්ත්වය තේරුමේ ගෙන අපි මේ මොරටු පුරවරය තුළ ජලභීතිකා රෝගය තුරන් කිරීම සඳහා විද්‍යාත්මක වැඩපිළිවෙලක් මෙම යෝජනාව හරහා සකස් කරමු කියන ඉල්ලීම කරනවා.

<u>මහා නගර සභා මන්ත්‍රී - එම්.තිලකසිරි ප්‍රනාන්දු මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, සුරේෂ් ප්‍රේමකුමාර මන්ත්‍රීතුමා ඉදිරිපත් කරපු යෝජනාව සම්බන්ධයෙන් කතා කරනවිට මෙය කාලයක් තිස්සේ තිබෙන ගැටලුවක්. අද ඊයේ ඇතිවුණ දෙයක් නෙමෙයි. මෙම ගැටලුව නිසා ජනතාව විශාල පීඩාවකට ලක්වෙලා තිබෙන්නේ. මෙහි එක් අවසථාවක් ලෙස අපි දකිනවා ගෙවල්වල ඇති කරන බොහෝ සුනඛයින් කුඩා කාලයේ කැමැත්ත හා ආදරය නිසා අරගෙන යනවා. නමුත් මෙම සතා ලොකු වෙනකොට පැටවුන් බෝකරන අවස්ථාවේ උන්ව එළියට දාන තත්ත්වයක් තමයි තිබෙන්නේ. මේ නිසා තමයි පාරවල් වල මෙම ප්‍රශ්ණය ගොඩක් ඇතිවෙලා තිබෙන්නේ. එමනිසා අපේ පැත්තෙන් කිසියම් දැනුවත් කිරීමක් හෝ කරන්න. ඇත්තටම පාර ගමන් කරන කෙනෙකුට පාරේ යන්න අමාරු තත්ත්වයක් තමයි තිබෙන්නේ. මෙතුමා කියන දේ හරියි. අපේ ඉදිබැද්දේ එකපාරක ඉන්නවා සත්තු පනහක් හැටක් විතර. පොඩි දරුවන්ට පාසල් යන්න විදිහක් නෑ. සතා පැටව් දාපු ගමන් උගේ සතුන් ආරක්ෂා කරගැනීමට පාරේ යන කෙනාව තමයි සපා කන්නේ. මේ පිළිබඳව මිනිසුන්වත් දැනුවත් කළ යුතුයි. කුඩා කාලයේදි පමණක් අයිතිකාරයෙක් ඉන්නවා, සතුන් බෝකරන අවස්ථාවේ අයිතිකාරයන් නොමැති තත්ත්වයට පත්වෙනවා. එමනිසා ගරු නගරාධිපතිතුමනි, මේ සම්බන්ධව ඔබතුමාගේ අවධානය යොමු කරලා සභාවක් හැටියට තීරණයක් ගන්න කියලා ඉල්ලා සිටිනවා.

<u>මහා නගර සභා මන්ත්‍රී - බී. සජිත් දුමින්ද පීරිස් මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, සභාවක් විදියට අපිට ප්‍රධාන වශයෙන්ම මම විශ්වාස කරන සිරෝ කරන්න ඕන ප්‍රධාන කාරණා 03ක් තියෙනවා. එකක් තමයි සිරෝ රෙබියස්. ජලභීතිකාව ශූන්‍ය කිරීම නගර සභාව සතු වගකීමක්. අනෙක් එක සීරෝ වේස්ට්. කසළ ශූන්‍යකරණය. අනෙක් එක තමයි සිරෝ ඩෙංගු. ඩෙංගු ශූන්‍ය කරන එක. ඒ නිසා ගරු නගරාධිපතිතුමනි, මේ සමාජ විද්‍යාත්මක කාරණා 03 කිවුව විදියට මේ සමාජය ගිලගෙන තියෙන විදියට අපේ නගර සභාව පැත්තෙන් ඒකට ප්‍රවේශයක් විදියට මම මීට පෙරත් කතා කළා මොරටුව මහා නගර සභාවේ පශු වෛද්‍ය අංශය මේ වනවිට හොඳ මට්ටමකින් ක්‍රියාත්මක වෙනවා. ගරු නගරාධිපතිතුමනී. මේ වැඩසටහනට ප්‍රවිශ්ඨ වෙන්න අපිට ආරම්භ කරන්න ඕන තැන අපි හොඳින් වටහා ගත යුතුව තියෙනවා. ඒ නිසා ගරු නගරාධිපතිතුමනි, මේ වනවිට පශු වෛද්‍ය අංශයේ මම මීට පෙරත් කතා කළා. මම විශ්වාස කරනවා ඔබතුමන්ලාත් මේ වෙනුවෙන් විශාල මැදිහත් වීමක් කරනවා කියලා

මම විශ්වාස කරනවා. ඒ තමයි ගරු නගරාධිපතිතුමනි, නගර සභාවේ අපේ පශු වෛද්‍ය අංශයේ තියෙන යම් යම් අඩුපාඩු ඒ කියන්නේ මේ ජලභීතිකාව වෙනුවෙන් ගෙනෙන එන්නත් අපිට ගබඩා කරන්න තියෙන ඩීෆ්‍රිසර් එක දැන් කැඩිලා. මම එදා කිවුවා අපිට ජලභීතිකාවට බල්ලාට එන්නත් ගහන්න ගිය මනුස්සයාට හදිස්සියේවත් මේ ෆ්‍රිජ් එකේ හරි වැදිලා තුවාල උනොත් පිටගැස්මටත් බෙහෙත් ගහන්න වෙනවා. ඒ නිසා ගරු නගරාධිපතිතුමනි, අපි අපේ මේ හොඳින් තියෙන පශු වෛද්‍ය අංශය වඩාත්ම අඩුපාඩු ටික හදලා, ඒත් එක්කම ජෙනරේටර් එකක අවශ්‍යතාවය එතුමිය කියලා තිබුණා. ඒ නිසා මම හිතන්නේ ඔබතුමන්ලාගේ පැත්තෙනුත් සභාවක් විදියට අපි අපේ පැත්තෙනුත් එකතු වෙලා මහජන නියෝජිතයෝ විදියට නගරාධිපතිතුමාගේ මැදිහත් වීමෙන් සහ මේ සෞඛ්‍ය කමිටුව පැත්තෙන් ලොකු මහන්සියක් වෙලා ඒ යෝජනාව ක්‍රියාත්මක කරන්න කැමති වෙලා තියෙන අවස්ථාවේ සැපයුම් අංශයේ අඩුපාඩුවක් තියෙනවානම් ලබන සභා වාරයට ඉස්සෙල්ලා අපි මේක විසඳගමු. එතකොට මේකේ පළවෙනි එක විසඳෙනවා.

ගරු නගරාධිපතිතුමනි, අනෙක් කරුණ තමයි විශේෂයෙන් ඕනම ආණ්ඩුවක් ඕනම පක්ෂයක් ගේන හොඳ යෝජනා නරක විදියට බලන්න අදහස් කරන්නේ නැහැ. ඒ වගේම 2017 ගෙනාපු චක්‍රලේඛයක් තියෙනවා මේ සම්බන්ධයෙන් ඒක මේ ආණ්ඩුව ක්‍රියාත්මක කරන්න පටන් අරගෙන තියෙනවා. ඒක හොඳ දෙයක් ඒ නිසා ගරු නගරාධිපතිතුමනි, ඒක මේ චක්‍රලේඛත් එක්ක ගනිද්දි මේ රේබිස් අඩු කරන්න නීතිය පැත්තෙන් තියෙන ඒ ක්‍රියාවලිය අපි මින් ඉදිරියට ගෙනියන්න ඕන මහා නගර සභා ආඥා පනතෙන් චන්දන මන්ත්‍රීතුමා මතු කරපු විදියට. ඒ වගේම ගරු නගරාධිපතිතුමනි, අපේ කොට්ඨාස මට්ටමින්, කොට්ඨාස තියෙනවා 29ක්. ග්‍රාමසේවා වසම් 42ක් තියෙනවා ඒ නිසා මෙහිදි අපිට කරන්න පුලුවන් දෙයකුත් මෙහි තියෙනවා. ඒ තමයි ගරු නගරාධිපතිතුමනි, උදාහරණයක් විදියට මම අපේ පශු වෛද්‍යතුමියත් එක්ක එකතු වෙලා රුපියල් එකසිය ගානයි බල්ලෙකුට ගෙවන්න තියෙන්නේ, ඒ වගේම ඒ බල්ලෝ කිහිපදෙනෙක් අල්ලගෙන මම සීරෝ රේබියස් කියන වැඩසටහන යටතේ මම සල්ලි දීලා ඒ බල්ලන්ට ඉන්ජෙක්ෂන් ගැස්සුවා. ඒ වගේම මේ මන්ත්‍රිවරුන්ටත් එක කරන්න පුලුවන්. ඒ නිසා මේක අපි ගරු නගරාධිපතිතුමනි, අර සමහරක් තැන්වලදී තියෙන රැල්ල, ඒ රැල්ල හැදුවා වගේ, ඒ රැල්ල හදන්න මම මූලික වුණා. ඒ නිසා මේ රේබියස් රැල්ල සීරෝ රේබියස් රැල්ලක් අපිට හදන්න පුලුවන්. ඒ අනුව ගරු නගරාධිපතිතුමනි, අර කිවුව රේබියස් රැල්ල, සීරෝ ඩෙංගු හා සීරෝ වේස්ට් මේ සංකල්පය මොරටුව මහා නගර සභාවේ පූර්වාදර්ශයක් කරගෙන රටට ම ආදර්ශයක් දෙන රැල්ලක් විදියට ජලභීතිකාවෙන් තොර ග්‍රාමසේවා වසමක්, ජලභීතිකාවෙන් තොර කොට්ඨාසයක්, ජලභීතිකාවෙන් තොර මොරටුවක් හදන්න අපි කටයුතු කරමු කියලා ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා.

අංක 05(04) යෝජනාව ඒකමතිව සභා සම්මත විය.

<u>ගරු නගරාධිපති - කේ.ඩී.නිශාන්ත ප්‍රදීනාන්දු මහතා</u>

ගරු මහා නගර සභා මන්ත්‍රිතිවරුනි, 05(04) යෝජනාව ඉදිරි කටයුතු සඳහා පරිසර, සෞඛ්‍ය හා සනීපාරක්ෂාව පිළිබඳ ස්ථාවර කමිටුවට යොමු කරනවා.

05(05)මහා නගර සභා මන්ත්‍රී , ජීවන්ත සෙනෙවිරත්න මහතා විසින් කල් දී ඇති යෝජනාව,

Community Life Saver Foundation මගින් ප්‍රජා මට්ටමින් ජීවිතාරක්ෂක කණ්ඩායම් ඇති කිරීම අරමුණු කරගත් ප්‍රජා ජීවිතාරක්ෂක ව්‍යාපෘතියක් ආරම්භ කිරීමට කටයුතු කරනු ලබන බව සභාව වෙත දැනුම් දී ඇත.

එම ව්‍යාපෘතියේ මූලික පුහුණු වැඩසටහන් පැවැත්වීම සහ අදාළ කටයුතු සම්බන්ධීකරණය කිරීම සඳහා ස්ථානයක් අවශ්‍යව ඇති බැවින් බඹටුව විල්ලෝරාවත්ත පෙර පාසල් ගොඩනැගිල්ල තාවකාලික පදනම මත භාවිතා කිරීමට අවසර ලබා දෙන ලෙස SLCommunity Life Saver Foundation විසින් ඉල්ලීමක් ඉදිරිපත් කර ඇත.

ඒ අනුව එම ආයතනය මගින් ක්‍රියාත්මක කිරීමට නියමිත ප්‍රජා ජීවිතාරක්ෂක ව්‍යාපෘතියේ මූලික පුහුණු හා සම්බන්ධීකරණ මධ්‍යස්ථානයක් ලෙස බඹටුව විල්ලෝරාවත්ත පෙර පාසල් ගොඩනැගිල්ල, සභාව විසින් තීරණය කරනු ලබන කොන්දේසි හා කාලසීමාවන්ට යටත්ව, තාවකාලික පදනම මත භාවිතා කිරීමට අවසර ලබාදීම සඳහා මෙම මහා සභාවේ අනුමැතිය ලබාගැනීම සඳහා මෙම ගරු සභාවට යෝජනා කර සිටින්නීය.

මහා නගර සභා මන්ත්‍රී, එච්. කේ. ෂර්මන් පිලිසියන් ප්‍රනාන්දු මහතා විසින් යෝජනාව ස්ථිර කරන ලදී.

<u>මහා නගර සභා මන්ත්‍රී - ජීවන්ත සෙනෙවිරත්න මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, ප්‍රජා මට්ටමින් ජීවිතාරක්ෂක ව්‍යාපෘතියක් ඉදිරිපත් කරනවා. මේකට හේතු සාධක වෙච්ච කාරණා කිහිපයක් තියෙනවා. අපිට දිට්වා සුළි කුණාටුව වෙලාවේදී විශාල ආපදාවකට ලක්වුණ වෙලාවේදී අපේ පැත්තෙන් ඉටුවිය යුතු සේවාවක් තිබුණා. නගර සභාවක් හැටියට අපේ සම්පත් සේවය ලබා දීපු අවස්ථාවක් තිබුණා. හැබැයි මට මතකයි ඒ මොහොතේත් ඒ සභා කාලය අවසන් වෙච්ච ඊළඟ සභා වාරයේ අපේ සජිත් දුමින්ද මන්ත්‍රීතුමත් යෝජනාවක් කලා අපිට ආපදාවක් කුමකින් ඒවිද කියලා විසඳුමක් ඕන වෙයි කියලා අපිට, අපි තේරුම් ගත්තා අපිට තියෙන ජල මූලාශ්‍ර තමයි බොල්ගොඩ ගඟ සහ මුහුදු තීරය අපේ ආසනය පුරාම විහිදී යනවා. ඉතින් අපිට තියෙන පළවෙනිම සුරක්ෂිතතාවයකට හෝ ආපදාවකට ලක්වෙන සුරක්ෂිත කරගත යුතු දෙයක් හැටියට අපි හඳුනා ගත්තා. ඒ නිසා අපි මේක ප්‍රජා ජීවිතාරක්ෂක වැඩසටහනක් හැටියට අපි නගර සභාවට යෝජනාවක් ගෙනාවා. අපි මේක පෞද්ගලික අංශයත් එක්ක තමයි දියත් කරන්න බලාපොරොත්තු වෙන්නේ. Community Life Saver Foundation ප්‍රජා මට්ටමින් අපි මේක පුහුණු කරනවා. ඒක ස්වෙච්ඡාවෙන් පුහුණු කරන්න අපේක්ෂා කරනවා. අපි නගර සභාවක් හැටියට, මොරටුව හැටියට මුළු රටේ ම ආපදාවකට ලක් වෙච්ච මොහොතක අපිට පුලුවන් වෙයි මොරටුව නියෝජනය කරන අපේම ජීවිතාරක්ෂක කණ්ඩායමක් ඕනෑම අවස්ථාවකදී අපිට ඒක ලබා දෙන්න පුලුවන්. ඒවගේම නගර සභාවටත් අපිට අවශ්‍යනම් පුහුණුවීම් ලබා දෙන්න ඒ අයගෙන් කර ගැනීමට පුලුවන්කමක් තියෙනවා. ඉතින් මම හිතනවා අපිට මේ යෝජනාව ඉතාම කාලෝචිත යෝජනාවක් කියලා. ඒ වගේම අපේ මොරටුවේ දරුවන්ට ඒ පුහුණුවෙන් විදේශගත වීමට හැකියාව තියෙනවා. ඒ සහතික පත්‍රයක් නිකුත් කරන මට්ටමට ව්‍යාප්ත කිරීමට අපේක්ෂා කරනවා. එතකොට විදේශගත රැකියාවක පවා නිරත වෙන්න පුලුවන්. මේ යෝජනාව අපි ඉදිරිපත් කරලා තියෙන්නේ බොල්ගොඩ ගඟ ආශ්‍රිතව තියෙන විල්ලෝරාවත්ත ළඳරු පෙර පාසල තිබුණා. ඒ ගොඩනැඟිල්ල දැන් හිස්ව තියෙනවා මේ වගේ

දෙයක් සඳහා සුදුසුම ස්ථානය විදියට හඳුනාගෙන තියෙනවා. ඒ නිසා අපි මේ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට අපේක්ෂා කරනවා.

<u>මහා නගර සභා මන්ත්‍රී - ඩී.එම්.සුජිත් පුෂ්පකුමාර මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, මෙම යෝජනාව, මාගේ පාසල් මිත්‍රයා, ගරු මන්ත්‍රීතුමා මෙම යෝජනාව ගෙනාවේ ඉතාමත් සත්චේතනාවෙන් කියලා එතුමාගේ අභිංසක අදහස්වලින් පැහැදිලියි. එතුමා හිතන විදිහ හා බලාපොරොත්තු වෙන විදිහ ගැන අපට තර්කයක් නෑ. එය එතුමාගේ සිහිනය. නමුත් මෙය රාජ්‍ය නොවන සංවිධානයක්. රාජ්‍ය නොවන සංවිධානවලට නගර සභාවේ දේපළ දෙන්න බෑ. මේ කාර්යය එයාලට කරගන්න පුළුවන් සල්ලි ගෙවලා කාර්යාලයක් අරගෙන එම කාර්යාලයේ එයාලට ක්‍රියාත්මක වෙන්න පුළුවන්. නමුත් නගර සභාවේ පෙර පාසලක් ඉවත් කරලා එම පෙර පාසල් ගොඩනැගිල්ලේ එන්.ජී.ඕ.එකක් කරන්න දෙන්න බෑ. අපේ එල්මෝ ප්‍රනාන්දු මහතාගේ එන්.ජී.ඕ.එකක් තියෙනවා එකෙන් පිහිණුම් තමයි උගන්වන්නේ. සෙබස්තියන් විද්‍යාලය මූලික කරගෙන එතුමා තමයි සෙබස්තියන් විද්‍යාලය හදලා දීලා තිබෙන්නේ.මගේ මතකය නිවැරදි නම් කැන්ඩලේට් කියන නමකින් එතුමා කරගෙන යනවා. එයින් මොරටුවේ ජනතාවට උදව් කරනවා. ඒවගේ මෙයිනුත් මොරටුවේ ජනතාවට උදව් කරන්න පුළුවන්. ශ්‍රී ලංකාවාසි ජනතාවට උදව් කරන්න පුළුවන්. නමුත් නගර සභාවේ දේපළක් දෙන්න බෑ. එය නීත්‍යානුකූල නෑ. නගර සභාවේ දේපළ නගර සභාවේ. එමනිසා ඒ සම්බන්ධව ඔබතුමාගේ අවධානය යොමු කරනවා. මගේ මිත්‍රයාට කියන්න ඕනේ වැඩේ හොඳයි. ඒ අය කරන වැඩේ හොඳ ඇති, අපි දන්නේ නෑ. නමුත් නගර සභාවේ දේපළ භාවිතා කිරීම සම්බන්ධ යෝජනාවට අපගේ දැඩි විරෝධතාවය පළ කරනවා.

<u>මහා නගර සභා මන්ත්‍රී - ඩබ්.රවින්ද්‍ර රංගන ප්‍රනාන්දු මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, ජීවන්ත මන්ත්‍රීතුමා ඉදිරිපත් කරපු කාරනාව පිළිබඳව පොඩි අදහසක් ඉදිරිපත් කරනවා.ගංවතුර අවස්ථාවක් ආවම මොරටුව ග්‍රාමය තුල යම් කිසි සේවාවක් ඉටු කිරීමට අපට හැකියාව තියනවානම් බොහොම හොඳයි.සුජිත් මන්ත්‍රීතුමා කිව්ව ලෙසම එන්.ජී.ඕ ආයතනයක් කියලා ප්‍රකාශ කරා.සභාවෙ මේ වෙනකොට ගිනි නිවීමේ ඒකකයක් තියනවා.නමුත් මුහුදේ හෝ ගඟේ ආපදාවක් සිදුවුනාම ඒකට මම හිතන්නේ මුහුණ දෙන්න පුලුවන් හැකියාවක් නැහැ.නගර සභාවේ සමහර සේවකයන් ඉන්නවා.ඔවුන්ට හැකියාව තියනවා.ඔවුන්ව සේවයට සම්බන්ධ කරගෙන මේක ස්ථාපනය කරගත්තොත් මොනවාහරි ආපදාවක් වුනාම ඒ ආයතනයෙන් උදව් අරගෙන ස්ථාපනය කරගන්න පුලුවන් නම් අපට ලොකු කාර්යයක් කරන්න පුලුවන් කියලා අපි හිතනවා.ඒකට අපි සාකච්ජාවක් කරගෙන පුලුවන් දේ අපි ඉදිරියට කරමු කියලා ඉල්ලා සිටිනවා.

<u>ගරු නගරාධිපති - කේ.ඩී.නිශාන්ත ප්‍රදිනාන්දු මහතා</u>

ගරු මන්ත්‍රීවරුනි, ඒක ඇත්තටම අවශ්‍යතාවයක් ඒ පිළිබඳ විවාදයක් නැහැ අපිට.ජීවිත ආරක්ෂක කණ්ඩායමක් ගොඩනැගීම රටට සහ මොරටුවට වැදගත්.ඒ කටයුතු නියැලෙන බාහිර කණ්ඩායමක දායකත්වයක් හරහා තමයි ලබාගන්න වෙන්නෙ.මතුකරන ගැටලුව තමයි පෙර පාසල් ගොඩනැගිල්ල .මේක ප්‍රයෝජනයට ගැනෙන ගොඩනැගිල්ලක් නොවෙයි.හැබැයි ඒ ගොඩනැගිල්ල නොසලකා හරින්න බැහැ රාජ්‍ය නොවන සංවිධානයකට අපේ දේපලක් දෙන්නෙ නැහැ. නමුත් මේක අහක නොදා ජීවිත ආරක්ෂක පුහුණුවක් ලබා දෙන්නෙ කොහොමද කියලා තැනකට සාකච්ජා කරලා තීන්දුවක් ගන්න නම් යෝජනාවක් කමිටුවකට යොමු කරලා තීන්දුවක්

ගන්න නම් කමිටුව ඇතුලෙ සාකච්ජා කරමු කොහොමද ජීවිත ආරක්ෂක පුහුණුව ලබාගන්නෙ කියලා.කමිටුවකට දාලා සාකච්ජාවක් සාකච්ජාවෙදි ගත්තොත් එකගතාවයක් හදාගන්න පුලුවන් වෙයි.අපි එහෙම කරමු.

අංක 05(05) යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

<u>ගරු නගරාධිපති - කේ. ඩී. නිශාන්ත ප්‍රදීනාන්දු මහතා</u>

ගරු මහා නගර සභා මන්ත්‍රීවරුනී, 05(05) යෝජනාව ඉදිරි කටයුතු සඳහා මහජන උපයෝගීතාව, කාන්තා හා ප්‍රජා සංවර්ධනය පිලිබඳ ස්ථාවර කමිටුවට යොමු කරනවා.

05(06) මහා නගර සභා මන්ත්‍රී , සිත්ති මසීනා බක්කර් මහත්මිය විසින් කල් දී ඇති යෝජනාව,

මුස්ලිම් දේවස්ථාන පාරේ නිවාස 45 කට ආසන්න නිවාස සංඛ්‍යාවක් පිහිටා ඇති අතර එම ප්‍රදේශයේ පවතින කාණු පද්ධතිය මේ වන විට සම්පූර්ණයෙන් සංවර්ධන කර නොමැති බැවින් ප්‍රදේශවාසීන් දැඩි අපහසුතාවයකට මුහුණ දෙමින් සිටී. දැනට ඉදිකර ඇති කාණු කොටස මගින් මාර්ගයේ එක් පසෙකින් ජලය ගඟ දෙසට බැහැර කිරීමට පමණක් පහසුකම් සලසා ඇති අතර ඉතිරි නිවාස සහ ප්‍රදේශ සඳහා ප්‍රමාණවත් ජල බැස යාමේ පහසුකම් නොමැත.

මේ හේතුවෙන් ජලය නිසි ලෙස බැස නොයෑම නිසා මාර්ගය හා අවට ප්‍රදේශයේ අපිරිසිදු ජලය රැඳි තිබීමෙන් ප්‍රදේශවාසීන්ගේ දෛනික කටයුතු වලට බාධා ඇතිවිම සිදුවේ. එමෙන්ම දිගු වේලාවක් ජලය රැඳි තිබීම හේතුවෙන් මදුරුවන් බෝවීම සහ ජලය ආශ්‍රිත රෝග ව්‍යාප්ත වීමේ අවදානමක් පවති.

එම නිසා මෙම කාණු පද්ධතිය ඉතා කඩිනමින් සංවර්ධනය කර දෙන මෙන් මෙම ගරු සභාවට යෝජනා කර සිටින්නීය.

මහා නගර සභා මන්ත්‍රී,එල්.ඩී.රොෂාන් කුමාර පෙරේරා මහතා විසින් යෝජනාව ස්ථිර කරන ලදී.

අංක 05(06) යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

<u>ගරු නගරාධිපති - කේ.ඩී.නිශාන්ත ප්‍රදීනාන්දු මහතා</u>

ගරු මහා නගර සභා මන්ත්‍රීවරුනි, ඉහත අංක 05(06) යෝජනාව ඉදිරි කටයුතු සඳහා කර්මාන්ත හා ඉදිකිරීම් පිලිබඳ ස්ථාවර කමිටුවට යොමු කරනවා.

05(07)ගරු මහා නගර සභා මන්ත්‍රී, ඒ.එච්.සුරේෂ් ඉන්දික මහතා විසින් මහ නගර සභා සම්මත අතුරු ව්‍යවස්ථාවේ සඳහන් සහා රැස්වීම් පිළිබඳ අතරු ව්‍යවස්ථාවේ 13 (උ) වගන්තිය යටතේ කළ යෝජනාව,

මොරටුව මහා නගර සීමාව තුල මහල් නිවාස සංකීර්ණ සැලකිය යුතු ප්‍රමාණයක් ඇත. පසුගිය දා සොයිසාපුර මහල් නිවාස සංකීර්ණයේ "C4" මහල් නිවාස ඒකකයේ බිම් මහල් විශාල පිපිරීමක් සමග ගින්නක් හට ගැනිනි. ඉන් ජීවිතක් අහිමි වූ අතර තවත් දෙදෙනෙකු තුවාල ලැබීය.එමෙන්ම තවත් නිවාස කිහිපයකටම අනතුරු සිදුවිය. තත්ත්වය මෙසේ නිවාස කිහිපයකටම අනතුරු සිදුවිය. තත්ත්වය මෙසේ හෙයින් මොරටුව තුල ඇති සියලුම මහල් නිවාස

සංකීර්ණ ආවරණය වන පරිදි අප මහා නගර සභාවත්,සභාධිපත්‍ය කළමනාකරණ අධිකාරියත්, මොරටුව හා ගල්කිස්ස පොලිස් ස්ථානයත් සිවිල් ආරක්ෂක කමිටුවත් ඒකාබද්ධ ආරක්ෂිත විවිධ පිළිවෙලක් සකස් කළ යුතු බව මෙසේ යෝජනා කර සිටින්නීය.

මහා නගර සභා මන්ත්‍රී, එම්.තිලකසිරි ප්‍රනාන්දු මහතා විසින් යෝජනාව ස්ථිර කරන ලදී.

<u>මහා නගර සභා මන්ත්‍රී - යූ.එල්.සේනක දමයන්ත ද සිල්වා මහතා</u>

ගරු නගරාධිපතිතුමනි,සුරේෂ් ඉන්දික මන්ත්‍රීතුමා ඉදිරිපත් කරපු යෝජනාව සොයිසාපුර නිවාස සංකීර්ණය තුල සිදු වූ විනාසය සම්බන්ධව අදහස් කීපයක් එක් කරන්න බලාපොරොත්තු වෙනවා.ප්‍රථමයෙන්ම ස්තූතිවන්ත වෙනවා මහා නගර සභාව නියෝජනය කරන අපේ නියෝජනයක් මේ නගර සභාව තුල සිත්ති මසීනා මන්ත්‍රීතුමිය එතුමියට හැකි ආකාරයෙන් පක්ෂ විපක්ෂ භේදයකින් තොරව අපෙන් වෙන්න ඕන යුතුකමක් ඉටුකිරීම සම්බන්ධව. ඇය බොහේම යුහුසුලුව කටයුතු කලා.මමත් සුජිත් මන්ත්‍රීතුමත් දින කිහිපයකට පස්සෙ එම ස්ථානයට ගියා.එම ප්‍රදේශයට ස්තූතිය පුද කලා මන්ත්‍රීතුමියට එතුමිය කරපු කාරනාව සම්බන්ධව.විශේෂයෙන්ම නගර සභාවේ ගිනි නිවන අංශයට ස්තූතිය පුද කරනවා.ගින්න ඇතිවෙච්ච නිවසේ පදිංචිව සිටින්නේ තුන්දෙනෙකු පමණයි.මේ අය කාත් එක්කවත් වැඩිපුර කතාබහ නොකරන පවුලක්.එකපාර ගෑස් සිලින්ඩර් තුනක් හෝ හතරක් රැගෙන එනවා දැකල තියෙනවාලු.කවුරුවත් විමසිලිමත් වෙලා නැහැ ගෑස් පරිභෝජනය ඔවුන්ට මෙපමණ අවශ්‍ය වන්නේ ඇයි කියා.අවසානයේ වෙන්නෙ මේ ගෑස් පිපිරීමක් හෝ ගිනි ගැනීමක් ඇතිවෙලා මේක විශාල විපතක් බවට පරිවර්තනය වුනා.ඒ නිවස පමණක් නෙමෙයි ඊට උඩහ ගෙවල් කීපයක් පදිංචියට පුලුවන් තත්ත්වයකට අද ඒ ගෙවල් නැහැ. සොයිසාපුර නිවාස සංකීර්ණයේ කළමනාකාරතුමියගෙන් දිස්ත්‍රික් කළමනාකාරතුමාගේ අංකය ඉල්ලගෙන කතා කරාම එතනින් කිව්වෙ සභාධිපත්‍ය ආයතනයේ ප්‍රශ්නයක් කියලා.මේක ඊලගට යොමු කරලා තිබුනා ගොඩනැගිලි පරියේෂණාත්මක ආයතනයෙන් වාර්තාවක් ලබාගන්න.හැබැයි එය මන්දගාමී වැඩ ක්‍රියාවලියක් කියලා අපිට පැහැදිලි වුනා.අපි මහජන නියෝජිතයො විදියට එහි පදිංචි වෙන්න බැරි ජනතාව ගැන වැඩි අවධානයකි යොමු කරන්න ඕනාකියන ඉල්ලීම මම අවස්ථාවේදී කරනවා.

විශේෂයෙන්ම සොයිසාපුර නිවාස සංකීර්ණය කියන්නේ ජනගහනය නමදහස් අටසියයක් වගේ ජීවත්වන නිවාස දෙදහස් පන්සිය අටසිය අටක් වගේ තියෙන නිවාස සංකීර්ණයක්.ජන්ද දායකයන් පන්දහකට වැඩි පිරිසක් නියෝජනය කරන කුඩා බිම් ප්‍රදේශකේ තුල විශාල ජන ගහනයක් නියෝජනය කරන කොට්ඨාශයක්.අපි අවධානය යොමු කරන්න ඕනා මේ අයටයි.තට්ටු හතරක ජීවත් වන පුද්ගලයො.බොහොම සීමිත ඉඩකඩ තියෙන්නෙ.මේ වගේ විපතකට පත්වුනාට පස්සෙ ලොකු ඇබැද්දියකට මුහුණ දෙන්නෙ.කරකියාගන්න දෙයක් නැති වෙනවා ඒ නිසා අපි සභාවක් විදියට අපේ අවධානය යොමු කරන්න ඕනා මේ අයට. අපි කැන්වසින් යනකොට අපි දකිනවා දෙමළ ගෙවල් වල දොරක් ඇරගන්න අපිට බැහැ.ඒ අය වෙනම ගේට්ටු දාගෙන ලොක් කරගෙන ඉන්නෙ කලින් නම් සොයාසිපුර ගෙවල් වල ආරක්ෂක කමිටුව බොහොම ශක්තිමත්ව තිබුනා.හොද වැඩපිළිවෙලක් දියත් කලා.ඒ වගේ වැඩපිළිවෙලකට යොමු වෙන්න.අපි ඒ ගැන සැකෙන් බලනවා නෙමෙයි.ඒ ගැන අවධානයෙන් කටයුතු කරන්න ඕන කියන ස්ථාවරයක අපි ඉන්නවා.අපෙන් වෙන්න ඕන යුතුකම් කොටසක් විදියට අසරණ වෙලා ඉන්න අනෙකුත් ජනතාව වෙනුවෙන් ක්‍රියාමාර්ගයක් ගන්න කියලා ඉල්ලීමක් කරනවා.

<u>මහා නගර සභා මන්ත්‍රී - බී.සජිත් දුමින්ද පීරිස් මහතා</u>

ගරු නගරාධිපතිතුමනි,මේ යෝජනාව ගෙනාපු සුදේශ් ඉන්දික මන්ත්‍රීතුමාටයි, සුදේශ් ඉන්ද්‍රජිත් මන්ත්‍රීතුමාටයි ස්තුති වන අතර,සොයිසාපුර ගින්න ඇතිවෙච්ච වෙලාවේදී සිත්ති මසීනා මන්ත්‍රීතුමිය බොහෝ වෙහෙස මහන්සි වී කටයුතු කල නිසා එතුමියට බෙහෙවින් ස්තූතිවන්ත වෙනවා.දුලිසිරි මහතා ඇතුලු ගිනි නිවන කණ්ඩායම ලබාදුන් සේවය විශිෂ්ඨයි.මේ යෝජනාව හරහා අපි නැවක වතාවක් මොරටුව නගර සභාව සීමාව තුල අවධානම් කළමනාකරණය ආපදා කළමනාකරණය පිළිබඳ නැවත හිතන්න ඕන තැනකට ඇවිල්ලා තියනවා.සමහර මොරටුවේ නගර සභා සීමාවලදී සමහර ඒවා සභාධිපත්‍ය කළමනාකරණ ඒකකයට අයිතියි.තවත් ඒවා ධීවර අමාත්‍යාංශයට අයිතියි.තවත් අයිතිය තියෙන්නෙ සමහර ඒවා නාගරික සංවර්ධන අධ්‍යක්ෂකාරියට අයිතියි.මේ සිද්ධීන් ඇති වුනාට පස්සෙ අපේ ගිනි නිවන කණ්ඩායම බොහොම ශක්තිමක් කණ්ඩායමක්.හැබැයි ඔවුන් එතනට ලඟාවෙන්න ඉස්සර පූර්ව ගිනින නිවීමේ ක්‍රමය ආයතන තුල තියෙන්න ඕනා,මහල් නිවාස වල තියෙන්න ඕනා.සමහර තැන්වල සවිකරලා තියෙන කාබන් ඩයොක්සයිඩ් ටැංකිය සමහරු වෙන වෙන වැඩවලට පාවිච්චි කරනවා.ගරු නගරාධිපතිතුමනි නගර සභාවේ විශිෂ්ඨ සේවය කරන්න කලින් පූර්ව ගිනි නිවීමේ ඒකකය සක්‍රීය ද කියලා නැවත වතාවක් අපි පුරෝකථනයක් කරන්න ඕනා ගරු නගරාධිපතිතුමනි,මෙවා යාවත්කාලීන කරන්න ක්‍රියාමාර්ග ගන්න ඕනා ඒ තුලින් අපිට පුලුවන් අවධානම හොඳින් කළමනාකරණය කරගන්න.ඒ නිසා අපි නගර සභාවක් පැත්තෙන් ආයතනවල තියන වෙන වෙන ආයතන වලට අයිති මහල් නිවාස මොකක්ද කියන එක ලැයිස්තු ගත කරගන්න ඕනා.ඒ ආයතනත් එක්ක අපි සම්බන්ධ වෙනන් ඕනා. අපිට තියන අඩුපාඩු මොනවාද ශක්තීන් මොනවාද කියලා පූර්ව සමීක්ෂණයක් කළ යුතුයි.මේ යෝජනාව ගැඹුරට සාකච්ඡා කරලා මොරටුවේ ඇතිවන ප්‍රශ්න වලට විසදුම් ආපදා කළමනාකරණය පැත්තෙනුත් අවධානම් කළමනාකරණය පැත්තෙනුත් විශේෂඥයො,දායකත්වයක් දෙන්න පුලුවන් පිරිස් ඉන්නවා.ඒ සඳහා කටයුතු කරන්න කියලා මම ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා.

<u>මහා නගර සභා මන්ත්‍රී - සිත්ති මසීනා බක්කර් මහත්මිය</u>

ගරු නගරාධිපතිතුමනි,කාලීන යෝජනාව ඉදිරිපත් කරපු සුරේජ් ඉන්දික මන්ත්‍රීතුමාට බෙහෙවින්ම ස්තූතියි.ඔබතුමත් දන්නවා සොයිසාපුර මහල් නිවාසය සී හතරෙ නිවාසයෙ පිපිරීමක් සමග ඇතිවෙච්ච ගින්න සම්බන්ධව.ඒක සොයිසාපුරට ඉතිහාසගත ගින්නක් එක ජීවිත හානියක් එතන සිද්ද වෙනවා.නිවාස සංකීර්ණයේ නිවාස දෙදහස් හතලිහක් තියනවා.මුලින්ම එක්දහස් නමසිය හැත්ත තුනේ පොදු පහසුකම් පනත යටතේ පොසු උපාංග නඩත්තු කිරීම සහ පාලනය කරා.නමුත් අවාසනාවකට දෙදහස් තුනේ මෙම පනත සංශෝධනය කරලා සභාධිපත්‍ය කළමනාකරණය කියලා පනතක් හදනවා.නිවාස සංවර්ධන අධිකාරියේ පොදු පහසුකම් සියල්ලම සභාධිපත්‍ය කළමනාකරණය අධිකාරියට පටවනවා.එතැන් සිට සභාධිපත්‍ය කළමනාකරණය අධිකාරිය මගින් තමයි පාලනය කරනන් ගත්තෙ.ඒ අය එතනින් නැවතුනේ නැහැ. ඒ අය කලේ වගකීම තවත් කණ්ඩායමකට පැවරුවා.එතනින් නවතින්නේ නැතිව සභාධිපත්‍ය කළමනාකරණ සංස්ථාව කියලා නිවාස හැම ඒකකයකටම සමිතියක් ස්ථාපනය කරලා මේ වගකීම පොදු අංගෝපාංග සම්පූර්ණයෙන් පාලනය කිරීම හා පරිපාලනය කිරීම සඳහා ඒ අයට මේ වගකීම බාරදුන්නා. මේ සමිතිය මගින් තමයි මේ ඒකක වල වැඩකටයුතු තියනවානම් ඉදිරිපත් වෙන්න ඕනා. සියයට සියයක් මේ සමිති සක්‍රීය නැහැ.ඒ ඒකයෙන් එකක් තමයි සී හතර කියන්නෙ ඒකක එකකියන් නිවාස දාසයක් තියනවා විපතට පත්වෙච්ච නිවාස නිසා තවත් උඩ මහලේ නිවාස තුනකට ඉදිරිපස තියන ගෙවල් හතරකටයි අලාභ හානි සිද්ද වෙනවා.ඉදිරිපස තියෙන ගෙදඒ

දොර ගැලවිලා ඇතුලට විසිවෙනවා.උඩ ගෙවල් වල පොලවේ ටයිල් පිපිරිලා ගැලවිලා ගිහිල්ලා.මොරටුව සොයිසාපුර නිවාස සංකීර්ණයේ ජනතාව අයිති අපිට.ඒ ජනතාවගෙ සුභසාධනය සම්බන්ධ අපිට වගකීමක් තියනවා.ගරු නගරාධිපතිතුමනි,ඔබතුමාට ස්තූති වන්ත වෙනවා.සුරේෂ් මන්ත්‍රීතුමත් ඇවිල්ලා බලලා ගිහාල්ලා තිබුනා.නියෝජ්‍ය ඇමතිතුමත් ඇවිල්ලා බලලා ගිහාල්ලා තිබුනා.හැබැයි තව වෙනතුරු විපතට පත්වෙච්ච අනෙක් කණ්ඩායමටක ලිඛිතව කාටවත් දන්වලා නැහැ නැවත පදිවියට සුදුසුයිද කියලා.කව්ද ඒ වගකීම ගන්නෙ.ඒගොල්ලන්ගෙ වැරැද්දෙන් වෙච්ච දෙයක් නෙවෙයි.පහල මහලෙ ගෑස් කාන්දුව නිසා වෙච්ච විපත සියලු දෙනාටම බලපාලා තියනවා.දාසයෙන් අටකට අලාභ හානි සිද්ද වෙලා තියනවා.අනෙක් අටදෙනත් බයෙන් ජීවත් වෙන්නෙ.බිල්ඩින් එකේ ස්ටක්චර් එක සම්බන්ධව ඒගොල්ලන්ව දැනුවත් කරලා නැහැ.මිනිස්සු බයයි.හදිසියේ ඉස්සරහට ආපදාවක් වුනොත් මෙගොල්ලන්ගෙ ස්ටක්චර් එකට මොනවා හරි ගරටලුවක් වෙයි කියලා.ගරු නගරාධිපතිතුමනි මම නැවත ස්තූති වන්ත වෙන්න ඕනා ගිනි නිවීමේ දෙපාර්තමේන්තුවට හා එහි සේවකයන්ට ,ඒවගේම මුරපොල හිටපු දෙදෙනාටත් ස්තූති වන්ත වෙනවා මොකද ගිනි ගන්න වෙලාවෙ ගේ ඇතුලට ගිහිල්ලා ඇතුලෙ ඉන්න දෙදෙනොව එලියට අරගෙන එනවා.ඉතා කණගාටුයි.අපිට හදිසියට මොරටුවට ගිලන් රථයක් නැහැ.පිච්චිච්ච එක්කොව එලියෙ තියලා පැයක් අපිට බලාගෙන ඉන්න සිද්ද වුනා.වෙන වාහනයකට දාන්න බැහැ කැලි ගැලවිලා අතේ ඇලවෙනවා.මින් ඉදිරියට එක ගිලන් රථයක් හරි මොරටුව ආසන්නයේ රඳවා තබා ගන්න ලෙස මම ඉල්ලීමක් කරනවා.ඉදිරියට ඔබතුමාට වගකීමක් තියනවා ජාතික ගොඩනැගිලි පර්යේෂණ ආයතනයට කතා කරලා බිල්ඩින් එකේ ස්ටක්චර් එක සම්බන්ධව ඉක්මණටම අපිව දැනුවත් කරන්න කියලා.

<u>මහා නගර සභා මන්ත්‍රී - එම්.ලිහිණි ප්‍රනාන්දු මහත්මිය</u>

ගරු නගරාධිපතිතුමනි,සොයිසාපුර මහල් නිවාස සංකීර්ණය ආරම්භ වන්නෙ එක්දහස් නමසිය හැත්තෑව වර්ෂයෙ.දැනට පදිංචි පුද්ගලයන් පන්දහසක් පමණ වේ.එක්දහස් නමසිය හැත්තෑව වර්ෂයෙ පටන් ගත්ත බිල්ඩින් එක සංධිපත්‍ය කළමනාකාරීත්වයට එක්දහස් නමසිය හැත්ත තුනෙ මහල් නිවාස නීතිය යටතේ තමයි යටත් වෙන්නෙ.නිවාස සංකීර්ණ මැනේජ් කරන්න කොන්ටමීඩියම් කෝපරේෂන් තියනවා.නමුත් අද වෙනකොට බලාත්මක වෙන්නෙ නැහැ.එ ක්දහස් නමසිය හැත්තෑව වර්ෂයේ හදපු බිල්ඩින් තමයි මෙතන තියෙන්නේ.මේවල ෆ්‍රයර් එක්සිට් නිසි විදියට හදලා තියනවද කියන එක තමයි ප්‍රශ්නය වෙන්නෙ.මේ වෙච්ච සිද්දිය සම්බන්ධයෙන් හොදම උදාහරණය ඒ කාලෙ හදනකොට ප්‍රමිතියකට අනුවද නිර්මාණයකරලා තියෙන්නෙ.මොරටුව නගර සභාවක් හැටියට මොරටුවෙ නගරයෙ ඉන්න පුරවැසියන් වෙනුවෙන් වහාම කළමනාකරණ සභාධිපත්‍ය කළමනාකරණ ආයතනය කැඳවලා.ෆන්ෂන් වෙන්නැති මැනේජ්මන්ට් කෝපරේෂන් සම්බන්ධයෙන් යම්කිසි මැදිහත්වීමක් කල යුතුයි.නිවාස වල ඉන්න වැසියන්ට මැනේජ්මන්ට් කෝපරේෂන් එකක් හරහා මම හිතන්නෙ නැහැ වත්කමක් හැකියාවක් තියනවා කියලා.අපි ගත්තොත් කොළඹ හයිලයිට්ස් බිල්ඩින්වල මැනේජ්මන්ට් කෝපරේෂන් එකට මාස්පතා යම්කිසි මුදලක් ඒ ඉන්න රෙසිඩන්ස්ලා ගෙවනවා.ඒ හරහා තමයි ඒකෙ තියෙන ලිෆ්ට්,කාර් පාක්,ජෙනරේටර් ඔක්කොම මැනේජ් වෙන්නෙ.මම හිතන්නෙ නැහැ සොයිසාපුර එවැනි දෙයක් සිද්ද වෙනවා කියලා. ඒඅනුව තියෙන එපාර්ට්මන්ට්, බිල්ඩින්ස් නඩත්තු වීමක් සිද්ද වෙන්නෙ නැහැ.අද වෙනකොට අපි මෙතන ගින්නක් විතරයි කතා කරන්නෙ.මේ බිල්ඩින් වල ප්‍රමිතිය සම්බන්ධයෙන් මම හිතන්නෙ නැහැ අපි කිසිම අවස්ථාවකදි අධ්‍යනයක් කරලා තියනවා කියලා.මම ඔබතුමාගෙන් ඉල්ලීමක් කරන්න කැමතිය මේ සිද්දිය පාදක කරගෙන ඉදිරි සති දෙක ඇතුලත සාභාධිපත්‍ය කළමනාකරණ අධිකාරියට ලියලා මේ සම්බන්දයෙන් අමාත්‍යාංශයේ නිවාස

සංවර්ධන අධිකාරියේ මැදිහත්වීමක් හරහා මේ සම්බන්ධයෙන් විශේෂ වූ සාකච්ඡාවක් කිරීමට ඔබතුමාට යෝජනා කරන්න කැමතියි.

<u>මහා නගර සභා මන්ත්‍රී - ඒ.ඒච්.සුදේශ්.ඉන්දුජීත් කුමාර මහතා</u>

ගරු නගරාධිපතිතුමනි,සුරේෂ් ඉන්දික මන්ත්‍රීතුමාගේ යෝජනාව පිළිබඳ කෙටි අදහසක් ඉදිරිපත් කිරීමට කැමතියි.ප්‍රථමයෙන්ම එතුමාට ස්තූතිවන්ත වෙනවා උ වගන්තිය යටතේ මේ යෝජනාව ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන්.මේ යෝජනවා පාදක වෙන්නෙ සොයිසාපුර ඇතිවෙච්ච සිද්දිය.කවුරුත් දන්නවා සොයිසාපුර කියන්නෙ මොනවගේ වපසරියක් සහිත පරිසරයක්ද මොනවිදියේ ජනතාවක් ඉන්න පරිසරයක්ද කොයිතරම් ආරක්ෂිතද නැද්ද කියන එක අපට ප්‍රායෝගික අවබෝධයක් තියනවා.සමහර තැන්වල මට ඇහුනා පාලක කණ්ඩායම විදියට මොනවත් කරේ නැහැ කියලා වගේ තමයි මට දැනුනේ.මේ සිද්දිය වෙච්ච පලමු පැය බාගෙ ඇතුලත නගරාධිපතිතුමා මෙම ස්ථානයට යනවා.මම වෙන තැනක සිටිය නිසා මම ආවෙ පරක්කු වෙලා. නමුත් දුරකථනයෙන් කල යුතු වැඩ හැම දෙයක්ම මම කලා.දුල්සිරි මහත්තයා සාක්කි.ප්‍රදේශවාසීන් මැදිහත්වුනා.ගිලන්රථයෙ ප්‍රමාදයක් තිබුනා.ඒක ඇත්ත.සියලු දෙනා එකතු වෙලා විශාල ව්‍යසනයක් වෙන්න තිබුන අවස්ථාව මග හැරුණා.නියෝජ්‍ය ඇමතිතුමත් ආවා.අදාල අංශවල වගකිවයුතු නිලධාරීන් විශාල ප්‍රමාණයක් ආවා.එම්.බී.ආර්. එක පහුවෙනිදා ආවා.මීට දින තුනකට කලින් තාවකාලික රිපෝට් එක එවලා තියනවා.රිපෝට් එකේ පැහැදිලිව ලියලා තියනවා තාවකාලිකව ගිනිගත්ත පේලියේ පදිංචිකරුවන් ඉවත් කරන්න කියලා. සිද්දිය වෙච්ච වෙලාවෙ ඒ අය අපිත් එක්ක වාද කරන්න ආවෙ නැහැ.අපි මෙතනින් ඉවත් වෙන්නම් කියලා ඒ අය එතනින් ඉවත් වුනා.ඒකට අපේ ස්තුතිය පුද කරනවා.රජයෙන් දේවල් කරනකල් බලන් ඉන්න තත්ත්වයක් ඇතුලෙ ඒ අය ස්වෙච්ඡාවෙන් ඒ කටයුත්ත කරා.මේ වෙනකොටත් අදාල අමාත්‍යාංශ හරහා ලිපි යවලා තියනවා.ඉතාම කඩිනමින් නිවාස අධිකාරිය සභාධිපත්‍ය කළමනාකරණ අධිකාරිය, එම්.බී.ආර් එක, නගර සභාව මේ සියල්ලටම ලිපි යොමු කරලා තියනවා.අද වෙනකොට මේ ලිපි ලැබෙයි. වහාම මේ සම්බන්ධයෙන් සාකච්ඡාවක් කරන්න විශේෂ සාකච්ඡාවක් කැදවන්න.ඒක අපි හිතනවා ඉදිරි සතිය ඇතුලත සකච්ඡාව කැදවෙයි.ඒකෙදි නාගරික සංවර්ධන අධිකාරියේ නියෝජ්‍ය ඇමති එරංග ගුණසේකර සහෝදරයා ඉතාම උනන්දුවෙන් මැදිහත් වෙමින් ඉන්නවා.සභාධිපත්‍ය කළමනාකරණ අධිකාරියේ තියෙන දුර්වලතාවයන් විශේෂයෙන් සොයිසාපුර වගේ නිවාස ඒකක වල කොන්ටමීඩියම් නැවුරට් ඇක්ටිව් නැහැ.අති විශාල අනවසර ඉදිකිරීම් ප්‍රමාණයක් ඉදිකරමින් ආරක්ෂාවට බාධවෙන විශාල ඉදිකිරීම් ප්‍රමාණයක් ඉදිකරලා තියනවා.මේවා කොහොමද වෙනස් කරලා ජනතාවගෙ ආරක්ෂාව තහවරු කරන්නෙ කියලා අපි දැනි අරගෙන තියනවා.ඉතාම ඉක්මණින් සාකචජාවක් අදාල ක්‍රියාමාර්ග තෝරන්න රජයක් විදියට සුදානමින් ඉන්නවා.එම්.බි.ආර් එකේ රිපෝට් එක එන්න ටිකක් ප්‍රමාදයි.තාවකාලික රිපෝට් එක එවලා තියෙන්නේ ඒකෙ තියනවා ගිනි ගත්ත ඒරියා එකේ අනෙක් පැත්තට කිසි බාධාවක් නැහැ කියලා ඒගොල්ලන් කියන්නේ.ගිනි ගත්ත ඒරියා එකේ බිම කොන්ක්‍රීට් කණු වලින් යම් ආරක්ෂිත ක්‍රමවේදයක් හදන්න කියලා රිපෝට් එකේ තියනවා.ඒක දැන් නිවාස අධිකාරියට දැනුම් දුන්නා.සභාධිපත්‍ය කළමනාකරණ අධිකාරියට දැනුම් දුන්නා.ඒ සාකච්ඡාව නගරාධිපතිතුමා ඉක්මණින් ගනියි. ඇත්තටම අපි කණගාටුවෙනවා නිවාස අධිකාරියේ සමහර නිලධාරීන් මේ අවස්ථාවේදී හැසිරෙච්ච විදිය හරිම කණගාටුයි.ඒ අයට අදාල නැහැ වගේ තමයි හැසිරුනේ.නිවැසියන් අදාල කාර්යාලයෙන් විමසුවම මේක අපිට අයිති නැහැ.ඔයගොල්ලන්ට ඔප්පු දීලා තියෙන්නෙ.ඔයගොල්ලන් තමයි බලාගන්න ඕන වගේ අදහසක් තමයි දීලා තියෙන්නෙ. ඇත්තටම අපි කණගාටුවෙනවා ඒ සම්බන්ධයෙන් රජය නියෝජනය කරන

මන්ත්‍රීවරයෙක් විදියට.එහෙම මඟහරින්න බැහැ.නිවාස අධිකාරියට පැහැදිලි වගකීමක් තියනවා.ඒ නිසා අපි ඒකට මැදිහත් වෙනවා.මට කියාගන්න ඕනකම තියෙන්නෙ මේ සිද්ධිය සැලවුන මොහොතේ සිට මේ දක්වා අපට හැකි උපරිමයෙන් නගරාධිපතිතුමා,නාගරික ලේකම්තුමා කතාකරා ලියුම් ටික යවන්න ඕනා කාටද ලියුම් ටික අද උදේ තැපැල් කරනවා.ඉක්මන් සාකච්ජාවක් මේ සම්බන්ධයෙන් අරගෙන සුරේෂ් මන්ත්‍රීතුමාගේ යෝජනාවත් මේකට අරගෙන විධිමත් මොරටුව සොයිසාපුර ඇතුලු මේ සියලු නිවාස ඒකක වල ආරක්ෂාව තහවරු කරගන්න වැඩපිළිවෙලක් සකස් කරගන්න අපි අපේ පැත්තෙන් මැදිහත් වෙනවා.සියලු දෙනාගෙන්ම ඉල්ලීමක් කරනවා.ඒ සදහා සහයෝගය දෙන්න.

<u>මහා නගර සභා මන්ත්‍රී - ඩබ්.මැක්සි.ජේ.ප්‍රනාන්දු මහතා</u>

ගරු නගරාධිපතිතුමනි,යෝජනාවේ අන්තර්ගතය ගැන සියලුදෙනා කතා කරා.අපි සමහර ස්ථාන නරඹන්න ගියාම හදිසි ගින්නක් හටගත්තම උපකරණ තියනවා.එම උපකරණ එම ස්ථානයේ අපි දැක්කෙ නැහැ.පුලුවන්නම් නගර සභාව හරහා සොයිසාපුර කොට්ඨාශය නියෝජනය කරන මන්ත්‍රීන් සමග එකතු වෙලා ඒ අයව දැනුවත් කරන්න හදිසි ගිනි උපකරණයක් සවි කරන්න පුලුවන් නම් ඒක වටිනවා.මේ වගේ නිවාස සංකීර්ණයකදී එතන තියනවා වෝටර් බෝඩ් එකේ වෙනම සම්ප් එකක් සවි කරලා මම හිතනවා නගරාධිපතිතුමා හරහා අපි වෝටර් බෝඩ් එක දැනුවත් කරොත් ස්ථාන හතරක් පහක් වෙන් කරලා ඒ වලට හදිසියේ ජලය ගන්න පුලුවන් ස්ථානයක් (ගිනි තටාක) කොළඹ තැන් තැන් වල සවි කරලා තියනවා. ඒවගේ අපිටත් තැන් තැන් වල හදාගන්න පුලුවන් නම් ගින්නක් හටගත්තම වාහනේ විතරක් ගියාම සන්තකයෙන් අවශ්‍ය කරන වතුර ටික ගන්න පුලුවන්.මම ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා.නගර සභාවේ මන්ත්‍රීවරු සියලු දෙනාම එකට එකතු වෙලා යෝජනාවක් හැටියට ජල සම්පාදන මණ්ඩලයට ලිපියක් හැටියට යෝජනා කරලා අපි ඉල්ලමු.එවැනි ස්ථාන කිහිපයක් හදුනාගෙන ඒවා සවි කරලා හදිසි අවශ්‍යතාවයකදි ජලය ලබාගන්න පුලුවන් ගිනි තටාක කිහිපයක් සවි කරන්න කියලා.ස්තූතියි.

<u>මහා නගර සභා මන්ත්‍රී - ඩී.එම්.සුජිත් පුෂ්පකුමාර මහතා</u>

ගරු නගරාධිපතිතුමනි,සොයිසාපුර ප්‍රදේශයේ පසුගියදා ඇතිවෙච්ච ගෑස් කාන්දුව නිසා කියන ගින්නෙන් පස්සෙ පසු විපරමක් කරන්න ගරු විපක්ෂ නායකතුමා ප්‍රදේශයේ මසීනා මන්ත්‍රීතුමියත් එක්ක එම ස්ථානයේ නිරීක්ෂණ චාරිකාවක් කරා.එහිදී අපිට නිරීක්ෂණය වෙච්ච ප්‍රධාන කරුණු කිහිපයක් තියනවා.සොයිසාපුර කියන්නෙ අපි කුඩා කල සිට ගැවසිච්ච ස්ථානයක්.සොයිසාපුර නිවැසියන්ගේ ගින්නත් ගැන අපි දැඩි කම්පනයකට පත්වුනා.මේ ගින්න නිසා නිවාස පේලියේම ඉහල තියෙන්නාවු නිවාස හතරකටම පදිංචි වෙලා ඉන්න අපහසු තත්ත්වයකට පත්වෙලා තියනවා.සුදේශ් මන්ත්‍රීතුමා ප්‍රකාශයක් කලා ඒගොල්ලන් විසින්ම විධි විධාන සලසා ගත්තා කාටවත් මොකුත් කියන්නෙ නැතුව කියලා.හැබැයි අපේ විපක්ෂ නායකතුමයි අපියි එතන ඉන්නකොට ඉහල මහලෙ හිටපු අම්ම කෙනෙක් ඇවිල්ලා දුකින් කතා කරා.ඒ අම්මා කිව්වා තාවකාලිකව අපි ඉවත් වෙනවා අපිට ඉන්න තැනක් නැහැ.තාම මේකට කිසිම ක්‍රියාමාර්ගයක් ගත්තෙ නැහැ කියලා.ඒ නිසා ඉක්මන් ක්‍රියාමාර්ගයක් ගන්න පුලුවන් නම් උදව් කරන්න කියලා.අපි කිවාවි අදාල බලධාරීන්ව දැනුවත් කරන්නම් කියලා.ඒ නිසා ඒ නිවාස පේලියේම ඉන්න මිනිස්සු දැඩි අසරණතාවයකට පත්වෙලා ඇති කියලා.ඒ සියලු නිවාස වල ඉන්න ජනතාව විශාල අවධානමකට ලක්වෙලා තියනවා. මොකද හේතුව ඒ මිනිසුන්ට පදිංචි වෙලා ඉන්න එක සුදුසුද නැද්ද කියන එකවත් කිසිදු ක්‍රියාමාර්ගයක්වත් කිසිදු දැනුවත් කිරීමක්වත් මෙතෙක් සිදුවෙලා නැහැ.ඒ නිසා විපක්ෂ නායකතුමයි,අපියි මසීනා මන්ත්‍රීතුමියයි එක්ක අපි ගිහිල්ලා

නිවාස අධිකාරියේ තියෙන කාර්යාල වලට ගිහිල්ලා වැඩ බලන කළමනාකරුත් එක්ක කතා කරන්න වුනාට පස්සෙ ඇය ඒ සම්බන්ධයෙන් කිසිවක් දන්නෙ නැහැ. ඇය කිව්වෙ ටී.ඕ මහතා ඇවිල්ලා බලලා වාර්තාවක් ගොඩනැගිලි පර්යේෂණ ආයතනයට යැව්වා කියලා.ඊට එහා කිසිම දෙදයක් ඇය දන්නෙ නැහැ.විපක්ෂ නායකතුමා දිස්ත්‍රික් කළමනාකරුත් එක්ක කතා කරාම දිස්ත්‍රික් කළමනාකරු මේ සම්බන්ධයෙන් කිසිම තැකීමක් නැතුව තමයි ඔහු පිළිතුරු දුන්නෙ.මිනිස්සු පත්වෙලා ඉන්න අපහසුතාවය සම්බන්ධයෙන් ඔහුට ගැටලුවක් නැහැ.නාගරික සංවර්ධන අධිකාරියේ නියෝජ්‍ය ඇමතිවරයා එතනට ඇවිල්ලා බලලා ගියත් එතනින් එහාට කිසිදු ක්‍රියාමාර්ගයක් අරගෙන නැහැ කියන එක තමයි අපගේ හැඟීම.ඒකට මැදිහත් වීමක් ඒ දක්වා වෙලා තිබුනෙ නැහැ. අනෙක් එත තමයි ගෑස් සිලින්ඩර් විසි එකකට වඩා වැඩි ප්‍රමාණයක් තිබුනා කියනවා.අඩුම තරමේ පොලිසියවත් ඉන් එහාට මොනවද ක්‍රියාත්මක වුනේ කියන එක සම්බන්ධයෙන් කිසිදු දැනුවත් වීමක් ඒ ප්‍රදේශයේ ජීවත් වන මිනිසුන්ට දන්වල තිබුනෙ නැහැ.ඒ නිසා ඒ සම්බන්ධයෙන් ඇත්තටම අපි ස්තූති වන්ත වෙන්න ඕනා ගිනි නිවන ඒකකයට මොකද හේතුව මොරටුවේ ප්‍රශ්නයක් ඇති වුනොත් මොරටුව මහා නගර සභාවේ ජාමෙ බේරන්න ඉන්න එකම ටීම් එක අපේ ගිනි නිවන ටීම් එක බවට පත්වෙලා ඉන්නවා.ඒකම තමයි මෙතනදිත් සිද්ද වෙලා තිබ්බෙ.ගිනි නිවන ඒකකයේ අපේ ආදරණීය සහෝදරවරුන් ගිහිල්ලා තමන්ට කල හැකි උපරිම දේ කරලා තිබුනා.හැබැයි ඔවුන්ගේ ජීවිත ලොකු අවධානමක දාලා තමයි ඔවුන් ඒ දේට මුහුණ දෙන්නෙ.ඒ නිසා ඔබතුමාගෙන් අපි ඉල්ලනවා ගිනි නිවීමේ ඒකකය සඳහා හදිසි අවස්ථාවකදී ගෑස් එකක් ආවොත් ආවරණයෙ වෙන්න ඇදුම උපකරණ තියනවද කියලා මම මට අවබෝධයක් නැහැ.එහෙම නැත්නම් ඒ උපකරණ අරන් දෙන එක හොඳයි.තරුණ ජීවිත අවධානමකට අරගෙන ඔවුන් අපි වෙනුවෙන් තමයි කාර්ය භාරය කරන්නෙ.එ නිසා ඇත්තටම අපි ඔවුන්ට ස්තූති වන්ත වෙනන් ඕනා.ඔවුන් ලොකු කාර්ය භාරයක් කරලා ඒ අවස්ථාවේදී.කණගාටුවට කරුණ කියන්නෙ ගිලන් රථයක් එනකන් විනාඩි හතලිස් පහක් පැයක් පමණ බලන් ඉදලා තියනවා.ගිනි නිවන ඒකකයට ඇම්බියුලන්ස් එකත් අපිට ඒකතු කරන්න පුලුවන් නම් මම හිතන්නෙ ඒක වඩා වැදගත් වෙයි.සමහර වෙලාවට ඔයිට වඩා දෙයක් වෙලා ලෙඩ්ඩු ආවොත් අපේ දුර්වලතාවයක් වෙනවා අපිට ගිලන් රථයක් නැති එක.ඒ නිසා පුලුවන් නම් ඔබතුමාලා සම්බන්ධ වෙලා ගිලන් රථ නොමිලේ දෙන්න ඕන තරම් රටවල් තියනවා.ඒ සම්බන්ධව ඔබතුමාගේ අවධානය යොමු කරන්න කියලා ඉල්ලීම කරනවා.කොහොම වුනත් අපි ඔබතුමාලගෙන් අපි ඉල්ලා සිටිනවා නගර සභාවක් හැටියට මැදිහත්වීමක් වෙන්න මේක කොහොමහරි මේ මිනිසුන්ට සාධාරණය කරලා අඩුම තරමේ ඒ මිනිස්සු මෙතන පදිංචි වෙලා ඉන්න සුදුසුද නැද්ද කියන එකවත් මිනිසුන්නට කියන්න ගොඩනැගිලි පර්යේෂණ ආයතනයේ වාර්තාව ඉක්මණින් ගෙන්වගන්න අවශ්‍ය කටයුතු කරන්න කියලා ගෞරවනීය ඉල්ලීම කරන්නවා.

<u>ගරු නගරාධිපති - කේ. ඩී. නිශාන්ත ප්‍රදීනාන්දු මහතා</u>

ගරු මහා නගර සභා මන්ත්‍රීවරුනි, මේ යෝජනාව ගෙන ඒම පිළිබඳව සුරේෂ් මන්ත්‍රීතුමාටත් අත්සන් කරපු අනෙක් මන්ත්‍රීවරුන්ටත් මම ස්තූතිවන්ත වෙනවා. මොකද මේක ඇත්තටම අත්‍යාවශ්‍ය යෝජනාවක්. දැන් මේ සිද්ධිය බොහෝමයක් දෙනා කතා කරපු නිසා මම මේ සිද්ධිය සම්බන්ධයෙන් නැවත කතා කරන්නේ නැහැ. ඒ සිද්ධිය දන්න මන්ත්‍රීවරු භූමියේ හිටිය මන්ත්‍රීවරු මේ සිද්ධිය සම්බන්ධව කතා කළා. දැන් අපිට වැදගත් වෙන්නේ මේ සිද්ධියට අදාළ පරිසරය හෙටත් අනතුරුදායක තත්ත්වයක තියෙන්නේ. ලංකාවේ විශාල මහල් නිවාස සංකීර්ණය හෙටත් මේ පද්ධතිය තුළ මේ අනතුර තියෙනවා. ඒ නිසා අද මේ සිද්ධිය මූලික කරගෙන අපි දකින්න ඕන

අනාගතය කොහොමද මෙය වළක්වා ගැනීමට කටයුතු කරන්නේ කියලා. මේ යෝජනාවෙන් මන්ත්‍රීතුමා යෝජනා කරන්නේ අපි අන්න ඒ වගේ පැත්තකට යන්න ඕන කියන දේ. ඇත්තටම මේ යෝජනාවේ හරයාත්මක වැදගත්කම තියෙන්නේ ඒකයි. ඒ කියන්නේ අදාළ වගකිව යුතු ආයතන වල තියෙන දුබලතා, අඩුපාඩුකම් ගැන දැන් මේ මන්ත්‍රීවරුන් වෙන වෙනම සාකච්ඡා කළා. නගර සභාව විදියට අපේ තියෙන හැකියාව අපේ තියෙන මැදිහත් වීම අපේ ගිනි නිවන ඒකකයට දෙන්න ඕන ප්‍රශංසාව ඒකත් අපි ඒ පැත්තෙන් ලබා දුන්නා. ඒවා එතකොට කාටවත් පුද්ගලිකව ලැබෙන දේවල් නෙවෙයි ආයතනයක් ලෙස අර දෝෂා රෝපණ යන්නෙත් ආයතනයක් ලෙස. සමහර නිලධාරින්ගෙත් දුර්වලතාත් ප්‍රදර්ශණය වුණා. සභාවක් ලෙස අපි කල්පනා කරනවා මෙන්න මේ නිවාස පද්ධතිය පමණක් නෙවෙයි විශේෂයෙන් අහුලාන, සයුරුපුර, ලුනාව මහල් නිවාස ධීවරපුර මහල් නිවාස, දැන් අපි සතුව තියෙන මේ තට්ටු නිවාස තියෙනවා ගණනාවක්. සාමාන්‍යය ගෙයක ගිනි ගත්තා වගේ නෙවෙයි තට්ටු නිවාසයක ගින්නක් සිද්ධ වුණාම. ඒක ඊට වැඩිය සංකීර්ණයි. එහෙනම් මොරටුව මහා නගර සභාව විදියට අපි බැදිලා ඉන්නවා අපිට වගකීමක් තියෙනවා අපේ ජනතාවගේ ජීවිතය ආරක්ෂා කර ගැනීම වෙනුවෙන් අපි මොකද්ද දැන් කරන්නේ. එතකොට අන්න ඒ කරන දේ ආරම්භය විදියට තමයි මන්ත්‍රීතුමා යෝජනා කරන්නේ මෙන්න මේ වගකිව යුතු ආයතන වලින් ඒකකයක් හදමු. දැන් අපි ඉතිහාසය ගැන කතා කරලා වැඩක් නැහැ. ඉතිහාසයේ තිබුණ පොදු පහසුකම් මණ්ඩලය වගේ එකක් හොඳින් හොයලා බලලා වැඩ කළා ඒ වගකීමට වගවුණා. හැබැයි ඊට පස්සේ මේවා කඩලා කඩලා වගකීම් විරහිත තැනකට මේක තල්ලු කළා. ඒ නිසා දැන් අදාළ ස්වාධිපත්‍යයේ ඒ කළමනාකරණ ඒකකය හරි දැන් වගකියන්නේ නැහැ. ඒ නිසා අපි ඒ හැම ආයතනයකටම අදාළ ඇමතිවරුන්ටත් බල කරමින් මෙන්න මේ යෝජනාව ආරම්භ කරන්න කටයුතු කරමු. විශේෂයෙන්ම ප්‍රාදේශීය ලේකම්තුමා, ඒ වගේම මේ අදාළ ආයතන, පොලිසියේ මැදිහත් වීමත් සම්බන්ධ කරගෙන අපි මූලික සාකච්ඡාවකට ගමු. එතකොට ඇත්තටම මේ භූමියට මේ වගේ ව්‍යුහයක් තියෙන්න ඕන. දැන් මන්ත්‍රීවරුන් කිවුවා වගේ හදිස්සි ගින්නක් නිවීමට අවශ්‍ය කරන පහසුකම් මේ භූමිය තුළ තියෙන්න ඕන. අපි මෙහේ ඉදලා යනවාට වඩා ඒ භූමිය තුළ සූදානමක් අපිට සකස් කර ගන්න පුලුවන්නම් වැදගත්. ඒ කියන්නේ නිවාස පද්ධතියක් නිසා මහල් නිවාස නිසා ඉතාම හොඳ ස්ථානක් ඒ භූමියෙන් වෙන් කර ගැනීමට පුලුවන් නිසාත් ගිනි නිවන ප්‍රාදේශීය මොකක්හරි දෙයක් භූමියේම වෙන් කරගන්න පුලුවන්නම් එතකොට මේකට අවශ්‍ය කරන ප්‍රතිපාදන සපයා ගැනීමේ ප්‍රශ්ණය මේ ඒකකය ගොඩනඟා ගැනීමෙන් පස්සේ එතැනට විසඳුමක් එනවා. ඒ නිසා මේ යෝජනාව හරි වැදගත්. මේ යෝජනාව මත පදනම් වෙලා මේ සාකච්ඡාව කැදවලා අපි ඉස්සරහාට මේ කටයුත්ත කරගන්නේ කොහොමද කියන අභියෝගය බාර ගමු. මම ගොඩක් ස්තූතිවන්ත වෙනවා පක්ෂ විපක්ෂ හැමදෙනාම පටු දේශපාලන ආකල්ප මත නෙවෙයි මේක විග්‍රහා කලේ. අඩුපාඩුකම් දැක්කා අඩුපාඩුකම් තියෙනවා. අපි මේක දකින්න ඕන එහෙම. ඒ නිසා අපි කාටත් වගකීමක් තියෙනවා ඒ වගකීම කාගේ අතිනුත් මේ වෙලාවේ ඉෂ්ඨ වෙමින් තියෙනවා. දැන් මේකේ අවසාන ප්‍රතිඵලය වෙන්න ඕන අපි මොරටුවට මොරටුවේ ජනතාවගේ ජන ජීවිතය ආරක්ෂා කර ගැනීම සඳහා විශ්වාසනීයත්වයක් සහිතව ඒකකයක් ගොඩනගන එක. ඒ කටයුත්තට මැදිහත් වෙමු. ඒ යෝජනාව ගෙනාපු මන්ත්‍රීවරයාට ස්තූතිවන්ත වෙනවා.

<u>මහා නගර සභා මන්ත්‍රී - ඒ.එච්. සුරේෂ් ඉන්දික මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, ඇත්තටම මේ යෝජනාව සම්බන්ධයෙන් අදහස් දක්වපු සියලුම මන්ත්‍රීවරුන්ට මට සඳහන් කරන්න ඕන ඇත්තටම ඔබතුමා ගත්ත ප්‍රවේශය ඇත්තටම වැදගත්. ව්‍යුහය ඉක්මනට හදන්න ඒ ව්‍යුහය සඳහා මහා නගර සභාව නායකත්වය ගන්න. ඒ ව්‍යුහය තුල

විශේෂයෙන්ම සභාධිපත්‍යය කළමනාකරණ අධිකාරියේ කළමනාකරණ සංස්ථාව පිහිටුවීමේ ක්‍රමවේදයන් වල ලොකු වැරදි සහගත දෙයක් තියෙනවා. ඒ වගේම යාවත්කාලීව වෙන්න තියෙන දේවල් තියෙනවා. දැන් උදාහරණයක් විදියට කළමනාකරණ සංස්ථාවක් පන ගන්වන්න විදියක් නැහැ ඒ තියෙන සමහර නීතිරීති අනුව. වැඩක් කරන මනුස්සයෙක්ට පත්වෙන්න බැහැ. නිවාස හිමිකාරීත්වය තියෙන්න ඕන, ඔහුගේ නමට නිවාස ඔප්පුව තියෙන්න ඕන එතකොට මේවගේ කාරණා එක්ක ගත්තාම වැඩ කරන්න බැරි කෙනෙකුට පත්වෙන්න වෙනවා එහෙම වුණාම මේ කළමනාකරණ සංස්ථාව ක්‍රියාත්මක වෙන්නේ නැහැ. ඒ නිසා කළමනාකරණ සංස්ථාව ක්‍රියාත්මක වීම ඉතාම වැදගත්. ඒ වගේම ගරු නගරාධිපතිතුමනි, ඇත්තටම අපි මේ සිද්ධිය පදනම් කරගත්තේ සිද්ධියෙන් පාඩමක් ඉගෙන ගන්න. මේ සොයිසාපුර මහල් නිවාස සංකීර්ණයේ ජීවත් වන අය සහ මහල් නිවාස සංකීර්ණ පාලනය කරන ආයතන පාඩමක් ඉගෙන ගන්න තමයි අපි මේ යෝජනාවේදී මූලිකව මේ ව්‍යූහය සකස් කිරීමේ කාරණාවට ඉල්ලුවේ. මම විශේෂයෙන්ම එක කාරණාවක් කියන්න ඕන නිවාස අධිකාරිය සම්බන්ධයෙන් මේ කටයුතු වලට විශේෂයෙන්ම සොයිසාපුර මහල් නිවාස සංකීර්ණය තවමත් නිවාස සංවර්ධන අධිකාරිය සතුව වගකීමක් තියෙනවා. ඒ නිසා තමයි නිවස අධිකාරියේ කාර්යාලයක් තවමත් සොයිසාපුර තියෙන්නේ. සොයිසාපුර ප්‍රශ්ණයකට නිවාස අධිකාරියේ නිලධාරීන් වගකියන්න බැහැ, ඒක අපිට අයිති නැහැ, අපිට අදාළ නැහැ කියනවානම් මොකකටද එහෙනම් සොයිසාපුර කාර්යාලයක් තියෙන්නේ. නිවාස අධිකාරිය මහජන බදු මුදල් වලින් පඩිගන්නේ. ඒ නිසා එහෙම බැහැර කරන්න බැහැ. අපේ සුදේශ් මන්ත්‍රීතුමත් මේ ගැන කතා කළ නිසාත් සහ නිවාස සංවර්ධන අධිකාරි ගැන මට ලොකු විවේචනයක් තියෙනවා ඒකේ ඉන්න සමහර නිලධාරීන්ගේ හැසිරීම් සම්බන්ධයෙන්. ඒවා වෙනම කතා කරමු. නමුත් ගරු නගරාධිපතිතුමනි, ඉක්මනින්ම මේ යාන්ත්‍රණය ක්‍රියාත්මක කරලා ඉදිරියේදී වෙන්න පුලුවන් අනතුරක් වළක්වා ගැනීම සඳහා අපි සියලුදෙනා සාමුහිකව මැදිහත් වෙමු කියන ඉල්ලීම කරනවා.

අංක 05(07) යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

<u>ගරු නගරාධිපති - කේ.ඩී.නිශාන්ත ප්‍රදීනාන්දු මහතා</u>
ගරු මහා නගර සභා මන්ත්‍රීවරුනි, ඉහත අංක 05(07) යෝජනාව ඉදිරි කටයුතු සඳහා කර්මාන්ත හා ඉදිකිරීම් පිලිබඳ ස්ථාවර කමිටුවට යොමු කරනවා.

06. <u>2026 සැප්තැම්බර් මස ස්ථාවර කමිටු වාර්තාවල නිර්දේශයන් සලකා බැලීම</u>

06(01) 2026.09.04 වන දින පැවති ඉඩම් හා නගර සංවර්ධනය පිළිබඳ ස්ථාවර කමිටු වාර්තාවේ නිර්දේශයන් සලකා බැලීම.

<u>මහා නගර සභා මන්ත්‍රී - යූ. අනුරසිරි ජයලාල් ද සිල්වා මහතා</u>
ගරු නගරාධිපතිතුමනි, 02 (04) නාගරික ඉංජිනේරු විසින් 2026.02.06 දිනැතිව ඉදිරිපත් කරන ලද සොයිසාපුර ජාතික නිවාස සංවර්ධන අධිකාරය සතු මොරටුව මහා නගර සභාව විසින් භුක්ති විඳිනු ලබන ගොඩනැඟිලි සම්බන්ධව කරුණු සලකා බැලීම කියලා දාලා තියෙනවා. ඒකේ තියෙනවා උක්ත කරුණ සලකා බැලූ කමිටුව මෙම කරුණට අදාළව සාකච්ඡා පැවැත්වීමට නියමිතව තිබූ දිනයේ වෙලා නැහැ. නමුත් ඒක නැවත 2026.09.22 දින පවත්වන්න නියමවෙලා තියෙනවා. නගරාධිපතිතුමනි, දැන් මේ සොයිසාපුර ජාතික නිවාස සංකීර්ණයට අයිති ඉඩම් වල

පමණක්ද අපේ සභාව සතු දේපළවල් සහ මොනවාහරි සංවර්ධනය කරලා තියෙන කටයුතු තියෙන්නේ? මොරටුවේ අනෙක් භූමිවල තියෙනවාද නිවාස සංවර්ධන අධිකාරියට අයිති අපේ දේපළ වල තියෙන දේවල් තියෙනවාද? සාමාන්‍යයෙන් මම දන්න විදියට තියෙනවා. ඒ තියෙන දේවලුත් මේ 2026.09.22 සාකච්ඡා කළානම් හොඳයි නේද?

<u>ගරු නගරාධිපති - කේ. ඩී. නිශාන්ත ප්‍රදීනාන්දු මහතා</u>

ගරු මහා නගර සභා මන්ත්‍රීවරුනී, දැනට අපි මූලික වශයෙන් සාකච්ඡා කිහිපයක් ඒගොල්ලන් එක්ක කළා. දැන් මේ සාකච්ඡාව කරන්නේ අපි දීර්ඝ කාලයක් භුක්ති විඳින දේපළක්. අපිට යම් සාධන පත්‍රයකින් දුන් ප්‍රමණයක් තියෙනවා. හැබැයි ඒ අයත් එක්ක සාකච්ඡා කරපුවාම ඒගොල්ලන්ටත් හොඳ අදහසක් නැහැ අපිට දීලා තියෙන ප්‍රමාණයත්, ඒගොල්ලන් සතුව තියෙන ප්‍රමාණයත් සහ සංකීර්ණ ගැටලු සහගත තත්ත්වයක් තියෙනවා. උදාහරණයක් ලෙස අපි නවීකරණය කරන ප්‍රජාශාලාවට අදාළ සංවර්ධන කටයුත්තේදී ඒ වැසිකිලි පද්ධතියට අදාළව සිලින්ඩරයක් බස්සන්න ගියාම ඒගොල්ලන් ගිහිල්ලා පොලිසියේ පැමිණිල්ලක් දැම්මා. මෙන්න මෙහෙම ගැටලු කිහිපයක් තියෙනවා. අපි දීර්ඝ කාලයක් මේ දේ භුක්ති විඳිමින් සංවර්ධනය කරමින් පවතින පොදු සේවා සපයන ස්ථාන. ඒගොල්ලන් දැනට සම්පූර්ණයෙන්ම එකඟවුණා අපිට දීලා තියෙන නිශ්චිත භූමි ප්‍රමාණය ස්ථිර එකඟතාවයකින් ලබා දෙන්න. ඒ වගේම බොහෝ ඉඩම් ප්‍රමාණයක් තියෙනවා නිවාස අධිකාරිය සතුව.

<u>මහා නගර සභා මන්ත්‍රී - යූ. අනුරසිරි ජයලාල් ද සිල්වා මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, මෙවැනි ප්‍රශ්ණ ඇති වෙන්න පුලුවන්නේ. ඒක නිසා අනෙක් ඒ ඉඩම් වල තියෙන අපේ දේපළ තියෙනවානම් එදාටම ඒවත් සාකච්ඡා කරගන්න.

<u>ගරු නගරාධිපති - කේ. ඩී. නිශාන්ත ප්‍රදීනාන්දු මහතා</u>

ගරු මහා නගර සභා මන්ත්‍රීවරුනී, ඔව් ඒගොල්ලෝ එකඟයි ඉස්සරහාට සාකච්ඡා කරලා මේ තත්ත්වය වෙනස් කරගන්න පුලුවන් වෙයි.

<u>මහා නගර සභා මන්ත්‍රී - එම්. ශිරෝමී ඉන්දිකා කුරේ මහත්මිය</u>

ගරු නගරාධිපතිතුමනි, එදා සාර්ථකව කමිටුවක් පැවැත්වූවා. ඒ සම්බන්ධව මම පොඩි සාරංශයක් කියන්නම් අනෙක් මන්ත්‍රීවරුන්ගේත් දැනගැනීම සඳහා. ජාතික නිවාස සංවර්ධන අධිකාරයට අදාළ නිලධාරීන් අපිත් සහභාගී වුණා විශේෂ කමිටුවකට. පොදු දේපළ සන්නස් පත්‍රයක් මඟින් යම්කිසි පවරාදීම් කිහිපයක් සම්බන්ධව ඉතිහාසයේ වෙච්ච සිදුවීම් කිහිපයක් සම්බන්ධව ඔවුන් අපිව දැනුවත් කළා. මම හිතන්නේ ඒක ඉතාමත් වැදගත් සාකච්ඡාවක් වුණා. ඒත් එක්කම විශේෂයෙන්ම සොයිසාපුර තියෙන මාර්ග සහ ක්‍රීඩාපිටිය කාණු පද්ධතිය සතුව තියෙන අයිතිය සම්බන්ධයෙන් ඔවුන් තහවුරු කිරීම් සහ පැහැදිලි කිරීම් කිහිපයක් ඉදිරිපත් කළා. ඒත් එක්කම 231 ප්ලෑන් එක අනුව ඒ පවරා ගැනීම සිදුකර ඇති බවත්, ඊට අදාළව ලිපිගොනු ඉදිරියට නගර සභාවට දැනුවත් කරන බවත් ඔවුන් දැනුවත් කළා. ඒත් එක්කම සාමාන්‍යයෙන් මෙතැන පර්චස් 800ක් පමණ ප්‍රමණයක් තියෙනවා කියලා කිවුවත් අපිට අයිති වෙන දේපළ ප්‍රමාණය 10%ක් වගේ ප්‍රමාණයක් බව තමයි ඔවුන් පැවසුවේ. ඉතින් විශේෂයෙන්ම මම හිතන්නේ අපිට ස්ථාන 05ක අයිතිය තහවුරු කරගන්න අවශ්‍යතාවය නගර සභාව සතුව තිබුණා. ඒ අවශ්‍යතාවයට අදාළව තොරතුරු නැවත ඔවුන් රැගෙන එන බවත්, ඒත් එක්කම කාණු පද්ධතිය සම්බන්ධව විශේෂයෙන්ම තොරතුරු සහ අනාගතයේ මේ සම්බන්ධව තවදුරටත් කටයුතු කිරීම සඳහා ඔවුන්ට සභා සම්මුතියක් සහිතව ඉල්ලීමක් කළ යුතු බව ඔවුන් පැවසුවා. මම හිතන්නේ ඒ සඳහා අපේ

කමිටු සාමාජිකයින් කිහිපදෙනෙක් නගරාධිපතිතුමා ප්‍රධානත්වයෙන් පැවැත්වූ සාකච්ඡාවට සහභාගී වුණා. මම හිතනවා මේක හොඳ ඉදිරි අපේ සැලසුම සඳහා ඉතාමත් වැදගත් වෙයි කියලා. විශේෂයෙන්ම ඉඩම් කමිටුවට සහභාගී වෙන කමිටු සාමාජිකයින් විදියට විශාල තොරතුරු රාශියක් ලබාගන්න හැකියාව ලැබුණා ඔබතුමාගෙන් ඉල්ලීමක් කරනවා ඒ සම්බන්ධයෙන් දිගින් දිගටම මේ සාකච්ඡාව පවත්වාගෙන ගිහිල්ලා අපිට අදාළ තොරතුරු සහ නිරවුල්භාවය ඒ තුළින් ඔප්පු කරගන්න අවස්ථාව ලබා ගන්න කියලා.

<u>මහා නගර සභා මන්ත්‍රී - මේරියන් ලිහිණි ප්‍රනාන්දු මහත්මිය</u>

ගරු නගරාධිපතිතුමනි, ඉඩම් කමිටුවේ 8 වෙනි කරුණ සහ ඊට පාදක වෙන පිරිස් මාවතේ ඉඩම් සම්බන්ධයෙන් යමක් ප්‍රකාශ කිරීමට කැමතියි. මෙහි සඳහන් වෙනවා කැඩැස්තර සිතියම් අංක 520206 කලාප අංක 4 හි ඉඩම් හිමිකම් නොලැබූ කැබලි අංක 207 හා 209 සම්බන්ධයෙන් මෙතැන ඉල්ලීමක් තියෙනවා ඒ ලිපියේ සඳහන් වෙනවා ඒ අදාළ තැනැත්තියට මේක ලැබිලා නැත්තේ බිම් සවිය කාර්යාලයේ දෝෂ සහගත තත්ත්වය මත රජය ලෙස ගැසට් වීම සම්බන්ධයෙන්. දැන් මේ පිරිස් මාවත සම්බන්ධයෙන් මොරටුව මහා නගර සභාව නමින් නඩු ගණනාවක් තියෙනවා. ඔලිවර් මහත්තයා විසින් ගොනු කරලා තියෙන නඩු සම්බන්ධයෙන්. එතකොට ඒ නඩුව මම අද දිනයේ දී 001 මොරටුව දිසා අධිකරණයේ තියෙන නඩු වාර්තා පරිශීලනය කළා මෙතන මන් ළඟ තියෙනවා. ඒකෙත් යම් යම් කරුණු අදාළත්වයක් නැහැ. මෙතැන පිරිස් මාවතේ මොරටුව නගර සභාව සතු පශු වෛද්‍ය කාර්යාලය තියෙනවා. මොරටුව මහා නගර සභාව සතු ඉඩම් ගණනාවක් තියෙනවා. එතකොට මේ සමහර ඉඩම් රජයට හිමිකම් කියන අතර හිමිකම රජය වන අතර සමහරක් මොරටුව මහා නගර සභාව භුක්ති විඳියි කියලා සඳහන් වෙනවා. එතකොට බොල්ගොඩ සිරිපුර නිවාස සංකීර්ණයේ සමහර ඒවාට බිම් සවිය සහතික නැහැ, සමහර ඒවා රජයේ, සමහර ඒවා මොරටුව නගර සභාව මේ වගේ විශාල වූ ගැටලු සහගත තත්ත්වයන් තියෙනවා. අපි දන්නවා දැන් බිම් සවිය කාර්යාලය හරහා ඉඩම් මනිනකොට සමහර ඒවා ඇවිල්ලා මනිනවා. මැනලා ඒගොල්ලෝ සමහරක් ඒවා ඉතිහාසය හදාරන්නේ නැතුව ඒවෙලාවට තියෙන පදිංචිකරුවන් අදාළ පුද්ගලයන් අනුව ඔවුන් භුක්ති විඳි කියලා ඔවුන් සටහන් දානවා. එතකොට ඔවුන් ළඟ තියෙන ලේඛන අනුව තමයි ඒ සමහර දේවල් සටහන් වෙන්නේ. ඔබ මම මේ බලන එක කැඩැස්තර සිතියම අරගෙන බැලුවාම අපි එක එක්කෙනාට සමහර වෙලාවට විවිධ වූ අර්ථකථන දෙන අවස්ථා තියෙනවා. ඒ අර්ථකථන මත අධිකරණයට ගිහිල්ලා නඩු පවරනවා. දැන් මේ අවස්ථාවේදීත් මම හිතනවා ඔලිවර් මහත්තයාත් නඩුවක් දාලා තියෙනවා. එතකොට මම ඔබතුමාගෙන් ඉල්ලීමක් කරන්න කැමතියි මේ ඉඩම් නඩු දාලා මේ නඩු හරහා අවසානයේ දී මොරටුව නගර සභාවෙන් විශාල වූ වන්දි ඉල්ලනවා. එතකොට මේ වන්දි ඉල්ලීම කොතරම් දුරට සාධාරණද සාධාරණ නැද්ද? දැන් එතුමා විසින් ශ්‍රේෂ්ඨාධිකරණයේ නඩුවක් දානවා පිරිස් මාවතේ ඉඩම සම්බන්ධයෙන් මේක මොරටුව මහා නගර සභාව සතුයි ඒ හරහා එතුමාට අයිතිය දෙන්න කියලා. එතකොට ඒ අයිතිය දෙන්න නගර සභාව කටයුතු කරනකොට කොන්දේසි ගණනාවක් ඉදිරිපත් කරනවා. එතකොට දැන් එහෙම තියෙද්දි තව ගිහිල්ලා නඩුවක් පවරනවා මේක මොරටුව මහා නගර සභාවට අයිති ඉඩමක් නෙවෙයි රජය සතු ඉඩමක් කියලා. දැන් එතකොට මේ තැනැත්තිය විසිනුත් 08 වෙනි කරුණ සම්බන්ධයෙන් මොරටුව නගර සභාවට ලියුමක් එවනවා මෙහි සඳහන් වෙන්නේ රජය කියලා. ඉතින් මම ඔබතුමාගෙන් ඉල්ලීමක් කරන්න කැමතියි මේ 520206 කලාපය අංක 04 දරණ කලාපය සම්බන්ධයෙන් මොරටුව නගර සභාවේ නීති නිලධාරියා හරහා රජයට ලියුමක් ලියන්න මේ සම්බන්ධයෙන් නිසි පැහැදිලි කිරීමක් ලබාගන්න කියලා. එතකොට බොල්ගොඩ නිවාස

සංකීර්ණය අපි දන්නවා ඒක ශ්‍රීමත් රණසිංහ ප්‍රේමදාස මහතාගේ කාලයේ දී තමයි මේක පැවරීමට ලක් කළේ. ඒ හරහා මේක මොරටුව මහා නගර සභාවට පවරා ගත්තාද, වැරදීමකින් පවරා ගත්තාද, නීත්‍යානුකූලව පවරා ගත්තාද මොකද්ද මේකේ නීත්‍යානුකූල වපසරිය. මේ සම්බන්ධයෙන් ඔබතුමා නගරාධිපතිවරයා හැටියට මේ සම්බන්ධයෙන් රජයෙන් පැහැදිලි කිරීමක් ලබා ගැනීම අත්‍යාවශ්‍යයි. හේතුව වර්තමානයේ මේ සම්බන්ධයෙන් නඩු ගණනාවක් තියෙනවා. ඒ නඩු වලට මේ කරුණු දැනටමත් තියෙන කරුණු පාදක වෙනවා. ඒ කරුණු අවස්ථාවෙන් අවස්ථාවට ඉන්ටර්ප්‍රිටේෂන් අර්ථ නිරූපණය කරනවා. අර්ථ නිරූපණය කිරීමේ දී අවසානයේ දී සිද්ධ වෙන්නේ රජය සතු දෙයක් අපි වංචනිකව පවරා ගත්තා කියලා යම් අය චෝදනා කරනවා. සමහර අවස්ථා වලදී මේවා වංචනික නැහැ සත්භාවයෙන් පැවරීමක් සිද්ධ කරලා තියෙන්නේ. එතකොට කැඩැස්තර සිතියමේ සමහරක් ඒවා රජයේ කියලා පවතින්නත්, රජය යටතේ තියෙන ඒවා මොරටුව මහා නගර සභාව භුක්ති විඳිනවා කියලා පවතින්නත්, මොරටුව මහා නගර සභාව සතුව සමහරක් ඒවායේ අයිතිය තියෙන්නත්, අයිතිය නොතියෙන්නත් මෙතැන විශාල වූ ගැටලු ගණනාවක් තියෙනවා. ඉතින් ඒ හින්දා මම ඔබතුමාට ඉල්ලීමක් කරන්න කැමතියි මේ පිරිස් වත්ත සම්බන්ධයෙන් සහ 520206/4 දරණ කැඩැස්තර සිතියමේ සඳහන් වන මේ කලාපය සතු බොල්ගොඩ නිවාස සංකීර්ණයේ පිරිස් මාවත සහ මොරටුව නගර සභාව සතු ඉඩම් සම්බන්ධයෙන් පැහැදිලි ලෙස අධ්‍යනයක් කරලා මේ සම්බන්ධයෙන් පැහැදිලි කිරීමක් ලබා ගන්න කියලා ඔබතුමාට නගර සභාව නියෝජනය කරන නීතිඥවරයෙක් සහ නාගරික මන්ත්‍රීවරයෙක් වශයෙන් මොරටුව නගර සභාවට මේ සම්බන්ධයෙන් අනවශ්‍ය ලෙස පුද්ගලයන්ට වන්දි නොගෙවිය යුතුයි කියන තැන ඉදගෙන කතා කරන්නේ. හේතුව මිනිස්සු නඩු දාලා මේ මොරටුව නගර සභාවෙන් අනවශ්‍ය ලෙස අපි වන්දි ගෙවීම් කරන්න අවශ්‍ය වෙන්නේ නැහැ. මේ සම්බන්ධයෙන් ඔබතුමාට සෘජු මැදිහත්වීමක් කරන්න කියලා ඉල්ලීමක් කරන්න කැමතියි. ඒ සාකච්ඡාවට අපිවත් සම්බන්ධ කරගන්න, ඒ සඳහා අපගේ සහභාගීත්වයක් ලබා දෙන්නම්.

<u>මහා නගර සභා මන්ත්‍රී - ඩී. එම්. සුජීත් පුෂ්පකුමාර මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, මම දැනගන්න කැමතියි මේ පිරිස් මාවතේ පශු වෛද්‍ය කාර්යාලය ඉඩමේ අයිතිය තියෙන්නේ නගර සභාව සතුවද? එහෙම නැතිනම් රජය සතුවද? මේවායේ හිමිකම් කියන්නේ කවුද? අපි තමයි භුක්ති විඳින්නේ. පශු වෛද්‍ය කාර්යාලය තමයි තියෙන්නේ. හැබැයි මේකේ හිමිකම් නිරවුල් දෙපාර්තමේන්තුවෙන් දෙනකොට අපිට මේ කෑල්ල දීලා නැහැයි කියලා තමයි සඳහන් වෙන්නේ. එතකොට දැන් අපිට මේකට අයිතියක් නැද්ද? අපි මේ කරගෙන යන පශු වෛද්‍ය කාර්යාලයේ හිමිකම තියෙන්නේ රජය සතුවද? නගර සභාව සතුවද? අපිට ඒක හිමිකම් නිරවුල් කිරීමේ දෙපාර්තමේන්තුවෙන් හම්බවෙලා තියෙනවාද?

<u>ගරු නගරාධිපති - කේ. ඩී. නිශාන්ත පුදිනාන්දු මහතා</u>

ගරු මහා නගර සභා මන්ත්‍රීවරුනී, මට ඔබට එක පාරටම උත්තරයක් දෙන්න බැහැ මෙහෙමයි කියාගන්න. මම කියන්නේ යම් අවිනිශ්චිතභාවයක් ගැටලු සහගත බවක් තියෙන බවනම් පැහැදිලි. ඒ කියන්නේ මේ පශු වෛද්‍ය කාර්යාලය පිහිටි ස්ථානය අපේ දේපළක් කියලා තමයි අපි හිතාගෙන ඉන්නේ මේක තහවුරු කරගෙන නෙවෙයි. මේ පිළිබඳව පශු වෛද්‍ය කාර්යාලය පිහිටි ඉඩමට ගිහිල්ලා බලන්න ගියාම අපිට ඉදිරියේ දී මොනවා හරි සංවර්ධන කටයුත්තකට ප්‍රයෝජනයක් ගන්න පුලුවන් කියන ගොඩනැඟිල්ලක් එහා පැත්තේ හිස්ව තියෙනවා. ඒක ගැන පොඩ්ඩක් බලන්න ගියාම එතැන හිටපු අපේ පශු වෛද්‍යතුමිය කලබල වුණා. කලබල වෙලා අනවශ්‍ය මැදිහත්වීමකුත් කළා. දැන් සෞඛ්‍ය දෙපාර්තමේන්තුව පළාත් සභාව යටතේ තමයි පශු

වෛද්‍ය කාර්යාලය පවතින්නේ. එතකොට මට හිතෙනවා මේකට අදාළව මුල් අයිතිය පිළිබඳව අවිනිශ්චිතභාවයක් තියෙයි. ඒකට අපේ අදාළ කවුරුහරි නිලධාරියෙක් ඉන්නවානම් මේ සම්බන්ධයෙන් මේකේ අයිතිය කොහොමද කියලා කියාගන්න.

<u>මහා නගර සභා මන්ත්‍රී - මේරියන් ලිහිණි ප්‍රනාන්දු මහත්මිය</u>

ගරු නගරාධිපතිතුමනි, මන් සතු තොරතුරක් කියන්නම්. එතැන 256 තියෙනවා හිමිකම් කියන්නා මොරටුව මහා නගර සභා පශු වෛද්‍ය කාර්යාලය පිහිටා ඇත. යාබද 257 තියෙන්නේ හිමිකම් කියන්නා මොරටුව මහා නගර සභාව, 258 හිමිකම් කියන්නා රජය. එතකොට එක ළඟ යාබද ඉඩම් තුන ඔන්න ඔහොම තමයි ගැටලුවක් තියෙන්නේ.

<u>ගරු නගරාධිපති - කේ. ඩී. නිශාන්ත ප්‍රදීනාන්දු මහතා</u>

ගරු මහා නගර සභා මන්ත්‍රීවරුනී, අපිට පළවෙනි පන්තියේ බිම් සවිය සහතිකයක් තියෙනවා කියලා තමයි කියන්නේ.

<u>මහා නගර සභා මන්ත්‍රී - ඩී. එම්. සුජීත් පුෂ්පකුමාර මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, අපිට බිම්සවිය සහතිකයක් නැහැ. අපිට කරුණාකරලා ඔබතුමා නිරවුල් කරලා දෙන්න. අපි ඉල්ලීමක් කරනවා ඊළඟ සභාවට හරි ඉදිරිපත් කරන්න කියලා බිම්සවිය සහතිකය. අපිට දැනුවත්ව තියෙන්නේ නම් ඒකේ හිමිකම් නැහැයි කියලා. ඒ නිසා ඒකේ හිමිකමක් නැති නිසා අපි ලියලා දාලා හරි ඒකේ හිමිකම ගන්න අවශ්‍ය කටයුතු කරන්න ඕන. ඒ නිසා නිවැරදිව මේ තොරතුරු ගන්න.

<u>මහා නගර සභා මන්ත්‍රී - යූ. එල්. සේනක දමයන්ත ද සිල්වා මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, විශේෂයෙන්ම මම ස්තුතිවන්ත වෙනවා විපක්ෂ කණ්ඩායමේ සියලුම මන්ත්‍රීවරුන්ට අද ඉතාමත් තීරණාත්මක අන්දමින් අද මේ සභාවේ සියලුම කමිටු පරද්දවන්න පුලුවන් හැකියාව අපිට තියෙනවා විපක්ෂයක් විදියට. මම හිතන්නේ එක පැත්තකින් ඉස්සරහා පුටුවේ ඉන්නකොට මම හරි ආඩම්බර වෙනවා මම දුර පැතිවල ගියාමත් කියනවා මොරටුව නගර සභාවේ තමයි ප්‍රබලම විපක්ෂය ඉන්නේ කියලා. මොකද හිටපු උප නගරාධිපතිවරු දෙන්නෙක්ම ඉන්නවා. නීතිඥවරු තුන්දෙනෙක් ඉන්නවා. ජ්‍යෙෂ්ඨ මන්ත්‍රීවරු ගණනාවක් ඉන්නවා අත්දැකීම් තියෙන මන්ත්‍රීවරු ගොඩක් ඉන්නවා ඒ වගේම පක්ෂ සංවිධායකවරු ගණනාවක් ඉන්නවා. හැබැයි මේ ඔක්කෝම අපි විපක්ෂයක් විදියට නෙවෙයි පහුගිය කාල සීමාව තුළ කටයුතු කළේ. මේ සභාව ගොඩනඟන්නට පුලුවන් ඔක්කෝම මන්ත්‍රීවරු විදියටයි කටයුතු කළේ. මම දකිනවා සුජීත් මන්ත්‍රීතුමා ලොකුවට විවේචනය කළා සමහරක් වෙලාවට ඉදිරිපත් කළා. හැබැයි මේ විවේචන තුළ තිබුණේ 80%කට වඩා තිබුණේ ඉතාමත් සාධාරණ යෝජනා. සභාව දියුනුවට ගෙන යන යෝජනා තමයි තිබුණේ. සමහරක් අයට වෙන වෙන විදියට පේන්නට ඇති. සමහරක් වෙලාවට දකින කෙනා වෙන විදියට හිතන්න ඇති. අද අපි විපක්ෂයක් විදියට කණ්ඩායමක් විදියට ඒකරාශී වෙලා ඒ තීන්දුවේ අපි ඉන්නවා. හැබැයි අපි කවදාවත් කැමති වෙන්නේ නැහැ මේ සභාව වට්ටන්න කැමැත්තක් දක්වන්නේ නැහැ අපි. අපිට ඕන මේ සභාව හරියට අරගෙන යන්න. තමුන්නාන්සේගේ සුභදශීලිත්වය තියෙනවා හැබැයි මෙතන ඉන්න සමහරක් මන්ත්‍රීවරු අපේ මන්ත්‍රීවරුන්ට සමහරක් වෙලාවට ගිහිල්ලා කර්මාන්ත වල වෙන්න පුලුවන් ඒ වෙන වෙන ප්‍රදේශ අනුව ගිහිල්ලා වැඩක් කරගන්න නොදීපු අවස්ථා තියෙනවා. අපි තමුන්නාන්සේගෙන් ඉල්ලීම් කළා යම් යම් යෝජනා අපිට තමුන්නාන්සේ දෙන්න කිවුවා අපි දුන්නත් අපිට ඒ වැඩේ වුණේ නැහැ. එක වැඩයි වුණේ බ්‍රෙන්ඩන් මන්ත්‍රීතුමාගේ වැඩේ විතරයි වුණේ. අපි යෝජනා දෙන එකේ

තේරුමකුත් නැහැ. ඒ නිසා අපි කවදාවත් කැමති වෙන්නේ නැහැ අපි කණ්ඩායමේ එකඟතාවයට කතා කළේ. ඔක්කෝම පක්ෂයක් විදියට කතා කළේ. අපි මේක වට්ටන්න ඉඩ දෙන්නේ නැහැ. නමුත් අපිට ශක්තිය තියෙනවා කියන එකයි අපි මේ අවස්ථාවේ පෙන්නුවේ. අපි මේ ශක්තිය හැමදාම දෙපැත්තට බෙදිලා වුණානම් තමුන්නාන්සේට කවදාවත් මේ මන්ත්‍රීවරයෙකුට ලෙඩක් වෙලා ඉන්න වෙන්නේ නැහැ ගෙදර වෙලා මහා සභාවක් දවසට. කාටවත් රට යන්න වෙන්නෙත් නැහැ.

<u>ගරු නගරාධිපති - කේ. ඩී. නිශාන්ත ප්‍රදීනාන්දු මහතා</u>

ගරු මහා නගර සභා මන්ත්‍රීවරුනී, මම හිතන්නේ මේ ඡන්දයෙන් පත්වුණ සංයුතියේ ප්‍රශ්ණය තමයි මේ තියෙන්නේ. ජනතාවගේ පැත්තෙන් පත්කරන ලද සංයුතිය පක්ෂ විපක්ෂ සංයුතියේ ප්‍රමාණය පිළිබඳ ගැටලු. හැබැයි මම ඇත්තටම අදහස් කරනවා ආණ්ඩු පක්ෂය අඩු වුණත් වැඩි වෙන්න ඕන කියලා ප්‍රාර්ථනා කරන්නේ කරන ඕන දෙයක් පවත්වගෙන යන්නනේ. හැබැයි මම දක්ෂ වෙන්න ඕන මේ පාලනය තුළ මේක ඉතාම හොඳින් විපක්ෂයේ මන්ත්‍රීවරයා කියන්නෙත් මේ සභාවේ අදාළ නීති වලට ආඥා පනත් වලට අනුව සභා මන්ත්‍රීවරයෙක්, මේක සභාවක්නේ. මේ සභාව ඇතුලේ පක්ෂග්‍රාහී විදියට හිතපුවාම ආණ්ඩු පක්ෂයක් ලෙස තියෙනවා සම්ප්‍රදායී පක්ෂයක් ලෙස තියෙනවා. හැබැයි පාලනයේ සමත් වෙන්න ඕනකම තියෙන්නේ සභාවේ මන්ත්‍රීවරුන්ව පුලුවන් තරම් ඒගොල්ලන්ගේ ආත්ම ගෞරවය රැකෙන විදියට ඒගොල්ලන් කියන දේවල් වලින් ඔක්කෝම බැරි වුණත් ඇහුම්කන් දෙන එක. ඒ කියන්නේ ටිකෙන් ටික මේ තත්ත්වය අර සභාවක් ලෙස ගේන්න. ඒ නිසා අපි දැන් මේ පුරුදු වුණ දෙයක් තියෙනවා බහුතරය ආණ්ඩු පක්ෂය බය නැහැ මොකක් කළත් බහුතරය තියෙනවා. හැබැයි මේ වගේ සමාන වෙලා එකක් හරි මොනවාහරි වුණ ගමන් සේරම ඉවරයි. ඒ නිසා මම කියන්නේ පුද්ගලිකවත් හැමවිටම ඔබට ඕනතරම් සාක්ෂි තියෙයි සුජීත් මන්ත්‍රීතුමා මොනතරම් මම කියන්නේ දේශපාලනික පැත්තෙන් ඡෝදනා එල්ල කළත් අපි අතර පෞද්ගලිකව තරහක් නැහැ. දීර්ඝ කාලයක් ලබපු දේශපාලන අත්දැකීම් ඇතුලේ මේ සුභදත්වය තරම් වටින එකක් තවත් නැහැ. මන්ත්‍රීකම අපේ තියෙන්නේ කෙටි කාලයයි. නගරාධිපතිකම තියෙන්නේ කෙටි කාලයයි හැබැයි ඊට පස්සේ අපි මුණගැහෙන්න ඕන. මගේ මූලික අදහස සුළුතරයකගෙන් හරි සභාව පවත්වාගෙන යන එක. වාද විවාද තියෙයි.

<u>මහා නගර සභා මන්ත්‍රී - එල්. ඔසඳ හර්ෂණ අබේකෝන් මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, අපි ඔක්කෝම එකට හිටියා. මම ආණ්ඩු පක්ෂ මන්ත්‍රීවරුන්ගෙන් ඉල්ලා සිටිනවා ඇත්තටම දැන් මේ අය දේශපාලනයට ඇවිල්ලා මන්ත්‍රීවරු වෙලා ඉන්නවා. ගම තුළ මොනවාහරි දෙයක් වෙනවාද, මේ මන්ත්‍රීකම කියන්නේ ජනතාවට සේවය කරන්න, අපි අවුරුදු විසිගාණක් තිස්සේ ඉදන් සේවය කරලා මොනවාහරි දෙයක් කරනවා. මම දන්නේ නැහැ ඔයාලා නිහඬව ඉන්නවා අපේ සජීත් මන්ත්‍රීතමා සුජීත් මන්ත්‍රීමා කතා කරලා කියනවා මේ මේ දේවල් කරන්න කියලා, මම කිවුවා ඒවා කියන්න ඕන නැහැ කියලා. ඒවා වෙන්න ඕන ආණ්ඩු පක්ෂයෙන්. නගරාධිපතිතුමන්ට ශක්තියක් වෙන්න කට්ටිය එන්න ඕන. එයාලා නිහඬව බලාගෙන ඉන්නවා. අපි බලාපොරොත්තු වුණේ ඒක නෙවෙයි නගරාධිපතිතුමා. ඒ නිසා නගරාධිපතිතුමාට උදවු කරන්න. අද අපි පෙන්නුවා බලගතු විපක්ෂයක් ඉන්නවා කියලා.

<u>මහා නගර සභා මන්ත්‍රී - ඩී. සමන්ත සිල්වා මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, මම මේ අවස්ථාවේ දකිනවා ඔබතුමාගේ මේ සභාව තුළ තියෙන පරිනතභාවය සහ සුභදශීලිත්වය අපි පැහැදිලිව දකිනවා. මොකද පෙර පාලනයේ අපි බොහෝ කාලයක් පාලනයේ ඉන්නකොට ඒ පාලයේ තිබුණ වියරු බව, ඒකාධිපති බව ඉතාම පැහැදිලිව අපි දැක්කා. හැබැයි ඊට වඩා ඔබතුමා පරිනත වෙලා ඔබතුමා කටයුතු කිරීම පිළිබඳව අපගේ සතුට ප්‍රකාශ කර සිටිනවා. අපි හැමදාම සර්වජන බලය වශයෙන් ඔබතුමාට මේක කරගෙන යන්නට

අවශ්‍ය තැන් වලදි අපි සභාවේ යෝජනා සම්මත කරන අවස්ථා වලදී අපි නිහඬභාවය තමයි රැක්කේ. නමුත් විපක්ෂයක් වශයෙන් මේ හඬ නැගෙනකොට, සභාව නියෝජය කරන්න ආව වෙලාවේ තමයි මේක දැනගන්න ලැබුණේ. විපක්ෂයක් වශයෙන් අපි යම් තැන්වලදී කරන්න ඕන තැන අපි ඉන්නවා. අපේ කාර්යය භාර්යය විපක්ෂයේ කාර්යය භාර්යය. අපි සමහර දේවල් වලට මේ විපක්ෂයේ අනෙක් කණ්ඩායම සමඟ එකඟ වුණා. නමුත් අපි විශ්වාස කරනවා මේ සභාව කරගෙන යන්න බැරි මට්ටමට තියෙන දේවල් උදාහරණයකට මුදල් කමිටුව කර්මාන්ත කමිටුවටට අපි විරුද්ධ වුණොත් ඒක මේ සභාවට හා මොරටුවටම කරන හානියක්. මොකද ඒක මම පෞද්ගලිකවත් විවෘතවත් කියනවා එකට නිහඬතාව ආරක්ෂා කරන්න හිටියේ. ඒවගේම ගරු නගරාධිපතිතුමනි, සමහරු අද මෙතන ප්‍රකාශ කළා මන්ත්‍රීවරුන්ටත් වැඩ කරන්න දෙන්න විපක්ෂ ආණ්ඩු පක්ෂ වගේම, ඒක හොඳයි. හැබැයි ඉතින් සමහරුන්ගේ පුද්ගලික දේවල් අනියම් දේවල් වලට උදවු කරන්න බලාගෙන මේ විරුද්ධ පක්ෂයෙන් මෙහෙයවන්න කටයුතු කරනවානම් එතන එකඟතාවයක් අපේ නැහැ. අපි ඉන්නේ විපක්ෂයක්වශයෙන් සර්වජන බලවේග වශයෙන් වෙනම අදහසක අපි ඉන්නේ. සමහරුන්ගේ මාරුකිරීම් අනියම් ගනුදෙනු බේරගන්න ඔබතුමත් එක්ක ඩීල් දාන්න අනෙක් අයව පාවිච්චි කරනවානම් ඒ එකඟතාවයේ අපි නැහැ කියලා මේ අවස්ථාවේ සඳහන් කරනවා.

<u>මහා නගර සභා මන්ත්‍රී - එල්. ඩී. රොෂාන් කුමාර පෙරේරා මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, මම හිතන්නේ අද දවසේ ඔප්පු කලා මේ බලය ඇත්තටම සදාකාලික නැහැ කියලා. අපේ විපක්ෂය ඇතුලේ මතවාද තියෙනවා නමුත් අපි මෙතැනට ඇවිල්ලා තියෙන්නේ මහජනතාවට සේවය කරන්න. ඒ නිසා ඔබතුමාගේ පළවෙනි රැස්වීමෙදිත් ඔබතුමා කිවුවා සියලුම මන්ත්‍රීවරුන්ට එකම විදියට සලකනවා කියලා. ගරු නගරාධිපතිතුමනි, මේ වෙනකන් ඔබතුමාගෙන් ඇරෙන්න ඔබතුමාගෙන් අපි ඉල්ලීමක් කළාම ඔබතුමා ඇත්තටම ඒ වැඩේ කරන්න පුලුවන් උපරිමයෙන් කරලා දුන්නා. නමුත් ඔබතුමාගේ සමහර මන්ත්‍රීවරු ඒ ගැන තැකුවේ නැහැ කියන එක මේ අවස්ථාවේ මතක් කරනවා. ගරු නගරාධිපතිතුමනි, අපිට ඇයි බැරි මේ සෞඛ්‍ය ප්‍රශ්ණ වලදී විතරක්වත් එකතුවෙලා වැඩ කරන්න. අපේ එක එක ප්‍රතිපත්ති තියෙනවා තමයි ඇයි අපිට බැරි එකතුවෙලා නගරයට සේවයක් කරන්න.

පහත නම් සඳහන් මහා නගර සභා මන්ත්‍රීවරුන් 2026.09.04 දින පැවති ඉඩම් හා නගර සංවර්ධනය පිළිබඳ ස්ථාවර කමිටු වාර්තාවේ සියලුම කමිටු නිර්දේශයන්ට පක්ෂව ඡන්දය ප්‍රකාශ කරන ලදි.

1.	නගරාධිපති	-	කේ.ඩී. නිශාන්ත ප්‍රදිනාන්දු මහතා
2.	නියෝජ්‍ය නගරාධිපති	-	ඩබ්.පී. ප්‍රභාෂණී වික්‍රමසිංහ මහත්මිය
3.	මහා නගර සභා මන්ත්‍රී	-	ඒ.එච්. සුදේශ් ඉන්ද්‍රජිත් කුමාර මහතා
4.	මහා නගර සභා මන්ත්‍රී	-	ඩබ්. රවින්ද්‍ර රංගන ප්‍රනාන්දු මහතා
5.	මහා නගර සභා මන්ත්‍රී	-	ඩබ්. ඉෂාන් දුමින්ද ප්‍රනාන්දු මහතා
6.	මහා නගර සභා මන්ත්‍රී	-	ඩී. සමන් සුජීව මහතා
7.	මහා නගර සභා මන්ත්‍රී	-	එම්.බී. සෙව්වන්දි නිලංගිකා ප්‍රනාන්දු මහත්මිය
8.	මහා නගර සභා මන්ත්‍රී	-	බී. යෝගේෂ ප්‍රියදර්ශණ මෙන්ඩිස් මහතා
9.	මහා නගර සභා මන්ත්‍රී	-	ඩබ්. සුජිත් ඩිල්රෝයි ප්‍රනාන්දු මහතා
10.	මහා නගර සභා මන්ත්‍රී	-	ඩී. ශාන්තිනී වල්ගම ද සිල්වා මහත්මිය
11.	මහා නගර සභා මන්ත්‍රී	-	එල්.ඩී. තිලක් විජේතුංග මහතා
12.	මහා නගර සභා මන්ත්‍රී	-	ඩබ්. ස්වර්ණා විජේරත්න මහත්මිය

13.	මහා නගර සභා මන්ත්‍රී	-	ටී. සංජීව ප්‍රියශාන්ත ප්‍රනාන්දු මහතා
14.	මහා නගර සභා මන්ත්‍රී	-	ඩී. ලීලාරත්න හේවාවිතාරණ මහතා
15.	මහා නගර සභා මන්ත්‍රී	-	අයි.ඩී. මහින්ද පල්ලිආරච්චි මහතා
16.	මහා නගර සභා මන්ත්‍රී	-	එච්.කේ. ෂර්මන් පිලිසියන් ප්‍රනාන්දු මහතා
17.	මහා නගර සභා මන්ත්‍රී	-	ඩබ්. ජීවන්ත සුදර්ශන කුමාර ප්‍රනාන්දු මහතා
18.	මහා නගර සභා මන්ත්‍රී	-	එච්.කේ. ශ්‍රියංග මනෝජ් ප්‍රනාන්දු මහතා
19.	මහා නගර සභා මන්ත්‍රී	-	ජීවන්ත සෙනෙවිරත්න මහතා
20.	මහා නගර සභා මන්ත්‍රී	-	කේ.ඩබ්. සඳුන් චාමර ප්‍රනාන්දු මහතා
21.	මහා නගර සභා මන්ත්‍රී	-	ඩී.එස්. සුසන්ත ඉරෝෂන් ප්‍රනාන්දු මහතා
22.	මහා නගර සභා මන්ත්‍රී	-	ඩබ්. දිලිප් මනෝජ් ප්‍රනාන්දු මහතා
23.	මහා නගර සභා මන්ත්‍රී	-	බී. සරෝජනී මැන්දිස් මහත්මිය
24.	මහා නගර සභා මන්ත්‍රී	-	එම්. චන්ද්‍රසිරි ප්‍රනාන්දු මහතා
25.	මහා නගර සභා මන්ත්‍රී	-	එම්. ඉන්ද්‍රජිත් ප්‍රනාන්දු මහතා

පහත නම් සඳහන් මහා නගර සභා මන්ත්‍රීවරුන් 2026.09.04 දින පැවති ඉඩම් හා නගර සංවර්ධනය පිළිබඳ ස්ථාවර කමිටු වාර්තාවේ අංක 02(02), 02(03), 02(06) හා 02(10) යන කමිටු නිර්දේශයන්ට පක්ෂව ඡන්දය ප්‍රකාශ කළ අතර, අනෙකුත් සියලුම කමිටු නිර්දේශයන්ට පක්ෂව හෝ විපක්ෂව ඡන්දය ප්‍රකාශ කිරීමෙන් වැළකී සිටින ලදි.

1.	මහා නගර සභා මන්ත්‍රී	-	ඩබ්. මැක්සි ජේ. ප්‍රනාන්දු මහතා
2.	මහා නගර සභා මන්ත්‍රී	-	එම්. තිලකසිරි ප්‍රනාන්දු මහතා
3.	මහා නගර සභා මන්ත්‍රී	-	පී. සජිත් දුමින්ද පීරිස් මහතා
4.	මහා නගර සභා මන්ත්‍රී	-	ඒ. එච්. සුරේෂ් ඉන්දික මහතා
5.	මහා නගර සභා මන්ත්‍රී	-	යූ. අනුරසිරි ජේ. ද සිල්වා මහතා
6.	මහා නගර සභා මන්ත්‍රී	-	යූ. එල්. සේනක දමයන්ත ද සිල්වා මහතා
7.	මහා නගර සභා මන්ත්‍රී	-	මේරියන් ලිහිණි ප්‍රනාන්දු මහත්මිය
8.	මහා නගර සභා මන්ත්‍රී	-	සිත්ති මසිනා බක්කර් මහත්මිය
9.	මහා නගර සභා මන්ත්‍රී	-	එම්. ශිරෝමි ඉන්දිකා කුරේ මහත්මිය
10.	මහා නගර සභා මන්ත්‍රී	-	එස්. වදුන් රොමේෂ් ප්‍රනාන්දු මහතා
11.	මහා නගර සභා මන්ත්‍රී	-	එල්. දිලිප් රොෂාන් කුමාර පෙරේරා මහතා
12.	මහා නගර සභා මන්ත්‍රී	-	ඩබ්. සුරේෂ් ප්‍රේමකුමාර ප්‍රනාන්දු මහතා
13.	මහා නගර සභා මන්ත්‍රී	-	ඩබ්. සමීර ප්‍රභාත් ප්‍රනාන්දු මහතා
14.	මහා නගර සභා මන්ත්‍රී	-	ඩබ්. ඩී. බ්‍රෙන්ඩන් හිමාෂා ක්‍රිස්ටල්කාන්ත මහතා
15.	මහා නගර සභා මන්ත්‍රී	-	පී. සුලක්ෂිකා තිලක්ෂනී ප්‍රනාන්දු මෙනෙවිය
16.	මහා නගර සභා මන්ත්‍රී	-	හරිෂ් චන්දන පිලානවිතානගේ මහතා
17.	මහා නගර සභා මන්ත්‍රී	-	ඩබ්. ඩී. රංජලා එස්. ජයතුංග මහත්මිය
18.	මහා නගර සභා මන්ත්‍රී	-	ඩී. එම්. මනෝජ් මධුරංග විජයරත්න මහතා
19.	මහා නගර සභා මන්ත්‍රී	-	ඕ. දිනුෂි කෞෂල්‍යා පෙරේරා මහත්මිය
20.	මහා නගර සභා මන්ත්‍රී	-	එච්. එල්. තිලිණි නෙත්සරණි මෙනෙවිය
21.	මහා නගර සභා මන්ත්‍රී	-	එම්. ප්‍රියනාත් මැකන්සි මැන්දිස් මහතා

පහත නම් සඳහන් මහා නගර සභා මන්ත්‍රීවරුන් 2026.09.04 දින පැවති ඉඩම් හා නගර සංවර්ධනය පිළිබඳ ස්ථාවර කමිටු වාර්තාවේ සියලුම කමිටු නිර්දේශයන් සඳහා විපක්ෂව ඡන්දය ප්‍රකාශ කරන ලදි.

1. මහා නගර සභා මන්ත්‍රී - ඩී. එම්. සුජිත් පුෂ්පකුමාර මහතා
2. මහා නගර සභා මන්ත්‍රී - පී. එම්. ෂෙයාන් දුලිප් තිසේරා මහතා

පහත නම් සඳහන් මහා නගර සභා මන්ත්‍රීවරුන් 2026.09.04 දින පැවති ඉඩම් හා නගර සංවර්ධනය පිළිබඳ ස්ථාවර කමිටු වාර්තාවේ සියලුම කමිටු නිර්දේශයන්ට පක්ෂව හෝ විපක්ෂව ඡන්දය ප්‍රකාශ කිරීමෙන් වැළකී සිටින ලදී.

1. මහා නගර සභා මන්ත්‍රී - ඩී. සමන්ත සිල්වා මහතා
2. මහා නගර සභා මන්ත්‍රී - ඩබ්. සුරේෂ් ප්‍රේමකුමාර ප්‍රනාන්දු මහතා

2026.09.04 දින පැවති ඉඩම් හා නගර සංවර්ධනය පිළිබඳ ස්ථාවර කමිටු වාර්තාවේ සියලුම කමිටු නිර්දේශයන් වැඩි ඡන්දයෙන් සභා සම්මත විය.

(එම අවස්ථාවේ දී පහත නම් සඳහන් මහා නගර සභා මන්ත්‍රීවරු සභා ගැබෙහි නොසිටියහ

1. මහා නගර සභා මන්ත්‍රී - එල්. ඔසඳ හර්ෂණ අබේකෝන් මහතා)

06(02) 2026.09.04 දින පැවති මහජන උපයෝගීතාව, කාන්තා හා ප්‍රජා සංවර්ධන පිළිබඳ ස්ථාවර කමිටු වාර්තාවේ නිර්දේශයන් සලකා බැලීම.

<u>මහා නගර සභා මන්ත්‍රී - එල්. ඔසඳ හර්ෂණ අබේකෝන් මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, 02(10) කරුණ මේක ගොඩක් හොඳ යෝජනාවක්. මේකේ පෙර පාසල් දරුවන්ගේ අනාරක්ෂිත බව පිළිබඳව තමයි ඔබතුමිය හොයලා බලලා තියෙන්නේ. පහුගිය කාලෙත් නාලිකා වල ගියා දරුවෙක් වැටිලා මැරෙනවා. ඒ නිසා මේ ගැන හරියටම හොයලා බලලා කරමු නගරාධිපතිතුමා. ඇමුණුම් අංක 02 ඒකේ තියෙනවා විදුලි අධිකාරිතුමා දාලා තියෙනවා මලගෙවල් වලටගහන ෆෑලෑෂ් ලයිට් 33ක් තිබුණා මේ වෙනකොට ලයිට් 22ක්ම පිලිස්සිලා තියෙන්නේ කියලා.

<u>ගරු නගරාධිපති - කේ. ඩී. නිශාන්ත පුදිනාන්දු මහතා</u>

ගරු මහා නගර සභා මන්ත්‍රීවරුනී, මේ වෙනකොට අපි ෆෑලෑෂ් ලයිට් 30ක් ඇනවුම් කරලා තියෙන්නේ.

<u>මහා නගර සභා මන්ත්‍රී - යූ. අනුරසිරි ජයලාල් ද සිල්වා මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, 02(02) සභාපතිතුමිය විසින් ඉදිරිපත් කරන ලද කරුණ. පෙර පාසල්වල පවතින අඩුපාඩු හා සම්බන්ධව, 2025.06.26 දින සහ 2025.07.04 දින මෙම කමිටුව මගින් සිදු කළ පෙර පාසල් නිරීක්ෂණ චාරිකාවේදී ඉදිරිපත් කළ නිර්දේශ ඇතුළත් වාර්තාව ගරු නගරාධිපතිතුමනි, මේක දැන් වසරකට වැඩියි මේගොල්ලන් නිරීක්ෂණයට ගිහිල්ලා. නමුත් මේකේ උක්ත කරුණ සලකා බැලූ කමිටුව, පෙර පාසල් පිහිටි ගොඩනැගිලි වල පවත්නා භෞතික තත්වයන් හා පවත්නා වැසිකිළි වල පහසුකම් අනුව බේබි කොමඩ් සවි කළ හැකිව තිබූ සියලු පෙර පාසල් සඳහා මේ වන විට බේබි කොමඩ් සවි කිරීම. ඒ කියන්නේ මේ පෙර පාසල් කියන්නේ අවුරුදු දෙකත් දෙකහමාරත් අතර දරුවෝ තමයි මේ පාසල් වලට යන්නේ.

ගරු නගරාධිපතිතුමනි, දැන් මේකේ අවුරුද්දකට වැඩියි මේක කරන්නේ නැතුව. ඒකට හේතුව මොකද්ද ගරු නගරාධිපතිතුමා, මම සභාපතිතුමියගෙන් අහනවා ඇයි මේක මෙච්චර කල් තියෙන්නේ කියලා.

<u>මහා නගර සභා මන්ත්‍රී - එම්. බී. සෙව්වන්දි නිලංගිකා ප්‍රනාන්දු මහත්මිය</u>

ගරු නගරාධිපතිතුමනි, බේබි කොමඩ් ඔක්කෝම සවිකරන්න පුලුවන් පෙර පාසල් වලට සවිකරලා ඉවරයි. ඊට පස්සේ පෙර පාසල් කිහිපයක් තියෙනවා ස්කොටින් පෑඩ් තියෙනවා ඒවා අයින් කරලා අළුතින්ම වොෂ්රූම් එක හදලා ඒකට බේබි කොමඩ් හයිකරන්න ඕන. ඒවාට අදාළ ඇස්තමේන්තු ඉදිරියේදී හදලා ඒ ටික වෙනම දාන්න ඕන වෙලා තියෙනවා. සවි කරන්න පුලුවන් හැම පෙර පාසලකටම බේබි කොමඩ් සවි කරලා තියෙන්නේ.

<u>ගරු නගරාධිපති - කේ. ඩී. නිශාන්ත ප්‍රදීනාන්දු මහතා</u>

ගරු මන්ත්‍රීතුමා, දැන් ඒවාට අදාළ අඩුපාඩුකම් හොයලා බලලා ඒවා සම්පූර්ණ වෙමින් තියෙනවා 100%ක්ම තවම ඉවර නැහැ. දැන් බේබි කොමඩ් කියන එක ගොඩක් ඒවගේ වැඩ කටයුතු ටික කරගත්තා. තව සමහරක් ඒවගේ මේවගේ තියෙන දොර ජනෙල්, ගොඩනැඟිල්ලේ තියෙන අඩුපාඩුකම් තියෙනවා. ඒ කටයුතු ටික කෙරෙමින් පවතිනවා. අපිට බස්නාහිර පළාත් සභාවෙන් ගයිඩ්ලයින් එකක් ඉදිරිපත් කරලා තියෙනවා පෙර පාසල් පවත්වාගෙන යනවානම් ඒ ලියාපංදිචි කරන්නේ මෙන්න මේ මට්ටමේ තිබුණොත් කියලා. ඉතින් ඒ නිසා අපිට සිද්ධවෙලා තියෙනවා ඒ මට්ටමට ගන්නනම් ඒ වෙනස්කම් ටික ඉක්මනට කරන්න. මන්ත්‍රීතුමා පෙර පාසල හදපු දවසේ ඉදන් බේබි කොමඩ් තිබුණේ නැහැ.

<u>මහා නගර සභා මන්ත්‍රී - යූ. අනුරසිරි ජයලාල් ද සිල්වා මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, ඔබතුමා කියන කාරණය පැහැදිලියි. දැන් මම කියන්නේ බේබි කොමඩ් විතරක් නෙවෙයි. ඒක් අළුත්වැඩියා කරන්න යනවා ගොඩනැඟිලි. ඇයි මෙච්චර පහු වෙන්නේ හේතුව මොකද්ද කියන එකයි මම අහන්නේ.

<u>ගරු නගරාධිපති - කේ. ඩී. නිශාන්ත ප්‍රදීනාන්දු මහතා</u>

ගරු මන්ත්‍රීතුමා, පහු වෙන්නේ වැඩ වල පමාවන් තියෙන්නේ ඒ වැඩේ පමණක් නොවෙයි වැඩ ගණනාවක් එක්ක තමයි අපි මේ යන්නේ. අපිට කොච්චර ඕන වුණත්, ඔබ කියන දේ හරි. අවුරුද්දක් යනකොට එතැනින් එක වයස් තලයක් යනවා. එතකල් මේක කරලා නැහැ. මම කියන්නේ මේ කර්මාන්ත අංශය පැත්තේ තියෙන ඉතාම කාර්යක්ෂම තැන එතැන.

<u>මහා නගර සභා මන්ත්‍රී - යූ. අනුරසිරි ජයලාල් ද සිල්වා මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, වසරකට මම හිතන්නේ පෙර පාසල් නිවාඩු දෙනවා මාස කිහිපයක්. ඒ කාල සීමාවෙත් කරන්න තිබුණානේ. මේ වැඩ කටයුතු ටික ඉතා ඉක්මනින් කරලා දෙන්න කියලා ඉල්ලා සිටිනවා.

<u>මහා නගර සභා මන්ත්‍රී - ඩී. එම්. සුජිත් පුෂ්පකුමාර මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, අපිට දැනගන්න ඕන කරුනු අංක 02(03) තෙලවල සිඟිති හමුව පෙර පාසල සම්බන්ධයෙන් සාකච්ඡාවක් තිබිලා තියෙනවා. ඒ සාකච්ඡාවේ මොකද්ද වුණේ කියලා දැනගන්න කැමතියි. මම මීට කලින් සභාවේ ඉල්ලීමකුත් කළා සාකච්ඡාවක් තියෙනවා කියලා ආරංචි ඒකට මාවත් කැදවන්න කියලා. මොකද ගමේ මන්ත්‍රීවරයෙක් හැටියට.

ගරු නගරාධිපති - කේ. ඩී. නිශාන්ත ප්‍රදීනාන්දු මහතා

ගරු මන්ත්‍රීතුමා, මට පොඩ්ඩක් ඒ අවස්ථාවක් මඟහැරුණා. මගේ පැත්තෙන් ඒක ටිකක් හොයලා බලන්න බැරිවුණා ඒ අදාළ දැනුම්දීම කළා ද කියලා. මම ඒ සාකච්ඡාවට මැදිහත් වුණා. ඒ සාකච්ඡාවට ප්‍රධාන අපේ පෙර පාසල් ප්‍රජා සංවර්ධන නිලධාරීතුමියත් උප නගරාධිපතිතුමියත් ඒ වගේම ඒ ගුරුවරියන්, දෙමාපියන් සම්බන්ධ වුණා. ඒවගේම විශේෂයෙන්ම අපේ හාමුදුරුවන් දෙනම සම්බන්ධ වුණා. ඊට අමතරව අපේ මහින්ද මහත්මයා සම්බන්ධ වුණා. ඒ සාකච්ඡාවේ දී කරුණු ගොඩක් සාකච්ඡා වුණා. ඒ සාකච්ඡා කළාට පස්සේ අපේ පැත්තෙන් කිවුවා ඒ නිර්ණායකයන් ටික ලියාපදිංචි කර ගැනීම සඳහා අප විසින් සැපිරිය යුතු කරුණු. එතකොට ඒක පෙරලා හාමුදුරුවොන්ගේ පැත්තෙන් ප්‍රශ්න කිරීම් කළා. මොකද ඒ පෙර පාසලට අදාළව අර ගයිඩ්ලයින් එක හරහා දීලා තිබුණ ලකුණු පිලිගත හැකි ඒවා නෙවෙයි. මම ඒ නිසා ඒ වෙලාවේම කිවුවා සම්පූර්ණයෙන්ම විරුද්ධයි ඒ දීලා තියෙන ලකුණු එක දෙක තුන ඒ ඔක්කෝටම බින්දුව බින්දුව, ප්‍රායෝගිකව අපි පොදුවේ දන්න දේ තමයි අපි ළඟ තියෙන පෙර පාසල් අතර මේක දීර්ඝ කාලයක් විතරක් නෙවෙයි මේකේ යම් ආරක්ෂාවක් සහිතව ආගමික ස්ථානයක් තුළ, අඩුපාඩුකම් හැම එකේම තියෙනවා. එතකොට දැන් අපේ කමිටුව පැත්තෙන් අපේ මන්ත්‍රීවරු බලලා ඒගොල්ලන් දැකපු ප්‍රධාන දේ තමයි ඒ ගොඩනැඟිල්ලේ තියෙන ස්වභාවය සහ එතැන පොල් ගසක් තියෙනවා, ළිඳක් තියෙනවා ඊට අමතරව මේ ළඟදිත් බල්ලෙක් ළමයෙකු පිටිපස්සෙන් එලවලා තිබුණා, ඒ වෙලාවේ ළමයා වැටිලා තියෙනවා. ඒ වගේ දේවල් ටිකක් තියෙනවා. ඉතින් මම හිතනවා දැන් මේකේ තියෙන මේ වෙනස්කම් ටික කළ යුතුයි. මේ භෞතික පැත්තේ තියෙන වෙනස්කම් ටික දැන් හාමුදුරුවෝ එකඟයි. ඒ නිසා මේක මෙතනින් එහාට ගෙනියන්න නෙවෙයි මෙතන තියලා සංවර්ධනය කරන්න ඕන කියන තැන මම ඉන්නවා. ඊළඟට කමිටුව තමයි සාකච්ඡා කරලා ඉවරවෙලා සභාවට ඒක කියන්න ඕන මම ඉන්න ස්ථාවරය තමයි ඒ සාකච්ඡාවේ දී මතු වෙච්ච කරුණුත් එක්ක හාමුදුරුවොත්, දෙමාපියොත්, ගුරුවරුනුත් එකඟයිනම් අපි මොකටද පෙර පාසල ගෙනියන්නේ.

මහා නගර සභා මන්ත්‍රී - ඩී. එම්. සුජිත් පුෂ්පකුමාර මහතා

ගරු නගරාධිපතිතුමනි, බොහෝම ස්තූතියි. ඒ කියන්නේ තෙලවල පෙර පාසල තියෙනවා. ගරු නගරාධිපතිතුමනි, ඊළඟට තියෙනවා 02(10) පෙර පාසල් වල අනාරක්ෂිත තත්වයන් පිළිබඳව වාර්තා කිරීම මම සහ අපේ විපක්ෂ නායකතුමා එක්ක අපි අර ගේ ගිනි ගත්ත එක බලන්න ගියාම විපක්ෂ නායකතුමා එන්න පොඩ්ඩක් පරක්කු වුණ නිසා මම ගියා එතැන තියෙන පෙර පාසලට. පෙර පාසල් ගුරුවරිය කකුලේ තුවාලයක් තියාගෙන හිටියා. පස්සේ මම ඇහුවා ඔබතුමියගේ කකුල මොකද්ද වෙලා තියෙන්නේ කියලා. බොහෝම අමාරුවෙන් එතුමිය ඇවිද්දේ. කකුල ගේට්ටුවේ වැදිලා, ගේට්ටුව කැඩිලා ගේට්ටුව වහන්න ගිහිල්ලා ඒකට කකුල කැපිලා. එතකොට එතුමිය බොහෝම අපහසුතාවයකින් ඉන්නවා. ඒ ගේට්ටුව ගැන ආපසු බැලිල්ලක් නැහැ ඒක එහෙම්මමයි. ආයේ ළමයෙකුට කකුලක් තුවාල වුණත් ඒකෙන් ඔච්චර තමයි. ඒ නිසා කරුණාකරලා මම හිතන්නේ මේකේ මේ ආරක්ෂිත තත්වයන් පිළිබඳව වාර්තා වෙලාවත් නැහැ. ඒ නිසා සොයිසාපුර පෙර පාසලේ ගේට්ටුවේ කැඩිච්ච කොටස වැල්ඩින් කරලා හදලා දෙන්න ඒ අනතුර වළක්වා ගන්න. ඒ සම්බන්ධයෙන් අවශය කටයුතු කරලා ළමයින්ගේ සුරක්ෂිතභාවය තහවුරු කරලා දෙන්න.

ගරු නගරාධිපතිතුමනි, අංක 02(11) කමිටු සභාපති, මහා නගර සභා මන්ත්‍රී, එම්.බී. සෙව්වන්දි නිලංගිකා ප්‍රනාන්දු මහත්මිය විසින් ඉදිරිපත් කරන ලද පහත කරුණු සලකා බැලීම. මේකේ ගරු නගරාධිපතිතුමනි, ප්‍රශ්ණාවලියක් දාලා තියෙන්නේ. මොරටුව මහා නගර සභාව මගින් මිලදී ගත් වීදි ලාම්පු බල්බ ප්‍රමාණය, එක් බල්බයක වෝල්ටීය අගය, මිල සහ වගකීම් කාලය, ඩඉන් මේ දක්වා පිළිස්සුණු බල්බ සංඛ්‍යාව සහ එම බල්බ වෙනුවෙන් අදාල වගකීම් කාලය අනුව නැවත ලබාගත් බල්බ සංඛ්‍යාව යන කරුණු පිළිබඳ වාර්තාවක් ද, සභාව සතුව අවමංගල්‍ය අවස්ථා සඳහා ප්‍රදේශයේ ජනතාව වෙත ලබා දෙන ෆ්ලැෂ් ලයිට් ප්‍රමාණය සහ ඉන් අලුත්වැඩියා කටයුතු සඳහා ඇති බල්බ සංඛ්‍යාවත්, නව බල්බ සපයා ගත යුතුද, එසේ නම් එය කොපමණක්ද සහ එය කඩිනමින් සපයා ගැනීමට අදාළ සඳහා යොමු වීමටත්, කියලා තියෙනවා. මේක යෝජනාවක් නෙවෙයි, මේක ප්‍රශ්නාවලියක්. මේක මහා සභාවට ප්‍රශ්ණාවලියක් හැටියට දාන්න ඕන එකක්. ඉතින් මම හිතන්නේ සභාපතිතුමිය තවම අලුත්නේ. ඒ කියන්නේ තාම ඒගොල්ලන්ට අත්දැකීම් නැහැනේ. ඒ නිසා ඔබතුමා පොඩ්ඩක් කියලා දෙන්න මේ වගේ ඒවා යෝජනා නෙවෙයි. හැබැයි මේකේ වැදගත් දෙයක් තිබුණා. දුලිසිරි මහත්තයාගේ උත්තරයක් දිලා තිබුණා. ඒකට දුල්සිරි මහත්තයාගේ උත්තරයක් දීලා තිබුණා. ඒ උත්තරය තමයි ගරු නගරාධිපතිතුමනි, මළගෙවල් සඳහා ඉදිරිපත් කරනු ලබන ෆැලැෂ් ලයිට් ප්‍රදේශයේ ජනතාවගේ අවමංගල්‍ය අවස්ථාවන් සඳහා ලබා දෙන් ෆැලැෂ් ලයිට් ප්‍රමාණය 33ක් වන අතර, එම ෆැලැෂ් ලයිට් 33න් මේ වනවිට එයින් ෆැලැෂ් ලයිට් 22ක් පිලිස්සි ඇත, මෙහෙම කියන්නේ විදුලි අධිකාරී. ඉතින් නගරාධිපතිතුමනි, ඒ නිසා කරුණාකරලා ඒ සම්බන්ධයෙන් සොයා බලන්න.

ගරු නගරාධිපතිතුමනි, සාහිත්‍යාංජලි 2026 සාහිත්‍ය කලා උළෙල. මේකේ තියෙනවා අංක IV කරුණ සාහිත්‍ය හා කලාව පදනම් කරගත් මාතෘකා යටතේ අධ්‍යාපනික ප්‍රදර්ශන කුටි පැවැත්වීමට ප්‍රදේශයේ පාසල් සඳහා අවස්ථාව ලබාදීම. ඒ සඳහා ඔවුන්ට නොමිලේ ඉඩකඩ හා විදුලිය ලබාදීමට තීරණය විය. මොරටුව වේල්ස් කුමර විද්‍යාලය, වේල්ස් කුමරි විද්‍යාලය, මොරටු මහා විද්‍යාලය, ජයලත් අප ස්වාමි දුගේ කන්‍යාරාමය, සෙබස්තියන් විද්‍යාලය, පුවක්අරඹ මෙතෝදිස්ත උසස් විදුහල සහ වීරපුරන්අප්පු විද්‍යාලය. ගරු නගරාධිපතිතුමනි, මොකද්ද මේ කරන්නේ. මේ මොරටුවේ පාසල් 33ක් ද කොහෙද තියෙනවා. ඒ පාසල් 33ටම ලියුම යවන්න. ඒ 33න්ම දක්ෂ ළමයි ඉන්න පුලුවන් ඒ පාසල් ඇතුලේ. ප්‍රාථමික පාසලක් ගත්තොත් ඒ පාසලේ දක්ෂතාවය තියෙන කණ්ඩායමක් එකතු කරගන්න පුලුවන්. ඒ නිසා මේ දරුවන්ට මම කියන්නේ මේ නමක් තියෙන පාසලක් විතරක් මෙතැනට අරගෙන, මම හිතන්නේ කවුරුහරි කියලා වෙන්න ඇති මෙතෝදිස්ත විද්‍යාලය හා වීරපුරන්අප්පු විද්‍යාලය දාලා තියෙන්නේ. ඊට ඉස්සෙල්ලා දාලා තියෙන්නේ අර පාසල් ටික විතරයි. මම කියන්නේ කරුණාකරලා මේ හැම පාසලකටම ලියුම යවන්න මොකද විෂමතාවයක් තියෙන්න බැහැ අපේ මිනිස්සු ඔක්කෝම, අපේ දරුවෝ ඉගෙන ගන්නේ, ඒ නිසා මේ දරුවෝ ඔක්කෝම අපිට පොදුයි. ඒ නිසා මේ සඳහා කරුණාකරලා ඔබතුමා උපදෙස් දෙන්න මේ පාසල් හැම එකකටම ලියුම යවලා ඒගොල්ලන් කැමතියිද? අකමැතියිද? කියන එක වෙනම කතාවක්. නමුත් අපි වෙනස්කමක් කරන්න ඕන නැහැ, ඒගොල්ලන් එන්නේ නැතිනම් ඒක වෙනම කතාවක්.

<u>මහා නගර සභා මන්ත්‍රී - එම්. බී. සෙව්වන්දි නිලංගිකා ප්‍රනාන්දු මහත්මිය</u>

ගරු නගරාධිපතිතුමනි, මේ සම්බන්ධයෙන් පොඩි අදහස් දැක්වීමක් කරන්නම්. ඇත්ත මේකේ පොඩි ගැටලුවක් තියෙනවා මේ වාර්තාවේ. මේ වාර්තාව එන මොහොතේ වෙනකොට සාහිත්‍යාංජලි කමිටු කිහිපයක්ම ගත්තා. දැන් මේ සභා වාර්තාවෙන් පස්සෙත් මන්ත්‍රීතුමා අපි කමිටු 02ක් ගත්තා. එතකොට මම සුරේෂ් මන්ත්‍රීතුමා උප නගරාධිපතිතුමිය පුස්තකාල සහායිකා

ප්‍රදීපිකා මහත්මිය අපි එකතු වෙලා මේ පාසල් ඔක්කෝටම ගියා. පාසල් වලට ලිපි දුන්නා විදුහල්පතිවරු එක්ක කතා කළා. මෙතන නැති පාසල් ගොඩකට අපි ගිහිල්ලා කතා කරලා ලිපි යොමු කරලා තියෙනවා. හැබැයි මේ කමිටු වාර්තාව එනකොට මුලින්ම සාකච්ඡා වුණේ පාසල් 05කට අවස්ථාව දෙමු කියලා. ඒ පදනමේ ඉදලා තමයි මේ පාසල් කිහිපයක් නම් කළේ. නමුත්, ඊට පස්සේ අපි ගිහිල්ලා ලිපි දිලා කතා කරලා තියෙනවා මේ පාසල් වලට. කමිටු වාර්තාව එනකොට ඒ ඔබතුමා කියපු එක හරි. ඒකේ ගැටලුවක් තියෙනවා. ඊට පස්සේ අපි ඒක ගිහිල්ලා කතා කළා පාසල් වලට ලිපි යොමු කරලා.

<u>මහා නගර සභා මන්ත්‍රී - ඩී. එම්. සුජිත් පුෂ්පකුමාර මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, කමිටු වාර්තාවට ආවාම නගර සභාවේ නම මිනිස්සුන්ට යන්නේ වෙනස් විදියකට. ඒ නිසා මේක ඒකේ සටහන් කරන්න, මෙහෙම පාසල් වලට දැනුම් දුන්නා කියලා. මොකද නැතිනම් ඒ මිනිස්සුන්ගේ හිත හොඳ නැති වෙනවානේ. ගරු නගරාධිපතිතුමනි, ඇමුණුම 01(VI) වෙනි කරුණ සම්බන්ධයෙන් රු.5000/-, 3000/-, 2000/- යි වවුචර පත් තියෙනවා සාහිත්‍ය තරඟ ජයග්‍රහණය කළ දරුවන්ට පසුගිය වසරේ ලබාදුන් පරිදීම දෙනවා. ඒකේ තියෙනවා කාර්ය මණ්ඩල තරඟ සඳහා පසුගිය වසරේ ලබාදුන් මූල්‍ය සීමාවන් යටතේම මුදල් ත්‍යාග ම ලබාදීම තීරණය කරන ලදී කියලා. සාමන්‍යයෙන් කමිටු වාර්තාවක එහෙම කියන්න බැහැ. මුදල් තීරණය කොච්චරද රු. 2000/- ද 3000/- ද 10000/- ද 15000/- ද කියලා දාන්න ඕන. ඒ නිසා ඒක සටහන් කරන්න කියන්න නගරාධිපතිතුමා.

<u>මහා නගර සභා මන්ත්‍රී - එම්. තිලකසිරි ප්‍රනාන්දු මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, මේ සුජිත් මන්ත්‍රීතුමා කියපු දේත් එක්කම මේකේ වැදගත්ම දේ තමයි මටනම් අවමංගල්‍ය අවස්ථාවකදී ෆැලෑෂ් ලයිට් සවි කිරීම සඳහා අලුතින් ලයිට් 30ක් ගේන්න කියලා තියෙනවා. අනේ ඉතාම ඉක්මනින් ඒ ටික ගෙනෙල්ලා දෙන්න. ඒක තමයි වෙන්න ඕනම දේ.

<u>මහා නගර සභා මන්ත්‍රී - එම්. ශිරෝමි ඉන්දිකා කුරේ මහත්මිය</u>

ගරු නගරාධිපතිතුමනි, 06 වෙනි කරුණ සම්බන්ධයෙන් අවධානය යොමු කරනවා. මුතුහර දිවා සුරැකුම් මධ්‍යස්ථානය ජූනි මාසේ ඇරලා සැප්තැම්බර් මාසේ 03 වෙනිදා වෙනකොට වහන්න වගේ තීරණ කරලා තියෙනවා වගේ හැඟීමක් තමයි ඇති වෙන්නේ. ඉතින් මම හිතන්නේ මේකට වහන එක සුදුසු ද කියන එක මම අහනවා. මොකද අපි දන්නවා කොළඹ නගර සභාව සහ ඊට අදාළ කොළඹ විශ්ව විද්‍යාලය වගේ තැන් වල දිවා සුරැකුම් මධ්‍යස්ථාන වල දරුවන්ට ඉන්න ඉඩත් නැහැ. ඒ තරම් ඉල්ලුමක් තියෙනවා. ඇයි මෙවැනි ව්‍යාපෘතින් ප්‍රචලිත කරන්නේ නැත්තේ. ග්‍රාම නිලධාරී වසම් 42 මොනවාහරි නොටිස් එකක් දාලා හරි අදාළ අවශ්‍යතා තියෙන අය ඉන්නවා. අපිට හම්බවෙනවා නමුත්, සමහර යොමු කරනවා එකිනෙක්කෙනා අනුව මිල ප්‍රශ්ණ තියෙනවා. නමුත් මේක දැනට ටිකක් වහන්න එපා. මොකද දැන් මෙතැන තියෙනවා මෙතැන සටහන් වෙලා තියෙන විදියට අපිට එහෙම දෙයක් හිතෙනවා. තීරණයක් ගැනීමට නිර්දේශයක් ලබා දෙන මෙන් කාරුණිකව ඉල්ලනවා. දරුවන් ඇතුලත් නොමැති වී නිසා කියලා තියෙනවා. ඉතින් මෙවැනි ව්‍යාපෘතින් මම හිතන්නේ අපි සමාජගත කරන අපේ අවශ්‍යතාවය දරුවන්ට මෙවැනි පහසුකම් සපයන බව අපි අපේ ආසනය මත ප්‍රචලිත කරන ආකාරයක් සකස් කරන්න ඕන කියන එක තමයි මම කියන්නේ.

මහා නගර සභා මන්ත්‍රී - එම්. බී. සෙව්වන්දි නිලංගිකා ප්‍රනාන්දු මහත්මිය

ගරු නගරාධිපතිතුමනි, මන්ත්‍රීතුමිය අපි මුතුහර පෙර පාසලේ දිවා සුරැකුම් මධ්‍යස්ථානය වහන්නේ නැහැ. මේකේ පොඩි ගැටලුවක් තිබුණේ නගරාධිපතිතුමා එකක් ඒකේ මිල පොඩ්ඩක් වැඩියි කියන දේත් ආවා. ඊළඟට මම දකින්නේ වසර මැදදී තමයි මේ දිවා සුරැකුම් මධයස්ථානය විවෘත කලේ. එතකොට ගොඩක් අය මුල් කාලයේ ළමයිව දාලා තිබුණා. හැබැයි මේ වෙනකොට දරුවෝ ඇතුලත් වෙමින් ඉන්නවා. එක දරුවෙක් දිවා සුරැකුම් මධ්‍යස්ථානයේ ඉන්නවා තව කිහිප දෙනෙක් අයදුම්පත් අරගෙන ගිහිල්ලා තියෙනවා. ගරු නගරාධිපතිතුමනි, මේකේ පොඩි ගැටලුවක් මතුවෙලා තියෙනවා. ඒ තමයි අපි මුතුහර දිවා සුරැකුම් මධ්‍යස්ථානයට දරුවන් ඇතුලත් කිරීම දිරි ගැනීමේ අරමුණින් එක් දරුවෙකු වෙනුවෙන් මසකට අයකරන මුදල රුපියල් පන්දහස දක්වා අඩු කිරීමට කමිටුව විදියට නිර්දේශයක් ඉදිරිපත් කළා. නමුත් දැන් මේ 5000 + වැට් වෙලා තියෙනවා. මේ වැට් මුදල් ඉවත් කරලා දෙන්න කියලා මම ඉල්ලා සිටිනවා. වැට් මුදල ඇතුලත් කිරීම රජයේ මූල්‍ය රෙගුලාසි වලට අනුකූලව අත්‍යාවශ්‍යනම් ඒ වැට් මුදල 5000 සීමාවට පහළින් තියන්න.

මහා නගර සභා මන්ත්‍රී - එම්. ශිරෝමි ඉන්දිකා කුරේ මහත්මිය

ගරු නගරාධිපතිතුමනි, ඔව් මට එක මවක් හමුවුණා ඒ මව ඕක තමයි මටත් කිවුවේ. ඒ අම්මා මම හිතන්නේ මෝල්පේ කොට්ඨාශයේ.

මහා නගර සභා මන්ත්‍රී - එම්. බී. සෙව්වන්දි නිලංගිකා ප්‍රනාන්දු මහත්මිය

ගරු නගරාධිපතිතුමනි, වැට් මුදල පන්දාහේ මූල්‍ය සීමාවට ඇතුලත් කරන්න ඊළඟට මන්ත්‍රීවරු සියලුදෙනාම අපේ මේ ආරම්භ කරපු දේ හොඳින්ම නඩත්තු කරගෙන යන්න අපේ ලිහිණි මන්ත්‍රීතුමියගේ යෝජනාවකට අනුව තමයි මේක අපි ආරම්භ කලේ. තමන්ගේ කොට්ඨාශ වල ඉන්න දරුවන්ව මේ සඳහා යොමු කිරීමක් සිදු කරන්න.

මහා නගර සභා මන්ත්‍රී - එම්. ශිරෝමි ඉන්දිකා කුරේ මහත්මිය

ගරු නගරාධිපතිතුමනි, මන්ත්‍රීවරුන් විතරක් නෙවෙයි නගර සභාවේ කාර්යය භාර්යයක් තියෙනවානේ මන්ත්‍රීවරයාගේ විතරක් නෙවෙයි මොකක්හරි ප්‍රවලිත කරන නෝටිස් එකක් හදලා දාන්න.

මහා නගර සභා මන්ත්‍රී - එම්. බී. සෙව්වන්දි නිලංගිකා ප්‍රනාන්දු මහත්මිය

ගරු නගරාධිපතිතුමනි, අපි නෝටිස් එකක් දැම්මා බැනර් ගැහුවා ඊළඟට ප්‍රජා සංවර්ධන අංශය මැදිහත් වෙලා ලීෆ්ලට් බෙදුවා ඒ සේරම කළා මන්ත්‍රීතුමිය.

මහා නගර සභා මන්ත්‍රී - එම්. ශිරෝමි ඉන්දිකා කුරේ මහත්මිය

ගරු නගරාධිපතිතුමනි, මම දැනගන්න කැමිති කොයි කාලේද එහෙම කලේ කියලා.

මහා නගර සභා මන්ත්‍රී - එම්. බී. සෙව්වන්දි නිලංගිකා ප්‍රනාන්දු මහත්මිය

ගරු නගරාධිපතිතුමනි, අපි මේ දේ ආරම්භ කරපු දවසේ ඉදන් මාස 03ක් ඒ දේ කළා එක දිගටම.

මහා නගර සභා මන්ත්‍රී - එම්. ශිරෝමි ඉන්දිකා කුරේ මහත්මිය

ගරු නගරාධිපතිතුමනි, කොට්ඨාස වල මම යෝජනා කරනවා ඔබතුමියට ග්‍රාම නිලධාරී වසම් වල ග්‍රාම නිලධාරී කාර්යාල වල පොඩි නෝටිස් එකක් දාන්න එතකොට අදාළ කට්ටි අවශ්‍යතාවය දැන්ගෙන කට්ටිය එයි.

<u>මහා නගර සභා මන්ත්‍රී - ඒ. එච්. සුරේෂ් ඉන්දික මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, අපේ මහා නගර සභාවේ අවුරුදු 27 ½ ක් මම හිතන්නේ ඔබතුමයි මමයි පත් වෙච්ච කාලේ ඉදලාම අපේ විදුලි අංශයේ සේවය කරපු ජූඩ් සහෝදරයා මම හිතන්නේ මේ මාසේ විශ්‍රාම යනවා ඉතින් අපි ආණ්ඩු පක්ෂයේ හිටියත් විපක්ෂයේ හිටියත් එතුමා එතුමාගේ රාජකාරියේ කිසිදු ගැටලුවක් නැතුව ඉටු කරපු කෙනෙක්. එතුමාට පක්ෂයක් ඇති, නමුත් එතුමා මේ සභාවේ ඒ කිසිදු දෙයක් නොසලකා තමන්ගේ රාජකාරිය රාජකාරී සීමාවන්ටත් එහාට ගිහිල්ලා සිදු කරපු කෙනෙක්. ඉතින් එතුමාගේ විශ්‍රාම දිවියට සුභ පතන්න මම මේක අවස්ථාවක් කර ගන්නවා.

<u>ගරු නගරාධිපති - කේ. ඩී. නිශාන්ත ප්‍රදීනාන්දු මහතා</u>

ගරු මහා නගර සභා මන්ත්‍රීවරුනී, ජූඩ් ඇවිල්ලා සභාවට පක්ෂ සේවකයෙක්. අපි කවුරුහරි කතා කරපුවාම වැඩක් කරගන්න පුලුවන් සේවක මහතෙක්. ඇත්තටම ඔහුට හැකියාවකුත් තියෙනවා ඇත්දැකීම් තියෙනවා අපිට ඉස්සරහාට මොකක්හරි ක්‍රමයක් තියෙනවානම් ඒගොල්ලන්ගේ සේවය නැවත ලබා ගන්න පුලුවන්ද කියලා අපි පොඩ්ඩක් බලමු.

<u>මහා නගර සභා මන්ත්‍රී - බී. සජිත් දුමින්ද පීරිස් මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, සභාවෙන් දරුවොන්ට ලබාදුන්න පොත් කට්ටලය විශිෂ්ඨයි. ඇත්තටම ප්‍රජා සංවර්ධන අංශයටත් කොමසාරිස්තුමිය ඇතුළු තාරක මහතාටත් අනෙකුත් නිලධාරීන්ටත් ස්තූතිවන්ත වෙනවා ඔබතුමා ඒ සඳහා පක්ෂ විපක්ෂ භේදයකින් තොරව අපි හැමෝටම නිසිලෙස ලැබුණා. ඊට පස්සේ අපේ සභා තීන්දුවක් පරිදි මෙතුමා ආයවනා හා පෙත්සම් යටතේත් මතුකළා. ඒක 31 වෙනිදා දක්වා කාලය දීර්ඝ කළා. හැබැයි අපේ ප්‍රජා සංවර්ධන අංශයට ලොකු කාර්යය භාර්යයක් තිබුණා වැඩ සටහන් ක්‍රියාත්මක කරන්න. එතකොට අපිට නැවත වතාවක් අර ග්‍රාම නිලධාරීතුමාගේ නිර්දේශය කියන කොටසත් එක්ක හම්බුණේ විසිවෙනිදා විතර තමයි ඒ අයදුම්පත් ටික. අපි ඊට පස්සේ ඒක භාර දුන්නා. එහෙම භාර දුන්නාට පස්සේ නගරාධිපතිතුමනි, සමහර තැන්වලදී ග්‍රාම නිලාධාරීතුමන්ලා අලුතින් බැදිච්ච පිරිස ඒක අත්සන් කරලා දෙන්න කියපු ඇතැම් කට්ටිය ඒක ප්‍රතික්ෂේප කළා. මොකද පාසලේ තොරතුරු අපි ළඟ හරියට නැහැ. ඒ නිසා අපිට මේ ගැන හරියට පාසල පිළිබඳව නිර්දේශයක් කරන්න බැහැ කියලා ප්‍රතික්ෂේප කරපු අවස්ථා තිබුණා. නැවත වතාවක් ඔවුන්ට ආපහු පාසලට යන්න සිද්ධ වුණා ඒ නිසා. ඉතින් ගරු නගරාධිපතිතුමනි, ඒ අයදුම් පත් සමහරක් ඒවා පළවෙනිදා දෙවනිදා වෙනකොට අපිට ලැබුණ ඒවා තියෙනවා. අපේ පැත්තෙන් තියෙන ප්‍රශ්නය තමයි සීල් ගහලා ගෙනවාට පස්සේ සමහර මිනිස්සු කියන්න පුලුවන් අපි ගෙනෙල්ලා දුන්නු ටික මන්ත්‍රීවරයා ගත්තා කියලා, දුන්නේ නැහැ කියනවට වඩා. ඒ නිසා ගරු නගරාධිපතිතුමනි, පොඩි කාල පරිච්ඡේදයක් මෙතුමා කියන දේට යටත්ව අපිට නැවත වතාවක් අපිට දීලා තියෙන අයදුම්පත් ටිකට අත්සන් කරලා දීලා තියෙන ටිකට පොඩි අවස්ථාවක් ඒ කියන්නේ සතියක් හෝ දෙකක් දෙන්න කියලා ඉල්ලා සිටිනවා.

<u>මහා නගර සභා මන්ත්‍රී - එම්. ශිරෝමි ඉන්දිකා කුරේ මහත්මිය</u>

ගරු නගරාධිපතිතුමනි, මටත් ඒ ප්‍රශ්නය තියෙනවා අයදුම්පත් හතරක. ඇත්තටම සතියක කාලයක් දෙන්න නැත්නම් ඒ මිනිස්සු අපහසුතාවයකට පත්වෙනවා. අපිට විසි වෙනිදා ලැබුණා එතකොට අපිත් උත්සහා කළා උපරිම. එතකොට 20 කියන්නේ දවස් 10යි තිබුණේ. කිවුවේ පළවෙනිදා දෙනවයි කියලා ඒත් දුන්නේ 20 වෙනිදා. දවස් 20ක් පහු කරලා තමයි දුන්නේ.

<u>ගරු නගරාධිපති - කේ. ඩී. නිශාන්ත ප්‍රදීනාන්දු මහතා</u>

ගරු මහා නගර සභා මන්ත්‍රීවරුනී, මම කියන්නේ මේ වගකීම් දරන අය කොච්චර අපුහසුතාවයකට පත්වෙනවාද කියන්නකෝ.

පහත නම් සඳහන් මහා නගර සභා මන්ත්‍රීවරුන් 2026.09.04 දින පැවති මහජන උපයෝගීතාව, කාන්තා හා ප්‍රජා සංවර්ධන පිළිබඳ ස්ථාවර කමිටු වාර්තාවේ සියලුම කමිටු නිර්දේශයන්ට පක්ෂව ඡන්දය ප්‍රකාශ කරන ලදි.

1.	නගරාධිපති	-	කේ.ඩී. නිශාන්ත ප්‍රදීනාන්දු මහතා
2.	නියෝජ්‍ය නගරාධිපති	-	ඩබ්.පී. ප්‍රභාෂණී වික්‍රමසිංහ මහත්මිය
3.	මහා නගර සභා මන්ත්‍රී	-	ඒ.එච්. සුදේශ් ඉන්ද්‍රජිත් කුමාර මහතා
4.	මහා නගර සභා මන්ත්‍රී	-	ඩබ්. රවින්ද්‍ර රංගන ප්‍රනාන්දු මහතා
5.	මහා නගර සභා මන්ත්‍රී	-	ඩබ්. ඉෂාන් දුමින්ද ප්‍රනාන්දු මහතා
6.	මහා නගර සභා මන්ත්‍රී	-	ඩී. සමන් සුජීව මහතා
7.	මහා නගර සභා මන්ත්‍රී	-	එම්.බී. සෙව්වන්දි නිලංගිකා ප්‍රනාන්දු මහත්මිය
8.	මහා නගර සභා මන්ත්‍රී	-	බී. යෝගේෂ ප්‍රියදර්ශණ මෙන්ඩිස් මහතා
9.	මහා නගර සභා මන්ත්‍රී	-	ඩබ්. සුජිත් ඩිල්රෝයි ප්‍රනාන්දු මහතා
10.	මහා නගර සභා මන්ත්‍රී	-	ඩී. ශාන්තිනී වල්ගම ද සිල්වා මහත්මිය
11.	මහා නගර සභා මන්ත්‍රී	-	එල්.ඩී. තිලක් විජේතුංග මහතා
12.	මහා නගර සභා මන්ත්‍රී	-	ඩබ්. ස්වර්ණා විජේරත්න මහත්මිය
13.	මහා නගර සභා මන්ත්‍රී	-	ටී. සංජීව ප්‍රියශාන්ත ප්‍රනාන්දු මහතා
14.	මහා නගර සභා මන්ත්‍රී	-	ඩී. ලීලාරත්න හේවාවිතාරණ මහතා
15.	මහා නගර සභා මන්ත්‍රී	-	අයි.ඩී. මහින්ද පල්ලිආරච්චි මහතා
16.	මහා නගර සභා මන්ත්‍රී	-	එච්.කේ. ෂර්මන් පිලිසියන් ප්‍රනාන්දු මහතා
17.	මහා නගර සභා මන්ත්‍රී	-	ඩබ්. ජීවන්ත සුදර්ශන කුමාර ප්‍රනාන්දු මහතා
18.	මහා නගර සභා මන්ත්‍රී	-	එච්.කේ. ශ්‍රියංග මනෝජ් ප්‍රනාන්දු මහතා
19.	මහා නගර සභා මන්ත්‍රී	-	ජීවන්ත සෙනෙවිරත්න මහතා
20.	මහා නගර සභා මන්ත්‍රී	-	කේ.ඩබ්. සඳුන් චාමර ප්‍රනාන්දු මහතා
21.	මහා නගර සභා මන්ත්‍රී	-	ඩී.එස්. සුසන්ත ඉරෝෂන් ප්‍රනාන්දු මහතා
22.	මහා නගර සභා මන්ත්‍රී	-	ඩබ්. දිලිප් මනෝජ් ප්‍රනාන්දු මහතා
23.	මහා නගර සභා මන්ත්‍රී	-	බී. සරෝජනී මැන්දිස් මහත්මිය
24.	මහා නගර සභා මන්ත්‍රී	-	එම්. චන්ද්‍රසිරි ප්‍රනාන්දු මහතා
25.	මහා නගර සභා මන්ත්‍රී	-	එම්. ඉන්ද්‍රජිත් ප්‍රනාන්දු මහතා

පහත නම් සඳහන් මහා නගර සභා මන්ත්‍රීවරුන් 2026.09.04 දින පැවති මහජන උපයෝගීතාව, කාන්තා හා ප්‍රජා සංවර්ධන පිළිබඳ ස්ථාවර කමිටු වාර්තාවේ අංක 02(01), 02(04), 02(08), 02(09), 02(10), 02(12), 04 හා 05 යන කමිටු නිර්දේශයන්ට පක්ෂව ඡන්දය ප්‍රකාශ කළ අතර, අනෙකුත් සියලුම කමිටු නිර්දේශයන් පක්ෂව හෝ විපක්ෂව ඡන්දය ප්‍රකාශ කිරීමෙන් වැළකී සිටින ලදී.

1.	මහා නගර සභා මන්ත්‍රී	-	ඩබ්. මැක්සි ජේ. ප්‍රනාන්දු මහතා
2.	මහා නගර සභා මන්ත්‍රී	-	එම්. තිලකසිරි ප්‍රනාන්දු මහතා

3.	මහා නගර සභා මන්ත්‍රී	-	එල්. ඔසඳ හර්ෂණ අබේකෝන් මහතා
4.	මහා නගර සභා මන්ත්‍රී	-	පී. සජිත් දුමින්ද පීරිස් මහතා
5.	මහා නගර සභා මන්ත්‍රී	-	යූ. සුදත් ක්‍රිෂාන්ත පෙරේරා මහතා
6.	මහා නගර සභා මන්ත්‍රී	-	යූ. අනුරසිරි ජේ. ද සිල්වා මහතා
7.	මහා නගර සභා මන්ත්‍රී	-	යූ. එල්. සේනක දමයන්ත ද සිල්වා මහතා
8.	මහා නගර සභා මන්ත්‍රී	-	මේරියන් ලිහිණි ප්‍රනාන්දු මහත්මිය
9.	මහා නගර සභා මන්ත්‍රී	-	සිත්ති මසිනා බක්කර් මහත්මිය
10.	මහා නගර සභා මන්ත්‍රී	-	එම්. ශිරෝමි ඉන්දිකා කුරේ මහත්මිය
11.	මහා නගර සභා මන්ත්‍රී	-	එස්. චදුන් රොමේෂ් ප්‍රනාන්දු මහතා
12.	මහා නගර සභා මන්ත්‍රී	-	එල්. දිලිජ් රොෂාන් කුමාර පෙරේරා මහතා
13.	මහා නගර සභා මන්ත්‍රී	-	ඩබ්. සමීර ප්‍රභාත් ප්‍රනාන්දු මහතා
14.	මහා නගර සභා මන්ත්‍රී	-	ඩබ්. ඩී. බ්‍රෙන්ඩන් හිමාෂා ක්‍රිස්ටිල්කාන්ත මහතා
15.	මහා නගර සභා මන්ත්‍රී	-	පී. සුලක්ෂිකා තිලක්ෂනී ප්‍රනාන්දු මෙනෙවිය
16.	මහා නගර සභා මන්ත්‍රී	-	හරිෂ් චන්දන පිලානවිතානගේ මහතා
17.	මහා නගර සභා මන්ත්‍රී	-	ඩබ්. ඩී. රංජලා එස්. ජයතුංග මහත්මිය
18.	මහා නගර සභා මන්ත්‍රී	-	ඩී. එම්. මනෝජ් මධුරංග විජයරත්න මහතා
19.	මහා නගර සභා මන්ත්‍රී	-	ඕ. දිනුෂි කෞෂල්‍යා පෙරේරා මහත්මිය
20.	මහා නගර සභා මන්ත්‍රී	-	එච්. එල්. තිලිණි නෙත්සරණි මෙනෙවිය
21.	මහා නගර සභා මන්ත්‍රී	-	එම්. ප්‍රියනාත් මැකන්සි මැන්දිස් මහතා

පහත නම් සඳහන් මහා නගර සභා මන්ත්‍රීවරයා 2026.09.04 දින පැවති මහජන උපයෝගීතාව, කාන්තා හා ප්‍රජා සංවර්ධන පිළිබඳ ස්ථාවර කමිටු වාර්තාවේ අංක 02(01), 02(04), 02(05), 02(08), 02(09), 02(10), 02(12), 04 හා 05 යන කමිටු නිර්දේශයන්ට පක්ෂව ඡන්දය ප්‍රකාශ කළ අතර, අනෙකුත් සියලුම කමිටු නිර්දේශයන් පක්ෂව හෝ විපක්ෂව ඡන්දය ප්‍රකාශ කිරීමෙන් වැළකී සිටින ලදී.

1.	මහා නගර සභා මන්ත්‍රී	-	ඒ. එච්. සුරේෂ් ඉන්දික මහතා

පහත නම් සඳහන් මහා නගර සභා මන්ත්‍රීවරුන් 2026.09.04 දින පැවති මහජන උපයෝගීතාව, කාන්තා හා ප්‍රජා සංවර්ධන පිළිබඳ ස්ථාවර කමිටු වාර්තාවේ සියලුම කමිටු නිර්දේශයන්ට විපක්ෂව ඡන්දය ප්‍රකාශ කරන ලදී.

1.	මහා නගර සභා මන්ත්‍රී	-	ඩී. එම්. සුජිත් පුෂ්පකුමාර මහතා
2.	මහා නගර සභා මන්ත්‍රී	-	පී. එම්. ෂෙයාන් දුලිප් තිසේරා මහතා

පහත නම් සඳහන් මහා නගර සභා මන්ත්‍රීවරුන් 2026.09.04 දින පැවති මහජන උපයෝගීතාව, කාන්තා හා ප්‍රජා සංවර්ධන පිළිබඳ ස්ථාවර කමිටු වාර්තාවේ සියලුම කමිටු නිර්දේශයන් පක්ෂව හෝ විපක්ෂව ඡන්දය ප්‍රකාශ කිරීමෙන් වැළකී සිටින ලදී.

3.	මහා නගර සභා මන්ත්‍රී	-	ඩී. සමන්ත සිල්වා මහතා
4.	මහා නගර සභා මන්ත්‍රී	-	ඩබ්. සුරේෂ් ප්‍රේමකුමාර ප්‍රනාන්දු මහතා

2026.09.04 දින පැවති මහජන උපයෝගීතාව, කාන්තා හා ප්‍රජා සංවර්ධන පිළිබඳ ස්ථාවර කමිටු වාර්තාවේ සියලුම කමිටු නිර්දේශයන් වැඩි ඡන්දයෙන් සභා සම්මත විය.

06(3) 2026.09.07 දින පැවති ආයතන හා නීතිය පිළිබඳ ස්ථාවර කමිටු වාර්ථාවේ නිර්දේශයන් සලකා බැලීම.

පහත නම් සඳහන් මහා නගර සභා මන්ත්‍රීවරුන් 2026.09.07 වන දින පැවති ආයතන හා නීතිය පිළිබඳ ස්ථාවර කමිටු වාර්තාවේ සියළුම කමිටු නිර්දේශයන්ට පක්ෂව ඡන්දය ප්‍රකාශ කරන ලදී.

1.	නගරාධිපති	-	කේ.ඩී.නිශාන්ත ප්‍රදිනාන්දු මහතා
2.	නියෝජ්‍ය නගරාධිපති	-	ඩබ්.පී.ප්‍රභාෂණී වික්‍රමසිංහ මහත්මිය
3.	මහා නගර සභා මන්ත්‍රී	-	ඒ.එච්.සුදේශ් ඉන්ද්‍රජීත් කුමාර මහතා
4.	මහා නගර සභා මන්ත්‍රී	-	ඩබ්.රවින්ද්‍ර රංගන ප්‍රනාන්දු මහතා
5.	මහා නගර සභා මන්ත්‍රී	-	ඩී.සමන් සුජීව මහතා
6.	මහා නගර සභා මන්ත්‍රී	-	එම්.බී.සෙව්වන්දි නිලංගිකා ප්‍රනාන්දු මහත්මිය
7.	මහා නගර සභා මන්ත්‍රී	-	ඩබ්.සුජීත් ඩිල්රෝයි ප්‍රනාන්දු මහතා
8.	මහා නගර සභා මන්ත්‍රී	-	ඩී.ශාන්තිනී වල්ගම ද සිල්වා මහත්මිය
9.	මහා නගර සභා මන්ත්‍රී	-	එල්.ඩී.තිලක් විජේතුංග මහතා
10.	මහා නගර සභා මන්ත්‍රී	-	ඩී.ලීලාරත්න හේවාවිතාරණ මහතා
11.	මහා නගර සභා මන්ත්‍රී	-	අයි.ඩී.මහින්ද පල්ලිආරච්චි මහතා
12.	මහා නගර සභා මන්ත්‍රී	-	එච්.කේ.ෂර්මන් පිලිසියන් ප්‍රනාන්දු මහතා
13.	මහා නගර සභා මන්ත්‍රී	-	එච්.කේ.ශ්‍රියංග මනෝජ් ප්‍රනාන්දු මහතා
14.	මහා නගර සභා මන්ත්‍රී	-	එම්.චන්ද්‍රසිරි ප්‍රනාන්දු මහතා
15.	මහා නගර සභා මන්ත්‍රී	-	එම්.ඉන්ද්‍රජීත් ප්‍රනාන්දු මහතා

පහත නම් සඳහන් මහා නගර සභා මන්ත්‍රීවරුන් 2026.09.07 වන දින පැවති ආයතනය හා නීතිය පිළිබඳ ස්ථාවර කමිටු වාර්තාවේ අංක 02(4), 02(07), 02(8) හා 04 දරණ කමිටු නිර්දේශයන්ට පක්ෂව ඡන්දය ප්‍රකාශ කළ අතර, අංක 02(1), 02(2), 02(3), 02(5), 02(6), 02(9) හා 03 කමිටු නිර්දේශයන්ට පක්ෂව හෝ විපක්ෂව ඡන්දය ප්‍රකාශ කිරීමෙන් වැළකී සිටි අතර, අනෙකුත් සියලුම කමිටු නිර්දේශයන්ට විපක්ෂව ඡන්දය ප්‍රකාශ කරන ලදී.

1.	මහා නගර සභා මන්ත්‍රී	-	එම්.ලිහිණි ප්‍රනාන්දු මහත්මිය
2.	මහා නගර සභා මන්ත්‍රී	-	සිත්ති මසීනා බක්කර් මහත්මිය
3.	මහා නගර සභා මන්ත්‍රී	-	එම්.ශිරෝමි ඉන්දිකා කුරේ මහත්මිය
4.	මහා නගර සභා මන්ත්‍රී	-	එල්. දිලිජ් රොෂාන් කුමාර පෙරේරා මහතා
5.	මහා නගර සභා මන්ත්‍රී	-	ඩබ්.ඒ.ඩී.බ්‍රෙන්ඩන් එච්.ක්‍රිස්ටල් කාන්ත මහතා
6.	මහා නගර සභා මන්ත්‍රී	-	පී. සුලක්ෂිකා තිලක්ෂනී ප්‍රනාන්දු මෙනවිය
7.	මහා නගර සභා මන්ත්‍රී	-	හරිෂ් චන්දන පිලානවිතානගේ මහතා
8.	මහා නගර සභා මන්ත්‍රී	-	ඩබ්.ඩී.රංජලා එස්.ජයතුංග මහත්මිය
9.	මහා නගර සභා මන්ත්‍රී	-	ඩී.එම්.මනෝජ් මධුරංග විජයරත්න මහතා
10.	මහා නගර සභා මන්ත්‍රී	-	ඕ. දිනූෂි කෞෂල්‍යා පෙරේරා මහත්මිය

පහත නම් සඳහන් මහා නගර සභා මන්ත්‍රීවරයා 2026.09.07 දින පැවති ආයතනය හා නීතිය පිළිබඳ ස්ථාවර කමිටු වාර්තාවේ සියළුම කමිටු නිර්දේශයන්ට විපක්ෂව ඡන්දය ප්‍රකාශ කරන ලදී.

1.	මහා නගර සභා මන්ත්‍රී	-	පී.එම්.ෂෙයාන් දුලිප් තිසේරා මහතා

2026.09.07 දින පැවති ආයතනය හා නීතිය පිළිබඳ ස්ථාවර කමිටු වාර්තාවේ සියලුම කමිටු නිර්දේශයන් වැඩි ඡන්දයෙන් සභා සම්මත විය.

(එම අවස්ථාවේ දී පහත නම් සඳහන් මහා නගර සභා මන්ත්‍රීවරු සභා ගැබෙහි නොසිටියහ

1. මහා නගර සභා මන්ත්‍රී - ඩබ්.ඉෂාන් දුමින්ද ප්‍රනාන්දු මහතා
2. මහා නගර සභා මන්ත්‍රී - බී.යෝගේෂ ප්‍රියදර්ශණ මෙන්ඩිස් මහතා
3. මහා නගර සභා මන්ත්‍රී - ඩබ්.ස්වර්ණා විජේරත්න මහත්මිය
4. මහා නගර සභා මන්ත්‍රී - ටී.සංජීව ප්‍රියශාන්ත ප්‍රනාන්දු මහතා
5. මහා නගර සභා මන්ත්‍රී - ඩබ්.ජීවන්ත සුදර්ශන කුමාර ප්‍රනාන්දු මහතා
6. මහා නගර සභා මන්ත්‍රී - ජීවන්ත සෙනෙවිරත්න මහතා
7. මහා නගර සභා මන්ත්‍රී - කේ.ඩබ්.සදුන් චාමර ප්‍රනාන්දු මහතා
8. මහා නගර සභා මන්ත්‍රී - ඩී.එස්.සුසන්ත ඉරෝෂන් ප්‍රනාන්දු මහතා
9. මහා නගර සභා මන්ත්‍රී - ඩබ්.දිලිප් මනෝජ් ප්‍රනාන්දු මහතා
10. මහා නගර සභා මන්ත්‍රී - බී.සරෝජනී මැන්දිස් මහත්මිය
11. මහා නගර සභා මන්ත්‍රී - ඩබ්. මැක්සි ජේ. ප්‍රනාන්දු මහතා
12. මහා නගර සභා මන්ත්‍රී - ඩී.එම්.සුජිත් පුෂ්පකුමාර මහතා
13. මහා නගර සභා මන්ත්‍රී - ඩී.සමන්ත සිල්වා මහතා
14. මහා නගර සභා මන්ත්‍රී - එම්. තිලකසිරි ප්‍රනාන්දු මහතා
15. මහා නගර සභා මන්ත්‍රී - එල්. ඔසඳ හර්ෂණ අබේකෝන් මහතා
16. මහා නගර සභා මන්ත්‍රී - බී.සජිත් දුමින්ද පීරිස් මහතා
17. මහා නගර සභා මන්ත්‍රී - ඒ.එච්. සුරේෂ් ඉන්දික මහතා
18. මහා නගර සභා මන්ත්‍රී - යූ.සුදත් ක්‍රිෂාන්ත පෙරේරා මහතා
19. මහා නගර සභා මන්ත්‍රී - යූ.අනුරසිරි ජයලාල් ද සිල්වා මහතා
20. මහා නගර සභා මන්ත්‍රී - යූ.එල්. සේනක දමයන්ත ද සිල්වා මහතා
21. මහා නගර සභා මන්ත්‍රී - එස්. වදුන් රොමේෂ් ප්‍රනාන්දු මහතා
22. මහා නගර සභා මන්ත්‍රී - ඩබ්.සුරේෂ් ප්‍රේමකුමාර ප්‍රනාන්දු මහතා
23. මහා නගර සභා මන්ත්‍රී - ඩබ්. සමීර ප්‍රභාත් ප්‍රනාන්දු මහතා
24. මහා නගර සභා මන්ත්‍රී - එච්.එල්.තිළිණි නෙත්සරණි මෙනවිය
25. මහා නගර සභා මන්ත්‍රී - එම්.ප්‍රියනාත් මැකන්සි මැන්දිස් මහතා)

06(04) 2026.09.08 වන දින පැවති පරිසර, සෞඛ්‍ය හා සනීපාරක්ෂාව පිළිබඳ ස්ථාවර කමිටු වාර්තාවේ නිර්දේශයන් සලකා බැලීම.

පහත නම් සඳහන් මහා නගර සභා මන්ත්‍රීවරුන් 2026.09.08 වන දින පැවති පරිසර, සෞඛ්‍ය හා සනීපාරක්ෂාව පිළිබඳ ස්ථාවර කමිටු වාර්තාවේ සියළුම කමිටු නිර්දේශයන්ට පක්ෂව ඡන්දය ප්‍රකාශ කරන ලදී.

1. නගරාධිපති - කේ.ඩී.නිශාන්ත ප්‍රදිනාන්දු මහතා
2. නියෝජ්‍ය නගරාධිපති - ඩබ්.පී.ප්‍රභාෂණී වික්‍රමසිංහ මහත්මිය
3. මහා නගර සභා මන්ත්‍රී - ඒ.එච්.සුදේශ් ඉන්ද්‍රජිත් කුමාර මහතා
4. මහා නගර සභා මන්ත්‍රී - ඩබ්.රවින්ද්‍ර රංගන ප්‍රනාන්දු මහතා
5. මහා නගර සභා මන්ත්‍රී - ඩී.සමන් සුජීව මහතා
6. මහා නගර සභා මන්ත්‍රී - එම්.බී.සෙව්වන්දි නිලංගිකා ප්‍රනාන්දු මහත්මිය
7. මහා නගර සභා මන්ත්‍රී - ඩබ්.සුජිත් ඩිල්රෝයි ප්‍රනාන්දු මහතා
8. මහා නගර සභා මන්ත්‍රී - ඩී.ශාන්තිනී වල්ගම ද සිල්වා මහත්මිය

9. මහා නගර සභා මන්ත්‍රී - එල්.ඩී.තිලක් විජේතුංග මහතා
10. මහා නගර සභා මන්ත්‍රී - ඩබ්.ස්වර්ණා විජේරත්න මහත්මිය
11. මහා නගර සභා මන්ත්‍රී - ඩී.ලීලාරත්න හේවාවිතාරණ මහතා
12. මහා නගර සභා මන්ත්‍රී - අයි.ඩී.මහින්ද පල්ලිආරච්චි මහතා
13. මහා නගර සභා මන්ත්‍රී - එච්.කේ.ෂර්මන් පිලිසියන් ප්‍රනාන්දු මහතා
14. මහා නගර සභා මන්ත්‍රී - එච්.කේ.ශ්‍රියංග මනෝජ් ප්‍රනාන්දු මහතා
15. මහා නගර සභා මන්ත්‍රී - බී.සරෝජනී මැන්දිස් මහත්මිය
16. මහා නගර සභා මන්ත්‍රී - එම්.චන්ද්‍රසිරි ප්‍රනාන්දු මහතා
17. මහා නගර සභා මන්ත්‍රී - එම්.ඉන්ද්‍රජිත් ප්‍රනාන්දු මහතා

පහත නම් සඳහන් මහා නගර සභා මන්ත්‍රීවරුන් 2026.09.08 වන දින පැවති පරිසර, සෞඛ්‍ය හා සනීපාරක්ෂාව පිළිබඳ ස්ථාවර කමිටු වාර්තාවේ සියළුම කමිටු නිර්දේශයන්ට විපක්ෂව ඡන්දය ප්‍රකාශ කරන ලදී.

1. මහා නගර සභා මන්ත්‍රී - ඩී.එම්.සුජිත් පුෂ්පකුමාර මහතා
2. මහා නගර සභා මන්ත්‍රී - එම්.ලිහිණි ප්‍රනාන්දු මහත්මිය
3. මහා නගර සභා මන්ත්‍රී - සිත්ති මෂිනා බක්කර් මහත්මිය
4. මහා නගර සභා මන්ත්‍රී - එම්.ශිරෝමි ඉන්දිකා කුරේ මහත්මිය
5. මහා නගර සභා මන්ත්‍රී - එල්. දිලිජ් රොෂාන් කුමාර පෙරේරා මහතා
6. මහා නගර සභා මන්ත්‍රී - පී.එම්.ෂෙයාන් දුලිජ් තිසේරා මහතා
7. මහා නගර සභා මන්ත්‍රී - ඩබ්.ඒ.ඩී.බ්‍රෙන්ඩන් එච්.ක්‍රිස්ටල් කාන්ත මහතා
8. මහා නගර සභා මන්ත්‍රී - පී. සුලක්ෂිකා තිලක්ෂනී ප්‍රනාන්දු මෙනවිය
9. මහා නගර සභා මන්ත්‍රී - හරිෂ් චන්දන පිලානවිතානගේ මහතා
10. මහා නගර සභා මන්ත්‍රී - ඩබ්.ඩී.රංජලා එස්.ජයතුංග මහත්මිය
11. මහා නගර සභා මන්ත්‍රී - ඩී.එම්.මනෝජ් මධුරංග විජයරත්න මහතා
12. මහා නගර සභා මන්ත්‍රී - ඕ. දිනූෂි කෞෂල්‍යා පෙරේරා මහත්මිය

2026.09.08 වන දින පැවති පරිසර, සෞඛ්‍ය හා සනීපාරක්ෂාව පිළිබඳ ස්ථාවර කමිටු වාර්තාවේ සියලුම කමිටු නිර්දේශයන් වැඩි ඡන්දයෙන් සහා සම්මත විය.

(එම අවස්ථාවේ දී පහත නම් සඳහන් මහා නගර සභා මන්ත්‍රීවරු සභා ගැබෙහි නොසිටියහ

1. මහා නගර සභා මන්ත්‍රී - ඩබ්.ඉෂාන් දුමින්ද ප්‍රනාන්දු මහතා
2. මහා නගර සභා මන්ත්‍රී - බී.යෝගේෂ ප්‍රියදර්ශණ මෙන්ඩිස් මහතා
3. මහා නගර සභා මන්ත්‍රී - ටී.සංජීව ප්‍රියශාන්ත ප්‍රනාන්දු මහතා
4. මහා නගර සභා මන්ත්‍රී - ඩබ්.ජීවන්ත සුදර්ශන කුමාර ප්‍රනාන්දු මහතා
5. මහා නගර සභා මන්ත්‍රී - ජීවන්ත සෙනෙවිරත්න මහතා
6. මහා නගර සභා මන්ත්‍රී - කේ.ඩබ්.සදුන් චාමර ප්‍රනාන්දු මහතා
7. මහා නගර සභා මන්ත්‍රී - ඩී.එස්.සුසන්ත ඉරෝෂන් ප්‍රනාන්දු මහතා
8. මහා නගර සභා මන්ත්‍රී - ඩබ්.දිලිජ් මනෝජ් ප්‍රනාන්දු මහතා
9. මහා නගර සභා මන්ත්‍රී - ඩබ්. මැක්සි ජේ. ප්‍රනාන්දු මහතා
10. මහා නගර සභා මන්ත්‍රී - ඩී.සමන්ත සිල්වා මහතා
11. මහා නගර සභා මන්ත්‍රී - එම්. තිලකසිරි ප්‍රනාන්දු මහතා

12. මහා නගර සභා මන්ත්‍රී - එල්. ඔසඳ හර්ෂණ අබේකෝන් මහතා
13. මහා නගර සභා මන්ත්‍රී - බී.සජිත් දුමින්ද පීරිස් මහතා
14. මහා නගර සභා මන්ත්‍රී - ඒ.එච්. සුරේෂ් ඉන්දික මහතා
15. මහා නගර සභා මන්ත්‍රී - යූ.සුදත් ක්‍රිෂාන්ත පෙරේරා මහතා
16. මහා නගර සභා මන්ත්‍රී - යූ.අනුරසිරි ජයලාල් ද සිල්වා මහතා
17. මහා නගර සභා මන්ත්‍රී - යූ.එල්. සේනක දමයන්ත ද සිල්වා මහතා
18. මහා නගර සභා මන්ත්‍රී - එස්. වදුන් රොමේෂ් ප්‍රනාන්දු මහතා
19. මහා නගර සභා මන්ත්‍රී - ඩබ්.සුරේෂ් ප්‍රේමකුමාර ප්‍රනාන්දු මහතා
20. මහා නගර සභා මන්ත්‍රී - ඩබ්. සමීර ප්‍රභාත් ප්‍රනාන්දු මහතා
21. මහා නගර සභා මන්ත්‍රී - එච්.එල්.තිළිණි නෙත්සරණි මෙනවිය
22. මහා නගර සභා මන්ත්‍රී - එම්.ප්‍රියනාත් මැකන්සි මැන්දිස් මහතා)

06(05) 2026.09.08 වන දින පැවති ක්‍රීඩා කටයුතු හා පොදු විනෝද කටයුතු පිළිබඳ ස්ථාවර කමිටු වාර්තාවේ නිර්දේශයන් සලකා බැලීම.

<u>මහා නගර සභා මන්ත්‍රී - එස්.ඩබ්.වදුන් රොමේෂ් ප්‍රනාන්දු මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, ඉදිබැද්ද ඩග්ලස් ප්‍රනාන්දු ක්‍රීඩාංගණය සම්බන්ධයෙන් ඔබතුමා ගිය කමිටුවේ පොරොන්දුවුණා සති දෙකකින් විකට්ටුව සාදා දෙන බව දෙනට මාසයකුත් ගිහින් තිබෙනවා කොහොමද ඒකේ ප්‍රගතිය.

<u>ගරු නගරාධිපති - කේ.ඩී.නිශාන්ත ප්‍රදීනාන්දු මහතා</u>

ගරු මන්ත්‍රීතුමා, මම වෙනම ගිහිල්ලා මැදිහත්වෙලා කථා කළා, නොකියත් බැහැ කියන්නත් වෙනවා පස් පරීක්ෂා කළා ඒ පස් ගැලපෙන්නේ නැහැ කියලා ප්‍රමිතියක් නැහැ කියලා කිව්වා හැබැයි මම බැලුවා ඒක ආපු දිනය එතැන් සිට සති තුනක කාලයක් ගිහින් තිබෙනවා නැවත මේ මම දුමින්දටත් කථා කරලා කි ව්වා මම ඒ මැදිහත්වීම කළා. පස් කියුබ් 6ක් හොඳ පස්වලින්

අරගෙන දාන එක ඔබතුමා අදාළ ඉංජිනේරුවරයාව හමුවෙලා කථාකරගන්න. කවද්දාද මේක අවසන් කරන්න පුළුවන්ද කියලා අහන්න.

<u>මහා නගර සභා මන්ත්‍රී - එස්.ඩබ්.වදුන් රොමේෂ් ප්‍රනාන්දු මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, තව කරුණක් තිබෙනවා 02(2) යෝජනාව (Grand Stand) සම්බන්ධව, මෙම කරුණ කමිටුව පටන්ගත්තු දා සිට තිබෙන බැවින්, විශ්ව විද්‍යාලයෙන් තාම අපිට ලිපියක් යවාගන්න බැරිවෙලා තිබෙනවා. මේ සම්බන්ධව අපි කමිටුවේදී සාකච්ඡා කළා. අපිට දෙන්න බැරි හේතු මොනවාදෙයි කියලා තව ලිපියක් යවන්න කියලා.

<u>මහා නගර සභා මන්ත්‍රී -ඒ.එච්. සුදේශ් ඉන්ද්‍රජිත් කුමාර මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, මොරටුව විශ්ව විද්‍යාලයෙන් මේක කරන්න බැහැ කියලා වාචිකව සඳහන් කරලා තිබුණා, නමුත් ලිඛිතව එවන්නේ නැහැ කිව්වා මම ඉංජිනේරුතුමා දැනුවත් කළා. ඉංජිනේරුතුමා කමිටුව දැනුවත් කරන්න දැනගන්න ඕනෑ.

මහා නගර සභා මන්ත්‍රී - එස්.ඩබ්.වදුන් රොමේෂ් ප්‍රනාන්දු මහතා
ගරු නගරාධිපතිතුමනි, වෙන ආයතනයකින් මේ පිළිබඳව වාර්තාවක් ගත්තානම් ඉක්මනට කරගන්න පුළුවන්.

මහා නගර සභා මන්ත්‍රී - ඩී.එස්.සුසන්ත ඉරෝෂන් ප්‍රනාන්දු මහතා
ගරු නගරාධිපතිතුමනි, වෙන ආයතනයකින් ගත්තා නම් අපිට ලොකු වියදමක් දරන්න වෙනවා.

ගරු නගරාධිපති - කේ.ඩී.නිශාන්ත ප්‍රදීනාන්දු මහතා
ගරු මන්ත්‍රීතුමා, අපි ළඟ මුදල් තියෙනවා නම් ඒ වියදම දරලා හරි කරන්න ඕනෑම එකක් නම් කරන්න ඕනෑ. මුදල් නැත්නම්, කරන්න බැරිනම් කමිටුවෙන් ඉවත් කරන්න ඕනෑ, පස්සේ කරන්න. කමිටුවේ තියාගෙන මොනවා හරි හේතුවක් ඕනෑ මේක පවත්වාගෙන යන්න, නැත්නම් නිකන් තේරුමක් නැහැ. මම හිතන්නේ මුදල් පිළිබඳ ප්‍රශ්නයක් නෙමෙයි මේකේ තියෙන්නේ.

මහා නගර සභා මන්ත්‍රී - එස්.ඩබ්.වදුන් රොමේෂ් ප්‍රනාන්දු මහතා
ගරු නගරාධිපතිතුමනි, අපි පටන් ගත්තු දා සිටම දිගින් දිගටම තිබෙන ප්‍රශ්නයක්. මේකට විසඳුමක් නැහැ.

මහා නගර සභා මන්ත්‍රී -එච්.චන්දන පී. විතානගේ මහතා
ගරු නගරාධිපතිතුමනි, ක්‍රීඩා කටයුතු හා පොදු විනෝද කටයුතු පිළිබඳ ස්ථාවර කමිටු වාර්තාවේ 02(1) ද සොයිසා ජාත්‍යන්තර ක්‍රිකට් ක්‍රීඩාංගණයේ ඇති ගෘහස්ථ ක්‍රීඩාගාරය සම්බන්ධව දිගින් දිගටම එන ගැටළුව වන්නේ වහලයේ ඇති සෙවිලි තහඩුව ඉවත්වී තිබීම,විදුලි බල්බ පද්ධතිය අකර්මන්‍ය වී තිබීම ඒවගේම දැල් (Net) අබලන් තත්ත්වයට පත්වෙලා තිබීම සහ (Astro turf) එක අපිට පේනවා සම්පූර්ණ මෙම ගෘහස්ථ ක්‍රීඩාංගනයම අකර්මන්‍ය වී තිබෙන බව. මොරටුව තරුණ තරුණියන්ගේ සහ ඒවාගේම පාසල් ක්‍රිකට් දරුවන්ට ක්‍රිකට් ක්‍රීඩාව කරන්න තිබෙන හොඳම ස්ථානයක්. ඒ වාගේම මේ පෞද්ගලික ආයතනවල ගෘහස්ථ ක්‍රීඩාංගන භාවිතා කිරීමේදී විශාල වියදමකුත් දරන්න වෙනවා. අපි කොහොම හරි මෙම ක්‍රීඩාංගනය නැවත පිළිසකර කරගෙන මනා තත්ත්වයට ගෙනල්ලා ක්‍රීඩා කරන්න පුළුවන් තත්ත්වයකට පසුබිම ඇති කර ගැනීම සඳහා ඔබතුමාත් උත්සහයක යෙදෙනවා. ඉතා ඉක්මනින් මෙම කටයුත්ත සාර්ථක කරගැනීම සඳහා හැකි වැඩපිළිවෙලක් සකස් කරන්න කියලා මම ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා.

මහා නගර සභා මන්ත්‍රී - සිත්ති මෂිනා බක්කර් මහත්මිය
ගරු නගරාධිපතිතුමනි, මම ඔබතුමාගේ අවධානය පිණිස යොමු කරනවා ක්‍රීඩා කමිටුවේ මෙම යෝජනාව ඉදිරිපත් කරලා තිබෙන ක්‍රමවේද සම්බන්ධව, එක් යෝජනාවකවත් දින වකවානුවක් නැහැ. ඒ නිසා ගිය සභා වාරයෙත් මෙම කමිටුව දින වකවානුවක් නැතුව ඉදිරිපත් කළ බැවින්, යෝජනාවලට දිනය සමඟ ඉදිරිපත් කරන්න කියලා මම ඉල්ලීමක් කරනවා.

ගරු නගරාධිපති - කේ.ඩී.නිශාන්ත ප්‍රදීනාන්දු මහතා
නාගරික ලේකම්තුමා, ජෝජනාව කමිටුවට එනකොට එම යෝජනාවේ දිනය සටහන් කරන්න. එතකොට තමයි කියන්න පුළුවන් වෙන්නේ මෙම යෝජනාව මෙච්චර කාලයක් වෙලාත් මේක තාමත් තියෙනවා කියලා.

පහත නම් සඳහන් මහා නගර සභා මන්ත්‍රීවරුන් 2026.09.08 වන දින පැවති ක්‍රීඩා කටයුතු හා පොදු විනෝද කටයුතු පිළිබඳ ස්ථාවර කමිටු වාර්තාවේ සියළුම කමිටු නිර්දේශයන්ට පක්ෂව ඡන්දය ප්‍රකාශ කරන ලදී.

1. නගරාධිපති - කේ.ඩී.නිශාන්ත ප්‍රදීනාන්දු මහතා
2. නියෝජ්‍ය නගරාධිපති - ඩබ්.පී.ප්‍රභාෂණී වික්‍රමසිංහ මහත්මිය
3. මහා නගර සභා මන්ත්‍රී - ඒ.එච්.සුදේශ් ඉන්ද්‍රජිත් කුමාර මහතා
4. මහා නගර සභා මන්ත්‍රී - ඩබ්.රවින්ද්‍ර රංගන ප්‍රනාන්දු මහතා
5. මහා නගර සභා මන්ත්‍රී - ඩබ්.ඉෂාන් දුමින්ද ප්‍රනාන්දු මහතා
6. මහා නගර සභා මන්ත්‍රී - ඩී.සමන් සුජීව මහතා
7. මහා නගර සභා මන්ත්‍රී - එම්.බී.සෙව්වන්දි නිලංගිකා ප්‍රනාන්දු මහත්මිය
8. මහා නගර සභා මන්ත්‍රී - ඩබ්.සුජිත් ඩිල්රෝයි ප්‍රනාන්දු මහතා
9. මහා නගර සභා මන්ත්‍රී - ඩී.ශාන්තිනී වල්ගම ද සිල්වා මහත්මිය
10. මහා නගර සභා මන්ත්‍රී - එල්.ඩී.තිලක් විජේතුංග මහතා
11. මහා නගර සභා මන්ත්‍රී - ඩබ්.ස්වර්ණා විජේරත්න මහත්මිය
12. මහා නගර සභා මන්ත්‍රී - ටී.සංජීව ප්‍රියශාන්ත ප්‍රනාන්දු මහතා
13. මහා නගර සභා මන්ත්‍රී - ඩී.ලීලාරත්න හේවාවිතාරණ මහතා
14. මහා නගර සභා මන්ත්‍රී - අයි.ඩී.මහින්ද පල්ලියගුරුවිච්චි මහතා
15. මහා නගර සභා මන්ත්‍රී - එච්.කේ.ෂර්මන් පිලීසියන් ප්‍රනාන්දු මහතා
16. මහා නගර සභා මන්ත්‍රී - එච්.කේ.ශ්‍රියංග මනෝජ් ප්‍රනාන්දු මහතා
17. මහා නගර සභා මන්ත්‍රී - ඩබ්.දිලිප් මනෝජ් ප්‍රනාන්දු මහතා
18. මහා නගර සභා මන්ත්‍රී - බී.සරෝජනී මැන්දිස් මහත්මිය
19. මහා නගර සභා මන්ත්‍රී - එම්.චන්ද්‍රසිරි ප්‍රනාන්දු මහතා
20. මහා නගර සභා මන්ත්‍රී - එම්.ඉන්ද්‍රජිත් ප්‍රනාන්දු මහතා

පහත නම් සඳහන් මහා නගර සභා මන්ත්‍රීවරුන් 2026.09.08 වන දින පැවති ක්‍රීඩා කටයුතු හා පොදු විනෝද කටයුතු පිළිබඳ ස්ථාවර කමිටු වාර්තාවේ අංක 02(3) හා 02(5) යන කමිටු නිර්දේශයන්ට පක්ෂව ඡන්දය ප්‍රකාශ කළ අතර, අනෙකුත් සියළුම කමිටු නිර්දේශයන්ට පක්ෂව හෝ විපක්ෂව ඡන්දය ප්‍රකාශ කිරීමෙන් වැළකී සිටින ලදී.

1. මහා නගර සභා මන්ත්‍රී - ඩබ්. මැක්සි ජේ. ප්‍රනාන්දු මහතා
2. මහා නගර සභා මන්ත්‍රී - බී.සජිත් දුමින්ද පීරිස් මහතා
3. මහා නගර සභා මන්ත්‍රී - යූ.අනුරසිරි ජයලාල් ද සිල්වා මහතා
4. මහා නගර සභා මන්ත්‍රී - එම්.ලිහිණි ප්‍රනාන්දු මහත්මිය
5. මහා නගර සභා මන්ත්‍රී - සිත්ති මසීනා බක්කර් මහත්මිය
6. මහා නගර සභා මන්ත්‍රී - එම්.ශිරෝමි ඉන්දිකා කුරේ මහත්මිය
7. මහා නගර සභා මන්ත්‍රී - එල්. දිලිප් රොෂාන් කුමාර පෙරේරා මහතා
8. මහා නගර සභා මන්ත්‍රී - ඩබ්. සමීර ප්‍රභාත් ප්‍රනාන්දු මහතා
9. මහා නගර සභා මන්ත්‍රී - ඩබ්.ඒ.ඩී.බ්‍රෙන්ඩන් එච්.ක්‍රිස්ටල් කාන්ත මහතා
10. මහා නගර සභා මන්ත්‍රී - පී. සුලක්ෂිකා තිලක්ෂනී ප්‍රනාන්දු මෙනවිය
11. මහා නගර සභා මන්ත්‍රී - හරිෂ් චන්දන පිලානවිතානගේ මහතා
12. මහා නගර සභා මන්ත්‍රී - ඩබ්.ඩී.රංජලා එස්.ජයතුංග මහත්මිය

13. මහා නගර සභා මන්ත්‍රී - ඩී.එම්.මනෝජ් මධුරංග විජයරත්න මහතා
14. මහා නගර සභා මන්ත්‍රී - ඕ. දිනූෂි කෞෂල්‍යා පෙරේරා මහත්මිය
15. මහා නගර සභා මන්ත්‍රී - එම්.ප්‍රියනාත් මැකන්සි මැන්දිස් මහතා

පහත නම් සඳහන් මහා නගර සභා මන්ත්‍රීවරුන් 2026.09.08 වන දින පැවති ක්‍රීඩා කටයුතු හා පොදු විනෝද කටයුතු පිළිබඳ ස්ථාවර කමිටු වාර්තාවේ සියලුම කමිටු නිර්දේශයන්ට විපක්ෂව ඡන්දය ප්‍රකාශ කරන ලදී.

1. මහා නගර සභා මන්ත්‍රී - ඩී.එම්.සුජිත් පුෂ්පකුමාර මහතා
2. මහා නගර සභා මන්ත්‍රී - පී.එම්.ෂෙයාන් දුලිප් තිසේරා මහතා

පහත නම් සඳහන් මහා නගර සභා මන්ත්‍රීවරුන් 2026.09.08 වන දින පැවති ක්‍රීඩා කටයුතු හා පොදු විනෝද කටයුතු පිළිබඳ ස්ථාවර කමිටු වාර්තාවේ සියලුම කමිටු නිර්දේශයන්ට පක්ෂව හෝ විපක්ෂව ඡන්දය ප්‍රකාශ කිරීමෙන් වැළකී සිටින ලදී.

1. මහා නගර සභා මන්ත්‍රී - ඩී.සමන්ත සිල්වා මහතා

2026.09.08 වන දින පැවති ක්‍රීඩා කටයුතු හා පොදු විනෝද කටයුතු පිළිබඳ ස්ථාවර කමිටු වාර්තාවේ සියලුම කමිටු නිර්දේශයන් වැඩි ඡන්දයෙන් සභා සම්මත විය.

(එම අවස්ථාවේ දී පහත නම් සඳහන් මහා නගර සභා මන්ත්‍රීවරු සභා ගැබෙහි නොසිටියහ

1. මහා නගර සභා මන්ත්‍රී - බී.යෝගේෂ ප්‍රියදර්ශණ මෙන්ඩිස් මහතා
2. මහා නගර සභා මන්ත්‍රී - ඩබ්.ජීවන්ත සුදර්ශන කුමාර ප්‍රනාන්දු මහතා
3. මහා නගර සභා මන්ත්‍රී - ජීවන්ත සෙනෙවිරත්න මහතා
4. මහා නගර සභා මන්ත්‍රී - කේ.ඩබ්.සදුන් චාමර ප්‍රනාන්දු මහතා
5. මහා නගර සභා මන්ත්‍රී - ඩී.එස්.සුසන්ත ඉරෝෂන් ප්‍රනාන්දු මහතා
6. මහා නගර සභා මන්ත්‍රී - එම්. තිලකසිරි ප්‍රනාන්දු මහතා
7. මහා නගර සභා මන්ත්‍රී - එල්. ඔසඳ හර්ෂණ අබේකෝන් මහතා
8. මහා නගර සභා මන්ත්‍රී - ඒ.එච්. සුරේෂ් ඉන්දික මහතා
9. මහා නගර සභා මන්ත්‍රී - යූ.සුදත් ක්‍රිෂාන්ත පෙරේරා මහතා
10. මහා නගර සභා මන්ත්‍රී - යූ.එල්. සේනක දමයන්ත ද සිල්වා මහතා
11. මහා නගර සභා මන්ත්‍රී - එස්. වදුන් රොමේෂ් ප්‍රනාන්දු මහතා
12. මහා නගර සභා මන්ත්‍රී - ඩබ්.සුරේෂ් ප්‍රේමකුමාර ප්‍රනාන්දු මහතා
13. මහා නගර සභා මන්ත්‍රී - එච්.එල්.තිළිණි නෙත්සරණි මෙනවිය

06(06) 2026.09.08 වන දින පැවති ව්‍යාපෘති හා භෞතික සම්පත් කළමනාකරණය පිළිබඳ ස්ථාවර කමිටු වාර්තාවේ නිර්දේශයන් සලකා බැලීම.

<u>මහා නගර සභා මන්ත්‍රී - ඕ.දිනූෂි කෞෂල්‍යා පෙරේරා මහත්මිය</u>

ගරු නගරාධිපතිතුමනි, 04 වැනි කරුණ සම්බන්ධව නාගරික යාන්ත්‍රික ඉංජිනේරු දෙපාර්තමේන්තුවේ කටයුතු විධිමත් කිරීම සඳහා පහත සඳහන් යෝජනාව, ව්‍යාපෘති හා භෞතික සම්පත් කළමනාකරණ කමිටුව වෙත ඉදිරිපත් කරමි. සභාවේ වාහන අළුත්වැඩියා කිරීම සඳහා අවශ්‍ය බැටරි, ටයර් සහ ත්‍රීවිල් අමතර කොටස් ප්‍රාදේශීය මිළ ගණන් කැඳවා පමණක් මිලදී ගැනීම

සිදු කිරීම සුදුසු බව යෝජනා කරමි. යන කරුණට මා අදහස් කිරීමට කැමැතියි. ප්‍රාදේශීය මිළ ගණන් පමණක් කැඳවා කටයුතු කිරීමට වඩා අපිට අනෙක් තැන්වලිනුත් මිළ ගණන් කැඳවලා ගන්න පුළුවන් නම් වඩාත් ලාබදායි විදිහට ගන්න පුළුවන් බවත්, එතකොට සාධාරණව සහ විණිවිධ භාවයෙන් යුක්තයි කියලා මම යෝජනා කරන්න කැමැතියි. මොකද අපිට ත්‍රීවිල් රථයට අවශ්‍ය උපාංගයක් ප්‍රාදේශීය මිළ ගණන්වලට වඩා කොළඹින් හෝ කොහෙන් හරි අඩුවට මිළ ගණන් අඩුවට ගන්න පුළුවන් නම් එහෙම ගන්න එක වඩා සාධාරණභාවයෙන් යුක්තයි කියා මා සිතනවා.

<u>මහා නගර සභා මන්ත්‍රී - ඩී.එම්. සුජීත් පුෂ්පකුමාර මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, ව්‍යාපෘති හා භෞතික සම්පත් කළමනාකරණ කමිටුවේ 02(01) සම්බන්ධයෙන් තුසිත් ද සිල්වා මන්ත්‍රීතුමා විසින් ඉදිරිපත් කරන ලද කොම්පෝස්ට් නිෂ්පාදන අංගනය දිගරොල්ල පොළ භූමිය ඉහත නිපැයුම් අංගනය මා විසින් නිරීක්ෂණය කෙරිනි. එහිදී ඉතා අවිධිමත් සහ අකාර්යක්ෂම ලෙස නිසි අධීක්ෂණයකින් තොරව පවත්වාගෙන යන ක්‍රියාකලාපයක් දැක ගත හැකි විය. දැන් මේ කියන්නේ කොම්පෝස්ට් අංගනය සම්බන්ධයෙන් එතකොට මේ සම්බන්ධව ගන්නා පියවර මොනවාදෙයි ? එසේ වූවද නිෂ්පාදන ක්‍රියාවලිය නිසිලෙස කෙරීගෙන යන බවත් විකිණීමට සූදානම් කර ඇති පැකට් වෙනම ගෙඩගසා තිබිණි. අංගනයේ සේවකයන් පැවසුවේ ඔවුනට හොඳ නිෂ්පාදන ධාරිතාවක් ඇති නමුත් ප්‍රායෝගික නොවන විකුණුම් ක්‍රමයක් නිසා ගැණුම්කරුවන් අධෛර්යමත් වන බැවින් හොඳ විකුණුමක් නොවන බවයි. තවද සාර්ථක විකුණුම් ක්‍රමයක් ඇත්නම් මාසයකට පැකට් 1000 වූවත් අලෙවි කළ හැකි බව ඔවුන් විශ්වාස කරනවා. මේකින් කියන්නේ මේ සේවකයොත් කියන්නේ මෙම කොම්පෝස්ට් අංගනය සම්බන්ධයෙන් ඔබගේ පාලනය යොදවලා තිබෙන අවධානය මදි කම.

<u>ගරු නගරාධිපති - කේ.ඩී.නිශාන්ත ප්‍රදීනාන්දු මහතා</u>

ගරු මන්ත්‍රීතුමා, අවධානය වැඩිකම ඒක පටන්ගත්තු දා සිට අවධානය සම්පූර්ණයෙන්ම අත්හැරලා තිබිච්ච තැනක්. මෙතැන කොම්පෝස්ට් අංගනයක් හදලා සෑහැන කාලයක් යනකම්ම එම කාර්ය සිදු වුනේ නැහැ. එතැන ප්‍රායෝගික ගැටළු ගණනාවක් තිබුණා. සේවකයන්ට යන්න හැකියාවක් තිබුණත් සේවකයෝ මේ කටයුත්ත කරනවාද කියලා හොඳ පසුවිපරමක් තිබුණේ නැහැ. ඊළඟට අපි මෙතනින්ම විකුණන්න පටන්ගත්තා. එතැන්ට පොළට යන මනුස්සයා නැවත මැතැනට එවිල්ලා මෙතෙනින්ම ගත්තා, ප්‍රායෝගික ගැටළු යම් මට්ටමකට වෙනස්කර ගත්තා, බොහෝ කාලෙකට කලින් කොම්පෝස්ට් විකිණීම සඳහා දින පොලෙන් කඩයක් වෙන් කර ගත්තා, ඒ කඩෙත් වහලා දාලා තිබුණා. දැන් අපි ටිකෙන් ටික විවෘත කළා, රුපියල් දහ පහොලොස් දහසක යම් ආදායමක් උපයමින් තිබෙනවා. අපි හිතනවා ඉස්සරහට තවදුරටත් වර්ධනය කරගන්න මේ යොජනාවේ ඇතුලේ කටයුතු සිදුවෙමින් තිබෙනවා. අවධානය නැතුව නැමැයි අවධානය තියෙනවා කියලා මම කියනවා.

ඉතිහාසයේ කොහොමද පැවැත්වුණේ කියලා අපිට අවබෝධයක් තිබෙනවා. දැන් යම් වෙනස්කමක් තිබෙනවා. මන්ත්‍රීතුමා ගිහිල්ලා දැකපු දේ වෙනස් කිරීමට අවශ්‍ය යෝජනා ටික ගෙනෙල්ලා තිබෙනවා. අපි දිනපොලේ සියලු වෙලෙන්දෝ ගෙනාවා, සත්තු වෙලෙඳපොලේ සත්තු වැලෙන්දන් ගෙනාවා මේ සෑම අය සමඟම සාකච්ඡා කළා. අපි කොච්චර සාකච්ඡා කරලා වැඩ පිළිවෙල සැලසුම් හැදුවත්, අපේ යාන්ත්‍රණය අපිට ඕන වේගයට දුවන්නේ නැහැ. අපි සාකච්ඡා කරලා ගත්තු සැලසුම් ක්‍රියාත්මක කරන්න ප්‍රමාණවත් කාලයකුත් ගියා. නැවත මා කතාකරලා දවස් දෙක තුනක් ඇතුළත දින පොළ භූමියේ ආකෘතිමය වෙනසක් සහ ඒ අවශ්‍ය

පහසුකම් ටික හදන්න කටයුතු කරනවා. අපේ උවමනාව කොච්චර උඩින් තිබුණත්, අපේ අවශ්‍ය වේගයට යාන්ත්‍රණය ගන්න අමාරුයි. පොර බඳිමින්, උත්සාහ කරමින්, ගැටමින් කොහොම හරි මෙම කටයුත්ත කළ යුතුයි. ඒකට උදව් කරන්න.

<u>මහා නගර සභා මන්ත්‍රී - ඩී.එම්. සුජීත් පුෂ්පකුමාර මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, 02(03) යෝජනාව සම්බන්ධව අවධානය යොමු කරනවා. මෙම කඩ කාමර මාර්ගයට අයත් ප්‍රදේශයේ ඉදිකර ඇති බව නිරීක්ෂණය වන හෙයින් ඒ සම්බන්ධයෙන් යම් ක්‍රියාමාර්ගයක් ගෙන ගිවිසුමක් යොදා ගන්නේද යන්න පිළිබඳව නිර්දේශ හා අනුමැතිය ලබාගැනීම සඳහා කාරුණිකව ඉදිරිපත් කරමි යන කරුණ සම්බන්ධව මට පැහැදිලි කරන්න මෙම කඩ කාමර මාර්ගයේද හදලා තිබෙන්නේ කියලා.

<u>ගරු නගරාධිපති - කේ.ඩී.නිශාන්ත ප්‍රදීනාන්දු මහතා</u>

ගරු මන්ත්‍රීතුමා, මෙම කඩ කාමර ටික වසර ගණනාවකට පෙර පාරට අදාල රක්ෂිත ඉඩ ප්‍රමාණයේ මායිම්වෙලා හදලා තිබෙන්නේ. මෙම කඩ කාමර කඩා ඉවත්කිරීම ලේසි පහසු වැඩක් නොවැයි. ඉතාම අවිධිමත්, අක්‍රමවත්, හුණ්ඩු වාගේ කඩ ටිකක් මෙම ස්ථානයේ පිහිටා තිබෙන්නේ. ඉස්සරහට මොනවාද කරන්නේ කියලා බලමු.

<u>මහා නගර සභා මන්ත්‍රී - මේරියන් ලිනිණි ප්‍රනාන්දු මහත්මිය</u>

ගරු නගරාධිපතිතුමනි, මෙම ස්ථාවර කමිටු යෝජනාවල දින සඳහන් කර නොමැත. 02(06) යෝජනාව සම්බන්ධව ප්‍රසම්පාදන කටයුතු විද්‍යුත් තැපෑල මාර්ගයෙන් කළ යුතු බවටත්, සභාවේ කසළ වාහනවල එදිනෙදා ඉඳුල් ද්‍රව්‍ය සෝදා ඉවත් කර ගැනීම සඳහා තාවකාලික සේදුම් මධ්‍යස්ථානයක් සකස් කිරීම සුදුසු බවටත්, අහුලාන වාහන සේවා ස්ථානයට CCTV සවි කිරීම සුදුසු බවටත් යන මෙම කරුණු තුන එක යෝජනාවේ සටහන් කර තිබෙනවා. සෑම යෝජනාවටම උක්ත කරුණ සලකා බැලූ කමිටුව මෙහි ඉදිරි කටයුතු කඩිනමින් සිදුකිරීමට නිර්දේශ කරමි යන වාක්‍ය සඳහන් කර තිබෙනා බවත්, ඊළඟට 02(07) මධ්‍යම වෙළඳපොල කඩ කාමර සම්බන්ධව අවුරුදු ගණනාවක් කථා කරමින් සිටිනා බැවින්, මෙම ගොඩනැගිල්ලේ ස්ථායිතාවය සම්බන්ධයෙන් ජාතික ගොඩනැගිලි පර්යේෂණ ආයතනයෙන් වාර්තාවක් ලබා ගැනීමට යටත්ව ඉදිරි කටයුතු ලිපිගොනුවෙන් සිදු කිරීමට කමිටුව නිර්දේශ කරන ලදි. යනුවෙන් සඳහන් කිරීම කිසිදු ප්‍රගතියක් නොමැති බවත්, මෙම මධ්‍යම වෙළඳපොල කඩ කාමර සම්බන්ධව ඉදිරි ප්‍රගතිය මොනවාදැයි කෙටි සටහනක් කරන ලෙස මා අදහස් කරන බවත්, 02(06) යෝජනාවේ කරුණු තුනක් තිබෙනා බැවින් එම කරුණු තුනම තුන් යෝජනාවක් ලෙස ඉදිරිපත් කළ යුතු බව මම කමිටුවේ සභාපතිගෙන් ඉල්ලා සිටිනවා. තවද, ව්‍යාපෘති කමිටුවේ අරමුණ අනුව මොරටුව නගරයේ තිබෙන ව්‍යාපෘති මොනවාදැයි කියා ව්‍යාපෘති හා භෞතික සම්පත් කළමනාකරණය පිළිබඳ ස්ථාවර කමිටුවේ සඳහන් වන්නේ නැහැ. අපි මෙම සභාවේ කථා කරන කරුණු සහ මොරටුව නගරයේ සිදුවන ව්‍යාපෘති මෙම වාර්තාවට ඇතුලත් කරන ලෙසත්, මෙම වාර්තාව ඊට වඩා විධිමත්ව ඉදිරිපත් කරන ලෙසත් මම සභාපතිතුමාගෙන් ඉල්ලා සිටිනවා.

<u>මහා නගර සභා මන්ත්‍රී - ජීවන්ත සෙනෙවිරත්න මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, නාගරික ඉංජිනේරු දෙපාර්තමේන්තුවට තිබුණු අපහසුතා මගවාහැරීම සඳහා පමණක් මෙම යෝජනාව ඉදිරිපත් කර ඇති බවත්, අපට ප්‍රසම්පාදන සම්බන්ධ විශාල ගැටළු තිබෙන බැවින්, වාහන නඩත්තු කිරීම සඳහා වැඩි කාලයක් ගත වී ඇත. එම හේතූන් මත තමයි විද්‍යුත් තැපෑල මාර්ගයට යන්න උත්සාහ දරමින් සිටිනවා. ඉන්පසුව කසළ වාහන සම්බන්ධ

ගැටළුවත් නාගරික ඉංජිනේරු යාන්ත්‍රිකයට බවත්, වාහන දිරාපත්වීමේ ප්‍රශ්ණ බරපතලවම තිබෙන්නෙත් යාන්ත්‍රික ඉංජිනේරුවට පමණක් බවත්, අහුලාන වාහන සේවා ස්ථානයට CCTV සවි කිරීම ගැටළුවත් නාගරික ඉංජිනේරු යාන්ත්‍රිකයට අදාළ බැවින් එම නිසා තමයි මෙම ප්‍රශ්ණ තුනම එකම යෝජනාවේ ඉදිරිපත් කර ඇති බව මම ප්‍රකාශ කර සිටිනවා.

මධ්‍යම වෙළඳපොල භාවිතයට නුසුදුසු බවත් එම පරීක්ෂණ කිරීමට තමන්ට පහසුකම් නොමැති බැවින්, ඉතිරි පරීක්ෂණ මොරටුව විශ්ව විද්‍යාලයෙන් කර ගන්නා ලෙසත් සඳහන් කර බස්නාහිර පළාත්, ප්‍රධාන ලේකම් කාර්යාලයේ ඉංජිනේරු කාර්යාංශය විසින් අප වෙත 2024 වර්ෂයේ දැනුවත් කර ඇති බැවින්, පෞද්ගලික ආයතනවල පරීක්ෂණ කරන්නේ නැති බව මොරටුව විශ්ව විද්‍යාලයෙන් අප වෙත දැනුම් දී ඇත. කමිටු වාර්තාවෙන් පසුව තමයි එම ප්‍රශ්ණට පිළිතුරු ලැබී ඇති බවත් එම හේතුන්මතයි එම කමිටු වාර්තාවට මෙම කරුණු ඇතුළත් වන්නේ නැති බවත් මම ප්‍රකාශ කර සිටිනවා. සියයට පනහක්ම මෙම ගොඩනැගිල්ල අක්‍රීය වී ඇති බැවින් අවුරුදු 10 ක පමණ කාලයක් පමණක් ගැරන්ටි එක පවතින බැවින් මෙම පරීක්ෂණය එන්.බී.ආර්.ඕ එකින් ගත යුතු බැවින්, ඒ සඳහා විශාල වියදමක් වැය වන බවත්, මේ පිළිබඳව ඉදිරි කමිටුවලදී තීරණය ගන්නා ලෙසත් මම ප්‍රකාශ කර සිටිනවා.

පහත නම් සඳහන් මහා නගර සභා මන්ත්‍රීවරුන් 2026.09.08 වන දින පැවති ව්‍යාපෘති හා භෞතික සම්පත් කළමනාකරණය පිළිබඳ ස්ථාවර කමිටු වාර්තාවේ සියළුම කමිටු නිර්දේශයන්ට පක්ෂව ඡන්දය ප්‍රකාශ කරන ලදී.

1.	නගරාධිපති	-	කේ.ඩී.නිශාන්ත ප්‍රදීනාන්දු මහතා
2.	නියෝජ්‍ය නගරාධිපති	-	ඩබ්.පී.ප්‍රභාෂණී වික්‍රමසිංහ මහත්මිය
3.	මහා නගර සභා මන්ත්‍රී	-	ඒ.එච්.සුදේශ් ඉන්ද්‍රජිත් කුමාර මහතා
4.	මහා නගර සභා මන්ත්‍රී	-	ඩබ්.රවින්ද්‍ර රංගන ප්‍රනාන්දු මහතා
5.	මහා නගර සභා මන්ත්‍රී	-	ඩබ්.ඉෂාන් දුමින්ද ප්‍රනාන්දු මහතා
6.	මහා නගර සභා මන්ත්‍රී	-	ඩී.සමන් සුජීව මහතා
7.	මහා නගර සභා මන්ත්‍රී	-	එම්.බී.සෙව්වන්දි නිලංගිකා ප්‍රනාන්දු මහත්මිය
8.	මහා නගර සභා මන්ත්‍රී	-	බී.යෝගේෂ ප්‍රියදර්ශණ මෙන්ඩිස් මහතා
9.	මහා නගර සභා මන්ත්‍රී	-	ඩබ්.සුජිත් ඩිල්රෝයි ප්‍රනාන්දු මහතා
10.	මහා නගර සභා මන්ත්‍රී	-	ඩී.ශාන්තිනී වල්ගම ද සිල්වා මහත්මිය
11.	මහා නගර සභා මන්ත්‍රී	-	එල්.ඩී.තිලක් විජේතුංග මහතා
12.	මහා නගර සභා මන්ත්‍රී	-	ඩබ්.ස්වර්ණා විජේරත්න මහත්මිය
13.	මහා නගර සභා මන්ත්‍රී	-	ටී.සංජීව ප්‍රියශාන්ත ප්‍රනාන්දු මහතා
14.	මහා නගර සභා මන්ත්‍රී	-	ඩී.ලීලාරත්න හේවාවිතාරණ මහතා
15.	මහා නගර සභා මන්ත්‍රී	-	අයි.ඩී.මහින්ද පල්ලිආරච්චි මහතා
16.	මහා නගර සභා මන්ත්‍රී	-	එච්.කේ.ෂර්මල් පිලිසියන් ප්‍රනාන්දු මහතා
17.	මහා නගර සභා මන්ත්‍රී	-	ඩබ්.ජීවන්ත සුදර්ශන කුමාර ප්‍රනාන්දු මහතා
18.	මහා නගර සභා මන්ත්‍රී	-	එච්.කේ.ශ්‍රියංග මනෝජ් ප්‍රනාන්දු මහතා
19.	මහා නගර සභා මන්ත්‍රී	-	ජීවන්ත සෙනෙවිරත්න මහතා
20.	මහා නගර සභා මන්ත්‍රී	-	කේ.ඩබ්.සදුන් චාමර ප්‍රනාන්දු මහතා
21.	මහා නගර සභා මන්ත්‍රී	-	ඩී.එස්.සුසන්ත ඉරෝෂන් ප්‍රනාන්දු මහතා
22.	මහා නගර සභා මන්ත්‍රී	-	ඩබ්.දිලිප් මනෝජ් ප්‍රනාන්දු මහතා

23. මහා නගර සභා මන්ත්‍රී - බී.සරෝජනී මැන්දිස් මහත්මිය
24. මහා නගර සභා මන්ත්‍රී - එම්.චන්ද්‍රසිරි ප්‍රනාන්දු මහතා
25. මහා නගර සභා මන්ත්‍රී - එම්.ඉන්ද්‍රජිත් ප්‍රනාන්දු මහතා

පහත නම් සඳහන් මහා නගර සභා මන්ත්‍රීවරුන් 2026.09.08 වන දින පැවති ව්‍යාපෘති හා භෞතික සම්පත් කළමනාකරණය පිළිබඳ ස්ථාවර කමිටු වාර්තාවේ සියළුම කමිටු නිර්දේශයන්ට පක්ෂව හෝ විපක්ෂව ඡන්දය ප්‍රකාශ කිරීමෙන් වැළකී සිටින ලදී.

1. මහා නගර සභා මන්ත්‍රී - ඩබ්. මැක්සි ජේ. ප්‍රනාන්දු මහතා
2. මහා නගර සභා මන්ත්‍රී - එම්. තිලකසිරි ප්‍රනාන්දු මහතා
3. මහා නගර සභා මන්ත්‍රී - බී.සජිත් දුමින්ද පීරිස් මහතා
4. මහා නගර සභා මන්ත්‍රී - ඒ.එච්. සුරේෂ් ඉන්දික මහතා
5. මහා නගර සභා මන්ත්‍රී - යූ.අනුරසිරි ජයලාල් ද සිල්වා මහතා
6. මහා නගර සභා මන්ත්‍රී - යූ.එල්. සේනක දමයන්ත ද සිල්වා මහතා
7. මහා නගර සභා මන්ත්‍රී - එම්.ලිහිණි ප්‍රනාන්දු මහත්මිය
8. මහා නගර සභා මන්ත්‍රී - සිත්ති මසීනා බක්කර් මහත්මිය
9. මහා නගර සභා මන්ත්‍රී - එම්.ශිරෝමි ඉන්දිකා කුරේ මහත්මිය
10. මහා නගර සභා මන්ත්‍රී - එස්. චදුන් රොමේෂ් ප්‍රනාන්දු මහතා
11. මහා නගර සභා මන්ත්‍රී - එල්. දිලිප් රොෂාන් කුමාර පෙරේරා මහතා
12. මහා නගර සභා මන්ත්‍රී - ඩබ්. සමීර ප්‍රභාත් ප්‍රනාන්දු මහතා
13. මහා නගර සභා මන්ත්‍රී - ඩබ්.ඒ.ඩී.බ්‍රෙන්ඩන් එච්.ක්‍රිස්ටල් කාන්ත මහතා
14. මහා නගර සභා මන්ත්‍රී - පී. සුලක්ෂිකා තිලක්ෂනී ප්‍රනාන්දු මෙනවිය
15. මහා නගර සභා මන්ත්‍රී - හරිෂ් චන්දන පිලානවිතානගේ මහතා
16. මහා නගර සභා මන්ත්‍රී - ඩබ්.ඩී.රංජලා එස්.ජයතුංග මහත්මිය
17. මහා නගර සභා මන්ත්‍රී - ඩී.එම්.මනෝජ් මධුරංග විජයරත්න මහතා
18. මහා නගර සභා මන්ත්‍රී - එම්.ප්‍රියනාත් මැකන්සි මැන්දිස් මහතා
19. මහා නගර සභා මන්ත්‍රී - ඕ. දිනූෂි කෞෂල්‍යා පෙරේරා මහත්මිය
20. මහා නගර සභා මන්ත්‍රී - එච්.එල්.තිළිණි නෙත්සරණි මෙනවිය

පහත නම් සඳහන් මහා නගර සභා මන්ත්‍රීවරුන් 2026.09.08 වන දින පැවති ව්‍යාපෘති හා භෞතික සම්පත් කළමනාකරණය පිළිබඳ ස්ථාවර කමිටු වාර්තාවේ සියලුම කමිටු නිර්දේශයන්ට විපක්ෂව ඡන්දය ප්‍රකාශ කරන ලදී.

1. මහා නගර සභා මන්ත්‍රී - ඩී.එම්.සුජිත් පුෂ්පකුමාර මහතා
2. මහා නගර සභා මන්ත්‍රී - පී.එම්.ෂෙයාන් දුලිප් තිසේරා මහතා

පහත නම් සඳහන් මහා නගර සභා මන්ත්‍රීවරුන් 2026.09.08 වන දින පැවති ව්‍යාපෘති හා භෞතික සම්පත් කළමනාකරණය පිළිබඳ ස්ථාවර කමිටු වාර්තාවේ සියලුම කමිටු නිර්දේශයන්ට පක්ෂව හෝ විපක්ෂව ඡන්දය ප්‍රකාශ කිරීමෙන් වැළකී සිටින ලදී.

1. මහා නගර සභා මන්ත්‍රී - ඩී.සමන්ත සිල්වා මහතා

2026.09.08 වන දින පැවති ව්‍යාපෘති හා භෞතික සම්පත් කළමනාකරණය පිළිබඳ ස්ථාවර කමිටු වාර්තාවේ සියලුම කමිටු නිර්දේශයන් වැඩි ඡන්දයෙන් සභා සම්මත විය.

(එම අවස්ථාවේ දී පහත නම් සඳහන් මහා නගර සභා මන්ත්‍රීවරු සභා ගැබෙහි නොසිටියහ

1. මහා නගර සභා මන්ත්‍රී - එල්. ඔසඳ හර්ෂණ අබේකෝන් මහතා
2. මහා නගර සභා මන්ත්‍රී - යූ.සුදත් ක්‍රිෂාන්ත පෙරේරා මහතා
3. මහා නගර සභා මන්ත්‍රී - ඩබ්.සුරේෂ් ප්‍රේමකුමාර ප්‍රනාන්දු මහතා)

06(07) 2026.09.09 වන දින පැවති ඵලදායිතාවය හා මුදල් උත්පාදනය පිළිබඳ ස්ථාවර කමිටු වාර්තාවේ නිර්දේශයන් සලකා බැලීම.

පහත නම් සඳහන් මහා නගර සභා මන්ත්‍රීවරුන් 2026.09.09 වන දින පැවති ඵලදායිතාවය හා මුදල් උත්පාදනය පිළිබඳ ස්ථාවර කමිටු වාර්තා වේ සියලුම නිර්දේශයන්ට පක්ෂව ජන්දය ප්‍රකාශ කරන ලදී.

1. නගරාධිපති - කේ.ඩී.නිශාන්ත ප්‍රදීනාන්දු මහතා
2. නියෝජ්‍ය නගරාධිපති - ඩබ්.පි.ප්‍රභාෂණී වික්‍රමසිංහ මහත්මිය
3. මහා නගර සභා මන්ත්‍රී - ඒ.එච්.සුදේශ් ඉන්ද්‍රජිත් කුමාර මහතා
4. මහා නගර සභා මන්ත්‍රී - ඩබ්.රවින්ද්‍ර රංගන ප්‍රනාන්දු මහතා
5. මහා නගර සභා මන්ත්‍රී - ඩබ්.ඉෂාන් දුමින්ද ප්‍රනාන්දු මහතා
6. මහා නගර සභා මන්ත්‍රී - ඩී.සමන් සුජීව මහතා
7. මහා නගර සභා මන්ත්‍රී - එම්.බී.සෙව්වන්දි නිලංගිකා ප්‍රනාන්දු මහත්මිය
8. මහා නගර සභා මන්ත්‍රී - බී.යෝගේෂ ප්‍රියදර්ශණ මෙන්ඩිස් මහතා
9. මහා නගර සභා මන්ත්‍රී - ඩබ්.සුජිත් ඩිල්රෝයි ප්‍රනාන්දු මහතා
10. මහා නගර සභා මන්ත්‍රී - ඩී.ශාන්තිනී වල්ගම ද සිල්වා මහත්මිය
11. මහා නගර සභා මන්ත්‍රී - එල්.ඩී.තිලක් විජේතුංග මහතා
12. මහා නගර සභා මන්ත්‍රී - ඩබ්.ස්වර්ණා විජේරත්න මහත්මිය
13. මහා නගර සභා මන්ත්‍රී - ටී.සංජීව ප්‍රියශාන්ත ප්‍රනාන්දු මහතා
14. මහා නගර සභා මන්ත්‍රී - ඩී.ලීලාරත්න හේවාවිතාරණ මහතා
15. මහා නගර සභා මන්ත්‍රී - අයි.ඩී.මහින්ද පල්ලිආරච්චි මහතා
16. මහා නගර සභා මන්ත්‍රී - එච්.කේ.ෂර්මල් පිලිසියන් ප්‍රනාන්දු මහතා
17. මහා නගර සභා මන්ත්‍රී - ඩබ්.ජීවන්ත සුදර්ශන කුමාර ප්‍රනාන්දු මහතා
18. මහා නගර සභා මන්ත්‍රී - එච්.කේ.ශ්‍රියංග මනෝජ් ප්‍රනාන්දු මහතා
19. මහා නගර සභා මන්ත්‍රී - ජීවන්ත සෙනෙවිරත්න මහතා
20. මහා නගර සභා මන්ත්‍රී - කේ.ඩබ්.සදුන් චාමර ප්‍රනාන්දු මහතා
21. මහා නගර සභා මන්ත්‍රී - ඩී.එස්.සුසන්ත ඉරෝෂන් ප්‍රනාන්දු මහතා
22. මහා නගර සභා මන්ත්‍රී - ඩබ්.දිලිප් මනෝජ් ප්‍රනාන්දු මහතා
23. මහා නගර සභා මන්ත්‍රී - බී.සරෝජනී මැන්දිස් මහත්මිය
24. මහා නගර සභා මන්ත්‍රී - එම්.චන්ද්‍රසිරි ප්‍රනාන්දු මහතා
25. මහා නගර සභා මන්ත්‍රී - එම්.ඉන්ද්‍රජිත් ප්‍රනාන්දු මහතා

පහත නම් සඳහන් මහා නගර සභා මන්ත්‍රීවරුන් 2026.09.09 වන දින පැවති ඵලදායිතාවය හා මුදල් උත්පාදනය පිළිබඳ ස්ථාවර කමිටු වාර්තාවේ අංක 02(7), 02(8), 02(9), 02(10), 02(11),02(12) හා 02(13) යන කමිටු නිර්දේශයන්ට පක්ෂව ඡන්දය ප්‍රකාශ කළ අතර, අනෙකුත් සියලුම කමිටු නිර්දේශයන්ට පක්ෂව හෝ විපක්ෂව ඡන්දය ප්‍රකාශ කිරීමෙන් වැළකී සිටින ලදී.

1. මහා නගර සභා මන්ත්‍රී - ඩබ්. මැක්සි ජේ. ප්‍රනාන්දු මහතා
2. මහා නගර සභා මන්ත්‍රී - එම්. තිලකසිරි ප්‍රනාන්දු මහතා
3. මහා නගර සභා මන්ත්‍රී - බී.සජිත් දුමින්ද පීරිස් මහතා
4. මහා නගර සභා මන්ත්‍රී - ඒ.එච්. සුරේෂ් ඉන්දික මහතා
5. මහා නගර සභා මන්ත්‍රී - යූ.අනුරසිරි ජයලාල් ද සිල්වා මහතා
6. මහා නගර සභා මන්ත්‍රී - යූ.එල්. සේනක දමයන්ත ද සිල්වා මහතා
7. මහා නගර සභා මන්ත්‍රී - එම්.ලිහිණි ප්‍රනාන්දු මහත්මිය
8. මහා නගර සභා මන්ත්‍රී - සිත්ති මසීනා බක්කර් මහත්මිය
9. මහා නගර සභා මන්ත්‍රී - එම්.ශිරෝමි ඉන්දිකා කුරේ මහත්මිය
10. මහා නගර සභා මන්ත්‍රී - එස්. චදුන් රොමේෂ් ප්‍රනාන්දු මහතා
11. මහා නගර සභා මන්ත්‍රී - එල්. දිලිජ් රොෂාන් කුමාර පෙරේරා මහතා
12. මහා නගර සභා මන්ත්‍රී - ඩබ්. සමීර ප්‍රභාත් ප්‍රනාන්දු මහතා
13. මහා නගර සභා මන්ත්‍රී - ඩබ්.ඒ.ඩී.බ්‍රෙන්ඩන් එච්.ක්‍රිස්ටල් කාන්ත මහතා
14. මහා නගර සභා මන්ත්‍රී - පී. සුලක්ෂිකා තිලක්ෂනී ප්‍රනාන්දු මෙනවිය
15. මහා නගර සභා මන්ත්‍රී - හරිෂ් චන්දන පිලානවිතානගේ මහතා
16. මහා නගර සභා මන්ත්‍රී - ඩබ්.ඩී.රංජලා එස්.ජයතුංග මහත්මිය
17. මහා නගර සභා මන්ත්‍රී - ඩී.එම්.මනෝජ් මධුරංග විජයරත්න මහතා
18. මහා නගර සභා මන්ත්‍රී - එම්.ප්‍රියනාත් මැකන්සි මැන්දිස් මහතා
19. මහා නගර සභා මන්ත්‍රී - ඕ. දිනූෂි කෞෂල්‍යා පෙරේරා මහත්මිය
20. මහා නගර සභා මන්ත්‍රී - එච්.එල්.තිළිණි නෙත්සරණි මෙනවිය

පහත නම් සඳහන් මහා නගර සභා මන්ත්‍රීවරුන් 2026.09.09 වන දින පැවති ඵලදායිතාවය හා මුදල් උත්පාදනය පිළිබඳ ස්ථාවර කමිටු වාර්තාවේ සියලුම කමිටු නිර්දේශයන්ට විපක්ෂව ඡන්දය ප්‍රකාශ කරන ලදී.

1. මහා නගර සභා මන්ත්‍රී - ඩී.එම්.සුජිත් පුෂ්පකුමාර මහතා
2. මහා නගර සභා මන්ත්‍රී - පී. එම්. ෂෙයාන් දුලිප් තිසේරා මහතා

පහත නම් සඳහන් මහා නගර සභා මන්ත්‍රීවරුන් 2026.09.09 වන දින පැවති ඵලදායිතාවය හා මුදල් උත්පාදනය පිළිබඳ ස්ථාවර කමිටු වාර්තාවේ සියලුම කමිටු නිර්දේශයන්ට පක්ෂව හෝ විපක්ෂව ඡන්දය ප්‍රකාශ කිරීමෙන් වැළකී සිටින ලදී.

1. මහා නගර සභා මන්ත්‍රී - ඩී. සමන්ත සිල්වා මහතා

2026.09.09 දින පැවති ඵලදායිතාවය හා මුදල් උත්පාදනය පිළිබඳ ස්ථාවර කමිටු වාර්තාවේ සියලුම කමිටු නිර්දේශයන් වැඩි ඡන්දයෙන් සභා සම්මත විය.

(එම අවස්ථාවේ දී පහත නම් සඳහන් මහා නගර සභා මන්ත්‍රීවරු සභා ගැබෙහි නොසිටියහ

1. මහා නගර සභා මන්ත්‍රී - එල්. ඔසඳ හර්ෂණ අබේකෝන් මහතා
2. මහා නගර සභා මන්ත්‍රී - යූ. සුදත් ක්‍රිශාන්ත පෙරේරා මහතා
3. මහා නගර සභා මන්ත්‍රී - ඩබ්. සුරේෂ් ප්‍රේමකුමාර ප්‍රනාන්දු මහතා)

06(08) 2026.09.09 වන දින පැවති කර්මාන්ත හා ඉදිකිරීම් පිළිබඳ ස්ථාවර කමිටු වාර්තාවේ නිර්දේශයන් සලකා බැලීම.

<u>මහා නගර සභා මන්ත්‍රී - එම්.ප්‍රියනාත් මැකන්සි මෙන්ඩිස් මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, 02(33) සම්බන්ධව වඩු කර්මාන්ත වඩු හිමියන් කර්මාන්ත කරගෙන යාමේදී ඇති වන ගැටළු හා එවැනි ගැටළු ඉදිරිපත් වන අවස්ථාවලදී ගරු නගරාධිපතිතුමාගේ මැදිහත්වීමෙන් අදාළ පාර්ශවකරුවන් කැඳවා සාකච්ඡා කර තීරණයක් ලබාදීම සුදුසු බවට කමිටුව නිර්දේශ කර ඇති බැවින්, නමුත් පැමිණිලිකරුවන් ප්‍රශ්ණ ඉදිරිපත් කරන්නේ නගර සභාවට පමණක් නොවෙයි, වෙනත් දෙපාර්තමේන්තුවලට පවා ඉදිරිපත් කරනවා. එම නිසා වරිපනම් ගෙවන සහ වඩුමඩුවට වෙනම බද්ධක් ගෙවන අදාළ පාර්ශවකරුවන්ව වෙනත් දෙපාර්තමේන්තුවලට යන්න නොදී මොනවා හරි විකල්පයක් යොදවා සභාවෙන් විසඳා දෙන ලෙස මම ඉල්ලීමක් කරනවා.

2026 සැප්තැම්බර් 09 වන දින මහ සභා වාර්තාවේ 03(01) සම්බන්ධව, මම ලිපියක් ඉදිරිපත් කළා, කඩලාන දේවස්ථානය ඉදිරිපිට අඩි 03ක පාර පුළුල්කර දෙන ලෙස මහ නගර සභා මන්ත්‍රී එච්.කේ. ෂර්මන් ෆිලිෂියන් ප්‍රනාන්දු මහතා විසින් 2026.09.09 වන දිනෙති කර්මාන්ත කටයුතුවලට ඉදිරිපත් කළ ලිපිය නිවැරදි කර අවශ්‍ය කටයුතු කරන ලෙස මම ඉල්ලා සිටිනවා.

<u>ගරු නගරාධිපති - කේ.ඩී.නිශාන්ත ප්‍රදීනාන්දු මහතා</u>

ගරු මන්ත්‍රීතුමා, අඩි 3 පාර අඩි 6 කරන්න කැමැති නැහැ. ඒ කාරණාව සම්බන්ධව අපි දෙන්නා වෙනම හම්බවෙලා කතා කරමු.

පහත නම් සඳහන් මහා නගර සභා මන්ත්‍රීවරුන් 2026.09.09 වන දින පැවති කර්මාන්ත හා ඉදිකිරීම් පිළිබඳ ස්ථාවර කමිටු වාර්තාවේ සියළුම කමිටු නිර්දේශයන්ට පක්ෂව ඡන්දය ප්‍රකාශ කරන ලදී.

1. නගරාධිපති - කේ.ඩී.නිශාන්ත ප්‍රදීනාන්දු මහතා
2. නියෝජ්‍ය නගරාධිපති - ඩබ්.පී.ප්‍රභාෂණී වික්‍රමසිංහ මහත්මිය
3. මහා නගර සභා මන්ත්‍රී - ඒ.එච්.සුදේශ් ඉන්ද්‍රජීත් කුමාර මහතා
4. මහා නගර සභා මන්ත්‍රී - ඩබ්.රවින්ද්‍ර රංගන ප්‍රනාන්දු මහතා
5. මහා නගර සභා මන්ත්‍රී - ඩබ්.ඉෂාන් දුමින්ද ප්‍රනාන්දු මහතා
6. මහා නගර සභා මන්ත්‍රී - ඩී.සමන් සුජීව මහතා
7. මහා නගර සභා මන්ත්‍රී - එම්.බී.සෙව්වන්දි නිලංගිකා ප්‍රනාන්දු මහත්මිය
8. මහා නගර සභා මන්ත්‍රී - බී.යෝගේෂ ප්‍රියදර්ශණ මෙන්ඩිස් මහතා
9. මහා නගර සභා මන්ත්‍රී - ඩබ්.සුජීත් ඩිල්රෝයි ප්‍රනාන්දු මහතා
10. මහා නගර සභා මන්ත්‍රී - ඩී.ශාන්තිනී වල්ගම ද සිල්වා මහත්මිය
11. මහා නගර සභා මන්ත්‍රී - එල්.ඩී.තිලක් විජේතුංග මහතා

12. මහා නගර සභා මන්ත්‍රී - ඩබ්.ස්වර්ණා විජේරත්න මහත්මිය
13. මහා නගර සභා මන්ත්‍රී - ටී.සංජීව ප්‍රියශාන්ත ප්‍රනාන්දු මහතා
14. මහා නගර සභා මන්ත්‍රී - ඩී.ලීලාරත්න හේවාවිතාරණ මහතා
15. මහා නගර සභා මන්ත්‍රී - අයි.ඩී.මහින්ද පල්ලිආරච්චි මහතා
16. මහා නගර සභා මන්ත්‍රී - එච්.කේ.ෂර්මල් පිලිසියන් ප්‍රනාන්දු මහතා
17. මහා නගර සභා මන්ත්‍රී - ඩබ්.ජීවන්ත සුදර්ශන කුමාර ප්‍රනාන්දු මහතා
18. මහා නගර සභා මන්ත්‍රී - එච්.කේ.ශ්‍රියංග මනෝජ් ප්‍රනාන්දු මහතා
19. මහා නගර සභා මන්ත්‍රී - ජීවන්ත සෙනෙවිරත්න මහතා
20. මහා නගර සභා මන්ත්‍රී - කේ.ඩබ්.සදුන් චාමර ප්‍රනාන්දු මහතා
21. මහා නගර සභා මන්ත්‍රී - ඩී.එස්.සුසන්ත ඉරෝෂන් ප්‍රනාන්දු මහතා
22. මහා නගර සභා මන්ත්‍රී - ඩබ්.දිලිප් මනෝජ් ප්‍රනාන්දු මහතා
23. මහා නගර සභා මන්ත්‍රී - බී.සරෝජනී මැන්දිස් මහත්මිය
24. මහා නගර සභා මන්ත්‍රී - එම්.චන්ද්‍රසිරි ප්‍රනාන්දු මහතා
25. මහා නගර සභා මන්ත්‍රී - එම්.ඉන්ද්‍රජිත් ප්‍රනාන්දු මහතා

පහත නම් සඳහන් මහා නගර සභා මන්ත්‍රීවරුන් 2026.09.09 වන දින පැවති කර්මාන්ත හා ඉදිකිරීම් පිළිබඳ ස්ථාවර කමිටු වාර්තාවේ කරුණු අංක 02(3), 02(4), 02(8), 02(10), 02(11), 02(13), 02(17), 02(23), 02(32), 02(33), 02(38), 03, 04, 07 හා 19 දරණ කමිටු නිර්දේශයන්ට පක්ෂව ඡන්දය ප්‍රකාශ කළ අතර අනෙකුත් සියළුම කමිටු නිර්දේශයන්ට පක්ෂව හෝ විපක්ෂව ඡන්දය ප්‍රකාශ කිරීමෙන් වැළකී සිටින ලදී.

1. මහා නගර සභා මන්ත්‍රී - ඩබ්. මැක්සි ජේ. ප්‍රනාන්දු මහතා
2. මහා නගර සභා මන්ත්‍රී - එම්. තිලකසිරි ප්‍රනාන්දු මහතා
3. මහා නගර සභා මන්ත්‍රී - බී.සජිත් දුමින්ද පීරිස් මහතා
4. මහා නගර සභා මන්ත්‍රී - ඒ.එච්. සුරේෂ් ඉන්දික මහතා
5. මහා නගර සභා මන්ත්‍රී - යූ.අනුරසිරි ජයලාල් ද සිල්වා මහතා
6. මහා නගර සභා මන්ත්‍රී - යූ.එල්. සේනක දමයන්ත ද සිල්වා මහතා
7. මහා නගර සභා මන්ත්‍රී - එම්.ලිහිණි ප්‍රනාන්දු මහත්මිය
8. මහා නගර සභා මන්ත්‍රී - සිත්ති මසීනා බක්කර් මහත්මිය
9. මහා නගර සභා මන්ත්‍රී - එම්.ශිරෝමි ඉන්දිකා කුරේ මහත්මිය
10. මහා නගර සභා මන්ත්‍රී - එස්. වදුන් රොමේෂ් ප්‍රනාන්දු මහතා
11. මහා නගර සභා මන්ත්‍රී - එල්. දිලිප් රොෂාන් කුමාර පෙරේරා මහතා
12. මහා නගර සභා මන්ත්‍රී - ඩබ්. සමීර ප්‍රභාත් ප්‍රනාන්දු මහතා
13. මහා නගර සභා මන්ත්‍රී - ඩබ්.ඒ.ඩී.බ්‍රෙන්ඩන් එච්.ක්‍රිස්ටල් කාන්ත මහතා
14. මහා නගර සභා මන්ත්‍රී - පී. සුලක්ෂිකා තිලක්ෂනී ප්‍රනාන්දු මෙනවිය
15. මහා නගර සභා මන්ත්‍රී - හරිෂ් චන්දන පිලානවිතානගේ මහතා
16. මහා නගර සභා මන්ත්‍රී - ඩබ්.ඩී.රංජලා එස්.ජයතුංග මහත්මිය
17. මහා නගර සභා මන්ත්‍රී - ඩී.එම්.මනෝජ් මධුරංග විජයරත්න මහතා
18. මහා නගර සභා මන්ත්‍රී - එම්.ප්‍රියනාත් මැකන්සි මැන්දිස් මහතා
19. මහා නගර සභා මන්ත්‍රී - ඕ. දිනූෂි කෞෂල්‍යා පෙරේරා මහත්මිය
20. මහා නගර සභා මන්ත්‍රී - එච්.එල්.තිළිණි නෙත්සරණි මෙනවිය

පහත නම් සඳහන් මහා නගර සභා මන්ත්‍රීවරුන් 2026.09.09 වන දින පැවති කර්මාන්ත හා ඉදිකිරීම් පිළිබඳ ස්ථාවර කමිටු වාර්තාවේ සියලුම කමිටු නිර්දේශයන්ට විපක්ෂව ඡන්දය ප්‍රකාශ කරන ලදී.

1. මහා නගර සභා මන්ත්‍රී - ඩී.එම්.සුජිත් පුෂ්පකුමාර මහතා
2. මහා නගර සභා මන්ත්‍රී - පී.එම්.ෂෙයාන් දුලිප් තිසේරා මහතා

පහත නම් සඳහන් මහා නගර සභා මන්ත්‍රීවරු 2026.09.09 වන දින පැවති කර්මාන්ත හා ඉදිකිරීම් පිළිබඳ ස්ථාවර කමිටු වාර්තාවේ සියලුම කමිටු නිර්දේශයන්ට පක්ෂව හෝ විපක්ෂව ඡන්දය ප්‍රකාශ කිරීමෙන් වැළකී සිටින ලදී.

1. මහා නගර සභා මන්ත්‍රී - ඩී.සමන්ත සිල්වා මහතා

2026.09.09 වන දින පැවති කර්මාන්ත හා ඉදිකිරීම් පිළිබඳ ස්ථාවර කමිටු වාර්තාවේ සියලුම කමිටු නිර්දේශයන් වැඩි ඡන්දයෙන් සභා සම්මත විය.

(එම අවස්ථාවේ දී පහත නම් සඳහන් මහා නගර සභා මන්ත්‍රීවරු සභා ගැබෙහි නොසිටියහ

1. මහා නගර සභා මන්ත්‍රී - එල්. ඔසඳ හර්ෂණ අබේකෝන් මහතා
2. මහා නගර සභා මන්ත්‍රී - යූ.සුදත් ක්‍රිෂාන්ත පෙරේරා මහතා
3. මහා නගර සභා මන්ත්‍රී - ඩබ්.සුරේෂ් ප්‍රේමකුමාර ප්‍රනාන්දු මහතා

06(09) 2026.09.10 වන දින පැවති මුදල් පිළිබඳ ස්ථාවර කමිටු වාර්තාවේ නිර්දේශයන් සලකා බැලීම.

<u>මහා නගර සභා මන්ත්‍රී - සිත්ති මෂිනා බක්කර් මහත්මිය</u>

ගරු නගරාධිපතිතුමනි, 02(3) සණ අපද්‍රව්‍ය සඳහා මිලියන 31 ක් ගෙවීම සම්බන්ධව වාරික වශයෙන් ගෙවීමට අපි සාකච්ඡා කළ බැවින් සහ ඊට පෙර ආණ්ඩුකාරතුමාගේ ප්‍රධානත්වයෙන් යුතුව අපද්‍රව්‍ය කළමනාකරණ අධිකාරිය සමඟ සාකච්ඡාවක් පැවැත්වීමට කටයුතු කරන්නා ලෙස අගෝස්තු මාස වාර්තාවේත් සහ සැප්තැම්බර් මාස වාර්තාවේත් එම නිර්දේශමයි තිබෙන්නේ. ආණ්ඩුකාරතුමා සමඟ සාකච්ඡාවක් ලබා ගැනීමට මාස දෙකක කාලයක් ගත වන බැවින්, මිලියන 31 සම්බන්ධ තීන්දුවක් ගැනීමට කඩිනමින් ආණ්ඩුකාරතුමා සමඟ සාකච්ඡාවක් කැඳවා තීන්දුවක් ලබා ගැනීමට මා ඉල්ලා සිටිනවා.

<u>ගරු නගරාධිපති - කේ.ඩී.නිශාන්ත ප්‍රදීනාන්දු මහතා</u>

ගරු මන්ත්‍රීතුමිය, ඒ පාර්ශවය සමඟ සාකච්ඡා කර වාරික වශයෙන් ගෙවීමට කටයුතු කරන ලෙස ආණ්ඩුකාරතුමා අදහස් දක්වා තිබෙනවා.

<u>මහා නගර සභා මන්ත්‍රී - සිත්ති මෂිනා බක්කර් මහත්මිය</u>

ගරු නගරාධිපතිතුමනි, සමන්ලාල් නගරාධිපතිතුමා හිටපු කාලයේ මේ සම්බන්ධව ගැටළුවකුත් ඇති වුණා, දිරා පත්වෙන කුණු අපි දීමෙන්, ඒකින් ඒ අය ප්‍රයෝජනයට අරන් ලාබයක් ලබන්නා බැවින්, එම නිසා අපි ගෙවීමක් කළ යුතුද යන්න ගැටළුවක් මතුවුණා. අපි මේ සම්බන්ධව සාකච්ඡා කර මිලියන 31 හැදුනේ කොහොමද කියා කැටියෙන් සාරාංශයක් අරගෙන සභාවට ඉදිරිපත් කලොත් වඩාක් උචිතයි කියා මා සිතනවා.

ගරු නගරාධිපති - කේ.ඩී.නිශාන්ත ප්‍රදීනාන්දු මහතා

ගරු මන්ත්‍රීතුමිය, අපෙන් කසල ගැනීම නතර කලොත් අපි විශාල ප්‍රශ්ණයකට මුහුණ දෙන්න වෙනවා. ඒ අයත් බස්නාහිර පළාත් කසල කළමනාකරණ ඒකකයට වගකිව යුතුයි. මට ඇත්තටම මේ පිළිබඳ ගැටළුවක් තිබෙනවා. මගේ අවබෝධය අනුව පානදුර ප්‍රාදේශීය සභා සහ නගර සභා වාහනත් මොරටුව මහ නගර සභාවේ නම ගහගෙන ගියා. ඔය කියන කාලයේ ගිවිසුමේ නිශ්චිත වගන්තියක් තිබෙනවා නමුත් ඒ වගන්තිවලට අනුව නොවෙයි මේ ගිවිසුමේ කාර්යය පවත්වාගෙන ගියේ, ඒ සම්බන්ධ සාකච්ඡා කර වාරික මොන මට්ටමෙන්ද ගෙවලා අවසන් කරන්නේද යන්න ඒ පාර්ශව සමඟ සාකච්ඡා කර තීන්දුවක් ලබා ගැනීම සුදුසුයි.

මහා නගර සභා මන්ත්‍රී - සිත්ති මෂිනා බක්කර් මහත්මිය

ගරු නගරාධිපතිතුමනි, 05 ඝණ අපද්‍රව්‍ය කළමනාකරණ ව්‍යාපෘතිය වෙනුවෙන් වෙන් කළ කසළ ඉවත් කිරීමේ සේවයේ යෙදෙන කම්කරු හා රියදුරු යන සේවක මහතුන්ට දිනකට රු.150 බැගින් ගෙවීම් කිරීම සම්බන්ධව ජුනි සහ ජූලි මාසය සඳහා සභා ආවරණ අනුමැතියට යටත්ව ගෙවීම් කර තිබෙනවා. නමුත් අනුමත කර තිබෙන්නේ ඔක්තෝබර්වල, මේවා අනුමත කිරීමට මෙච්චර කල් යන්නේ කෙසේද ? අපි පුළුවන් තරම් ඉක්මනට අවසන් කළ යුතු බව මා කියා සිටිනවා.

ගරු නගරාධිපති - කේ.ඩී.නිශාන්ත ප්‍රදීනාන්දු මහතා

ගරු මන්ත්‍රීතුමිය,ඒවාගේ ඇතිවුණු ප්‍රමාද දෝෂයන් තිබෙනවා, ඔබතුමාගේ කථාවට මම එකඟයි. ගරු කොමසාරිස්තුමිය මේ පිළිබඳ අවධානය යොමු කරන්න.

මහා නගර සභා මන්ත්‍රී - සිත්ති මෂිනා බක්කර් මහත්මිය

ගරු නගරාධිපතිතුමනි, 17(6) සම්බන්ධව 547/ බී රාවතාවත්ත දකුණ වසමේ පිහිටි රාවතාවත්ත සුසාන භූමිය සඳහා නව ආදාහනාගාරයක් ඉදිකිරීම සහ 547/ඒ අඟුලාන දකුණ වසමේ පිහිටි අඟුලාන ආදාහනාගාරය අළුත්වැඩියා කිරීම සම්බන්ධව ඇමුණුම අංක 17 තිබෙනවා කරන්න ඕන කරුණු සම්බන්ධ සාකච්ඡා කර, මාස නවයකින් ඉවර කරන්න කල් මදිවීම හේතුවෙන් අදියර දෙකකින් කළ යුතු බව කොමසාරිස්තුමිය කියනවා, ඒ කරුණම තමයි

අංක 22 ත් ඒ කරුණ සම්බන්ධවමයි තිබෙන්නේ රාවතාවත්ත ආදාහනාගාරය සහ අඟුලාන ආදාහනාගාරය අළුත්වැඩියා කිරීම මේකේ ඇමුණුම අංක 23 සහ ඇමුණුම අංක 24 පිළිබඳ අවධානය යොමු කරන්න කියනවා. මෙම ඇමුණුම් ටික ඉංග්‍රීසි භාෂාවෙන් එවා තිබෙන බැවින්, ඒවා හරියට කියවා තේරුම් අරගෙන පිළිතුර යවන්න ඕනෑ බවත්, නිර්දේශ තිබෙන්නේ උක්ත කරුණ සලකා බැලූ කමිටුව, ශ්‍රී ලංකා ජාතික ඉංජිනේරු පර්යේෂණ සහ සංවර්ධන ආයතනය මඟින් එවන ලද ලිපිය අනුව කටයුතු කිරීමටත්, ඒ සමඟ එවා ඇති උපදේශන සේවාවන් සඳහා වූ කොන්ත්‍රාත් ගිවිසුමෙහි කෙටුම්පත අනුමත කිරීමටත් නිර්දේශ කරන ලදී කියන මෙම නිර්දේශ ඉංග්‍රීසියෙන් තිබෙන්නේ ගිවිසුම අත්සන් කිරීමට පෙර සිංහල පරිවර්ථනයක් කර කමිටුව ඉදිරිපත් කළ යුතු බව මා කියා සිටිනවා. උපදේශන සේවාවන් සඳහා මිලියන 3.5 කුත් අඟුලානට මිලියන 1.5 කුත් ගෙවනා බැවින් සෑම පැමිණීමටම රුපියල් පහලොස්දහසක් බැගින් ගෙවීම් කිරීමට සිදු වන බැවින්, ව්‍යාපෘති අවසන් වන තෙක් ඒ අය විසි වාරයක් පමණ පැමිණෙන බැවින්, සිංහලෙන් පරිවර්ථනය කර ගත යුතු බව මම යෝජනා කර සිටිනවා.

අංක 25 නිමිතෙර මෑන් පවර් සම්බන්ධව, 2026 මැයි මස 15 සිට 2026 නොවැම්බර් මස 30 දක්වා දිනකට රු.1,800/- බැගින් දින 2635 ක්, සේවකයින් 85 දෙනෙකුට පැයකට රු. 202.50 බැගින් පැය 5270ක්, මාසයට පැය 62 ක් බැගින් ගෙවීම් කරන බැවින්, නිතරම 15 දෙනෙක් අඩු බව සඳහන් වී තිබෙන බැවින්, ඒ සේවකයින් නොපැමිණෙන දවසටත් අපි ගෙවීම් කරනවාද යන්න මා ප්‍රශ්ණ කර සිටිනවා.

ගරු නගරාධිපති - කේ.ඩී.නිශාන්ත ප්‍රදීනාන්දු මහතා

ගරු මන්ත්‍රීතුමිය, ආපු නැති අයට ගෙවීම් කරන්නේ නැහැ. එහෙම ගෙවීම් කලොත් විශාල ප්‍රශ්ණ ගොඩකට නිලධාරීන් මුහුණ දෙන්න වෙනවා. සේවයට වාර්තා කළ අයට පමණක් ගෙවීම් කර තිබෙන බව මා කියා සිටිනවා. නිමිතෙර මෑන් පවර් ආයතනයට ගෙවිය යුතු මූලික ගණනය කිරීම අයවැයෙන් අනුමත කර තිබෙන බවත්, මාසෙන් මාසෙට හිස ගණන්වලට පමණක් ගෙවීම් කරගෙන යන බවත් මා කියා සිටිනවා.

මහා නගර සභා මන්ත්‍රී - සිත්ති මෂිනා බක්කර් මහත්මිය

ගරු නගරාධිපතිතුමනි, උක්ත කරුණ සලකා බැලූ කමිටුව, ට්‍රයල් පිට්ස් වෙනුවෙන් අයකල රු. 1,080,000.00 ක තැන්පතු මුදල නිදහස් කරන ලෙස චයිනා ජියෝ ඉංජිනේරිං කෝපරේෂන් (එස්එල්) ආයතනය මඟින් සිදු කරන ලද ඉල්ලීම අනුමත කිරීමට නිර්දේශ කරන ලදී . ට්‍රයල් පිට්ස් වෙනුවෙන් ගෙවපු ඒ මුදල ගෙවන්න කියලා නිර්දේශ වෙනවා, නමුත් ඒ අයගේ වැඩ ටික සම්පූර්ණද, නැත්නම් භාගෙට තියෙලා ගිහින්ද

ගරු නගරාධිපති - කේ.ඩී.නිශාන්ත ප්‍රදීනාන්දු මහතා

ගරු මහ නගර සභා මන්ත්‍රීවරුනි, මේ සම්බන්ධයෙන් අදහස් දැක්වීම සඳහා නාගරික ඉංජිනේරුතුමාට අවස්ථාව ලබා දෙනවා.

නාගරික ඉංජිනේරු - සී.අයි.යමසිංහ මහතා

ගරු නගරාධිපතිතුමනි, ට්‍රයල් පිට්ස් තැන්පත් මුදල සම්බන්ධ කාරණාවට අදාළ කරුණු සියල්ල අවසන් ඒ හේතූන් මත තමයි තැන්පතු මුදල නිදහස් කරන්න දී තිබෙන්නේ.

මහා නගර සභා මන්ත්‍රී - එම්.ප්‍රියනාත් මැකන්සි මැන්දිස් මහතා

ගරු නගරාධිපතිතුමනි, අංක 25 නිමිතෙර මෑන් පවර් සප්ලයර්ස් සම්බන්ධව දිනකට රු.1,800/- බැගින් ගෙවීම් කරනවාද යන්න සම්බන්ධව සහ සේවකයන් සියලු දෙනාටම පැයකට රු.202.50 බැගින් අමතර පැයකට ගෙවීම් කරනවාද සම්බන්ධව සහ මෙම සේවකයින් බඳවාගෙන දැනට අවුරුදු 4 ක් හෝ 5 ක් වන බැවින් එම සේවකයන් හට දැනට ඊපීඑෆ් දීමනාවක් කපාහරිනවාද යන්න සම්බන්ධව මා ඔබතුමාගෙන් දැනගන්න කැමැතියි.

ගරු නගරාධිපති - කේ.ඩී.නිශාන්ත ප්‍රදීනාන්දු මහතා

ගරු මන්ත්‍රීතුමා, ඔබතුමා ප්‍රශ්ණාවලියක් යොමු කළානම් බොහෝම ලේසියි මට උත්තර දෙන්න. එකපාරටම නිශ්චිතව ප්‍රශ්ණ ඇසුවහම උත්තර දී ගැනීමේදී අපහසුතාවයක් තිබෙනවා. නමුත් කිව යුත්තේ මෙහෙමයි , සිස්ටම් චේන්ජ් එක නිසා තමයි රු. 1,800/- ක් කර තිබෙන බැවින්, සම්පූර්ණ වගකියන්නේ අදාළ ආයතනය, අපි නොවෙයි. අපි ඒ අයගෙන් ශ්‍රම මිළදීගැනීමයි කර

තිබෙන්නේ. එක් අයෙකුට ගෙවන ගාන සහ ඒ අයට ලැබෙන අතිකාල දීමනාව. පැමිණීම් ලේඛණගතවීම අනුව වැඩ කරන අයට පමණක් දීමනා හම්බවෙනවා.

<u>මහා නගර සභා මන්ත්‍රිනී - මේරියන් ලිහිණි ප්‍රනාන්දු මහත්මිය</u>

ගරු නගරාධිපතිතුමනි, 25 සම්බන්ධව මටත් පැහැදිලි කිරීමක් අවශ්‍යයි. මාසිකව ගෙවිය යුතු මුදල වශයෙන් මුදල් කමිටුවට ඉදිරිපත් කර මිලියන 6.8 ක මුදලකට අනුමැතියක් ගන්නවා. මිලියන 6.8 ක් ගෙවීමට සභාවෙන් අනුමැතිය දෙනවා. නමුත් ඔබතුමා කියනවා පැමිණි අයට පමණක් ගෙවීම් කරන බව. එතකොට මුදල් කමිටුවෙන් අනුමැතිය හම්බවුනාම ගෙවීම මොකද්ද, කාටද ගෙවන්නේ කොහොමද ගෙවන්නේ කියා සභාවට වාර්තාවක් නැහැ. මේවා නොවෙයිද අක්‍රමිකතාවලට යන්නේ. අදාළ මාසයට ගෙවිය යුතු වාර්තාව නොවෙයිද සභාවට ඉදිරිපත් කළ යුත්තේ. දිනකට රු. 1,800 බැගින් දින 2635 කුත්, අතිකාල පැය 5270 කුත් සේවකයන් කිහිප දෙනෙක්ද, අතිකාල පැය ගණන් පාවිච්චි කලාද යන්න සම්බන්ධව පැහැදිලි කිරීමක් කරන්න පුළුවන්ද.

<u>ගරු නගරාධිපති - කේ.ඩී.නිශාන්ත ප්‍රදීනාන්දු මහතා</u>

ගරු මන්ත්‍රිතුමිය, මුදල් කමිටුව මේක අනුමත කළාට, පැමිණීම් වාර්තාව හා පැමිණි සේවක සංඛ්‍යාව සහ අදාළ මාසයට ගෙවන මුදල් ද අපි වෙත මාසිකව එවන බැවින්,ඒ සෑම දෙයක්ම මුදල්

කමිටුවට ඉදිරිපත් කර ඇති බැවින්, මේක ගැටළුවක් වෙන්නේ නැහැ. නමුත් මාස් පතා ගෙවපු ගාණ මුදල් කමිටුවට ඉදිරිපත් කරන ලෙස මා ඉල්ලා සිටිනවා.

<u>මහා නගර සභා මන්ත්‍රි - එල්.ඔසඳ හර්ෂණ අබේකෝන් මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, 22 සම්බන්ධව රාවතාවත්ත සුසාන භූමියේ නව ආදාහනාගාරයක් හදනවාද, කොතනද.

<u>ගරු නගරාධිපති - කේ.ඩී.නිශාන්ත ප්‍රදීනාන්දු මහතා</u>

ගරු මන්ත්‍රිතුමා, ඔය ආදාහනාගාරයේ මැෂින් හොඳටම පැරණි වෙලා, කොයි වෙලාවේ මොකක් වෙයිද දන්නේ නැහැ. ඉදිරිපසෙන් ඒකටම සම්බන්ධ කර එකම විදිහේ ගොඩනැගිල්ලක් සෑදීමට දැනට මුදල් වෙන් කර තිබෙනවා.

<u>මහා නගර සභා මන්ත්‍රි - ඩී.එම්. මනෝජ් මධුරංග විජයරත්න මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, 02(4) සම්බන්ධව 2025.07.31 සිට 2026.07.31 දක්වා කාලය තුළ ගිවිසුම් ගත වී නොමැති බැවින්, ගිවිසුම් ගත වී නොමැති කාලයටත් එක්ක ඩ්‍රාෆ්ට් හදා තිබෙනවා. ගිවිසුම අත්සන් කිරීමේදී වලංගු බාවය සම්බන්ධව ගැටළුවක් තිබෙන බැවින්, බැක් ඩේට් කරලා අත්සන් කිරීමේදී නීතිමය සම්බන්ධ ගැටළුවක් තිබෙනවා. මම දන්නා තරමට බැක් ඩේට් කරලා හොර ඔප්පු අත්සන් කරන්න බැහැ. රු.ලක්ෂ 72 ක කොන්දේසි විරහිත බැංකු ඇපකරයක් තැබීම සම්බන්ධ සුරක්ෂිතතාවය සම්බන්ධ පැහැදිලි කිරීමක් කරන්න පුළුවන් නම් වඩාත් හොඳයි.

<u>ගරු නගරාධිපති - කේ.ඩී.නිශාන්ත ප්‍රදීනාන්දු මහතා</u>

ගරු මන්ත්‍රිතුමා, දීර්ඝ කාලයක් මේ එන වැරදි ප්‍රශ්ණ විදිහට දිගටම එනවා. කරදියාන කසළ අංගනයට කසල දැමීමට ගිවිසුමක් තිබුණා. පසු කාලීනව මෙම මුදල් නොගෙවීමෙන් ඇතිවුණු

ගැටළුව හේතුවෙන් ගිවිසුම අත්සන් කලේ නැහැ. හැබැයි ගිවිසුම අත්සන් නොකළට, අපි කසල ගිහින් දැම්මා. මේ ගෙවපු අවුරුද්දයි මාස ගාණක් ඇතුලේ ගිවිසුමට ගියේ නැතුව අපි ඒ වැරදීම නැවත කළා. අපි බැලුවා තිබෙන ප්‍රශ්ණ ටික කොහොමද බේරගන්නේ කියා. ගිවිසුම් ගතවීම අනිවාර්ය හේතුවෙන් ආයතනයක් විදිහට නැවත නැවත නීතියේ ඉදිරියේ අසරණ වන තත්ත්වයකට පත් වෙනවා. ගිවිසුම් ගතවීමට එකඟතාවයක් තිබෙන විට අපේ මෙම කටයුත්ත සම්බන්ධව බැංකු ඇපයක් තබා ගන්නවා කොන්දේසි විරහිතව, ඒක ලොකු ගැටළුවක් නොමැති බැවින්, කොහොම නමුත් නීත්‍යානුකූල වන්නේ ගිවිසුම් අත්සන් කිරීම තුළින් පමණක් බැවින්, දින පමා වුණත් අත්සන් තබන්නම වෙන බවත්, බලහත්කාරකම්වලින් චන්ඩිකම්වලින්, නීති විරෝධි ලෙස කටයුතු කරන්නට නොහැකි බැවින්, අකමැත්තෙන් හෝ මෙම කටයුත්ත සුහදව කථා කරලා කරගන්න වෙන බව මාගේ දැනුම අනුව මා අදහස් කර සිටිනවා.

<u>මහා නගර සභා මන්ත්‍රී - ඩී.එම්.සුජිත් පුෂ්පකුමාර මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, 02(3) සම්බන්ධව මහ නගර සභා ආඥා පනතේ අංක 130 වගන්තිය මම කියවන්නම්, මේ කොටසේ විධිවිධාන යටතේ මහ නගරයක් තුළ එකතු කරනු ලබන සියලුම වීදි කසල, නිවාස කසල, මළ හෝ එවැනි වෙනත් ද්‍රව්‍ය සභාවේ දේපලක් විය යුතු අතර, ඒ සියලු ද්‍රව්‍ය විකිණීම හෝ බැහැර කිරීම සඳහා සභාවට පූර්ණ බලය තිබිය යුතුය. ඒකින් ලැබෙන මුදල් මහ නගර සභා අරමුදලට බැර විය යුතුය.

ගරු නගරාධිපතිතුමනි, කරදියාන කසල අංගනයට මිලියන 31.4 ක් අපි ගෙවිය යුතු බව කියා සිටිනවා. ඒ කාල සීමාව තුළ අපේ හිටපු නගරාධිපතිතුමා කරදියාන අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජිකයෙක්. ඒ හේතුවෙන් අධ්‍යක්ෂ මණ්ඩලය තීන්දුවක් ගන්නවා මොරටුව මහ නගර සභාව විසින් කසල වෙන් කරලා, කොම්පෝස්ට් හදන්න පුළුවන් විධිහට දෙනවානම්, මුදල් ලබා ගන්නේ නැතිව නොමිලේම කසල දැමීමට ඉඩ දෙන බව අධ්‍යක්ෂ මණ්ඩලයෙන් තීන්දුවක් ගන්නවා. ඒ තීන්දුව හේතුවෙන් ගෙවල්වලින් කසල වෙන් කරලා එකතුකිරීමට ලොකු පරිශ්‍රමයක් යොදන්න මොරටුව මහ නගර සභාවට සිද්ධවුණා. අපි සේවකයන්ට වෙඩේ කරනවාට වෙනම ගාණක් ගෙවුවා, මේ සම්බන්ධව ජනතාව දැනුවත් කිරීමට විවිධ වියදම් දැරුවා, කොම්පෝස්ට් බැරල් බෙදුවා, අත් පත්‍රිකා ගෙහුවා, විවිධ වැඩසටහන් කරලා ජනතාව දැනුවත් කළා, ඒ වාගේ විශාල වියදමක් මේ සඳහා අපි දැරුවා. අපේ වෙන්කරපු කසලවලින් හෙදුවා කොම්පෝස්ට් හදලා ඒ අය විකුණුවා. අපේ කසලවලින් ඒගොල්ලු මුදල් උපයෙව්වා. ඒ කාලසීමාවතුළ අපේ කසලවලින් ඒ අය මුදල් ඉපැයුවා. ඉන්පසුව අධ්‍යක්ෂ මණ්ඩලය වෙනස් වුණහම කියනවා මේ කාල සීමාව තුළ මොරටුව මහ නගර සභාව මුදල් ගෙවා නොමැති හැයින් මුදල් ගෙවන ලෙස ඉල්ලනවා. කරදියානෙන් අපිට දීපු මෙම පොරොන්දුව හේතුවෙන් අපි මේ මුදල ගෙවන්න ඕනෑ නැහැ. මේ මුදල ගෙවුවොත් කවදා හරි දවසක අපිට නෛතික ගැටළුවක් මතු වෙනවා. අපේ ලේකම්තුමා මේ පිළිබඳව දන්නා බැවින්, අතීතයේ අපි ඒ කාලසීමාව තුළ මුදල් නොගෙවපු කාරණය සොයා බලන්නා ලෙස මා ඉල්ලා සිටිනවා. තවද, පානදුරේ කථාව සිද්ධ වුනේ 2018 වර්ෂයෙන් පසු බැවින්, ඒ කථාවයි මෙම කථාවත් සම්බන්ධයක් නොමැති බැවින්, ඒක පොහොට්ටුවේ පාලනය තිබෙන කාලයේ හිතවත්කම්වලට බෙදපු එකක්. අපිත් ඒකට විරුද්ධ වුණා, යන්න ඕනෑ තැන්වලට ගිහිල්ලා පෙත්සම් භාර දුන්නා ඒ කථාව නොවෙයි මේක කියා මා කියා සිටිනවා.

ගරු නගරාධිපති - කේ.ඩී.නිශාන්ත ප්‍රදීනාන්දු මහතා
ගරු මන්ත්‍රීතුමා, ඔබතුමා කියපු මේ කාරණා සම්බන්ධව ලිඛිත ලේඛණ මොකුත් නැද්ද.

මහා නගර සභා මන්ත්‍රී - ඩී. එම්. සුජිත් පුෂ්පකුමාර මහතා
ඒගොල්ලෝ ඉල්ලපු කාල සීමාවේ අපිත් එක්ක හුවමාරු වුණ ලිපි ඇති, අපි ඒක හොයලා බලමු. හොයලා බලලා අපි මේ මිලියන 31 ක් කියන්නේ ලොකු ගානක්නේ නගරාධිපතිතුමා. අපි ඒක රැකගන්න බලමු. අපිට දෙන්න පුලුවන් සහයෝගය දෙන්නම්. අපි සාමාන්‍යයෙන් කළේ කසල එකතු කරන එක. කසළ එකතු කරලා කරදියානට දාපු එකයි කළේ. දැන් අපි කසළ වෙන් කරලා එකතු කරන්න ගියේ කොම්පෝස්ට් හදන මට්ටමට එකතු කරන්න ගිහිල්ලා ලොකු වියදමක් දැරුවා. එතකොට අපි මෙහේ වියදමකුත් දරලා අපි කරදියානට ගිහිල්ලා කුණු ටික දීලා ඒගොල්ලන් ඒකෙන් හම්බ කරගෙන. ඔබතුමා සාකච්ඡාවකදී කියන්න මෙන්න මේක මේ කාල සීමාව තුළ එහේ හිටිය අධ්‍යක්ෂක මණ්ඩලය කවුද කියලා පොඩ්ඩක් බලලා ඒ අධ්‍යක්ෂක මණ්ඩල තීරණ වල ඇතිනේ. ඒ අපේ හිටිය පරණ නිලධාරීන් ඉන්නවානම් එඅයගෙන් ඇහුවානම් දන්නවා.

ගරු නගරාධිපති - කේ. ඩී. නිශාන්ත ප්‍රදීනාන්දු මහතා
ගරු මහා නගර සභා මන්ත්‍රීවරුනී, මමත් ඔය සම්බන්ධයෙන් ඕනතරම් කතා කරලා ඇති. නමුත් අපි කොච්චර කතා කළත් වැඩක් නැහැ. අපේ මොනවාහරි ලිපිගොනුවක හොයාගන්න පුලුවන් වෙන්න එපැයි. ඔය ගෙවීම එකඟ වෙන්නේ අපේ පාලනය එන්න ඉස්සෙල්ලානේ. එහෙම එකපාරම ගෙවන්නේ නැහැනේ.

මහා නගර සභා මන්ත්‍රී - ඩී. එම්. සුජිත් පුෂ්පකුමාර මහතා
ගරු නගරාධිපතිතුමනි, 02(04) මේ සම්බන්ධයෙන් මධුරංග මන්ත්‍රීතුමත් කිවුවා. එකී ගිවිසුම් ගත වී නොමැති කාලයද අන්තර්ගත කරමින් 2025.08.01 සිට 2028.07.31 දක්වා කාලය සඳහා ගිවිසුම් කෙටුම්පත ඉදිරිපත් කර ඇත. තවද ගිවිසුමේ ඉදිරියට පවතින කාලය වසර දෙකක් වන බැවින් මසකට නිකුත් වන ඉන්වොයිස් අගය සලකා ඉදිරි වසර දෙක කාලය වන 2028.07.31 දක්වා වලංගු වන පරිදි රුපියල් හැත්තෑ දෙලක්ෂයක වටිනාකමින් යුත් කොන්දේසි විරහිත බැංකු ඇපකරයක් පිළිගත් බැංකුවක තබා අදාළ බැංකුගත ලියවිල්ල අපද්‍රව්‍ය කළමනාකරණ අධිකාරිය වෙත එවන ලෙස දන්වා ඇත. ගරු නගරාධිපතිතුමනි, මේක පළවෙනි එක තමයි අපේ පහුගිය අවුරුද්දක කාල සීමාවට බැක්ඩේට් කරලා ගිවිසුම් ගන්න නගර සභාවට කිසිදු බලයක් නගර සභාවට නැහැ. මේක නීත්‍යානුකූල නැහැ. මේක බැක්ඩේට් කරලා ගිවිසුම් ගැහුවොත් එහෙම මේක ලොකු ප්‍රශ්ණයක් වෙනවා නගර සභාවට නීතිමය වශයෙන්. එතකොට මේකෙදී පැහැදිලිව අපේ ඉදිරි කාල සීමාව තුළ ගහන්න ඕන පෙර පහුගිය කාල සීමාවන් වලට ගිවිසුම් ගහලා ඒ අවශ්‍ය කටයුතු කරන්න බැහැ. එහෙමනම් අපි වෙන මොකක්හරි ලේඛනයක් හදන්න වෙනවා ඒකට. එහෙම නැතුව එක ලේඛනයකින් අරකත් කවර් වෙන්න එහෙම කරන්න බැහැ. අනෙක් එක තමයි බැංකු ඇපකරයක් ඉල්ලනවා. අපි මෙතෙක් කල් බැංකු ඇපකර දුන්නේ නැහැ කරදියාන වත්තට කිසිම දවසක. හිටපු නගරාධිපතිතුමා එක්ක දාපු ඒගොල්ලන් කතා කරගත්ත විදියට ඒකේ හිඟ මුදල හැරුණු කොටගෙන, අපි මෙතෙක් හිඟ නැහැ නේද? අපේ හිඟ නැහැනේ. ඒ කියන්නේ අපි ඒගොල්ලන්ගේ විශ්වාසය කඩලා නැහැනේ. එතකොට ඇයි ඒගොල්ලන් මොරටුව මහා නගර සභාවකින් රුපියල් හැත්තෑ දෙලක්ෂයක බැංකු ගැරන්ටි එකක් ඉල්ලන්නේ. ඒක නිකන් නගර සභාවට කරපු නිගාවක්නේ. අපි කියන්නේ නගරාධිපතිතුමා අර අයිඑම්එෆ් එක

අපේ රටට දානවනේ එක එක පාලකයෝ ඉන්නකොට එක එක නීති දානවනේ අර ඒගොල්න්ගේ කටයුතු කරගන්නවා වගේ කරදියානත් හදන්නේ නිකන් අපිව මෙහෙම අල්ලලා බිත්තියට හේත්තු කරන්න උත්සහා කරගෙන ඉන්නේ. කරුණාකරලා මෙහෙම කරන්න එපා. මේවා කරන්න ගියොත් එහෙම අපිට එතව ඉස්සරහාට ඒගොල්ලන් කියන කියන දේට යටත් වෙන්න වෙනවා. ඒ නිසා මේකට එකඟ වෙන්න එපා කියන ගෞරවනීය ඉල්ලීම කරනවා.

ගරු නගරාධිපතිතුමනි, 02(05) වොට් 18 එල්ඊඩී බල්බ 3000 ක ප්‍රමාණය රු.3,633,060.00 (වැට් රහිත) මුදලකට මිලදී ගැනීම හා කෝබ්රා එල්ඊඩී චිප් බල්බ සඳහා නැවත මිල ගණන් කැඳවීම සඳහා මුදල් කාරක සභාවේ අනුමැතිය පිණිස ඉදිරිපත් කරමි. නිර්දේශය දීලා තියෙනවා. උක්ත කරුණ සලකා බැලූ කමිටුවට, මේ පිළිබඳ වාර්තාවක් නාගරික ගබඩාව වෙතින් ඉදිරිපත් වූ නමුත් එම වාර්තාවේ කමිටුව අපේක්ෂා කරන තොරතුරු ප්‍රමාණවත්ව ඇතුළත් නොවන බැවින් මේ පිළිබඳව සවිස්තරාත්මක වාර්තාවක් මීළඟ කමිටුවට ඉදිරිපත් කිරීමට නිර්දේශ කරන ලදී. මට පොඩි ගැටලුවක් තියෙනවා ඒක නිරකාරණය කරගන්න ඕන. රු.3,633,060.00 ක මුදල් ගෙවලා බල්බ අරගෙන තියෙනවා මේකේ තියෙන විදියට හැබැයි ඒක අනුමත කරලා මුදල් කමිටුව. මේක ගන්න ඇත්තේ ඔබතුමාගේ ආවරණ අනුමැතිය යටතේනේ. හරිනම් වෙන්න ඕන මේක අනුමත කරලා අරකේ වාර්තාවක් ඉල්ලන්නනේ ඕන. නමුත් මේ සල්ලි දීලා බඩු ගත්ත එක අනුමත කරලාද අපිට පැහැදිලි නැහැ. අන්න ඒකයි අපිට දැනගන්න ඕන.

<u>ගරු නගරාධිපති - කේ. ඩී. නිශාන්ත ප්‍රදීනාන්දු මහතා</u>

ගරු මහා නගර සභා මන්ත්‍රීවරුනී, මේ සම්බන්ධයෙන් අදහස් දක්වන්න ප්‍රධාන නාගරික ගණකාධිකාරීතුමියට අවස්ථාව ලබා දෙනවා. අපි මූලික මිල ගණන් කැඳවීම කළාට. අපි තවම ගෙවීම කරලාද තියෙන්නේ.

<u>ප්‍රධාන නාගරික ගණකාධිකාරි - ආර්. එම්. සංජීවනී රත්නායක මහත්මිය</u>

ගරු නගරාධිපතිතුමනි, අපි මෙතන ටෙන්ඩර් ඩිසිෂන් එක ගන්නේ බල්බ් 3000කට. 1000 ගානේ තමයි අපි ඕඩර් කරන්නේ. මේ ටෙන්ඩර් ඩිසිෂන් එක තමයි මුදල් කමිටු නිර්දේශයටයි සභා අනුමැතියටයි දාලා තියෙන්නේ. අපි 1000කට ගෙවීම් කරලා තියෙන්නේ. එක පාරකට 1000යි ගන්නේ අනෙක් 1000 කට ගෙවීම් කරලා නැහැ තවම ඒක කරගෙන යනවා.

<u>ගරු නගරාධිපති - කේ. ඩී. නිශාන්ත ප්‍රදීනාන්දු මහතා</u>

ගරු මන්ත්‍රීතුමා, මේකේ යම් පටලැවිල්ලක් තියෙනවා. ඔබතුමා මතු කරන කාරණය හරි. මිල මොකකවත් ගෙවීම් කරලා නෙවෙයි. කමිටුවේ දී ප්‍රශ්ණයක් ආවා මහජන උපයෝගිතා කමිටුවට දාලා තිබුණා අපි ලයිට් ගන්නවා ඒවා කාලයක් වොරන්ටි තියෙනවානේ ඒ වොරන්ටි තියෙන එක අපිට බලාගන්න විදියක් නැහැ අර මාර්කර් පෙන් එකකින් මාර්ක් එකක් දානවා, ඒක මැකෙනවා. දැන් අපි ලයිට් ගොඩක් ගෙනෙල්ලා තියෙනවා. හැබැයි අපි ලයිට් ගොඩක් ගෙනෙල්ලා තියෙනවා නමුත් ඒ අදාළ ගැරන්ටි සහිතව තියෙන්නේ ආයේ ගහලා ගිය ලයිට් 42යි. දැන් ඔය සාකච්ඡාව තමයි මුදල් කමිටුවේ ගත්තේ. ඒ ගත්තු සාකච්ඡාව තමයි මාරුවෙලා තමයි මේක ඇවිල්ලා තියෙන්නේ. මේකේ මුකුත් ගෙවීම් කරලා නැහැ. ලයිට් ගන්න තියෙන මුළු ගානයි. ඊට පස්සේ අපි ගන්නවානම් 1000 ගානේ තමයි ගන්නේ කියලා සාකච්ඡාවට ගත්තා. අපි අරගත්ත ප්‍රමාණයක් තියෙනවා. බල්බ් 1000ක් ගත්තා.

<u>මහා නගර සභා මන්ත්‍රී - ඩී. එම්. සුජිත් පුෂ්පකුමාර මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, එතකොට බල්බ් 1000 ක් ගත්තා. එතකොට ඒකට සල්ලි ගෙව්වේ නැද්ද? මේකේ තියෙන්නේ නගරාධිපතිතුමනි, රු.3,633,060.00 (වැට් රහිත) මුදලකට මිලදී ගැනීම.

1000කට සල්ලි ගෙවුවානම් 1000කට සල්ලි ගෙවුවා කියලා එන්න එපැයි මේකේ. දැන් ඔයගොල්ලන්ගේ හිතේ තියෙන දේ අපි දන්නේ නැහැනේ.

<u>ගරු නගරාධිපති - කේ. ඩී. නිශාන්ත ප්‍රදීනාන්දු මහතා</u>

ගරු මන්ත්‍රීතුමා, මේ ප්‍රසම්පාදන තීරණය තමයි ඉදිරිපත් කරලා තියෙන්නේ. අපිට මේ සමහර ගැටලු ආවාම ඒ වෙලාවේ උත්තර දෙන්න අමාරුයිනේ. ඕනනම් ෆයිල් එක ගෙනෙල්ලා බලන්න.

<u>මහා නගර සභා මන්ත්‍රී - ඩී. එම්. සුජීත් පුෂ්පකුමාර මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, අපි කියන්නේ නැහැ මේකේ වංචාවක් වෙලා තියෙනවා කියලා. අපි කියන්නේ මේ වාර්තාවේ පටලැවිල්ලක් තියෙනවා. ඒ නිසා ඒක නිවැරදි කරලා දාන්න කියන දේ තමයි අපි කියන්නේ. අපි දන්නේ නැහැ මේකේ මොකද්ද වෙලා තියෙන්නේ කියලා. අපි දන්නේ බල්බ් 1000ක් ඇවිල්ලා තියෙනවා කියන දේ. එතකොට බල්බ් 1000 නිකන් එන්න බැහැනේ නගරාධිපතිතුමා. එක්කෝ ණයට ගන්න ඕන නැතිනම් සල්ලි දීලා ගන්න ඕන.

ගරු නගරාධිපතිතුමනි, 03(03) සංවර්ධනය නොකළ ඉඩම් බදු මුදල් රු.60,000/- යි. ඉහත පරිදි රු.60,000/- ක මුදල සම්බන්ධ සුදුසු තීරණයක් ලබා ගැනීම සඳහා මුදල් කමිටු නිර්දේශය හා සභා අනුමැතිය ලබාගැනීම සඳහා කියලා දාලා තියෙනවා. හැබැයි ඒක ඉහත කරුණ සම්බන්ධයෙන් වර්තමාන තොරතුරු ඇතුළත් කරන ලද වාර්තාවක් මීළඟ මුදල් කමිටුවට ඉදිරිපත් කිරීමට නිර්දේශ කරන ලදී කියලා. කොහොමත් නගරාධිපතිතුමා මේකේ අපි ඔබතුමාට පොඩි මතක් කිරීමක් කරලා තියන්නම්. මේක පොඩ්ඩක් කියවපුවාම අපිට තේරුණ දේ තමයි බදු කපාහරින්න බැහැ. හැබැයි ඔබතුමා බදු කපා හරින්න කියලා තීන්දුවක් අරගෙන නැහැ. හැබැයි මේකේ තියෙන්නේ ඊළඟ කමිටුවේ දී තීන්දුවක් ගන්නවා කියලා. ඒ නිසා ඒ සම්බන්ධයෙන් අපි ඔබතුමාගේ අවධානය යොමු කරනවා.

ගරු නගරාධිපතිතුමනි, සභාවේ වාහන අළුත්වැඩියා කිරීම සඳහා අවශ්‍ය බැටරි, ටයර් සහ ත්‍රීවිල් අමතර කොටස් ප්‍රාදේශීය මිළ ගණන් කැඳවා පමණක් මිල දී ගැනීම සුදුසු බවට යෝජනා කරමි. නගරාධිපතිතුමනි රු.700,000.00 ක පමණ මූල්‍ය සීමාවකට යටත්ව ප්‍රාදේශීය මිල ගණන් කැඳවන්න කියලා තියෙන්නේ. අපි ඔබතුමාගේ අවධානය යොමු කරනවා මේක ලොකු ගැටලුවක් ඒ නිසා මේකට ඉඩ දෙන්න එපා. අනෙක් එක 22 කරුණේ ඉදිරිපත් කරලා තියෙන වාර්තාව අපිට ඒක සිංහලට පරිවර්ථනය කරලා ලබා දෙන්න කියන ඉල්ලීම කරනවා. අනෙක් කරුණ 23, අඟුලාන දකුණ වසමේ පිහිටි අඟුලාන ආදාහනාගාරය අලුත්වැඩියා කිරීම සම්බන්ධයෙන් ඒකේ ගාන දාලා තියෙනවා ඇස්තමේන්තුවක් ඉදිරිපත් කරලා නැහැ. ඒ සම්බන්ධයෙන් ඔබතුමාගේ අවධානය යොමු කරනවා. ඒ වගේම රාවතාවත්ත ආදාහනාගාරය සම්බන්ධයෙනුත් ඇස්තමේන්තුවක් ඉදිරිපත් කරලා නැහැ. ඒ සම්බන්ධයෙනුත් අවධානය යොමු කරනවා. ඊට පස්සේ අංක 28 ව්‍යාපෘති ගණනාවක් ඉදිරිපත් කරලා තියෙනවා. ඒ ව්‍යාපෘති බොහෝ ඒවා කරලා ඉවරයි. ඒකේ එකක් ඔබතුමාගේ අවධානයට යොමු කරන්නම්. ඔක්කෝම 2026.07.24 කියලා තියෙන්නේ ප්‍රසම්පාදන කමිටු වාර්තා දිනය. හැබැයි එකක් තියෙනවා නගරාධිපතිතුමා 2026.03.27 කියලා ඒක වැරදිලා දාලාද? ඒ කියන්නේ ප්‍රසම්පාදන කමිටු රැස්වීම තිබිලා තියෙන්නේ 2026.03.27 ඒක මේ කමිටුවට තමයි ඇවිල්ලා තියෙන්නේ. කරුණ සෝභිත විද්‍යාල මාවත සංවර්ධනය කිරීම. වැඩේ කරලා ඉවරයිද? ඒකේ ප්‍රසම්පාදන ක්‍රියාවලිය වෙලා තියෙන්නේ 2026.03.27. මීට මාස 09කට උඩදි. දිනය වැරදිලාද නැතිනම් ප්‍රින්ටින් මිස්ටේක් එකක්ද දන්නේ නැහැ.

පහත නම් සඳහන් මහා නගර සභා මන්ත්‍රීවරුන් 2026.09.10 දින පැවති මුදල් පිළිබඳ ස්ථාවර කමිටු වාර්තාවේ සියළුම කමිටු නිර්දේශයන්ට පක්ෂව ඡන්දය ප්‍රකාශ කරන ලදී.

1.	නගරාධිපති	-	කේ.ඩී.නිශාන්ත ප්‍රදීනාන්දු මහතා
2.	නියෝජ්‍ය නගරාධිපති	-	ඩබ්.පී.ප්‍රභාෂණී වික්‍රමසිංහ මහත්මිය
3.	මහා නගර සභා මන්ත්‍රී	-	ඒ.එච්.සුදේශ් ඉන්ද්‍රජිත් කුමාර මහතා
4.	මහා නගර සභා මන්ත්‍රී	-	ඩබ්.රවින්ද්‍ර රංගන ප්‍රනාන්දු මහතා
5.	මහා නගර සභා මන්ත්‍රී	-	ඩබ්.ඉෂාන් දුමින්ද ප්‍රනාන්දු මහතා
6.	මහා නගර සභා මන්ත්‍රී	-	ඩී.සමන් සුජීව මහතා
7.	මහා නගර සභා මන්ත්‍රී	-	එම්.බී.සෙව්වන්දි නිලංගිකා ප්‍රනාන්දු මහත්මිය
8.	මහා නගර සභා මන්ත්‍රී	-	බී.යෝගේෂ ප්‍රියදර්ශණ මෙන්ඩිස් මහතා
9.	මහා නගර සභා මන්ත්‍රී	-	ඩබ්.සුජිත් ඩිල්රෝයි ප්‍රනාන්දු මහතා
10.	මහා නගර සභා මන්ත්‍රී	-	ඩී.ශාන්තිනී වල්ගම ද සිල්වා මහත්මිය
11.	මහා නගර සභා මන්ත්‍රී	-	එල්.ඩී.තිලක් විජේතුංග මහතා
12.	මහා නගර සභා මන්ත්‍රී	-	ඩබ්.ස්වර්ණා විජේරත්න මහත්මිය
13.	මහා නගර සභා මන්ත්‍රී	-	ටී.සංජීව ප්‍රියශාන්ත ප්‍රනාන්දු මහතා
14.	මහා නගර සභා මන්ත්‍රී	-	ඩී.ලීලාරත්න හේවාවිතාරණ මහතා
15.	මහා නගර සභා මන්ත්‍රී	-	අයි.ඩී.මහින්ද පල්ලිආරච්චි මහතා
16.	මහා නගර සභා මන්ත්‍රී	-	එච්.කේ.ෂර්මන් පිලිසියන් ප්‍රනාන්දු මහතා
17.	මහා නගර සභා මන්ත්‍රී	-	ඩබ්.ජීවන්ත සුදර්ශන කුමාර ප්‍රනාන්දු මහතා
18.	මහා නගර සභා මන්ත්‍රී	-	එච්.කේ.ශ්‍රියංග මනෝජ් ප්‍රනාන්දු මහතා
19.	මහා නගර සභා මන්ත්‍රී	-	ජීවන්ත සෙනෙවිරත්න මහතා
20.	මහා නගර සභා මන්ත්‍රී	-	කේ.ඩබ්.සදුන් චාමර ප්‍රනාන්දු මහතා
21.	මහා නගර සභා මන්ත්‍රී	-	ඩී.එස්.සුසන්ත ඉරෝෂන් ප්‍රනාන්දු මහතා
22.	මහා නගර සභා මන්ත්‍රී	-	ඩබ්.දිලිප් මනෝජ් ප්‍රනාන්දු මහතා
23.	මහා නගර සභා මන්ත්‍රී	-	බී.සරෝජනී මැන්දිස් මහත්මිය
24.	මහා නගර සභා මන්ත්‍රී	-	එම්.චන්ද්‍රසිරි ප්‍රනාන්දු මහතා
25.	මහා නගර සභා මන්ත්‍රී	-	එම්.ඉන්ද්‍රජිත් ප්‍රනාන්දු මහතා

පහත නම් සඳහන් මහා නගර සභා මන්ත්‍රීවරුන් 2026.09.10 දින පැවති මුදල් පිළිබඳ ස්ථාවර කමිටු වාර්තාවේ අංක 02(1), 03(02), 06, 09, 10, 15, 17(01), 17(02), 17(03), 18, 19, 23, 24 හා 32 දරණ කමිටු නිර්දේශයන්ට පක්ෂව ඡන්දය ප්‍රකාශ කළ අතර, අනෙකුත් සියළුම කමිටු නිර්දේශයන්ට පක්ෂව හෝ විපක්ෂව ඡන්දය ප්‍රකාශ කිරීමෙන් වැළකී සිටින ලදී.

1.	මහා නගර සභා මන්ත්‍රී	-	ඩබ්. මැක්සි ජේ. ප්‍රනාන්දු මහතා
2.	මහා නගර සභා මන්ත්‍රී	-	එම්. තිලකසිරි ප්‍රනාන්දු මහතා
3.	මහා නගර සභා මන්ත්‍රී	-	එල්. ඔසඳ හර්ෂණ අබේකෝන් මහතා
4.	මහා නගර සභා මන්ත්‍රී	-	බී. සජිත් දුමින්ද පීරිස් මහතා
5.	මහා නගර සභා මන්ත්‍රී	-	ඒ. එච්. සුරේෂ් ඉන්දික මහතා
6.	මහා නගර සභා මන්ත්‍රී	-	යූ. සුදත් ක්‍රිශාන්ත පෙරේරා මහතා
7.	මහා නගර සභා මන්ත්‍රී	-	යූ. අනුරසිරි ජයලාල් ද සිල්වා මහතා
8.	මහා නගර සභා මන්ත්‍රී	-	යූ. එල්. සේනක දමයන්ත ද සිල්වා මහතා
9.	මහා නගර සභා මන්ත්‍රී	-	එම්.ලිහිණි ප්‍රනාන්දු මහත්මිය
10.	මහා නගර සභා මන්ත්‍රී	-	සිත්ති මසීනා බක්කර් මහත්මිය

11.	මහා නගර සභා මන්ත්‍රී	-	එම්. ශිරෝමි ඉන්දිකා කුරේ මහත්මිය
12.	මහා නගර සභා මන්ත්‍රී	-	එස්. වදුන් රොමේෂ් ප්‍රනාන්දු මහතා
13.	මහා නගර සභා මන්ත්‍රී	-	එල්. දිලිජ් රොෂාන් කුමාර පෙරේරා මහතා
14.	මහා නගර සභා මන්ත්‍රී	-	ඩබ්. සමීර ප්‍රභාත් ප්‍රනාන්දු මහතා
15.	මහා නගර සභා මන්ත්‍රී	-	ඩබ්. ඩී. බ්‍රෙන්ඩන් හිමාෂා ක්‍රිස්ටිල්කාන්ත මහතා
16.	මහා නගර සභා මන්ත්‍රී	-	පී. සුලක්ෂිකා තිලක්ෂනී ප්‍රනාන්දු මෙනවිය
17.	මහා නගර සභා මන්ත්‍රී	-	හරිෂ් වන්දන පිලානවිතානගේ මහතා
18.	මහා නගර සභා මන්ත්‍රී	-	ඩබ්.ඩී. රංජලා එස්.ජයතුංග මහත්මිය
19.	මහා නගර සභා මන්ත්‍රී	-	ඩී.එම්. මනෝජ් මධුරංග විජයරත්න මහතා
20.	මහා නගර සභා මන්ත්‍රී	-	ඕ. දිනූෂි කෞෂල්‍යා පෙරේරා මහත්මිය
21.	මහා නගර සභා මන්ත්‍රී	-	එච්.එල්.තිළිණි නෙත්සරණි මෙනවිය
22.	මහා නගර සභා මන්ත්‍රී	-	එම්. ප්‍රියනාත් මැකන්සි මැන්දිස් මහතා

පහත නම් සඳහන් මහා නගර සභා මන්ත්‍රීවරු 2026.09.10 දින පැවති මුදල් පිළිබඳ ස්ථාවර කමිටු වාර්තාවේ සියලුම කමිටු නිර්දේශයන්ට විපක්ෂව ඡන්දය ප්‍රකාශ කරන ලදී.

1.	මහා නගර සභා මන්ත්‍රී	-	ඩී.එම්.සුජිත් පුෂ්පකුමාර මහතා
2.	මහා නගර සභා මන්ත්‍රී	-	පී.එම්.ෂෙයාන් දුලිප් තිසේරා මහතා

පහත නම් සඳහන් මහා නගර සභා මන්ත්‍රීවරුන් 2026.09.10 දින පැවති මුදල් පිළිබඳ ස්ථාවර කමිටු වාර්තාවේ සියළුම කමිටු නිර්දේශයන්ට පක්ෂව හෝ විපක්ෂව ඡන්දය ප්‍රකාශ කිරීමෙන් වැළකී සිටින ලදී.

1.	මහා නගර සභා මන්ත්‍රී	-	ඩී. සමන්ත සිල්වා මහතා
2.	මහා නගර සභා මන්ත්‍රී	-	ඩබ්. සුරේෂ් ප්‍රේමකුමාර ප්‍රනාන්දු මහතා

2026.09.10 දින පැවති මුදල් පිළිබඳ ස්ථාවර කමිටු වාර්තාවේ සියලුම කමිටු නිර්දේශයන් වැඩි ඡන්දයෙන් සභා සම්මත විය.

07 <u>ලැබීම් ගෙවීම් පිළිබඳ මාසික ප්‍රකාශන වැඩ ප්‍රගති වාර්තාව</u>

<u>ගරු නගරාධිපති - කේ. ඩී. නිශාන්ත ප්‍රදීන්නාදු මහතා</u>

ගරු මහා නගර සභා මන්ත්‍රීවරුනී, 2026.09.10 දිනැති මුදල් කමිටු වාර්තාවේ අංක 14 යටතේ 2026 අගෝස්තු මාසයට අදාළ මූල්‍ය වාර්තාව ඇමුණුම 13 ලෙස ඉදිරිපත් කර තිබෙනවා.

08 <u>පුද්ගලික ස්වභාවයේ කරුණු</u> - නැත

09. <u>වෙනත් කරුණු</u> - නැත

අ.කලේ කේ.ඩී. නිශාන්ත ප්‍රදිනාන්දු,
නගරාධිපති,
මොරටුව මහා නගර සභාව,
මොරටුව.

2026.10.06 දින,
මොරටුව මහා නගර සභා කාර්යාලයේදී ය.